(iv) the annual sugar production and sales made by the said factories from the year 2020 up to now;

(v) whether he knows that sugarcane farmers have been inconvenienced by the halt of the process of obtaining sugarcane by the said factories;

(vi) since it is reported that employees' salaries and contributions to the Employees' Provident Fund and the Employees' Trust Fund are not paid by the relevant factories properly, whether action will be taken to overcome the said situation; and

(vii) the measures taken to ensure the proper functioning of these factories and the proper fulfillment of workers' rights?

(b) If not, why?

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු කථානායකතුමනි, කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) පැල්වත්ත - හෙක්ටෙයාර 9,595යි.

සෙවනගල - හෙක්ටෙයාර 7,518යි.

(ii)

| විස්තරය | පැල්වත්ත (හෙක්ටෙයාර) | සෙවනගල (හෙක්ටෙයාර) |
|---|---|---|
| මුළු වපසරිය | 9,595 | 7,518 |
| උක් වගා වපසරිය | 8,791 | 3,385 |
| ඉතිරි වපසරිය (වෙනත් භෝග, අනවසර ඉදිකිරීම්) | 804 | 830 |

(අනවසර කටයුතු සඳහා නීති මඟින් කටයුතු කරමින් පවතී)

(iii) **සෙවනගල**

- 2025 වර්ෂයේදී කර්මාන්තශාලාවෙහි ක්‍රියාත්මක වූ කටර් මෝටර් එකක් අක්‍රිය වීම සහ රික්ත උදුන් 02ක් අක්‍රිය වීම නිසා අපේක්ෂිත උක් ඇඹරීම අඩු වීම හේතුවෙන් සහ ගොවි උද්ඝෝෂණ හේතුවෙන් මසකට ආසන්න කාලයක් සීනි නිෂ්පාදන කටයුතු සිදු කිරීමට නොහැකි විය.
- එතනෝල් අළෙවිය අඩු වීම හේතුවෙන් 2023, 2024 සහ 2025 වර්ෂවල එතනෝල් නිෂ්පාදනයේ යම් අඩුවක් දක්නට ලැබේ.

**පැල්වත්ත**

- 2025 වර්ෂයේදී පැල්වත්ත ඒකකයේ නිෂ්පාදන කටයුතු සැලසුම් කර ඇති පරිදි සිදු කරනු ලැබීය.

2025 මහ කන්නයෙන් අනතුරුව නඩත්තු කටයුතු සඳහා දැනට කර්මාන්තශාලා දෙකෙහිම නිෂ්පාදන කටයුතු නතර කර ඇති අතර, 2026 යල කන්නය සඳහා පෙබරවාරි මස මැදදී නැවත නිෂ්පාදන කටයුතු ඇරඹීමට නියමිතය.

(iv)

| වර්ෂය | පැල්වත්ත | | සෙවනගල | |
|---|---|---|---|---|
| | සීනි නිෂ්පාදනය (මෙට්‍රික් ටොන්) | සීනි අළෙවිය (මෙට්‍රික් ටොන්) | සීනි නිෂ්පාදනය (මෙට්‍රික් ටොන්) | සීනි අළෙවිය (මෙට්‍රික් ටොන්) |
| 2020 | 23,582.15 | 17,614 | 16,115 | 13,851 |
| 2021 | 30,381.20 | 33,304 | 17,796 | 15,647 |
| 2022 | 24,110.25 | 23,217 | 12,628 | 14,632 |
| 2023 | 28,076.65 | 20,303 | 13,784 | 12,089 |
| 2024 | 27,790.85 | 15,415 | 11,930 | 9,901 |
| 2025 | 27,361.05 | 23,003 | 8,091 | 8,742 |

(v) **සෙවනගල**

- පෙර වර්ෂයන්ට සාපේක්ෂව 2025 වර්ෂයේ සෙවනගල කර්මාන්තශාලාවේ සිදු වූ හදිසි බිඳවැටීම් හේතුවෙන් දෛනිකව ලබා දීමට නියමිත උක් සලාකය නිසි වේලාවට කම්හල වෙත ලබා ගැනීමට නොහැකි විය. එමෙන්ම, උක් වගාවන් කඩාකප්පල්කාරී ලෙස ගිනි තැබීම හේතුවෙන් දිගින් දිගටම සිදු වූ ගොවි උද්ඝෝෂණ හේතුවෙන් ද මසකට ආසන්න කාලයක් කර්මාන්තශාලාවේ නිෂ්පාදන කටයුතු සිදු කිරීමට නොහැකි විය.
- එමෙන්ම, 2024දී VAT එක පැනවීමෙන් පසු සීනි හා එතනෝල් නිසි පරිදි ප්‍රමාණාත්මකව අළෙවි කර ගැනීමට නොහැකිවීම මත ආයතනයේ පැවති අයහපත් මූල්‍යමය තත්ත්වය හේතුවෙන් කර්මාන්තශාලාවේ හදිසි බිඳවැටීම් හා නඩත්තු කටයුතු සඳහා අවශ්‍ය යන්ත්‍රෝපකරණ හා අමතර කොටස් තොග ගබඩාවන්හි පවත්වා ගෙන යාමට නොහැකි වීම හා යන්ත්‍රෝපකරණ හා අමතර කොටස් නිසි කාලපරිච්ඡේදයේදී මිලදී ගැනීමට අදාළ ප්‍රසම්පාදන කටයුතු සිදු කිරීමට නොහැකි වීම මත ඇඹරුම් ධාරිතාව අපේක්ෂිත මට්ටමට වඩා අඩු විය. ඒ හේතුව මත 2025 සඳහා අපේක්ෂිත උක් ප්‍රමාණය අඹරා ගැනීමට නොහැකි විය.
- තවද, ඇඹරුම් කටයුතු සඳහා යොදා ගන්නා කටර් මෝටර් දෙකෙන් එක් මෝටරයක් අක්‍රිය වීම නිසා එය අලුත්වැඩියා කිරීමට ජාත්‍යන්තර මිල ගණන් කැඳවීමට සිදු වූ බැවින් එහි අලුත්වැඩියා කටයුතු ප්‍රමාදවීම හේතුවෙන් එක් මෝටරයක් පමණක් ක්‍රියාත්මක කිරීම හේතුවෙන් ඇති වූ අවදානම් තත්ත්වය නිසා නියමිත ඇඹරුම් ධාරිතාව පවත්වාගෙන යාමට හැකියාවක් නොතිබීම.
- සීනි නිෂ්පාදනය කිරීමේදී දෛනිකව vacuum fans 4ක් යොදා ගනු ලැබුවත් ඉහත කාල පරිච්ඡේදය තුළ ඉන් එක් vacuum fan 1ක් අලුත්වැඩියා කිරීම සඳහා පළමුවර ගෙන්වන ලද ERW පයිප්ප අදාළ පිරිවිතරයන්ට නොගැළපීම හේතුවෙන් නැවත ජාත්‍යන්තර මිල ගණන් කැඳවීමට සිදුවීම මත එහි අලුත්වැඩියා කටයුතු ප්‍රමාදවීම හේතුවෙන් දෛනික උක් ඇඹරුම් ධාරිතාව අඩු වීම මත නියමිත උක් ප්‍රමාණය අඹරා ගැනීමට නොහැකි විය.

**පැල්වත්ත**

පැල්වත්ත කර්මාන්තශාලාව මඟින් උක් ලබා ගැනීමේ ක්‍රියාවලිය ඇනහිට තිබුණේ නැත.

(vi) **සෙවනගල**

2025 ජුනි සිට සැප්තැම්බර් දක්වා සේවක අර්ථසාධක අරමුදල් - EPF - රුපියල් මිලියන 46.77ක් හිඟව ඇති අතර, 2025 ඔක්තෝබර් මස සිට අදාළ ගෙවීම් නිසි පරිදි සිදු කරනු ඇත.

**පැල්වත්ත**

සේවක අර්ථසාධක අරමුදල් සඳහා දායක මුදල් ගෙවීම 2024 දෙසැම්බර් මස සිට 2025 සැප්තැම්බර් මස දක්වා රුපියල් මිලියන 370.5ක් හිඟව පවතී.

- 2025 ඔක්තෝබර් මස සිට ගෙවිය යුතු සේවක භාරකාර අරමුදල් නිසි පරිදි නියමිත දිනට ගෙවීමට කටයුතු කර ඇත.
- ඉහත හිඟහිටි මුදලින් අමප/25/1673/804/202 හා 2025.09.23 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය මඟින් අනුමැතිය ලබා දී ඇති රුපියල් මිලියන 291ක සේවක අර්ථසාධක අරමුදල් පියවීම සඳහා 2026 රාජ්‍ය අය වැය මඟින් මුදල් වෙන් කර ඇත. එමෙන්ම 2025 ඔක්තෝබර් මස සිට සේවක අර්ථසාධක අරමුදල සහ සේවක භාරකාර අරමුදල සඳහා දායක මුදල් මාසිකව නියමිත දිනයට ගෙවීමට කටයුතු කර ඇත.

(vii)

- 2011.11.11 දින රජයට පවරා ගන්නා ලද නිලධාරීන් සහ සේවක මණ්ඩලය 5,000කට ආසන්න සංඛ්‍යාවක් සේවය කරනු ලබන ශ්‍රී/ස ලංකා සීනි සමාගමේ කාර්ය මණ්ඩලය සකස් කර කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මඟින් අනුමත කර ගැනීමක් මේ දක්වා සිදු කර නොමැත. ඒ හේතුවෙන් රාජ්‍ය වැටුප් තලයන්හි මෙම ආයතන සේවකයින් පිහිටුවා නොමැත. මේ වන විට එම කටයුතු අවසන් අදියර දක්වා පැමිණ ඇත. කාර්ය මණ්ඩලය අනුමත වීමෙන් පසු ආයතනයේ සියලු සේවකයින් රාජ්‍ය වැටුප් චක්‍රලේඛ අනුව තෘප්තිමත් වැටුප් තලවල පිහිටුවීමට හැකියාවක් පවතී.

[ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා]

- එමෙන්ම නිසි පරිදි අධ්‍යාපන සුදුසුකම් මත බාහිර අයදුම්කරුවන් සමාගමට බඳවා ගැනීමක් සිදු කර නොමැත. අභ්‍යන්තර බඳවා ගැනීම් ද නිසි ක්‍රමවේද අනුව ආයතනය තුළ වූ පළපුරුද්ද මත සිදු කර නොමැත. අභ්‍යන්තර උසස්වීම් ද නිසි ක්‍රමවේද අනුව සුදුස්සාට සුදුසු ස්ථානයක් ලැබෙන ආකාරයෙන් සිදු කර නොමැති බව අධ්‍යයනය මඟින් මෙන්ම ලැබී ඇති විගණන විමසුම්වලින් ද පැහැදිලි වේ. කාර්ය මණ්ඩලය අනුමත කිරීම තුළින් රාජ්‍ය සේවයේ සමාගමක් සඳහා වන බඳවා ගැනීමේ පටිපාටි සකස් කර ගැනීමේ කටයුතු ද මේ වන විට අවසන් අදියරෙහි පවතී. නියමිත බඳවා ගැනීමේ පටිපාටි තුළින් සමාගමේ සේවයට බාහිරව මෙන්ම අභ්‍යන්තරව බඳවා ගැනීම මෙන්ම උසස්වීම් ද නිසි පරිදි සිදු කිරීමට හැකියාව ලැබීම තුළ සේවක අයිතිවාසිකම් ඉටු කිරීමට හැකියාව ලැබේ.

- ඉහත කාරණා ඉතා කෙටි කාලයක් තුළ සම්පූර්ණ කිරීමට අවශ්‍ය කටයුතු මේ වන විට ඉටු කරමින් පවතින අතර ඒ තුළින් තෘප්තිමත් රැකියා පරිසරයක් ඇති කිරීම සහ සේවක අයිතිවාසිකම් ආරක්ෂා කර දීම සිදු කළ හැකි වේ.

- රාජ්‍ය මැදිහත්වීම මත දැනට හිඟව පවතින ඉහත (vi) මඟින් දක්වා ඇති ව්‍යවස්ථාපිත දීමනා ගෙවීමට 2026 අය වැය මඟින් ප්‍රතිපාදන සලසා ඇත.

- සීනි නිෂ්පාදනය කරනු ලබන සියලු ආයතන එක්ව සීනි හා එතනෝල් සඳහා ස්ථාවර විකුණුම් මිලක් තීරණය කර ඒ යටතේ අලෙවි කිරීමට කටයුතු කරගෙන යාම ද දැනට සිදු කරමින් පවතී.

(ආ) අදාළ නොවේ.

**ගරු ඩබ්ලිව්.එච්.එම්. ධර්මසේන මහතා**
(மாண்புமிகு டப்ளியூ.எச்.எம். தர்மசேன)
(The Hon. W.H.M. Dharmasena)

ගරු අමාත්‍යතුමනි, ඔබතුමාට බෙහෙවින් ස්තුතිවන්ත වනවා, මගේ ප්‍රශ්නයට පිළිතුරු ලබා දීම පිළිබඳව. එතනෝල්වල මිල අඩු වෙලා තිබෙන්නේ නිසි වෙලාවට නඩත්තු කටයුතු සිදු නොවීමත්, එතනෝල් පිටරටින් ගෙන්වීමත් නිසාය කියලා තමයි මම විශ්වාස කරන්නේ.

ගරු ඇමතිතුමනි, 2025 සිට මේ දක්වා දෙවරක් රාජ්‍ය සේවයේ වැටුප් වැඩි වීම් සිදු වෙලා තිබෙනවා. නමුත් රාජ්‍ය ආයතන දෙකක් වන සෙවනගල සීනි කර්මාන්තශාලාවේ සහ පැල්වත්ත සීනි කර්මාන්තශාලාවේ සේවකයින්ට මේ වැටුප් වැඩිවීම සිද්ධ වෙලා නැහැ. ගරු ඇමතිතුමනි, පැල්වත්ත සහ සෙවනගල සීනි කර්මාන්තශාලා බිඳ වැටීමත් එක්ක විශාල වශයෙන් අසරණ තත්ත්වයට පත් වෙලා ඉන්න ඒවායේ සිටින සේවකයින්ගේ වැටුප් වැඩි කිරීම මේ වසරේ සිදු කරනවාද, නැද්ද කියන එක තමයි මම පළමුවැනි අතුරු ප්‍රශ්නය විධියට අහන්නේ.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු මන්ත්‍රීතුමනි, මගේ පිළිතුර තුළ අන්තර්ගත වුණා, ඔබතුමා අහන ප්‍රශ්නයට පිළිතුර. පසුගිය කාලයේ ඒ කර්මාන්තශාලාවල තිබුණු ගැටලු නිසා ඒවාට අදාළ අනුමැතීන් ලබාගෙන, ඒ වාගේම මුදල් වෙන් කිරීමක් සිදු කරලා ඒ කටයුතු සිදු කරමින් පවතින බව තමයි අදාළ අමාත්‍යාංශය වාර්තා කරන්නේ.

**ගරු ඩබ්ලිව්.එච්.එම්. ධර්මසේන මහතා**
(மாண்புமிகு டப்ளியூ.எச்.எம். தர்மசேன)
(The Hon. W.H.M. Dharmasena)

ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. ගරු ඇමතිතුමනි, 2025 වර්ෂයේ ස්ප්‍රීතු ලීටර් ලක්ෂ 60ක් විතර නිෂ්පාදනය කරලා අලෙවි කර තිබෙනවා. සීනි තොග අවසන් වන තරමට අලෙවි කර තිබෙනවා. හැබැයි, පැල්වත්තේ උක් ගොවීන්ට රුපියල් මිලියන 300කට ආසන්න ප්‍රමාණයක් ගෙවන්න තිබෙනවා. බඩු භාණ්ඩ මිලදී ගත් අයට රුපියල් මිලියන 300කට ආසන්න ප්‍රමාණයක් ගෙවන්න තිබෙනවා. ලංකා බැංකුවට රුපියල් මිලියන 800ක් පමණ ණය තිබෙනවා. ඒ වාගේම තමයි, බැංකුවල රුපියල් මිලියන 800ක පමණ OD තිබෙනවා. ඊළඟට, EPF එකට රුපියල් මිලියන 370ක් වශයෙන් මුළු එකතුව ගත්තාම රුපියල් මිලියන 2,570ක් පමණ ණය තිබෙනවා. මේ හේතු නිසා ගොවීන් උක් වගාවෙන් පොඩ්ඩක් බැහැර වෙන ආකාරයක් දැනෙනවා. පිටස්තර උක් ගොවීන් උක් වගාව සම්පූර්ණයෙන්ම වාගේ අත්හැර තිබෙනවා. කේන්ද්‍රීය වතු යායේත් උක් වගාව අඩු වෙලා තිබෙනවා. මේ තත්ත්වය මත ඔබතුමන්ලා මේ සමාගම වසා දමන්න හදනවාද, එහෙම නැත්නම් අඩු තරමින් මෙය පෞද්ගලීකරණය කරන්න හදනවාද කියන ගැටලුව අපට මතු වෙලා තිබෙනවා. ඒ නිසා මේ සම්බන්ධයෙන් වන වැඩ පිළිවෙළ මොකක්ද කියන එක අපි දැනගන්න කැමැතියි.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු කථානායකතුමනි, පැල්වත්තෙන්, සෙවනගලින් හදන සීනි රස වුණාට, ඉතිහාසය තුළ ඒවායේ පැවැති කළමනාකාරීත්වය අන්තිම තිත්තයි. අපි මේ අවුරුදු එකහමාර තුළ මේ ආයතන ගොඩ ගනිමින් ක්‍රමානුකූලව ලාභ ලබන ආයතන බවට පත් කර ගන්න ලොකු වෙහෙසක් දැරුවා. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නොවෙයි, මම මේ කියන්නේ. අවුරුදු ගණනක් තිස්සේ විනාශ කරපු ආයතන තමයි දැන් අපි ගොඩ ගනිමින් ඉන්නේ. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට මේ සම්බන්ධව තේරුම් යනවා ඇති, මම ලබා දීපු පිළිතුරෙන්ම. අමාත්‍යාංශය මේ සඳහා විශාල පරිශ්‍රමයක් දරමින් ඉන්නවා. මුදල් අමාත්‍යාංශය එම කටයුත්තට මැදිහත් වෙමින් ඉන්නවා. අපි කැබිනට් මණ්ඩලයේදී මේ ගැන අවස්ථා කිහිපයකදී සාකච්ඡා කළා. ඒ අනුව ගොවියාට සහ නිෂ්පාදනයට සාධාරණයක් වන විධියට කටයුතු කරමින් පවතිනවා.

## රාගම නගරයේ UDA ඉඩම්: අනවසර ඉදිකිරීම්
## ராகம நகரிலுள்ள UDAக்குச் சொந்தமான காணிகள்: சட்டவிரோத கட்டுமானங்கள்
## UDA LANDS IN RAGAMA TOWN: UNAUTHORIZED CONSTRUCTIONS

1565/2025

**6. ගරු ස්ටෙෆනි ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஸ்டெபனி பர்னாந்து)
(The Hon. Stepni Fernando)

ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) රාගම නගරයේ නාගරික සංවර්ධන අධිකාරිය සතු මුළු භූමි ප්‍රමාණය කොපමණද;

(ii) එම භූමිය තුළ අනවසරයෙන් ඉදි කරන ලද ව්‍යාපාරික ස්ථාන තිබේද;

(iii) එසේ නම්, එම සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) උතුරු කොළඹ ශික්ෂණ රෝහලේ පිවිසුම් දොරටුව ඉදිරිපිට ගුවන් පාලම ආරම්භ වන ස්ථානයේ ඇති නාගරික සංවර්ධන අධිකාරිය සතු ඉඩමේ පිහිටුවා ඇති පොලිස් මුරපොළ වටකර කඩ කාමර ඉදිකර ඇති බව දන්නේද;

(ii) එසේ කඩ කාමර ඉදි කරන මුල් අවස්ථාවේදී, අධිකාරියේ රාගම නගරය භාර ක්ෂේත්‍ර නිලධාරීන් විසින් ඒ සම්බන්ධයෙන් අධිකාරිය දැනුම්වත් කර තිබේද;

(iii) එසේ නම්, ඒ සම්බන්ධව ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(iv) ඒ අනුව එම ඉදිකිරීම් ඉවත් කර තිබේද;

(v) නොඑසේ නම්, එම ඉදිකිරීම් ඉවත් කිරීමට ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

போக்குவரத்து, நெடுஞ்சாலைகள் மற்றும் நகர அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) ராகம நகரிலுள்ள, நகர அபிவிருத்தி அதிகாரசபைக்குச் சொந்தமான காணிகளின் மொத்த அளவு யாது என்பதையும்;

(ii) மேற்படி காணிகளில் சட்டவிரோதமாக நிர்மாணிக்கப்பட்டுள்ள வர்த்தக நிலையங்கள் காணப்படுகின்றனவா என்பதையும்;

(iii) ஆமெனில், அவற்றின் எண்ணிக்கை எத்தனை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) கொழும்பு வடக்கு போதனா வைத்தியசாலையின் நுழைவாயிலுக்கு முன்பாக, மேம்பாலம் ஆரம்பமாகும் இடத்தில் காணப்படுகின்ற நகர அபிவிருத்தி அதிகாரசபைக்குச் சொந்தமான காணியில் அமைந்துள்ள பொலிஸ் காவலரணைச் சுற்றி கடைகள் அமைக்கப்பட்டுள்ளதை அறிவாரா என்பதையும்;

(ii) மேற்படி கடைகள் நிர்மாணிக்கப்படும் நடவடிக்கைகள் தொடங்கிய ஆரம்ப காலத்தில், அதிகாரசபையின் ராகம நகரத்துக்குப் பொறுப்பான கள அலுவலர்கள் இது தொடர்பில் அதிகாரசபைக்கு அறிவித்திருந்தார்களா என்பதையும்;

(iii) ஆமெனில், அது தொடர்பில் மேற்கொள்ளப்பட்டுள்ள நடவடிக்கைகள் யாவை என்பதையும்;

(iv) அதற்கமைவாக மேற்படி கட்டுமானங்கள் அகற்றப்பட்டுள்ளனவா என்பதையும்;

(v) இன்றேல், மேற்படி கட்டுமானங்களை அகற்றுவதற்கு மேற்கொள்ளப்படும் நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Transport, Highways and Urban Development:

(a) Will he inform this House-

(i) the total extent of land in Ragama Town owned by the Urban Development Authority;

(ii) whether there are unauthorized business establishements in the said land; and

(iii) if so, the number of those?

(b) Will he also inform this House-

(i) whether he is aware that shops have been constructed round the Police Post located on the land owned by the Urban Development Authority at the starting point of the flyover in front of the entrance of the Colombo North Teaching Hospital;

(ii) whether the field officers of the Authority in charge of Ragama Town informed the Authority in this regard at the commencement of construction of those shops;

(iii) if so, the steps taken in that regard;

(iv) whether the constructions have been removed accordingly; and

(v) if not, the measures to be taken to remove such constructions?

(c) If not, why?

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) හෙක්ටෙයාර 1.7490කි.

(ii) ඔව්.

(iii) රාගම නගරයේ ප්‍රධාන මාර්ගය දෙපස අනවසර ඉදිකිරීම් රාශියක් පවතින අතර, රාගම ශික්ෂණ රෝහල ඉදිරිපිට පිහිටා ඇති නාගරික සංවර්ධන අධිකාරිය සතු, දැනට වෙනත් පාර්ශ්වයන් වෙත පවරා දී ඇති ඉඩම තුළද අනවසර ඉදිකිරීම් පවතින බව නිරීක්ෂණය කර ඇත. ඒ අනුව ප්‍රශ්නගත ව්‍යාපාරික ස්ථාන 6ක් හඳුනා ගෙන ඇත. එමෙන්ම අනෙකුත් අනවසර ඉදිකිරීම් පිළිබඳ සමීක්ෂණයක් මඟින් හඳුනාගෙන ඉදිරි කටයුතු සිදු කිරීමට නියමිතය.

(ආ) (i) ඔව්.

(ii) ඔව්.

(iii) නාගරික සංවර්ධන අධිකාරියේ ගම්පහ දිස්ත්‍රික් කාර්යාලයෙන් මෙම අනවසර ඉදිකිරීම් සඳහා ක්‍රියාමාර්ග ගන්නා ලෙස අධිකාරියේ ප්‍රධාන කාර්යාලයේ බලාත්මක, විගණන හා පසුවිපරම් ඒකකය වෙත දන්වා ඇති අතර, ඒ අනුව ගෙන ඇති ක්‍රියාමාර්ග පහත පරිදි වේ.

- නැවත ස්ථානීය පරීක්ෂණයක් සිදු කර ඇත.

[ගරු බිමල් රත්නායක මහතා]

- දින 14ක් ඇතුළත අනවසර ඉදිකිරීම් ඉවත් කරන ලෙස සහ අනුමත සැලසුම් ඉදිරිපත් කරන ලෙස දන්වා 2025.12.29වන දින නිවේදන යවා ඇති අතර එම කාල සීමාව 2026.01.13 දිනෙන් අවසන් වේ.

- එම නිවේදනය සඳහා අනවසරකරුවන් විසින් ප්‍රතිචාරයක් දක්වා නොමැති බැවින් දින 7ක් ඇතුළත අනවසර ඉදිකිරීම් ඉවත් කර ගන්නා ලෙස 2026.01.14 දින නිවේදනය කර ඇත. එම කාල සීමාව 2026.01.21 දිනෙන් අවසන් වේ.

- දින 7 නිවේදනය සඳහා අනවසරකරුවන් විසින් ප්‍රතිචාර නොදැක්වුවහොත් එකී අනවසර ඉදිකිරීම් කඩා ඉවත් කිරීමට අවශ්‍ය ඉදිරි නීතිමය කටයුතු සිදු කිරීමට 2025.12.31වන දින නාගරික සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ප්‍රධානත්වයෙන් පැවැති සමාලෝචන කමිටුවේදී තීරණය කර ඇත.

සමාලෝචන කමිටුව කියන්නේ ගරු කථානායකතුමනි, නාගරික සංවර්ධන අධිකාරියේ ප්‍රකාශිත බල ප්‍රදේශවල සිදු වන අනවසර ඉදිකිරීම් ඇතුළු සැලසුම් වශයෙන් ඇති වන ගැටලු, නඩු පැවරීම් සහ සැලසුම් පසු විපරම, අනවසර ඉදිකිරීම් තුළින් ඇති වන හානිපූරණ ගැටලු යනාදිය සඳහා තීරණ ගැනීමට අධිකාරිය විසින් ස්ථාපනය කර ඇති අභ්‍යන්තර කමිටුවක්. එම කමිටුව නාගරික සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්, අධ්‍යක්ෂ (නීති), බලාත්මක-විගණන හා පසු විපරම් අංශයේ අංශ ප්‍රධානී ඇතුළු එම අංශයේ නිලධාරින්ගෙන්, කොළඹ මහ නාගරික ප්‍රදේශ අංශයේ නිලධාරින්ගෙන් හා අවශ්‍ය වූ විටක අදාළ අනෙකුත් ආයතනවල නිලධාරින්ගෙන් සමන්විත වේ.

(iv) නැත. ඉවත් කිරීමට අදාළ මූලික කටයුතු ආරම්භ කර ඇත.

(v) දින 7 නිවේදනය සඳහා ප්‍රතිචාර නොදැක්වුවහොත් ඉදිරි අධිකරණ කටයුතු සිදු කිරීමට නියමිතය.

(ඈ) අදාළ නොවේ.

**ගරු ස්ටෙෆනි ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஸ்டெபனி பர்னாந்து)
(The Hon. Stepni Fernando)

ගරු කථානායකතුමනි, ගරු ඇමතිතුමාට මා ස්තුතිවන්ත වෙනවා, එම පිළිතුර ලබා දීම පිළිබඳව. මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. එම ඉඩම පිටුපස නාගරික සංවර්ධන අධිකාරියට අයත් තවත් ගොඩනැඟිලි වාගේම හිස් ඉඩම් තිබෙනවා. ඒවා නිසි ක්‍රමවේදයක් ඇතුව ඒ අයට ලබා දීලා තිබෙනවාද? එසේ නොමැති නම් නාගරික සංවර්ධන අධිකාරිය හරහා ඒ හිස් ඉඩම්වල මොකක් හෝ ව්‍යාපෘතියක් පටන් අරගෙන තිබෙනවාද? නැත්නම් එම ඉඩම් එක එක අවශ්‍යතා සඳහා එක එක්කෙනා පවරා ගන්න පුළුවන්. එම නිසා ඒකට ඉක්මනින් ක්‍රියාමාර්ගයක් ගන්න තීරණය කරලා තිබෙනවාද, ගරු ඇමතිතුමනි?

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු කථානායකතුමනි, රාගම නගරයේ නාගරික සංවර්ධන අධිකාරිය සතු භූමිය පිළිබඳව මම කෙටියෙන් පැහැදිලි කිරීමක් කරන්නම්. ජා-ඇල නගර සංවර්ධන සැලැස්ම යටතේ හඳුනාගෙන තිබෙන රාගම සෞඛ්‍ය නගරයේ - Health Cityහි - සංවර්ධන කටයුතු ඉදිරියට ගෙන යාම සඳහා රාගම නගරයේ පවතින අනවසර ඉදිකිරීම් බාධාවක් වෙලා තිබෙනවා. ඒ අනුව රාගම නගරයේ රෝහල ඉදිරිපිට වටරවුම ගත්තොත්, එතැන flyover එකක් තිබෙනවා. ඉතාම සංකීර්ණ කෝච්චි පාරවල් තිබෙනවා. ඒ නිසා මාර්ග සංවර්ධන අධිකාරිය මඟින් රාගම නගරය සඳහා ප්‍රධාන සංවර්ධන ව්‍යාපෘතියක් සැලසුම් කරලා තිබෙනවා, Health City එකක් විධියට කරන්න. සරලව, තේරෙන විධියට කිව්වොත් ගරු මන්ත්‍රීතුමනි, එතැන තිබෙන flyover එකෙන් යනකොටම, ඒ ramp එක ඉවර වෙනකොටම එතැනිනුත් වාහන හරවනවාය කියන එක ඔබතුමා දන්නවා. ඒ නිසා එතැන තිබෙන අනවසර ඉදිකිරීම් ඉවත් කළේ නැති වුණොත්, ඒ flyover එක හදපු එකේත් ප්‍රයෝජනයක් නැති වනවා. හයදෙනෙක් වාගේ තමයි ඒවා අල්ලාගෙන ඉන්නේ. අපේ නිලධාරින් ගියාම පරීක්ෂා කරන්න ඉඩ දීලාත් නැහැ කියලා තමයි මම ඒ ගැන සාකච්ඡා කළාම දැන ගත්තේ. පරණ දේශපාලන හයිය අරගෙන එතැන සිටින අය කටයුතු කරන බවකුත් පෙනෙනවා. නමුත්, අපි කියන්න කැමැතියි, නීතියට කවුරුත් යටත් වෙන්න ඕනෑ බව. ඒ අනවසර ඉදිකිරීම් ඉවත් කරන්න අවශ්‍ය වෙන්නේ ඒ මූලික අරමුණත් එක්කයි. මොකද, රාගම නගර සංවර්ධනයට ඒ අනවසර ඉදිකිරීම් බාධාවක්. එම නිසා ඒ කටයුත්ත සිදු කරනවාය කියන එක තමයි මට කියන්න තිබෙන්නේ.

**ගරු ස්ටෙෆනි ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஸ்டெபனி பர்னாந்து)
(The Hon. Stepni Fernando)

පිළිතුරු ලබා දීම සම්බන්ධයෙන් ගරු ඇමතිතුමාට මම ස්තුතිවන්ත වෙනවා. මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි, ගරු ඇමතිතුමනි. ඇත්තටම රාගම නගරය කියන්නේ, බොහොම කුඩා නගරයක්. හැබැයි, ඒක මෙච්චර කල් කිසිම ක්‍රමවේදයක් ඇතුව හදලා නැහැ. තැන් තැන්වල පොඩි පොඩි කඩ කෑලි වාගේ ඒවා තමයි තිබෙන්නේ. රාගම නගර සංවර්ධනයට මීට කලිනුත් ක්‍රියාමාර්ග අරගෙන තිබෙනවා. හැබැයි, ඒවා සිද්ධ වෙලා නැහැ. එම නිසා ඒ සම්බන්ධව නිසි ක්‍රියාමාර්ගයක් ගන්න වනවා. එතැන ප්‍රාදේශීය සභාවට අයිති ඉඩම් පවා තිබෙනවා. ඒවාත් එකතු කරලා රාගම නගරය ක්‍රමවේදයකට අනුව හදන්න ඕනෑ. මොකද, රාගම නගරයට මුළු රටේම මිනිස්සු එනවා. රාගම හන්දිය කියන්නේ, දුම්රිය ගමන් කරන ස්ථානයක්. එම නිසා අපට රාගම නගරය ඉතාම අලංකාර ලෙස නිර්මාණය කරන්න අවශ්‍යයි. එම කටයුතු ඉක්මනින් ක්‍රියාත්මක වනවාද, කොපමණ කාලයකදී ආරම්භ කරනවාද කියලා මම ගරු ඇමතිතුමාගෙන් අහන්න කැමැතියි.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු කථානායකතුමනි, නගරය සංවර්ධනය කර ගැනීම නගරය විසින්ම කර ගන්න ඕනෑ. ඒ වෙනුවෙන් ආණ්ඩුවට හා ප්‍රාදේශීය සභාවට කළ හැකි වැඩ කොටසක් තිබෙනවා වාගේම කළ යුතු වැඩ කොටසකුත් තිබෙනවා. අපි රාගම නගරය බැලුවොත්, එය එක පැත්තකින් Health City එකක් විධියට දියුණු කරන්න පුළුවන්. මොකද, රාගම නගරය Health City එකක් බවට වෙලා තිබෙනවා. රාගම රෝහලේ වෛද්‍ය අධ්‍යාපනය ලබන සිසු

සිසුවියන් විශාල ප්‍රමාණයක් ඉන්නවා. කඳාන ප්‍රදේශයේ nursing school එකක් තිබෙනවා. එම නිසා රාගම නගරය education hub එකක් බවටත් පත් වනවා. ඒ වාගේම ගරු කථානායකතුමනි, රාගම කියන්නේ බහුවිධ - multimodal - ප්‍රවාහන සේවා ඇති ස්ථානයක්. කෝච්චි තිබෙනවා. බස් තිබෙනවා. Ragama Station එක, ප්‍රධාන station එකක්. මගී ප්‍රවාහනය සඳහා බස් සේවාව තිබෙනවා. ඒ වාගේම taxi services තිබෙනවා. මීට මාස ගණනකට කලින් ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යාංශය මඟින් තීරණය කරලා අපේ සැලසුමක් තිබෙනවා, රාගම නගරය තුළ බහුවිධ ප්‍රවාහන මධ්‍යස්ථානයක් ඉදිකරලා, multimodal system එකක් ගොඩනඟන්න. බහුවිධ ප්‍රවාහන මධ්‍යස්ථානයක් සහ Health City එකක් වාගේම අනෙක් පැත්තෙන් රාගම නගරයේ සිටින ඉගෙන ගන්න තරුණ දරුවන්ට අවශ්‍ය කරන පහසුකම් සහිත නගරයක් ලෙස එය දියුණු කරන්න ඕනෑය කියන තීරණය තමයි නාගරික සංවර්ධන අධිකාරියට සහ අපේ අමාත්‍යාංශයට තිබෙන්නේ. අන්න ඒ පූර්ණ සැලැස්ම ඇතුව තමයි අපි රාගම නගරය දිහා බලන්නේ.

ගරු මන්ත්‍රීතුමාගෙන් මා ඉල්ලා සිටින්නේ මේකයි. ඔබතුමන්ලාගේ ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවේ හැම දෙනාම සම්බන්ධ කරගෙන රාගම දැනට හදලා තිබෙන නාගරික සංවර්ධන සැලැස්ම නූතන විධියට සහ තව අවුරුදු 15කින්, 25කින් කොහොමද කියලා බලලා ඒක update කරලා දෙන්න පුළුවන් නම් ඊට අදාළව අපේ අමාත්‍යාංශයෙනුත්, අනෙකුත් Line Ministriesවලිනුත් ඒ වෙනුවෙන් උදවු කරන්න පුළුවන්. අනවසර ව්‍යාපාරික ස්ථාන ඉවත් කරන්නේ පොදු යහපත සඳහා මිසක්, පෞද්ගලික කාරණයක් නිසා නොවෙයි කියන එකත් මම කියන්න ඕනෑ.

## වනජීවී සහ වන සංරක්ෂණ දෙපාර්තමේන්තු සතු ඉඩම්: මොනරාගල දිස්ත්‍රික්කය

### வனசீவராசிகள் பாதுகாப்பு, வனப் பாதுகாப்பு திணைக்களங்களுக்குச் சொந்தமான காணிகள்: மொனராகலை மாவட்டம்

### LANDS OWNED BY DEPARTMENTS OF WILD LIFE AND FOREST CONSERVATION: MONARAGALA DISTRICT

1636/2025

**7. ගරු රුවන් විජේවීර මහතා**
(மாண்புமிகு ருவன் விஜேவீர)
(The Hon. Ruwan Wijeweera)
පරිසර අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) මොනරාගල දිස්ත්‍රික්කයට අයත් සමස්ත භූමි ප්‍රමාණය හා එම භූමි ප්‍රමාණයෙන් වනජීවී දෙපාර්තමේන්තුව සහ වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව සතුව පවතින භූමි ප්‍රමාණ වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එය ප්‍රතිශතයක් ලෙස කොපමණද;

(iii) කිසියම් භූමි ප්‍රමාණයක්, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව යටතට ගැනීමේදී යොදා ගැනෙන නිර්ණායක කවරේද;

(iv) 2021දී, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් ප්‍රාදේශීය ලේකම් යටතට පවරා ඇති මොනරාගල දිස්ත්‍රික්කයේ ඉඩම් ප්‍රමාණය කොපමණද;

(v) ඒ අතරින්, ප්‍රාදේශීය ලේකම් විසින් දීර්ඝ කාලීන බදු පදනම මත නිදහස් කර ඇති ඉඩම් ප්‍රමාණය කොපමණද;

(vi) එසේ නම්, ඒ කුමන ආයතන හෝ පුද්ගලයන්ටද;

(vii) මෙම පැවරීම් ක්‍රියාවලිය තුළ, මොනරාගල දිස්ත්‍රික්කයේ 'වන්දම-දෙමළිය' රක්ෂිතයට අයත් භූමි ප්‍රමාණය හා මේ වනවිට ප්‍රාදේශීය ලේකම් වෙත නිදහස් කර ඇති ඉඩම් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(viii) ප්‍රාදේශීය ලේකම් වෙත නිදහස් කර ඇති භූමි ප්‍රමාණයෙන් බදු පදනම මත නිදහස් කර ඇති භූමි ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

சுற்றாடல் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) மொனராகலை மாவட்டத்துக்குச் சொந்தமான மொத்த நிலப்பரப்பு மற்றும் அந்த நிலப்பரப்பில் வனசீவராசிகள் பாதுகாப்புத் திணைக்களம் மற்றும் வனப் பாதுகாப்புத் திணைக்களத்துக்குச் சொந்தமாகக் காணப்படுகின்ற நிலப்பரப்புகள் வெவ்வேறாக யாது என்பதையும்;

( ii) அது சதவீதமாக எவ்வளவு என்பதையும்;

(iii) ஒரு குறிப்பிட்ட நிலப்பகுதியை வனப் பாதுகாப்புத் திணைக்களத்தின்கீழ் கொண்டு வரும்போது பின்பற்றப்படும் அளவுகோல்கள் யாவை என்பதையும்;

(iv) 2021ஆம் ஆண்டில் மொனராகலை மாவட் டத்தில் வனப் பாதுகாப்புத் திணைக்களத்தால் பிரதேச செயலாளருக்கு சாட்டுதல் செய்யப் பட்டுள்ள காணியின் அளவு யாது என்பதையும்;

(v) அவற்றுள், பிரதேச செயலாளரால் நீண்டகால குத்தகை அடிப்படையில் விடுவிக்கப்பட்டுள்ள காணியின் அளவு யாது என்பதையும்;

(vi) அவ்வாறாயின், அது எந்த நிறுவனங்கள் அல்லது தனிநபர்களுக்கு என்பதையும்;

(vii) இந்தச் சாட்டுதல் செய்யும் செயன்முறையினுள், மொனராகலை மாவட்டத்திலுள்ள 'வந்தம-தெமலிய' வன ஒதுக்கத்துக்குச் சொந்தமான காணியின் அளவு மற்றும் இதுவரை பிரதேச செயலாளருக்கு விடுவிக்கப்பட்டுள்ள காணியின் அளவு வெவ்வேறாக யாது என்பதையும்;

(viii) பிரதேச செயலாளருக்கு விடுவிக்கப்பட்டுள்ள காணியின் அளவில் குத்தகை அடிப்படையில் விடுவிக்கப்பட்டுள்ள காணியின் அளவு யாது என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Environment:

(a) Will he inform this House -

(i) the total area of land in Monaragala District and out of that area, the portions owned by the Department of Wildlife and the Department of Forest Conservation, separately;

[ගරු රුවන් විජේවීර මහතා]

(ii) such extent, as a percentage;

(iii) the criteria applied when a certain extent of land is brought under the purview of the Department of Forest Conservation;

(iv) the extent of land in Monaragala District handed over to the Divisional Secretary by the Department of Forest Conservation in 2021;

(v) of such land, the extent that has been released by the Divisional Secretaries on long-term lease basis;

(vi) if so, the names of such institutions and individuals;

(vii) within this transfer process, the extent of land held by the "Wandama-Demaliya" Reserve and the extent of land released to the Divisional Secretary in the Monaragala District, separately; and

(viii) of the said extent of land released to the Divisional Secretary, the extent that has been released on lease basis?

(b) If not, why?

**ගරු (වෛද්‍ය) දම්මික පටබැඳි මහතා (පරිසර අමාත්‍යතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) தம்மிக பட்டபெந்தி - சுற்றாடல் அமைச்சர்)
(The Hon. (Dr.) Dammika Patabendi - Minister of Environment)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) • මොනරාගල දිස්ත්‍රික්කයට අයත් සමස්ත භූමි ප්‍රමාණය හෙක්ටෙයාර 563,900කි.

• වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව සතුව පවතින භූමි ප්‍රමාණය හෙක්ටෙයාර 228,001කි.

• වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව සතුව පවතින භූමි ප්‍රමාණය හෙක්ටෙයාර 170,752කි.

(ii) • වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව සතුව පවතින භූමි ප්‍රමාණය සියයට 40.43කි.

• වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව සතුව පවතින භූමි ප්‍රමාණය සියයට 30.28කි.

(iii) • වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව මඟින් රක්ෂිත හා සංරක්ෂිත ලෙස ප්‍රකාශයට පත් කර ඇති වනාන්තර හා රජයට සුදුස්සක් කළ හැකි, වෙනත් යම් පනතක් මඟින් විශේෂිත ආයතනයක් වෙත පවරා නොමැති හා යම් නීත්‍යනුකූල ක්‍රමයකින් වලංගුව පවත්නා හිමිකමක් අත්කරගෙන තිබෙන බවට හෝ තහවුරු නොකළ සියලු ඉඩම් වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව යටතේ පාලනය වේ.

(iv) හෙක්ටෙයාර 20,760කි.

(v) හෙක්ටෙයාර 472.08කි.

(vi) • සියඹලාණ්ඩුව ප්‍රාදේශීය ලේක කොට්ඨාසයේ,

• ශ්‍රී ලංකා සුනිත්‍ය බල අධිකාරිය වෙත

• බුත්තල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ,

• නෙල්නා ඇග්‍රි ඩිවලොප්මන්ට් ආයතනය වෙත

• අනුෂා ප්‍රනාන්දු මහත්මිය වෙත (ගල්කිස්ස)

• තුසිත විමලනාත් මහතා වෙත (ගල්කිස්ස)

• හේනලයිෆ් පුද්ගලික සමාගම, පන්නිපිටිය වෙත

(vii) • "වන්දම - දෙමලිය" වනාන්තරයට අයත්, මේ වන විට වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව යටතේ පාලනය වන,

• වන්දම වනාන්තරය හෙක්ටෙයාර 548.3කි.

• දෙමලිය වනාන්තරය හෙක්ටෙයාර 2,711කි.

• "වන්දම - දෙමලිය" රක්ෂිතයෙන් මේ වන විට ප්‍රාදේශීය ලේකම් වෙත නිදහස් කර ඇති ඉඩම් ප්‍රමාණය

• බුත්තල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ වන්දම රක්ෂිතයෙන් නිදහස් කර ඇති ඉඩම් ප්‍රමාණය හෙක්ටෙයාර 1,714.72කි.

(viii) • බුත්තල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ හෙක්ටෙයාර 256.24කි.

• වැල්ලවාය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ නිදහස් කර නොමැත.

(ආ) අදාළ නොවේ.

**ගරු රුවන් විජේවීර මහතා**
(மாண்புமிகு ருவன் விஜேவீர)
(The Hon. Ruwan Wijeweera)
පිළිතුර ලබා දීම පිළිබඳව ස්තුතිවන්ත වෙනවා, ගරු ඇමතිතුමාට. ගරු කථානායකතුමනි, මගේ පළමුවන අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු අමාත්‍යතුමා ලබා දුන් පිළිතුරත් එක්ක බලනකොට බුත්තල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ වන්දම - දෙමලිය ඇතුළු ප්‍රදේශවල අවශේෂ කැලෑ විධියට පවතින ඉඩම්වලින්, 2021දී ප්‍රාදේශීය ලේකම්ට පවරා තිබෙන ඉඩම්වලින් වැඩි කොටසක් මේ වනකොට අනවසර පුද්ගලයන් විසින් අත්පත් කරගෙන තිබෙනවා, ගරු ඇමතිතුමනි. එතැන තිබෙන ප්‍රශ්නය මේකයි. මේ ඉඩම්වලින් වැඩි ප්‍රමාණයක්, 2021ට කලින් වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව සතුව තිබුණු ඉඩම් තමයි ප්‍රාදේශීය ලේකම්ට පවරා තිබෙන්නේ. ඊට අවුරුදු ගණනාවකට කලින් මේ ඉඩම්වල සාම්ප්‍රදායික හේන් ගොවිතැන කර තිබෙනවා. නමුත්, මේ වෙනකොට ඇතිවෙලා තිබෙන ප්‍රශ්නය තමයි අවශේෂ කැලෑ විධියට තිබෙන මේ වනාන්තරවල දැඩි ලෙස වනඅලි ගැවසීම. ශීඝ්‍ර වනඅලි ගැවසීමක් තිබෙන අතිශය සංවේදී පරිසර කලාපයක් තමයි මේ වන්දම - දෙමලිය ආශ්‍රිත කලාපය. නමුත්, අනවසරයෙන් ඉඩම් අත්පත් කරගෙන අක්කර 100, 150 අලි වැටවල් ගසා පවත්වාගෙන යන නිසා දැන් බරපතළ ප්‍රශ්නයක් මතුවෙලා තිබෙනවා. ඒ නිසා මම ඔබතුමාගෙන් අහන්නේ, මේ මතුවෙලා තිබෙන තත්ත්වය කළමනාකරණය කිරීම සඳහා වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව විධියට කුමන හෝ ආකාරයක පියවරක් ගැනීමට අපේක්ෂා කරනවාද කියලායි.

**ගරු (වෛද්‍ය) දම්මික පටබැඳි මහතා**
(மாண்புமிகு (வைத்தியர்) தம்மிக பட்டபெந்தி)
(The Hon. (Dr.) Dammika Patabendi)

ගරු මන්ත්‍රීතුමනි, වනඅලි ප්‍රශ්නය සම්බන්ධයෙන් තිබෙන සංකීර්ණතාව පිළිබඳ ඔබ ඉදිරිපත් කරපු කාරණය නිවැරදියි. දැනට අපි වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව සතුව තිබුණු ඉඩම් ප්‍රාදේශීය ලේකම් වෙත පවරා තිබෙනවා. එතකොට ඒ සම්බන්ධයෙන් තීන්දු තීරණ ගැනීමේ අයිතිය අප සතුව නැහැ. නමුත්, යෝජනා කරනවා නම් කිසියම් රක්ෂිත ගොඩනැඟීමට, එවැනි දෙයක් ගැන අපට සලකා බලන්නට පුළුවන්. ඒ සඳහා යම් ක්‍රියාවලියක් තිබෙනවා. අපි පරිසර අමාත්‍යාංශය හැටියට "වනස්පති" වැඩසටහන ක්‍රියාත්මක කරමින් ඉන්නවා. ඒ යටතේ එවැනි යෝජනා ඉදිරිපත් කරන්න පුළුවන්, කිසියම් සංවේදී සහ ඔවැනි ගැටලු තිබෙන ප්‍රදේශ හඳුනාගෙන ඉදිරිපත් කරනවා නම්. නමුත්, ඒක දිගු ක්‍රියාවලියක්. ඒ නිසා ප්‍රාදේශීය ලේකම් වෙත නිදහස් කර තිබෙන ඉඩම් සම්බන්ධයෙන් මේ මොහොතේ අපට ක්‍රියාමාර්ග ගන්න බැහැ. නමුත්, එහෙම යෝජනා තිබෙනවා නම් ඒ පිළිබඳ සාකච්ඡා කර අපට කරගන්න පුළුවන් වෙයි.

**ගරු රුවන් විජේවීර මහතා**
(மாண்புமிகு ருவன் விஜேவீர)
(The Hon. Ruwan Wijeweera)

ගරු කථානායකතුමනි, ගරු ඇමතිතුමා ලබා දුන් පිළිතුර ඇතුළේ තිබෙන කාරණාවත් එක්ක බැලුවාම, මොනරාගල දිස්ත්‍රික්කයේ වැඩි භූමි ප්‍රමාණයක් වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට සහ වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අයිති සියයට 70ක් පමණ භූමි ප්‍රමාණයට අයත් වන බව පෙනෙනවා. ගරු කථානායකතුමනි, අපේ රටේ සංචාරක කර්මාන්තය ගත්තාම, මොනරාගල දිස්ත්‍රික්කය ඇතුළේ සංචාරක කර්මාන්තයට ලොකු විභවයක් තිබෙනවා. ඒ විභවය තිබෙන එක base වෙලා තිබෙන්නේම වනජීවී සහ වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ ඒ තිබෙන සම්පතත් එක්ක. දැන් අපට ආයෝජන කරන්න ඇවිල්ලා තිබෙන යෝජනා දෙස බැලුවාමත්, ඒවා වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට සහ වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අයිති ඉඩම්වලට තමයි ඇවිල්ලා තිබෙන්නේ. විශේෂයෙන් වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අයිති ඉඩම්වලට. ගරු ඇමතිතුමනි, මේ වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අයිති ඉඩම්වල සංචාරක කර්මාන්තයට අදාළ යෝජනා ක්‍රියාත්මක කරන්න යනකොට ඒ සඳහා අවශ්‍ය කරන වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ අවසරය ලබා ගැනීමේ ක්‍රියාවලියේ යම් සංකීර්ණතාවක් සහ කාලය ගතවීමක් තිබෙනවා. ඒ අවසරය ලබා ගැනීමේදී තිබෙන සංකීර්ණභාවය සහ ඒ කාලය අවම කර ගැනීම සඳහා කිසියම් ක්‍රියාමාර්ගයක් වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව පැත්තෙන් ඔබතුමන්ලා ගනිමින් තිබෙනවාද?

**ගරු (වෛද්‍ය) දම්මික පටබැඳි මහතා**
(மாண்புமிகு (வைத்தியர்) தம்மிக பட்டபெந்தி)
(The Hon. (Dr.) Dammika Patabendi)

ගරු මන්ත්‍රීතුමනි, සංචාරක කර්මාන්තය පැත්තෙන් ඉදිරිපත් වෙන යෝජනා සහ කිසියම් යෝජනාවක් අනුමත කර ගැනීමේදී ගැටලු පවතින තැන්, බාධාකාරී වන තැන් මොනවාද කියලා අපට ඉදිරිපත් කරනවා නම්, අපට පුළුවන් ඒ සම්බන්ධයෙන් මැදිහත් වෙලා කඩිනමින් අවශ්‍ය පියවර ගන්න. ඉදිරියේදී සාකච්ඡා කරලා ඔබතුමන්ලාගේ පැත්තෙන් යෝජනා මොනවා හරි තිබෙනවා නම් ඒවා ඉදිරිපත් කරන්න. ඒ සම්බන්ධයෙනුත්, ඒ වාගේම ඒ ක්‍රියාවලියේ ගැටලුකාරී තැන් තිබෙනවා නම් ඒවාත් හඳුනාගෙන අවශ්‍ය කටයුතු කඩිනමින් කරගන්න අපට පුළුවන්කම ලැබෙයි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රශ්න අංක 8 -1677/2025- (1), ගරු ඔෂානි උමංගා මහත්මිය - *[සභා ගර්භය තුළ නැත.]*

## වතු ප්‍රදේශවල සමුපකාර අළෙවිසැල්: බදුල්ල දිස්ත්‍රික්කය
## தோட்டப்புறங்களிலுள்ள கூட்டுறவு விற்பனை நிலையங்கள்: பதுளை மாவட்டம்
## CO-OPERATIVE OUTLETS IN ESTATE AREAS: BADULLA DISTRICT

1738/2025

**9. ගරු කිට්නන් සෙල්වරාජ් මහතා**
(மாண்புமிகு கிட்ணன் செல்வராஜ்)
(The Hon. Kitnan Selvaraj)

වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) බදුල්ල දිස්ත්‍රික්කයේ -

(i) සමුපකාර අළෙවිසැල් සංඛ්‍යාව;

(ii) වතු ආශ්‍රිතව ක්‍රියාත්මක වන සමුපකාර අළෙවිසැල් සංඛ්‍යාව;

(iii) පසුගිය වසර 10 තුළ වැසී ගිය සමුපකාර අළෙවිසැල් සංඛ්‍යාව;

කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) වතු ආශ්‍රිතව නිවාස ඉදිකිරීම සහ ණය ලබා දීම සඳහා සමුපකාර සංගම් ඇති බව දන්නේද;

(ii) එසේ නම්, බදුල්ල දිස්ත්‍රික්කයේ වතු ආශ්‍රිතව ක්‍රියාත්මක වන සමුපකාර සංගම් සංඛ්‍යාව කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

வர்த்தக, வாணிப, உணவுப் பாதுகாப்பு மற்றும் கூட்டுறவு அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) பதுளை மாவட்டத்திலுள்ள -

(i) கூட்டுறவு விற்பனை நிலையங்களின் எண்ணிக்கை எத்தனை என்பதையும்;

(ii) தோட்டப்புறங்களைச் சார்ந்து இயங்கும் கூட்டுறவு விற்பனை நிலையங்களின் எண்ணிக்கை எத்தனை என்பதையும்;

(iii) கடந்த 10 வருடங்களுக்குள் மூடப்பட்ட கூட்டுறவு விற்பனை நிலையங்களின் எண்ணிக்கை எத்தனை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) தோட்டப்புறங்களைச் சார்ந்த வீடமைப்பு மற்றும் கடன் வழங்கல் நடவடிக்கைகளுக்காக கூட்டுறவுச் சங்கங்கள் இயங்குகின்றன என்பதை அறிவாரா என்பதையும்;

(ii) ஆமெனில், பதுளை மாவட்டத்தில் தோட்டப்புறங்களைச் சார்ந்ததாக இயங்கும் கூட்டுறவுச் சங்கங்களின் எண்ணிக்கை எத்தனை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Trade, Commerce, Food Security and Co-operative Development:

(a) Will he inform this House with regard to the Badulla District, the number of -
  (i) co-operative outlets;
  (ii) co-operative outlets operating within the estate areas; and
  (iii) co-operative outlets closed down in the last 10 years?

(b) Will he also inform this House -
  (i) whether he is aware that co-operative societies have been established within the estate areas to facilitate the construction of houses and the provision of loans; and
  (ii) if so, the number of co-operative societies operating within the estate areas in the Badulla District?

(c) If not, why?

**ගරු උපාලි සමරසිංහ මහතා (සමුපකාර සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு உபாலி சமரசிங்ஹ - கூட்டுறவு அபிவிருத்திப் பிரதி அமைச்சர்)
(The Hon. Upali Samarasingha - Deputy Minister of Co-operative Development)

ගරු කථානායකතුමනි, වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) බදුල්ල දිස්ත්‍රික්කය.

(i) සමුපකාර අළෙවිසැල් සංඛ්‍යාව - 2026.01.01 දිනට

| අ.අ | විස්තරය | සමුපකාර අළෙවිසැල් ප්‍රමාණය |
|---|---|---|
| 1 | සීමාසහිත විවිධ සේවා සමුපකාර සමිති මඟින් ක්‍රියාත්මක | 49 |
| 2 | සීමාසහිත වතු සේවක නිවාස සමුපකාර සමිති මඟින් ක්‍රියාත්මක | 04 |
| 3 | සීමාසහිත වතු සේවක කඩ සමුපකාර සමිති මඟින් ක්‍රියාත්මක | 05 |
| එකතුව | | 58 |

(ii) වතු ආශ්‍රිතව ක්‍රියාත්මක වන සමුපකාර අළෙවිසැල් සංඛ්‍යාව - 2026.01.01 දිනට,

| අ.අ | විස්තරය | සමුපකාර අළෙවිසැල් ප්‍රමාණය |
|---|---|---|
| 1 | සීමාසහිත වතු සේවක නිවාස සමුපකාර සමිති මඟින් ක්‍රියාත්මක | 04 |
| 2 | සීමාසහිත වතු සේවක කඩ සමුපකාර සමිති මඟින් ක්‍රියාත්මක | 05 |
| එකතුව | | 09 |

(iii) පසුගිය වසර 10 තුළ වැසී ගිය සමුපකාර අළෙවිසැල් සංඛ්‍යාව - (2015 සිට 2025 දක්වා)

| අ.අ | විස්තරය | සමුපකාර අළෙවිසැල් ප්‍රමාණය |
|---|---|---|
| 1 | සීමාසහිත විවිධ සේවා සමුපකාර සමිති මඟින් ක්‍රියාත්මකව තිබුණු | 168 |
| 2 | සීමාසහිත වතු සේවක නිවාස සමුපකාර සමිති මඟින් ක්‍රියාත්මකව තිබුණු | 11 |
| 3 | සීමාසහිත වතු සේවක කඩ සමුපකාර සමිති මඟින් ක්‍රියාත්මකව තිබුණු | 01 |
| එකතුව | | 180 |

(ආ) (i) වතු ආශ්‍රිතව නිවාස ඉදිකිරීම සහ ණය ලබාදීම සඳහා සමුපකාර සංගම් ලියාපදිංචි කර නොමැති අතර, වතු ආශ්‍රිතව සේවය කරන සේවකයින්ට ණය ලබාදීම සහ පාරිභෝගික භාණ්ඩ හා ද්‍රව්‍ය අළෙවි කිරීමට වතු සේවක සමුපකාර සමිති කටයුතු කරයි.

(ii) වතු ආශ්‍රිතව ක්‍රියාත්මක වන සමුපකාර සංගම් නොමැත. නමුත්, බදුල්ල දිස්ත්‍රික්කය තුළ වතු කඩ සමුපකාර සමිති 3ක් සහ වතු නිවාස සමුපකාර සමිති 63ක් ක්‍රියාත්මක වේ.

(ඇ) අදාළ නොවේ.

**ගරු කිට්නන් සෙල්වරාජ් මහතා**
(மாண்புமிகு கிட்ணன் செல்வராஜ்)
(The Hon. Kitnan Selvaraj)

கௌரவ சபாநாயகர் அவர்களே, என்னுடைய முதலாவது மேலதிக வினாவைக் கேட்கின்றேன்.

பதுளை மாவட்டத்தின் தோட்டப்புறங்களில் அல்லது தோட்டப்புறங்களை அண்மித்துள்ள அநேகமான கூட்டுறவுச் சங்கக் கடைகள் கடந்த காலத்தில் மூடப்படும் நிலையில் இருந்தது; மூடப்பட்டும் இருக்கின்றன. நான் நினைக் கின்றேன், அரசியலமைப்பின் 13ஆம் திருத்தச் சட்டத்துக்கு அமைவாக உள்ளீர்க்கப்பட்டதுதான் கூட்டுறவுச் சங்கக் கட்டமைப்பு அல்லது கூட்டுறவுக் கட்டமைப்பு என்று. ஒரு காலத்தில் ஊவா மாகாண சபையில் கூட்டுறவு அமைச்சராக செந்தில் தொண்டமான் அவர்கள் இருந்தார். அவருடைய காலத்தில் அநேகமான கூட்டுறவுச் சங்கக் கடைகள் மூடப்பட்டன. அவ்வாறு மூடப்பட்ட கூட்டுறவுச் சங்கக் கடைகள் தொடர்பான விபரங்களை எதிர்வரும் காலத்தில் இந்தச் சபைக்குச் சமர்ப்பிக்க முடியுமா? என நான் கௌரவ பிரதி அமைச்சர் அவர்களிடம் கேட்கின்றேன்.

**ගරු උපාලි සමරසිංහ මහතා**
(மாண்புமிகு உபாலி சமரசிங்ஹ)
(The Hon. Upali Samarasingha)

ගරු මන්ත්‍රීතුමනි, ඇත්තටම ගත්තොත් 2015 සිට 2025 දක්වා කාලය තුළ ඒ ඒ දේශපාලන පාලනයන්ට අදාළව තිබූ සමුපකාර, ග්‍රාමීය සමුපකාර විශාල ප්‍රමාණයක් වැසී ගියා. අවිධිමත් ලෙස පාලනය කිරීම, විගණනය නොකිරීම් ඇතුළු කාරණා නිසා ඒ සමුපකාර වැසී ගොස් තිබෙනවා. ඒ අනුව මේ වෙනකොට

සාමාන්‍යයෙන් පොදුවේ තිබෙන තොරතුරු අනුව පසුගිය අවුරුදු 10ක කාලය තුළ ඌව පළාතේ, බදුල්ල දිස්ත්‍රික්කයේ වැසී ගිය සමිති ප්‍රමාණයක් හඳුන්වා දෙන්න පුළුවන්. ඒ අනුව, සී/ස ස්ප්‍රින්වැලි වතු සේවක කඩ සමුපකාර සමිතියේ 1ක්, සී/ස නිව්බර්ග් වතු සේවක නිවාස සමුපකාර සමිතියේ 1ක්, සී/ස හියුගෝලන්ඩ් වතු සේවක නිවාස සමුපකාර සමිතියේ 1ක්, සී/ස ක්‍රේග් වතු සේවක නිවාස සමුපකාර සමිතියේ 1ක්, සී/ස ඩයරබා වතු සේවක නිවාස සමුපකාර සමිතියේ 1ක්, සී/ස බෝවේ වතු සේවක නිවාස සමුපකාර සමිතියේ 1ක්, සී/ස වැලිමඩ වතු සේවක නිවාස සමුපකාර සමිතියේ 1ක්, සී/ස කහගල වතු සේවක නිවාස සමුපකාර සමිතියේ 1ක්, සී/ස ග්ලේනෝර් වතු සේවක නිවාස සමුපකාර සමිතියේ 1ක්, සී/ස දඹේතැන්න වතු සේවක නිවාස සමුපකාර සමිතියේ 1ක් සහ සී/ස හපුතලේ වතු සේවක නිවාස සමුපකාර සමිතියේ 2ක් ලෙස දැනට සමුපකාර අළෙවිසැල් 12ක් වැහිලා තිබෙනවා.

**ගරු කිට්නන් සෙල්වරාජ් මහතා**
(மாண்புமிகு கிட்ணன் செல்வராஜ்)
(The Hon. Kitnan Selvaraj)

கௌரவ சபாநாயகர் அவர்களே, பெருந்தோட்டங்களில் கூட்டுறவுச் சங்கங்கள் இயங்கி வருகின்றன. அவற்றினூடாகத் தோட்டத் தொழிலாளர்களுக்குக் கடன் வழங்கப்படுகின்றன. எனினும், அவை இதுவரை கணக்காய்வுக்கு உட்படுத்தப் படவில்லை. ஒருசில தோட்டங்களிலுள்ள கூட்டுறவுச் சங்கங்கள் மட்டுமே கணக்காய்வுக்கு உட்படுத்தப்படுகின்றன. எனவே, பெருந்தோட்டத் தொழிலாளர்களுக்குக் கடன் வழங்கும் பெருந்தோட்டங்களில் இருக்கின்ற கூட்டுறவுச் சங்கங்களை எதிர்காலத்தில் கணக்காய்வுக்கு உட்படுத்தி, அதன் அறிக்கையை இச்சபைக்குச் சமர்ப்பிக்க முடியுமா? என்பதை என்னுடைய இரண்டாவது மேலதிக வினாவாக கௌரவ பிரதி அமைச்சர் அவர்களிடம் கேட்கின்றேன்.

**ගරු උපාලි සමරසිංහ මහතා**
(மாண்புமிகு உபாலி சமரசிங்ஹ)
(The Hon. Upali Samarasingha)

ගරු කථානායකතුමනි, අපේ සමුපකාර විෂයය මධ්‍යම රජයේ රේඛීය අමාත්‍යාංශය යටතේත්, පළාත් සභාව තුළ කොමසාරිස්තුමන්ලා යටතේත් තමයි ක්‍රියාත්මක වන්නේ. මා මුලින් සඳහන් කළ පරිදි, පැවැති රජයන්ට සමුපකාර සම්බන්ධයෙන් තිබුණු දැක්ම, වගකීම, ඒ සම්බන්ධයෙන් තිබුණු ප්‍රතිපත්තිගරුකභාවය ඇතුළු කාරණා හේතු කොටගෙනත්, පළාත් සභාව සහ මධ්‍යම ආණ්ඩුව අතර තිබුණු සම්බන්ධතා බිඳ වැටීම නිසාත් සාමාන්‍ය ග්‍රාමීය ජනතාවට ඉතාම සමීප සේවාවක් ලබා දෙන්න පුළුවන් සමුපකාර සේවාව පසුගිය කාලය පුරා බිඳ වැටිලා තිබෙනවා. විශේෂයෙන් ඒවා බිඳ වැටෙන්න බලපෑ කාරණා කීපයක් තිබෙනවා. පාලන තන්ත්‍රය විසින් අධ්‍යක්ෂ මණ්ඩලය පත් කිරීම, ඔවුන් දීර්ඝ කාලයක් තිස්සේ, එනම් අවුරුදු ගාණක් ඒවා තුළ බලය අත්පත් කර ගැනීම, දේශපාලන බලය පාවිච්චි කරමින් ඒවායෙහි කටයුතු විගණනයෙන් තොරව පවත්වාගෙන යෑම සහ හරියාකාර ක්‍රියාවලියක් ඇතුළේ වැඩ කටයුතු සිදු නොවීම නිසා මෙම සමිති කඩා වැටිලා තිබෙනවා.

අප ආණ්ඩුව භාර ගත්තාට පසුව මේ වනකොට පළාත් සමුපකාර සේවක කොමිෂන් සභාව සමඟ සාකච්ඡා කරමින් සිටිනවා. පසුගිය කාලයේ බිඳ වැටිලා තිබුණු සියලු සමුපකාර සම්බන්ධයෙන් නැවත පරීක්ෂණයක් පවත්වා, විගණනයන් කරලා මේ අවුරුද්ද තුළ ඒ සමුපකාර සමිති ඉතා ඉක්මනින් නැවත ගොඩ නැඟීමටත්, ඊට අදාළව රාජ්‍ය මැදිහත්වීම කිරීම සඳහාත් කටයුතු කරනවා. මා ගරු මන්ත්‍රීතුමාට කියන්න කැමැතියි, මේ අවුරුද්ද අවසන් වනකොට විශේෂයෙන් වතුකරයේ තිබෙන සමුපකාර සමිති සඳහා විශේෂ මැදිහත්වීමක් කරලා, ඒ සමිති සම්බන්ධව ඉතිහාසයේ වුණු අඩුපාඩු නිවැරදි කරලා, ඒ වැරදි නිවැරදි කිරීමට අවශ්‍ය කටයුතු කරමින් ඒවා ශක්තිමත් කරන බවට පොරොන්දු වන බව.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රශ්න අංක 10 -1784/2025- (1), ගරු පද්මසිරි බණ්ඩාර මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

දෙවන වටය.

ප්‍රශ්න අංක 8 -1677/2025- (1), ගරු ඔෂානි උමංගා මහත්මිය.

**ගරු ධර්මප්‍රිය විජේසිංහ මහතා**
(மாண்புமிகு தர்மப்ரிய விஜேசிங்ஹ)
(The Hon. Darmapriya Wijesinghe)

ගරු කථානායකතුමනි, ගරු ඔෂානි උමංගා මන්ත්‍රීතුමිය වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු කථානායකතුමනි, ආරක්ෂක අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දීම සඳහා සතියක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ තාක්ෂණික සේවය: වර්තමාන තත්ත්වය
## தேசிய வீடமைப்பு அபிவிருத்தி அதிகாரசபையில் தொழில்நுட்ப சேவை: தற்போதைய நிலை
## TECHNICAL SERVICE AT NATIONAL HOUSING DEVELOPMENT AUTHORITY: CURRENT STATUS

1784/2025

**10. ගරු ධර්මප්‍රිය විජේසිංහ මහතා (ගරු පද්මසිරි බණ්ඩාර මහතා වෙනුවට)**
(மாண்புமிகு தர்மப்ரிய விஜேசிங்ஹ - மாண்புமிகு பத்மசிறி பண்டார சார்பாக)
(The Hon. Darmapriya Wijesinghe on behalf of the Hon. Padmasiri Bandara)

නිවාස, ඉදිකිරීම් සහ ජල සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (1):

(අ) (i) ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ පැවැති තාක්ෂණික සේවය මේ වන විට ක්‍රියාත්මක වන්නේද;

(ii) එසේ නම්, එහි සේවය කරනු ලබන තාක්ෂණ නිලධාරීන් සංඛ්‍යාව කොපමණද;

(iii) මෙම නිලධාරීන්ට ක්ෂේත්‍ර රාජකාරි සඳහා කි.මී. 1කට ගෙවනු ලබන ගමන් වියදම් දීමනාව කොපමණද;

(iv) තාක්ෂණ නිලධාරීන්ට ගෙවනු ලබන සංයුක්ත දීමනාව කොපමණද;

[ගරු ධර්මප්‍රිය විජේසිංහ මහතා]

(v) එම දීමනාව අනුමත කරන ලද දිනය කවරේද;

(vi) මෙම නිලධාරින්ගේ උසස්වීමේ කාර්ය පටිපාටිය යාවත්කාලීන කිරීම සඳහා ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) 2026 වර්ෂය සඳහා ජාතික නිවාස සංවර්ධන අධිකාරියට නිවාස ඉදි කිරීම වෙනුවෙන් වෙන් කර ඇති ප්‍රතිපාදන ප්‍රමාණය කොපමණද;

(ii) එම ප්‍රතිපාදන ප්‍රමාණයට සාපේක්ෂව අධිකාරිය සතු තාක්ෂණික නිලධාරින් සංඛ්‍යාව ප්‍රමාණවත් වන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

வீடமைப்பு, நிர்மாணிப்பு மற்றும் நீர் வழங்கல் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) தேசிய வீடமைப்பு அபிவிருத்தி அதிகாரசபையில் காணப்பட்ட தொழில்நுட்பச் சேவை இன்றளவில் இயங்குநிலையில் உள்ளதா;

(ii) ஆமெனில், அச்சேவையில் கடமையாற்றி வருகின்ற தொழில்நுட்ப அலுவலர்களின் எண்ணிக்கை யாது;

(iii) மேற்படி அலுவலர்களுக்கு வெளிக்கள கடமைகளுக்காக ஒரு கிலோமீற்றருக்குச் செலுத்தப்படுகின்ற பிரயாணச் செலவுக் கொடுப்பனவு எவ்வளவு;

(iv) தொழில்நுட்ப அலுவலர்களுக்குச் செலுத்தப்படுகின்ற இணைந்த படிகள் எவ்வளவு;

(v) மேற்படி கொடுப்பனவு அங்கீகரிக்கப்பட்ட திகதி யாது;

(vi) குறித்த அலுவலர்களின் பதவி உயர்வுக்கான நடவடிக்கைமுறையை இற்றைப்படுத்த மேற்கொள்ளப்படும் நடவடிக்கைகள் யாவை;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) 2026ஆம் ஆண்டுக்காக தேசிய வீடமைப்பு அபிவிருத்தி அதிகாரசபைக்கு வீடுகளை நிர்மாணிக்கவென ஒதுக்கப்பட்டுள்ள தொகை எவ்வளவு;

(ii) மேற்படி ஏற்பாடுகளுக்கு இசைவாக அதிகாரசபை கொண்டுள்ள தொழில்நுட்ப அலுவலர்களின் எண்ணிக்கை போதுமானதா;

என்பதையும் அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Housing, Construction and Water Supply:

(a) Will he inform this House-

(i) whether the technical service that existed at the National Housing Development Authority is still operational;

(ii) if so, the number of technical officers serving there;

(iii) the travelling expenses per 1 km paid to those officers for field duties;

(iv) the amount of combined allowance paid to the technical officers;

(v) the date on which the said allowance was approved; and

(vi) the steps that will be taken to update the promotion procedure of these officers?

(b) Will he also inform this House-

(i) the amount of allocations made to the National Housing Development Authority for the year 2026 for the construction of houses; and

(ii) whether the number of technical officers available to the Authority is sufficient in relation to the said amount of allocations?

(c) If not, why?

**ගරු (වෛද්‍ය) සුසිල් රණසිංහ මහතා (නිවාස, ඉදිකිරීම් සහ ජල සම්පාදන අමාත්‍යතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) சுசில் ரணசிங்ஹ - வீடமைப்பு, நிர்மாணிப்பு மற்றும் நீர் வழங்கல் அமைச்சர்)
(The Hon. (Dr.) Susil Ranasinghe - Minister of Housing, Construction and Water Supply)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මම **සභාගත*** කරනවා.

***සභාමේසය මත තබන ලද පිළිතුර:**
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை:*
** Answer tabled:*

(අ) (i) නැත.

ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ ඒකාබද්ධ තාක්ෂණ නිලධාරින්ගේ සේවයක් ස්ථිර කාර්ය මණ්ඩලය සඳහා 1999.10.01 දින සිට ක්‍රියාත්මකව පැවතියද, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 30 ක්‍රියාත්මක වීමත් සමඟ 2006.01.01 දින සිට අහෝසි වී ඇත.

(ii) ඉහත සඳහන් කළ පරිදි ස්ථිර සේවකයින් සඳහා තාක්ෂණ සේවයක් ජාතික නිවාස සංවර්ධන අධිකාරිය තුළ ක්‍රියාත්මක නොවන බැවින් එම සේවය යටතේ සේවය කරනු ලබන තාක්ෂණ නිලධාරින් නොමැත.

1999.10.01 දින සිට ක්‍රියාත්මකව පැවති ඒකාබද්ධ තාක්ෂණ නිලධාරින්ගේ සේවය යටතේ සේවය කළ ස්ථිර කාර්ය මණ්ඩලය කළමනාකරණ සේවා චක්‍රලේඛ 30හි විධිවිධාන ප්‍රකාරව ප්‍රතිව්‍යුහගතකරණය කර ඇති අතර, ඒ අනුව 2025.11.30 දිනට සේවයේ නියුතුව සිටින තාක්ෂණික කාර්ය මණ්ඩල (කොන්ත්‍රාත්/දෛනික කාර්ය මණ්ඩලයද ඇතුළුව) 412කි.

(iii) ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ තාක්ෂණ කාර්ය මණ්ඩලය විසින් රාජකාරි සඳහා ගමන් කරනු ලබන කිලෝමීටර් ගණන් සඳහා ගමන් වියදම් දීමනාවක් ගෙවනු නොලැබේ.

(iv) තාක්ෂණ සහකාර, ඉංජිනේරු සහකාර, ඉංජිනේරු ඇතුළු ක්ෂේත්‍ර රාජකාරිවල නියුක්ත කාර්ය මණ්ඩලය සඳහා ක්ෂේත්‍ර රාජකාරිවලට අදාළව මාසිකව දින 05ක උපරිමයකට යටත්ව සංයුක්ත දීමනාව ගෙවීම ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර ඇත.

(v) මෙම සංයුක්ත දීමනාව සඳහා එක් දිනකට ගෙවනු ලබන මුදල සම්බන්ධයෙන් අවසන් වරට උපදෙස් ලැබී ඇත්තේ 2025.03.25 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2025හි 20වන පරිච්ඡේදය මඟින් බැවින් සංයුක්ත දීමනාව වශයෙන් ගෙවනු ලබන මුදල අනුමත කළ දිනය වශයෙන් චක්‍රලේඛය නිකුත් කරන ලද 2025.03.25 දිනය සැලකේ.

(vi) ඔව්. කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ උපදෙස් අනුව උසස්වීම් කාර්ය පටිපාටිය යාවත්කාලීන කිරීම සඳහා කටයුතු කරගෙන යනු ලැබේ.

(ආ) (i) භාණ්ඩාගාර අරමුදලින් සංවර්ධන වැඩසටහන් සඳහා වෙන් වූ මුදල රුපියල් මිලියන 12,128.0කි.

2026 වර්ෂයේ සංවර්ධන වැඩසටහන සඳහා ඇස්තමේන්තුගත සමස්ත මුදල රුපියල් මිලියන 17,137.4කි.

(ii) ඔව්. ප්‍රමාණවත් වේ.

(ඇ) අදාළ නොවේ.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Sajith Premadasa - Leader of the Opposition)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විපක්ෂ නායකතුමා, ඔබතුමාගේ point of Order එක මොකක්ද?

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, මම ස්ථාවර නියෝග 146 යටතේයි මේ කාරණාව මතු කරන්නේ. ඔබතුමන්ලා අද දිනට යොදා ගෙන තිබෙනවා, කාර්ය මණ්ඩල උපදේශක කාරක සභාවේ රැස්වීම. ඒ කාර්ය මණ්ඩල උපදේශක කාරක සභාවේ රැස්වීමේදී සාකච්ඡාවට භාජන වෙනවා, විශේෂයෙන්ම පාර්ලිමේන්තුව තුළ යම් ලිංගික හිංසන ක්‍රියාවකට ලක් වූ කාරණාවක්. ඔබතුමන්ලා අපට එවපු කරුණු කාරණා දිහා බැලුවාම පෙනෙනවා, ඒ කාරණාව පිළිබඳව සම්පූර්ණ වාර්තාව අපට එවලා නැති බව. ගරු කථානායකතුමනි, ඒ සම්පූර්ණ වාර්තාව නොමැතිව අපේ අදහස් හා යෝජනා ඉදිරිපත් කරන්නේ කොහොමද? මේ එවපු එකේ තිබෙන්නේ, "The inquiry officer submitted..." කියලා. මම මේක ප්‍රසිද්ධියේ කියවන්නේ නැහැ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විපක්ෂ නායකතුමනි,-

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මට විනාඩියක් දෙන්න. මම මේක ප්‍රසිද්ධියේ කියන්න යන්නේ නැහැ. නමුත්, එවලා තිබෙන එකේ සඳහන් කරලා තිබෙන්නේ වාක්‍ය දෙකක් විතරයි; report එකක් submit කළ බව සහ ඒ report එකේ නිගමනය විතරයි. Staff Advisory Committee එකේදී මේ ගැන සාකච්ඡා කරන්නට පෙර, අපි මේවා ගැන හොඳට කියවා බලන්න ඕනෑ. ඊයේ හැන්දෑවේ එවලා තිබෙන්නේ. ඇත්ත වශයෙන්ම ලිංගික හිංසනය වාගේ මාතෘකාවක් පිළිබඳව අප මීට වඩා සංවේදී වෙන්න ඕනෑ. කරුණාකරලා ඒ වාර්තාව අපට ලැබෙන්න සලස්වන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විපක්ෂ නායකතුමනි, අද Staff Advisory Committee එකේදී එය table කරනවා. Table කළාට පස්සේ තීරණය කරන්න පුළුවන්.

ස්ථාවර නියෝග 27 (2) යටතේ ප්‍රශ්න, ගරු සජිත් ප්‍රේමදාස මහතා.

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු නලින් බණ්ඩාර ජයමහ මන්ත්‍රීතුමා, ඔබතුමාගේ point of Order එක මොකක්ද?

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
ගරු කථානායකතුමනි, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ වගකීම තිබෙන්නේ ඔබතුමාට. විශේෂයෙන්ම මට වෙච්ච අසාධාරණයක් ගැන මේ කථා කරන්නේ. මම අධිවේගී මාර්ගයේ කටුනායකින් e-gate එකෙන් ඇතුළට ඇවිල්ලා,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, වරප්‍රසාද ප්‍රශ්න යටතේ ඉදිරිපත් කරන්න.

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
මට විනාඩියක කාලයක් දෙන්න. ඔබතුමාගේ අවධානයට ඉදිරිපත් කරන්නේ. කටුනායකින් e-gate එකෙන් ඇතුළු වෙලා කෙරවලපිටියෙන් එළියට ගියාම මීට කලින් රුපියල් 1,150ක ටිකට් එකක් කැඩුවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, වරප්‍රසාද ප්‍රශ්න යටතේ මතු කරන්න.

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
ගරු කථානායකතුමනි, ඔබතුමා පොඩ්ඩක් මේක අහගන්න. අද මට වෙච්ච අසාධාරණය දිහා ඔබතුමා පොඩ්ඩක් බලන්න. අද මම හදිසියේ wedding එකකට යන්න ගිහිල්ලා traffic නිසා පැලියගොඩින් ගිහිල්ලා කෙරවලපිටියෙන් එළියට එනකොට, ටිකට් එකක් දුන්නේ නැහැ. *[බාධා කිරීමක්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ස්ථාවර නියෝග 27(2) යටතේ ප්‍රශ්න, ගරු සජිත් ප්‍රේමදාස මහතා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමා ස්ථාවර නියෝග 27(2) යටතේ ප්‍රශ්නය ඉදිරිපත් කරන්න.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, ඔබතුමාගේ වගකීම තමයි,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විපක්ෂ නායකතුමා,-

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
පොඩ්ඩක් අහගන්න. පාර්ලිමේන්තුව පවත්වන දිනයේ නියමිත වෙලාවට මන්ත්‍රීවරුන්ට පැමිණීමට අවස්ථාව සලසා දීම, ඒ මන්ත්‍රීවරුන්ගේ වරප්‍රසාදයක්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒක ඔබතුමා ලිඛිතව දැනුම් දෙන්න.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ඒ පිළිබඳවයි මෙතුමා මේ මතු කරන්නේ. ඒකට පොඩ්ඩක් සවන් දෙන්න.*[බාධා කිරීම්]*

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
ප්‍රවාහන ඇමතිතුමාත් ගරු සභාවේ ඉන්නවා. මේක විසඳාගන්න ඉඩ දෙන්න. ගරු කථානායකතුමනි, -

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි, නලින් බණ්ඩාර මන්ත්‍රීතුමා කියන්න.

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
අද e-gate එකෙන් පැලියගොඩින් එළියට ගිහිල්ලා මට wedding එකකට වෙලාවට යන්න ඕනෑ නිසා මම කෙරවලපිටියෙන් එළියට දැම්මා, වාහනය. මොකද, traffic jam එක නිසා. එතකොට විනාඩි 15ක් පමණ මාව තියාගෙන හිටියා. එහෙම නැත්නම් මට රුපියල් 1,150ක ටිකට් එකක් කඩන්න ඕනෑ කිව්වා. E-gate එකක් නැහැ කෙරවලපිටියෙන් එළියට එනකොට. විනාඩි 15ක් තියාගෙන, CCTV බලලා තමයි මට රුපියල් 200ක ටිකට් එකක් කැඩුවේ. මේ රුපියල් 1,150 ටිකට් එක මීට කලින් කඩපු ටිකට් එකක්. ගරු ඇමතිතුමා, දැන් දවස් 15ක්, 20ක් වෙනවා, ඔබතුමාට මේ කෙරවලපිටියේ highway එකේ ප්‍රශ්නය විසඳා ගන්න බැහැ නේ. අනෙක් ආණ්ඩු ගැන කවර කථාද, ගරු බිමල් රත්නායක ඇමතිතුමා? මේක මට විතරක් අදාළ එකක් නොවෙයි. ඔබතුමන්ලාට ඡන්දය දීපු මිනිහෙකුත් අද බැණ බැණ ගියා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, එතැන දුෂ්කරතාවක් තිබෙනවා කියලා අපි දන්නවා. නමුත්, කෙරවලපිටියේ තිබ්බ system එක හදලා තිබුණේ, පිටත වට රවුම් මාර්ගය සම්බන්ධ කරන්න කලින්. දැන් ඒක සම්බන්ධ කළාට පසු සාමාන්‍ය තත්ත්වයකදී - විනාඩි 6ක් සහ peak hoursවලදී විනාඩි 9ක් විතර - කිසිම තේරුමක් නැතිව මිනිස්සු ටිකට් එකක් ගන්නවා; එතැනින් පිට වෙන්න බලාගෙන ඉන්නවා. අපි ඒක study කරලා තමයි ඒක ඉවත් කළේ. දැන් පැලියගොඩ තිබෙන traffic jam එකයි, කටුනායක තිබෙන traffic jam එකයි ගත්තොත්, කෙරවලපිටියේ අපි මේ කරපු කටයුත්තත් එක්ක ඍජු සම්බන්ධයක් ඒවාට නැහැ. මේ කටයුත්ත පටන් ගත්තු මුල්ම දවස්වල ප්‍රශ්නයක් තිබුණා. මොකද, ඕනෑම අලුතින් දෙයක් පටන් ගත්තාම ඒකට මිනිස්සු පුරුදු වෙන්න පොඩි වෙලාවක් යන නිසා ප්‍රශ්නයක් තිබුණා. මම ඔය ප්‍රශ්නයට ඉතාම විධිමත් විධියට උත්තර දුන්නා. අපට expressway එක පුළුල් කරන්න බැහැ වාහන වැඩි වෙන ප්‍රමාණයට. ඇත්තටම, 2011දී මිලියන 3ක් වාහන ගියත් දැන් මිලියන 46ක් යනවා. හැබැයි, ඊට වඩා lanes ගණන වැඩි කරන්න බැහැ. දැන් තිබෙන්නේ ETC lanes ප්‍රමාණය වැඩි කරන එක. *[බාධා කිරීමක්]* පාර්ලිමේන්තුවට එන්න තමයි. *[බාධා කිරීමක්]* Weddingsවලට යන්න නම් කලින් යන්න ඕනෑ. හරිද? ඒ නිසා මම කියන්නම්. මම ඔබතුමා ගැනත් concerned, මිනිස්සු ගැනත් concerned. මම ඔය ගැන හොයලා simulations කරලා තමයි ඒ කටයුත්ත කළේ. එහෙම නැතුව අපි නිකම් ගෙදර යන ගමන් මේවා කරන්නේ නැහැ. නමුත් ඇත්ත ප්‍රශ්නයක් තිබෙනවා. එතැන Electronic Toll Collection - ETC - කරන lane එකට තිබෙන්නේ එකයි. ඒකට අදාළ උපකරණ අවුරුදු ගණනකින් ගෙනැල්ලා නැහැ. ඒවා upgrade කරලා නැහැ. ETC lane එක කියලා display එකක් තිබෙනවා. ඒ displaysවත් ගෙනැල්ලා නැහැ. දැන් අහයි, අවුරුද්දක් හිටියා නේ මොකක්ද කළේ කියලා. ඒවා ගෙන්වන්න බැහැ. මොකද, ඒවා ගෙන්වන්න ඔබතුමන්ලා සහ කලින් ආණ්ඩු ගහපු agreements තිබෙනවා. ඒ tenders දීලා තිබෙන්නේ. එතකොට කොච්චර ප්‍රශ්නයක් තිබුණත් ඒවා වෙනස් කරනවා නම්, ඒවාට අතිවිශාල දඩ ගෙවන්න ඕනෑ. අපි කරන්න හදන්නේ සම්පූර්ණ විසඳුමකට එන්න. සමහර ඒවාට නීතිමය බාධා තිබෙනවා. ඊට පස්සේ අහයි, tenders දීපු ඒවාට ඇයි බොරුවට රටේ සල්ලි ගෙව්වේ කියලා. අපි මේ සතියේ ඒවා ගෙනැල්ලා ඉවරයි. වරායට ගෙනැල්ලා තිබුණා, ගිය සතියේ. දැන් අපි ඒ displays සවි කරනවා. අපි ETC counters වැඩි කරන්න යනවා. අපි අනිවාර්ය කරන්න යනවා, ඒ ප්‍රදේශයේ යන මගී

ප්‍රවාහන වාහනවලට අනිවාර්යයෙන් ETC cards ගන්න කියලා. ඒක අනිවාර්ය කරන්න කලින් ETC displays හදන්න ඕනෑ, ETC machines හදන්න ඕනෑ, cameras හදන්න ඕනෑ. ගොඩක් දේවල් තිබෙනවා කරන්න. ඒ නිසා කෙරවලපිටියත් එක්ක මේක සම්බන්ධයක් නැහැ. ඒකයි මට කියන්න තිබෙන්නේ. කෙරවලපිටියත් එක්ක ඒක සම්බන්ධයක් නැහැ. ඒ නිසා අනෙක් දවසේ weddingsවලට කලින් යන්න නැකතට අත්සන් කරන්න තිබෙන නිසා. පාර්ලිමේන්තුවට 9.30ට එන්න. මේ දවස් ටිකේ ඇත්තටම ආවේ නැත්තේ ඇයි? දිගටම weddingsවලට ගියාද?

ගරු කථානායකතුමනි, කෙරවලපිටියේ අපි ETCs හරහා යන අයට ටිකට් එකක් දෙන්න බලනවා. මොකද, ඒ ගැන තවම මිනිසුන්ගේ තේරුම් ගැනීමේ ප්‍රශ්නයක් තිබෙන නිසා. දැනට ETCs නැති නිසා එතැන අපි counters දෙකක් විතර තියන්න බලාපොරොත්තු වෙනවා. එතකොට මම හිතනවා, ඔය වාගේ අවුල් කරගෙන යන කට්ටියටත් උදවු කරන්න අපට පුළුවන් වෙයි කියලා.

අනික් දවසේ පාර්ලිමේන්තුවට එන්න, වෙලාවට.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ස්ථාවර නියෝග 27(2) යටතේ ප්‍රශ්නය, ගරු සජිත් ප්‍රේමදාස මහතා.

## පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය
### தனி அறிவித்தல் மூல வினா
### QUESTION BY PRIVATE NOTICE

## නීතිපති ධුරයේ ස්වාධීනත්වය සහ ස්වාධිපත්‍ය ආරක්ෂා කිරීම
### சட்டமா அதிபர் பதவியின் சுதந்திரம் மற்றும் தன்னாளுமையை உறுதி செய்தல்
### ASSURANCE OF INDEPENDENCE AND AUTONOMY OF OFFICE OF ATTORNEY-GENERAL

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, වසර 140කට වඩා පැරණි නීතිපති දෙපාර්තමේන්තුවේ නීතිපති තනතුර, අපරාධ යුක්තිය පසිඳලීම සඳහා අවශ්‍ය වැදගත් තනතුරක් වේ. It is called the linchpin of the criminal justice system. එම කර්තව්‍යය නීතියේ ආධිපත්‍යයට අනුව ඉටු කිරීමට නම්, එහි ස්වාධීනත්වය සහ ස්වාධිපත්‍ය - independence and autonomy - ආරක්ෂා විය යුතුය. නීත්‍යනුකූල රාමුව තුළ සෑම විටම කරුණුසහගතව කටයුතු කළ යුතුය. නීතියෙන් ලබා දී තිබෙන අභිමානය භාවිත කළ යුත්තේ ව්‍යවස්ථානුකූලව සහ නීතියේ ආධිපත්‍යයට අනුවයි. ඒ අනුව, මා පහත සඳහන් ප්‍රශ්න යොමු කරන්නට කැමැතියි.

01. විශේෂයෙන්ම මම ගරු අමාත්‍යතුමාගෙන් අහන්න කැමැතියි, නීතිපති ධුරය ස්වාධීන ධුරයක් වන්නේද කියන එක ගැන. ඒ පිළිබඳව මම ඔබතුමාගෙන් පැහැදිලි කිරීමක් බලාපොරොත්තු වෙනවා. මොකද, නීතිපතිවරයාට තිබෙන්නේ සුවිශේෂී ව්‍යවස්ථාමය තත්ත්වයක්. ඔහුට කාගේවත් ගැත්තෙක් වෙන්නට බැහැ, ආණ්ඩුවේ හෝ විපක්ෂයේ හෝ වෙනත් පාර්ශ්වයක. ඒ වාගේම ඔහුට තිබෙනවා, අර්ධ අධිකරණ බලයක්. He possesses or at least his position possesses quasi-judicial powers. I am sure that you agree with me. ඒ නිසා නඩුවක් පවරනවාද, ඉල්ලා අස්කර ගන්නවාද කියන එක පිළිබඳව අපක්ෂපාතී තීන්දුවක් ගන්නට එතුමාට හැකියාවක් තිබෙන්න ඕනෑ. ඒකට බලපෑම් කරන්නට බැහැ. ඒ නිසා මේ තනතුර ස්වාධීනව, අපක්ෂපාතීව ක්‍රියාත්මක විය යුතු තනතුරක්. ඒ කරුණු ඔබතුමා පිළිගන්නවාද නැද්ද කියන එක තමයි පළමුවෙනි ප්‍රශ්නය.

02. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41(ඇ) ව්‍යවස්ථාව අනුව, ජනාධිපතිවරයා විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවට කරනු ලබන නිර්දේශයක් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව අනුමත කිරීමෙන් පසුව පමණක් නීතිපතිවරයා පත් කරනු ලබන්නේද?

ඒ කියන්නේ, නීතිපතිවරයා පත් කිරීම හුදෙක් විධායකය සතු තනි බලයක් නොවෙයි. ඒක ඇත්තවශයෙන්ම සංවරණ සහ තුලන - checks and balances - ක්‍රමය හරහා ක්‍රියාත්මක වනවා නේද කියන එක මම ඔබතුමාගෙන් ප්‍රශ්න කරනවා.

03. ඒ අනුව, නීතිපතිවරයාගේ ස්වාධීනත්වයේ පාරිශුද්ධත්වය - sanctity of independence of the position of the Attorney-General - ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මඟින් සහතික කොට ආරක්ෂා කර තිබෙනවාද?

04. නීතියේ ආධිපත්‍යය සුරක්ෂිත වන ආකාරයට ස්වාධීනව, විශේෂඥ දැනුම මත නීතිපතිවරයාට ක්‍රියාත්මක වීමට අවශ්‍ය පසුබිම රජය විසින් සලසා දී තිබේද?

විශේෂයෙන්ම අපරාධ සම්බන්ධයෙන් නඩු පැවරීමේ කාර්යභාරය, නීති පැනවීම ඉටු කිරීමේදී ඉටු කළ යුතු කාර්යභාරය, - ඒ කියන්නේ, ව්‍යවස්ථාදායක ක්‍රියාවලියට සහයෝගය ලබා දීම- රජයේ නීති උපදේශකවරයා ලෙස කටයුතු කිරීම. විශේෂයෙන්ම මේ කරුණු කාරණා තුළ නීතිපතිවරයාට කටයුතු කරන්නට අවශ්‍ය නිදහස් වපසරිය ලබා දී තිබෙනවාද කියන එක මම අහන්නට කැමැතියි.

ඒ වාගේම දේශපාලන බලපෑම්වලින් තොරව කටයුතු කිරීමට අවකාශය ලබා දී තිබෙනවාද කියන එකත් අහන්නට කැමැතියි.

05. 2002 අංක 5 දරන නිලධරයන් ඉවත් කිරීමේ (කාර්ය පටිපාටිය) පනතේ 3වන වගන්තියේ සඳහන් පරිදි පොලිස්පති හා නීතිපති ධුර දරන්නන් අනිසි චෝදනාවලට ලක්වීම වැළැක්වීමට රජය විසින් කුමන පියවර ගෙන ඇත්ද?

විශේෂයෙන්ම අපි දන්නවා, යම් කිසි අඩුපාඩුවක්, අක්‍රමිකතාවක් සිදු වනකොට ඒ කර්තව්‍යය ක්‍රියාත්මක කරන්න යම් ක්‍රමයක් තිබෙන බව. ඔබතුමා ම දන්නවා, පසුගිය කාලයේ හිටපු පොලිස්පතිවරයාගේ අක්‍රමිකතා පිළිබඳව. ඒ පිළිබඳව පක්ෂ, විපක්ෂ භේදයකින් තොරව අපිත් කථා කළා. අපිත් ඒකට සහයෝගය ලබා දුන්නා, නිවැරදි දේ ඉෂ්ට සිද්ධ කරන්න. ඇත්ත වශයෙන්ම ඒ කාලයේ තිබුණේ පොලිස් රාජ්‍යයක්. ඔබතුමන්ලාත් පොලිස් රාජ්‍යයකට යන්න හොඳ නැහැ. ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා කරන්නට ඕනෑ. එදා තිබුණු පොලිස් රාජ්‍යය, ඒ පොලිස්පතිවරයාගේ අත්තනෝමතික ක්‍රියාවලිය පරාජය කරන්න පක්ෂ, විපක්ෂ භේදයකින් තොරව අපි සහයෝගය ලබා දුන්නා. හැබැයි, අපි මේ අවස්ථාවේ ඔබතුමාගේ සහයෝගය ඉල්ලා සිටිනවා. ඔබතුමා ප්‍රගතිශීලී තැනක ඉන්න පුද්ගලයෙක්. අනිසි බලපෑම්වලින් තොරව නීතිපතිවරයාට නිවැරදිව තමන්ගේ ස්වාධීන ක්‍රියාවලිය ක්‍රියාත්මක කරන්නට ඉඩ දෙන්නට ඕනෑ. අනිසි චෝදනාවන්වලට ලක්වීම වැළැක්වීමට ඔබතුමන්ලා යම්කිසි ක්‍රියාමාර්ගයක් ගන්න ඕනෑ. මොනවා හරි

චෝදනාවක් හෝ ප්‍රශ්නයක් තිබෙනවා නම් ඒ ක්‍රියාදාමය අනුගමනය කරන්න ඔබතුමා කටයුතු කරනවාද කියලා මම අහන්න කැමැතියි.

06. නීතිපතිවරයාගේ රාජකාරි ඉලක්ක කොටගෙන සෘජුවම හා වක්‍රව සංවිධානාත්මක ලෙස විවිධ චෝදනා රැල්ලක් නැඟී තිබෙන බව ඔබතුමා පිළිගන්නේද? ඒ සම්බන්ධව රජයේ ස්ථාවරය කුමක්ද?

07. නීතිපති ධුරයේ ස්වාධීනත්වය ආරක්ෂා වන පරිදි ඒ සංවිධානාත්මක ප්‍රහාර නැවැත්වීමට රජය විසින් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද?

මම ඔබතුමාට මේ කාරණය කියන්න කැමැතියි. අපේ රටේ භාෂණයේ නිදහස තිබෙනවා. විවිධ අයට විවිධ මත පළ කරන්නට පුළුවන්. ඒක ගැන කිසි ගැටලුවක් නැහැ. නමුත් මේකේ යම්කිසි සාධාරණත්වයකුත් සිදු වන්නට ඕනෑ කියලා මම හිතනවා. වැරදි විධියට චෝදනා ඉදිරිපත් වෙන කොට නීතිපතිවරයාට තමන්ගේ කර්තව්‍යයන් ස්වාධීනව ක්‍රියාත්මක කරන්නට යම්කිසි බලපෑමක් ඇති වෙන්නට ඉඩ තිබෙනවා. ඒ වාගේම මම ඔබතුමාට මේ කාරණයත් කියන්න කැමැතියි. යම්කිසි අඩුපාඩුවක් තිබෙනවා නම් ඒ ක්‍රමවේදය අනුගමනය කරලා, එම නීතිමය ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීමට ඔබතුමන්ලාට අයිතිය තිබෙනවා. මා විසින් අසන ලද ප්‍රශ්නවලට ඔබතුමාගෙන් පිළිතුරු බලාපොරොත්තු වෙනවා, ගරු ඇමතිතුමනි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු අධිකරණ අමාත්‍යතුමා.

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා (අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමා)**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார - நீதி மற்றும் தேசிய ஒருமைப்பாட்டு அமைச்சர்)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law - Minister of Justice and National Integration)
ගරු කථානායකතුමනි, විපක්ෂ නායකතුමා ස්ථාවර නියෝග 27(2) යටතේ අසන ලද ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

1 ඔව්.

2 ඔව්.

1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41ඇ(1) ව්‍යවස්ථාව ප්‍රකාරව, ජනාධිපතිවරයා විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව වෙත නීතිපති ධුරයට යම් පුද්ගලයෙකු නිර්දේශ කරනු ලැබ, එම නිර්දේශය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව විසින් අනුමත කිරීමෙන් අනතුරුව පමණක් නීතිපති ධුරයට පුද්ගලයන් පත් කිරීම ජනාධිපතිවරයා විසින් සිදු කරනු ලැබිය යුතුය.

තවද, ඉහත 41ඇ(1) ව්‍යවස්ථාවේ දක්වා ඇති ජනාධිපතිවරයා විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ අනුමැතිය මත පමණක් නීතිපති ධුරයට පුද්ගලයකු පත්කළ යුතු යැයි වන ප්‍රතිපාදනය, 61ඉ(ආ) ව්‍යවස්ථාව යටතේ ද තහවුරු කර ඇත.

3 ඔව්.

විසිඑක්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මඟින් හඳුන්වා දෙන ලද 41ඇ(1) ව්‍යවස්ථාව යටතේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ අනුමැතියට යටත්ව ජනාධිපතිවරයා විසින් නීතිපතිවරයා පත් කිරීමට ප්‍රතිපාදන යෙදීමේ අරමුණ මෙම ධුරයේ පත්වීම සෘජු විධායක බලපෑමෙන් සිදුවන පත්වීමකින් ඉවත් කොට ස්වාධීන පත්වීමක් බවට පත් කිරීම බව පැහැදිලි වේ.

ඉහත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ක්‍රියාවලිය, මෙම ධුරය දරන තැනැත්තාට අපක්ෂපාතීව සහ ස්වාධීනව ධුරයක් හෙබවීමට අවශ්‍ය වන ආරක්ෂාව සහ පරිසරය නිර්මාණය කිරීමේ අපේක්ෂාවෙන් නිර්මාණය කර ඇති ශක්තිමත්, ප්‍රජාතන්ත්‍රවාදී පරීක්ෂාවක් ලෙස දැක්වේ.

4. ඔව්.

වර්තමාන රජය යටතේ නීතිපති ධුරයේ ස්වාධීනත්වය තහවුරු කිරීම සඳහා වත්මන් ව්‍යවස්ථාමය ප්‍රතිපාදන හා නෛතික විධිවිධාන යටතේ මෙම රජය ඉතා ප්‍රගතිශීලීව සහ වගකීමෙන් කටයුතු සිදු කරනු ලබයි.

5. 2002 අංක 5 දරන නිලධරයන් ඉවත් කිරීමේ (කාර්ය පටිපාටි) පනතේ 3 වන වගන්තියෙන් නීතිපති ධුරය දරන තැනැත්තකු ඉවත් කිරීම සිදු කළ හැකි හේතු දක්වා ඇති අතර, එවැනි යම් හේතුවක් සම්බන්ධයෙන් සිදු කරනු ලබන දැනුවත් කිරීමක හෝ චෝදනාවක නිසි අනිසි බව එකී පනතේ 4(1) වන වගන්තිය යටතේ සලකා බලා තීරණය කළ හැකි වනුයේ ජනාධිපතිවරයාට වේ.

එලෙස එවැනි කරුණු සම්බන්ධයෙන් ජනාධිපතිවරයා විසින් තීරණය කළ යුත්තේ කුමන ක්‍රමවේදයක් යටතේ ද යන්න පනතේ 4(2) වන වගන්තියේ දක්වා ඇත.

6. රජයේ ඕනෑම ධුරයක් දරන පුද්ගලයෙකුගේ නිලයේ ස්වාධීනත්වය පසෙකලා, ඔවුන් රාජකාරි කටයුතු සිදු කිරීම පිළිබඳව බාහිර පුද්ගලයන් විසින් කලින් කලට විවිධ අවබෝධයන් මත පදනම්ව විවේචනවලට බඳුන් කරනු ලැබේ.

අපි ඒක දැක්කා, පසුගිය කාලයේ අධිකරණ සේවා කොමිෂන් සභාවේ යම් පත්කිරීම්, ඉවත් කිරීම් සම්බන්ධයෙන්. එය ස්වාධීන ආයතනයක් වුවත්, මේ පාර්ලිමේන්තුව තුළම ඒ පිළිබඳව ප්‍රශ්න කරන්නට, විවේචනය කරන්නට යෙදුණා. ඒ වාගේම සමාජ මාධ්‍ය තුළත් එය සිද්ධ වෙනවා.

ඒ අනුව, මේ දිනවල ජනමාධ්‍යවල නීතිපතිවරයා විසින් සිදු කරනු ලබන රාජකාරි ඉලක්ක කොට විවිධ මත ඉදිරිපත් වන බව රජය විසින් නිරීක්ෂණය කර ඇති වුවද, එවැනි මතයන්හි සත්‍යතාව හෝ අසත්‍යතාව පිළිබඳව තහවුරු කර නොමැත.

ගරු විපක්ෂ නායකතුමා කිව්වා වාගේම මිනිස්සුන්ගේ භාෂණ නිදහසකුත් තිබෙන බව අපි තේරුම් අරගෙන ඉන්නවා.

7. එසේ ඉදිරිපත් වනු ලබන මතයන් මඟින් යම් ලෙසෙකට නීතිපති ධුරයේ ස්වාධීනත්වයට බලපෑමක් වන බවට රජය විසින් නිරීක්ෂණය කරනු ලබන ඕනෑම අවස්ථාවක දී එම ධුරයේ ස්වාධීනත්වය ආරක්ෂා කිරීම සඳහා අවශ්‍ය වනු ලබන, රටේ පවතින නීතියට අනුකූලව උපරිම ක්‍රියා මාර්ග ගැනීමට රජය කටයුතු කරනු ලැබේ.

ගරු විපක්ෂ නායකතුමනි, එම පිළිතුරුවලට අමතරව මේ වන විට කලින් කියූ පරිදි වෙනත් රජයයන්වල නඩුකාරතුමන්ලාගේ ගෙවල්වලට ගල් ගහන ඒවා තිබුණා. නඩුකාරයන්ට විරුද්ධව පෝස්ටර් ගහන ඒවා තිබුණා. ඒ වාගේම දෝෂාභියෝගයක් ගෙනැල්ලා, අග්‍රවිනිශ්චයකාර ශිරාණි බණ්ඩාරනායක මැතිනියට සලකපු විධිය මම දැක්කා. මේ රජය එවන් ආකාරයකට කටයුතු කරනු ලබන්නේ නැහැ. නීතියට අනුව පමණයි කටයුතු කරනු ලබන්නේ. මේ ටික තමයි මගේ උත්තරය, විපක්ෂ නායකතුමනි.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු අමාත්‍යතුමනි, ඔබතුමා ලබා දුන් පිළිතුරට මම ස්තුතිවන්ත වෙනවා. ඒ වාගේම මම විශ්වාස කරනවා - ඔබතුමා ගැන මේ කියන්නේ, අමාත්‍යතුමනි. ඔබතුමාත් නීතිපතිවරයාගේ තීන්දු තීරණ ගැනීමේ නිදහස වෙනුවෙන්, ඒ ස්වාධීනත්වය වෙනුවෙන් පෙනී සිටිනවා. හැබැයි, ඒ පෙනී සිටීම තුළම ඔබතුමාටත් පහර ගැහුවා. මම මේ දේශපාලනයක් මතු කරන්න කථා කරනවා නොවෙයි. ඔබතුමාට එක එක අවලාද නැඟුවා, drinking partnerව ආරක්ෂා කරනවා කියලා. මම මේ ඔබතුමාට අපහාස කරන්න කියනවා නොවෙයි. මම මේ කියන්නේ විවිධ websitesවල ක්‍රියාත්මක වුණු දේවල්. මම ඔබතුමාට යෝජනාවක් කරනවා. පොඩ්ඩක් හොයා බලන්න, මොන වෙබ් අඩවි ද ඔබතුමාට පහර ගැහුවේ කියන එක. මම වැඩිය විග්‍රහ කරන්න යන්නේ නැහැ. වැඩිය විග්‍රහ කරන්න ගියොත් ඔබතුමාටත් ඒක ප්‍රශ්නයක් වෙනවා. ඒක නිසා මම එහෙම කරන්න යන්නේ නැහැ. මම මේක දේශපාලනයක් කර ගන්න යන්නේ නැහැ. ඔබතුමාටත් අවලාද කළා, ඔබතුමාටත් අපහාස කළා, "drinking partnerව ආරක්ෂා කරනවා" කියලා කිව්වා. කාගේ websites ද, මොන පාර්ශ්වයේ websites ද කියලා හොයලා බලන්න.

මම ඔබතුමාට යෝජනාවක් කරනවා. විශේෂයෙන්ම අපට පමණක් නොවෙයි, අපේ රටේ සියලු දෙනාට ඉතා වැදගත් වෙනවා, *imperium legis* - the rule of law, නීතියේ ආධිපත්‍ය ගැන. ඒ වාගේම, *lex suprema est* - the law is supreme; අන් සියලු දෙයට වැඩිය නීතිය ඉහළින්ම තිබිය යුතුයි. *Sub lege non sub homine* කියන්නේ, නීතිය ක්‍රියාත්මක විය යුත්තේ පුද්ගලයෙකුගේ අභිමතය පරිදි නොවෙයි, නීතිය යටතේ ක්‍රියාත්මක විය යුතුයි කියන එකයි.

මම හිතන විධියට, මේ ප්‍රතිපත්ති පිළිබඳව ඔබතුමාට අමුතුවෙන් උගන්වන්න දෙයක් නැහැ. *Audi alteram partem;* ඒ කියන්නේ අනෙක් පාර්ශ්වයටත් සවන් දෙන්නට ඕනෑ. *Nemo judex in causa sua* - කිසිම කෙනෙකුට තමන්ට එල්ල වී තිබෙන චෝදනාවක් පිළිබඳව තමන්ටම තීන්දු තීරණ ගන්න බැහැ යනාදි වශයෙන් මේ නීතිමය කරුණු පිළිබඳව අපේ රටේ නීති පද්ධතිය, අපේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය, අධිකරණය, ව්‍යවස්ථාදායකය, විධායකය, ඒ වාගේම ස්වාධීන මාධ්‍යයන්, - *[බාධා කිරීමක්]* මම මේ වැදගත් කාරණාවක් මතු කරන්නේ. මොකද, එතුමාට මඩ ගහන්නේ එතුමාම නියෝජනය කරන පාර්ශ්වයේ වෙබ් අඩවි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

දැන් අවසන් කරන්න. අමතර ප්‍රශ්නය අහලා අවසන් කරන්න.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ඔන්න, මට දැන් ඔබතුමාට කියන්න සිද්ධ වුණා. මොකද, මේ කථාව දික් ගැස්සෙන නිසා. මම යෝජනා කරනවා, -

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රශ්නය අහන්න, ගරු විපක්ෂ නායකතුමනි.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

හරි, හරි. ප්‍රශ්නය අහන්නම්.

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)

ප්‍රශ්නය මේක තමයි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රශ්නය අහන්න. ඔබතුමා විනාඩි 3ක් ගත්තා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

නලින්ද ජයතිස්ස ඇමතිතුමනි, ඒ ඔබතුමාගේ වෙබ් අඩවියක් නොවෙයි. ඔබතුමා එහෙම කරන්නේ නැහැ. මම ඔබතුමාගේ නම කිව්වේ නැහැ නේ. නලින්ද ජයතිස්ස මැතිතුමා මේවාට සම්බන්ධ නැහැ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු විපක්ෂ නායකතුමනි, ඔබතුමා අමතර ප්‍රශ්නයට විනාඩි තුනක් අරගෙන තිබෙනවා. *[බාධා කිරීම්]* ගරු විපක්ෂ නායකතුමනි, -

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

එතුමා සම්බන්ධ නැහැ. විජිත හේරත් ඇමතිතුමා මේ සභාවේ ඉන්නවා, එතුමා සම්බන්ධත් නැහැ.

**ගරු කථානායකතුමා**
( மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු විපක්ෂ නායකතුමනි, ඔබතුමා දැන් විනාඩි තුනක් අරගෙන තිබෙනවා. එම නිසා අවසන් කරන්න.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

හැබැයි, නීතිපතිවරයාගේ ස්වාධීනත්වය ගැන, ස්වාධීනව තීන්දු තීරණ ගැනීමේ කරුණු කාරණා ඉස්මතු කරනකොට අධිකරණ ඇමතිවරයාත් එක්ක එකට බොන පුද්ගලයා යයි කියලා, - *[බාධා කිරීමක්]* නැහැ, නැහැ, පොඩ්ඩක් ඉන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ඔබතුමා අමතර ප්‍රශ්නයට විනාඩි 4ක් ගත්තා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

එතුමා වෙනුවෙන් මම මේ කියන්නේ. එතුමා එක්ක එකට බොන පුද්ගලයෙක් කියලා, - මේක බොරුවක් නම් ඔබතුමා කියන්න, "මේ කියන්නේ බොරුවක්" කියලා. එහෙම අපහාස කරන එක, ඒක හරි වැරැදියි. විශේෂයෙන්ම මම ඔබතුමාට

[ගරු සජිත් ප්‍රේමදාස මහතා]

කියන්න කැමැතියි, මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රමවේදය තුළ නීතිපතිවරයාගේ ස්වාධීනත්වය, නිදහස, අපක්ෂපාතීව තීන්දු තීරණ ගැනීම අතිශයින්ම වැදගත් වන බව. මම අධිකරණ ඇමතිතුමාට ස්තුතිවන්ත වෙනවා, ඒ වෙනුවෙන් පෙනී සිටීම ගැන. ඒ වෙනුවෙන් එතුමා විතරක් නොවෙයි,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු අධිකරණ ඇමතිතුමා. *[බාධා කිරීමක්]* විපක්ෂ නායකතුමනි, අවසන් කරන්න. ඔබතුමා විනාඩි 4ක් ගත්තා. *[බාධා කිරීමක්]* මේක විවාදයක් බවට පත් වෙනවා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
හොඳයි, තත්පර 15යි ගන්නේ. මට අවසන් කරන්න දෙන්න. මම ගන්නේ තත්පර 15යි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි, කථා කරන්න.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
එතුමා කටයුතු කරන ආකාරයටම, නීතිපතිවරයාගේ ස්වාධීනත්වය වෙනුවෙන් මේ සභාවේ මන්ත්‍රීවරු 225දෙනාම පෙනී සිටිමුයි කියලා මම යෝජනා කරනවා. ස්තුතියි.

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, නීතිපති දෙපාර්තමේන්තුවේ නීතිපති කියන ආයතනයේ ස්වාධීනත්වය වෙනුවෙන් මම තනියෙන් පෙනී හිටින්නේ නැහැ. අපේ 159දෙනාත්, ජනාධිපතිතුමාත් ඒ වෙනුවෙන් පෙනී හිටිනවා. ඒකයි ක්‍රමය. ඒ වාගේම හර්ෂණ නානායක්කාර තනියම ආණ්ඩු කරනවා නොවෙයි. අපි දන්නවා, සමාජ මාධ්‍යවල තහවුරු කර නොගත් ගොඩක් මත පළ වන බව. ඒ හැම මතයකටම උත්තර දෙන්න අපි බැඳෙන්නේත් නැහැ. ගරු විපක්ෂ නායකතුමාටත් කතන්දර කියන්නේ. ඒවා වැඩිය ගණන් ගන්න හොඳ නැහැ නේ. "ඕක ඔබතුමාට කරන්න බැහැ, පොඩි ළමයෙක්ට භාර දෙන්න" වාගේ කතන්දර කියනවා නේ. අලි මන්තර, අරවා මේවා කේස් ගැන කියනවා. ඒවා ගණන් ගන්න හොඳ නැහැ, ගරු විපක්ෂ නායකතුමනි. අපි ඒවා ගණන් ගන්න හොඳ නැහැ.

මගේ කණ්ඩායම පිළිබඳවත්, මගේ ආණ්ඩුව පිළිබඳවත්, මගේ ජනාධිපතිතුමා පිළිබඳවත් මට ඉතාම හොඳ විශ්වාසයක් තිබෙනවා. මට අමාත්‍ය ධුරයේ වගකීම භාර දී තිබෙන්නේ ජනාධිපතිවරයා. සමාජ මාධ්‍යවලින් නොවෙයි. මම ඒක හොඳට කරන්නේ නැත්නම් එතුමා මට කියාවි. නමුත්, දක්වපු සැලකිල්ලට ස්තුතියි, ගරු විපක්ෂ නායකතුමනි. මේ රජය යටතේ නීතිපතිවරයාගේ පමණක් නොවෙයි, ඕනෑම ආයතනයක ස්වාධීනත්වය සහ නීතිය රැකගෙන, නීතියේ විධානය, ආධිපත්‍යය රැක ගෙන අපි ඉදිරියට යනවා. ඒ වාගේම මොන තනතුරේ හිටියත්, කොහේ හිටියත් පුද්ගලයන් වැරදි කරනවා නම් ඒවා සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගන්න අපි පැකිළෙන්නෙත් නැහැ. එකම දේ තමයි, අපි වැඩ කරනකොට අර වළං කඩේට පැනපු ගොනා වාගේ ඇන ගෙන යන සිරිතකුත් අපට නැහැ.

බොහොම ස්තුතියි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ස්ථාවර නියෝග 27(2) යටතේ මීළඟ ප්‍රශ්නය, ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා.

# II

## උතුරු සහ නැඟෙනහිර දෙමළ ජනතාවගේ රන් ආභරණ නැවත ලබා දීම
## வடக்கு, கிழக்கு தமிழ் மக்களின் தங்க நகைகளை மீள வழங்குதல்
## RETURN OF GOLD JEWELLERY BELONGING TO TAMIL PEOPLE OF NORTH AND EAST

**ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා**
(மாண்புமிகு சிவஞானம் சிறீதரன்)
(The Hon. Sivagnanam Shritharan)
கௌரவ சபாநாயகர் அவர்களே, நிலையியற் கட்டளை 27 (2)இன்கீழ் சனாதிபதியும் பாதுகாப்பு அமைச்சரும் நிதி, திட்டமிடல் மற்றும் பொருளாதார அபிவிருத்தி அமைச்சரும் டிஜிட்டல் பொருளாதார அமைச்சருமான மாண்புமிகு அநுர குமார திஸாநாயக்க அவர்களிடம் கேள்வி கேட்பதற்கு அனுமதித்ததற்கு நன்றி!

1980களில் இருந்து 2009ஆம் ஆண்டு வரை வடக்கு, கிழக்கு மாகாணங்களில் வாழ்ந்த தமிழ் மக்கள் கடுமையான போர் தாக்கங்களையும் பொருளாதார நெருக்கடிகளையும் எதிர்கொண்டார்கள். உலகில் எங்கும் இல்லாதவாறு, குழந்தைகளுக்கான பால்மா முதல் போஷாக்கு உணவான கோழி முட்டை வரையான உணவுப் பொருட்கள், எரிபொருள், விவசாய உள்ளீடுகள், கட்டிடப் பொருட்கள், மோட்டார் வாகனங்கள் என அனைத்துக்குமே 1990இலிருந்து 2009ஆம் ஆண்டு வரை இலங்கையில் மாறி மாறி ஆட்சிக்கு வந்த அரசுகளால் தடைவிதிக்கப்பட்டு இருந்தன. இதனால் வடக்கு, கிழக்கில் வாழ்ந்த தமிழ் மக்களின் பொருளாதாரம் மட்டுமல்ல, போஷாக்கு மட்டமும் மிகவும் கீழ்மட்டத்திலேயே காணப்பட்டது. இப்பொழுதுகூட, போஷாக்குக் குறைபாடுள்ள மாவட்டங்களில் கிளிநொச்சி மற்றும் முல்லைத்தீவு மாவட்டங்கள் உள்ளடக்கப்பட்டு இருப்பதைக் காண முடியும்.

இவ்வாறான நெருக்கடி மிகுந்த 1990களில்தான் தமிழீழ விடுதலைப் புலிகளால் தூரநோக்கோடு தமிழீழ வைப்பகம் உருவாக்கப்பட்டு, தமிழ் மக்களின் பொருளாதாரத்தில், உற்பத்தித்துறையில் மக்களுக்கான வாழ்வாதார உதவிகள் செய்யப்பட்டன. யுத்தம் நடைபெறும் காலத்தில் ஓர் அரசாக தமிழீழ விடுதலைப் புலிகளால் மக்களுக்கு வங்கிச் சேவையூடாகப் பணியாற்ற முடிந்தது. விடுதலைப் புலிகளின் இப்பொருண்மிய திட்டமிடலை உலகமே வியந்து பார்த்ததை தாங்களும் அறிவீர்கள். இக்காலத்தில் தமிழ் மக்களில் பலர் தமிழீழ வைப்பகத்தில் தங்களது நகைகளை அடகுவைத்து, விவசாயத்துக்கும் தொழில்முயற்சிகளுக்கும் வீட்டுத் திருமண நிகழ்வுகளுக்கும் பணம் பெற்றுக் கொண்டார்கள். இவ்வாறு தமிழீழ வைப்பகத்தில் நகைகளை அடகுவைத்தவர்களால் இறுதி யுத்தத்தின்போது நகைகளைப் பெற முடியவில்லை. தொடர் யுத்தம், இடப்பெயர்வுகள் அந்த மக்களின் கையிலிருந்த தங்கம் மீதான செல்வாக்கையும் இழக்கச் செய்திருந்தது.

கடந்த 2024ஆம் ஆண்டு சனாதிபதித் தேர்தல் மற்றும் பாராளுமன்றத் தேர்தல் காலங்களில், தமிழீழ வைப்பகத்தில்

வைக்கப்பட்ட நகைகளைத் திருப்பி ஒப்படைப்பதாகத் தங்களாலும் தங்கள் உறுப்பினர்களாலும் பகிரங்கமாகத் தெரிவிக்கப்பட்டது. தேர்தல்கள் முடிந்து ஓராண்டுக்கு மேலாகியும், எதிர்பார்ப்போடும் ஏக்கத்தோடும் இருக்கும் தமிழ் மக்களுக்கு எந்தவித மகிழ்ச்சியான செய்தியும் இதுவரை கிடைக்கவில்லை. தங்களின் பொருளாதாரத்தை இழந்து தவிக்கும் மக்களின் மனநிலையை இந்த அரசு மனிதாபிமானத்தோடு கரிசனை கொள்ளுமா?

1. வடக்கு, கிழக்கில் இவ்வாறு தமிழ் மக்களிடம் எடுக்கப்பட்ட தங்க நகைகள் எத்தனை கிலோ பவுண்?
2. நீண்ட எதிர்பார்ப்புடன் காத்திருக்கும் இம்மக்களின் தங்க நகைகள் எப்போது அவர்களிடம் மீள வழங்கப்படும்?
3. இந்தத் தங்க நகைகளை மீள அம்மக்களிடம் ஒப்படைப்பதற்கான ஏதாவது ஒரு வேலைத்திட்டம் அரசால் அறிவிக்கப்பட்டுள்ளதா?
4. மொத்தமாக வடக்கு, கிழக்கில் இவ்வாறு தமிழீழ வைப்பகத்தில் தங்க நகைகளை அடகுவைத்தோரின் விபரங்களையாவது உங்கள் அரசு மேற்கொண்டு வெளியிடுமா?
5. தங்களுடைய தேர்தல் கால வாக்குறுதிகளில் இத்தங்க நகை விடயம் முக்கியத்துவம் பெறுவதால், தமிழ் மக்கள் ஏமாற்றப்படாமல் இருக்க தாங்கள் எடுத்துள்ள துரித நடவடிக்கைகள் என்ன?

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර ලබා දීම සඳහා සතියක කාලයක් ඉල්ලා සිටිනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

අමාත්‍යාංශ නිවේදන, නිවාස, ඉදිකිරීම් සහ ජල සම්පාදන අමාත්‍ය ගරු (වෛද්‍ය) සුසිල් රණසිංහ මහතා.

## අවතැන් වූ පුද්ගලයන් සඳහා වන සුබසාධන මධ්‍යස්ථාන වෙත ලබා දී ඇති වාහන: නිවාස, ඉදිකිරීම් සහ ජල සම්පාදන අමාත්‍යතුමාගේ ප්‍රකාශය

## இடம்பெயர்ந்தோர் தொடர்பில் நலன்புரி நிலையங்களுக்கு வழங்கப்பட்ட வாகனங்கள்: வீடமைப்பு, நிர்மாணிப்பு மற்றும் நீர் வழங்கல் அமைச்சரினது கூற்று

## VEHICLES PROVIDED TO WELFARE CENTRES FOR DISPLACED PERSONS: STATEMENT BY MINISTER OF HOUSING, CONSTRUCTION AND WATER SUPPLY

**ගරු (වෛද්‍ය) සුසිල් රණසිංහ මහතා (නිවාස, ඉදිකිරීම් සහ ජල සම්පාදන අමාත්‍යතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) சுசில் ரணசிங்ஹ - வீடமைப்பு, நிர்மாணிப்பு மற்றும் நீர் வழங்கல் அமைச்சர்)
(The Hon. (Dr.) Susil Ranasinghe - Minister of Housing, Construction and Water Supply)

ගරු කථානායකතුමනි, ගරු කේ. කාදර් මස්තාන් මන්ත්‍රීතුමා විසින් ස්ථාවර නියෝග 27(2) යටතේ 2025.09.09 දින අසන ලද ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

1. i. අමාත්‍යාංශය සතු ගොනුවලින් ලබා ගත් තොරතුරු අනුව වවුනියා වෙංගලසෙට්ටිකුලම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය යටතේ ක්‍රියාත්මක වූ මැණික් ෆාර්ම් සුබසාධන කඳවුර වෙත වාහන 107ක් ලබා දී ඇති බව හඳුනාගෙන ඇති අතර, වෙනත් සුබසාධන කඳවුරු වෙත වාහන ලබා දුන් බවට තොරතුරු නැත.

   ii. මැණික් ෆාම් සුබසාධන කඳවුර වෙත ලබා දුන් වාහන අතරින් වාහන 12ක් එක්සත් ජාතීන්ගේ සරණාගතයින් පිළිබඳ මහ කොමසාරිස් කාර්යාලය විසින් භාර ගැනීමෙන් අනතුරුව අපහරණය කර ඇති අතර, අනෙකුත් වාහන භාර ගත් ආයතන, වාහන භාර දුන් දිනය සහ වගකිව යුතු නිලධාරින් පිළිබඳ තොරතුරු මෙම අමාත්‍යාංශ ගොනුවල නොමැත.

   iii. නමුත්, අදාළ වාහන 107 භාවිත කරනු ලබන ආයතන පිළිබඳ තොරතුරු පිළිතුරෙහි දක්වා ඇත.

2. i. මැණික් ෆාම් සුබසාධන කඳවුර වෙත ලබා දුන් වාහන 56ක් පිළිබඳව 2014 වර්ෂයේදී සිදු කරන ලද සමීක්ෂණයක් පිළිබඳ තොරතුරු මෙම අමාත්‍යාංශය සතු ගොනුවල නැත. එහෙත්, FCID/09/2025 දරන පැමිණිල්ලට අදාළව 2019 වර්ෂයේදී නැවත පදිංචි කිරීමේ අමාත්‍යාංශය විසින් ප්‍රාදේශීය අධිකාරින් මඟින් තොරතුරු රැස්කර ඇති අතර, එසේ රැස්කර ගන්නා ලද තොරතුරු අනුව මැණික් ෆාම් සුබසාධන කඳවුර වෙත ලබා දුන් වාහන 95ක් රජයේ ආයතන විසින්ද, වාහන 12ක් එක්සත් ජාතීන්ගේ සරණාගතයින් පිළිබඳ මහ කොමසාරිස් කාර්යාලය විසින් ද භාරගෙන ඇත. එක්සත් ජාතීන්ගේ සරණාගතයින් පිළිබඳ කොමසාරිස් කාර්යාලය විසින් භාරගත් වාහන 12 එම ආයතනය විසින් අපහරණය කර ඇති බව එම ආයතනය විසින් විද්‍යුත් තැපැල් පණිවුඩයක් මඟින් දන්වා ඇත. එම විද්‍යුත් තැපැල් පණිවුඩයේ සහතික කළ පිටපතක් ඇමුණුම 01 ලෙස මේ සමඟ ඉදිරිපත් කර ඇත. අදාළ වාහන පිළිබඳ තොරතුරු ඉහත අනු අංක 1 ප්‍රශ්නයට අදාළව ලබා දී ඇති වාහන ලේඛනයේ සවිස්තරාත්මකව සඳහන් වේ.

   ii. එබැවින්, නැවත පදිංචි කිරීමේ අමාත්‍යාංශය විසින් මැණික් ෆාම් සුබසාධන කඳවුර වෙත ලබා දුන් වාහන අස්ථානගත වී නොමැති බව නිරීක්ෂණය වේ.

3. අමාත්‍යාංශය සතු ගොනුවල ඇති තොරතුරු අනුව RB-2639 ට්‍රැක්ටර් රථය පෞද්ගලික පාර්ශ්වයක් වෙත බදු දීමට හෝ භාර දීමට කටයුතු කර නැත.

4. මන්නාරම ප්‍රාදේශීය සභා සභාපතිට විරුද්ධව නීතිමය ක්‍රියාමාර්ග ගන්නා ලෙස එම ප්‍රාදේශීය සභා සාමාජිකයින් විසින් අමාත්‍යාංශ ලේකම් වෙත ලිපි ඉදිරිපත් කළ බවට තොරතුරු අමාත්‍යාංශය සතු ගොනුවල නොමැති අතර, ඒ අනුව ව්‍යාජ තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් මන්නාරම ප්‍රාදේශීය සභාවේ සභාපතිට එරෙහිව මෙම අමාත්‍යාංශය විසින් ක්‍රියාමාර්ග ගෙන නොමැත.

5. මෙම ප්‍රශ්නයට ලබා දී තිබෙන පිළිතුර ඉතා දීර්ඝ එකක්. එය කෙටි කරන්නත් බැරි නිසා මම සාරාංශයක් ඉදිරිපත් කරන්නම්. මොකද, මෙම ප්‍රශ්නයට අදාළ මුළු පිළිතුරම මම සභාගත කරන නිසා.

   RB-2639 ලියාපදිංචි අංකය දරන ට්‍රැක්ටර් රථය අත්අඩංගුවට ගැනීම සම්බන්ධයෙන් සිදු කළ නීතිමය

[ගරු (වෛද්‍ය) සුසිල් රණසිංහ මහතා]

ක්‍රියාමාර්ග පිළිබඳව ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති (පරිපාලන - වැඩ බලන) ලලිත් පතිනායක මහතාගේ අත්සනින් එවා ඇති A1/SOQ/09/2025 දරන 2025.09.09 දිනැති පොලිස් වාර්තාව මඟින් දන්වා ඇත. එම ලිපියෙහි සහතික කළ පිටපත ඇමුණුම 02 ලෙස මේ සමඟ ඉදිරිපත් කර ඇත.

එම පොලිස් වාර්තාවට අනුව 2019.04.19 දින තලෙයිමන්නාරම පොලිස් ස්ථානයේ රාජකාරි කරන ලද නිලධාරියෙකුට තලෙයිමන්නාරම, පරිතිපනෙයි පාර, කජුවත්ත කැලෑ ප්‍රදේශයේ ට්‍රැක්ටර් රථයකින් ගවයෙකු ප්‍රවාහනය කරන බවට තොරතුරක් ලැබී ඇති අතර, එම තොරතුරට අදාළව තලෙයිමන්නාරම පොලිස් ස්ථානයේ නිලධාරින් කණ්ඩායමක් වැටලීමක් සිදු කර ඇත. ඒ සම්බන්ධ විස්තර තමයි දීර්ඝ වශයෙන් අසා තිබෙන්නේ.

තවද, එම පොලිස් වාර්තාව අනුව අරුලුප්පු ක්‍රිස්ටියාන් යන සැකකරුට පොලිස් ස්ථානය මඟින් ඇප ලබා දී ඇති අතර, මෙම අත්අඩංගුවට ගැනීම සම්බන්ධයෙන් 2019.04.25 දින තලෙයිමන්නාරම පොලිස් ස්ථානයේ මූලස්ථාන පොලිස් පරීක්ෂක, ප්‍රධාන පොලිස් පරීක්ෂක යූ.කේ.ඩී.පී.එල්. උඩවත්ත නැමැති නිලධාරියා විසින් මන්නාරම ම/උ බී 316/2019 යටතේ අධිකරණයට කරුණු වාර්තා කර ඇත.

වැඩිදුර විමර්ශනයේදී බලපත්‍ර නොමැතිව ගවයෙකු ප්‍රවාහනය කර ඇති බව, සත්ව හිංසාව ඇති වන පරිදි ගවයා ප්‍රවාහනය කර ඇති බව, ට්‍රැක්ටර් රථයට ආදායම් බලපත්‍රයක් සහ රක්ෂණ සහතිකයක් නොමැති බව, ට්‍රේලරයට අංක තහඩුවක් නොමැතිව ධාවනය කර ඇති බව අනාවරණය වී ඇති අතර, පලා ගිය සැකකරුවන් දෙදෙනා වන ක්‍රිස්ටියාන් රොබින්සන්, පිලිප්පු රොබින්සන් යන සැකකරුවන් අධිකරණයට භාර වී ඇත. මේ සම්බන්ධයෙන් දීර්ඝ පිළිතුරක් සඳහන් කරලා තිබෙනවා.

ඉහත චෝදනා සඳහා චූදිතයින් 2020.08.28 දින වරද පිළිගෙන ඇති බවත්, ඒ සඳහා පළමුවන චූදිතට රුපියල් 12,000ක දඩයක්ද, දෙවන චූදිතට රුපියල් 4,000ක දඩයක්ද, තුන්වන චූදිතට රුපියල් 4,000ක දඩයක්ද නියම කර ඇති බවත්, මුළු දඩ මුදල ලෙස රුපියල් 20,000ක් නියම කර ඇති බවත් තලෙයිමන්නාරම පොලිස් ස්ථානයේ ලේඛන පරීක්ෂා කිරීමේදී කරුණු අනාවරණය වී ඇති බව උක්ත පොලිස් වාර්තාව මඟින් දන්වා ඇත.

6. මන්නාරම ම/උ නඩු අංක 50558 යටතේ පහත චූදිතයින්ට එරෙහිව පැමිණිල්ල ගොනු කර ඇත.

චූදිතයින් -

අරුලුප්පු ක්‍රිස්ටියාන්, කවුබියන්කුඩි ඉරිප්පු, නඩුකුඩා, තලෙයිමන්නාරම

ක්‍රිස්ටියාන් රොබින්සන්, කවුබියන්කුඩි ඉරිප්පු, නඩුකුඩා, තලෙයිමන්නාරම

පිලිප්පු රොබින්සන්, කවුබියන්කුඩි ඉරිප්පු, නඩුකුඩා, තලෙයිමන්නාරම

ඒ අයට තිබෙන චෝදනා සඳහන් කර තිබෙනවා.

ඉහත චෝදනා සඳහා චූදිතයින් 2020.08.28 දින වරද පිළිගෙන ඇති අතර, ඒ සඳහා පළමුවන චූදිතට රුපියල් 12,000ක්, දෙවැනි චූදිතට රුපියල් 4,000ක්, තුන්වැනි චූදිතට රුපියල් 4,000ක දඩයක්ද ලෙස රුපියල් 20,000ක දඩ මුදලක් නියම කර ඇත.

7. ඉහත පිළිතුර අනුව නීතිමය ක්‍රියාමාර්ග ගෙන ඇත.

ගරු කථානායකතුමනි, මෙහි සවිස්තරාත්මක පිළිතුර සහ ඇමුණුම් 1 සහ 2 මා **සභාගත*** කරනවා.

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රධාන වැඩ කටයුතු.

න්‍යාය පත්‍රයේ විෂය අංක 1 ඉදිරිපත් කිරීම, the Hon. Anura Karunathilaka. You have 16 minutes.

# විශ්වවිද්‍යාල (සංශෝධන) පනත් කෙටුම්පත
## பல்கலைக்கழகங்கள் (திருத்தம்) சட்டமூலம்
## UNIVERSITIES (AMENDMENT) BILL

*දෙ වන වර කියවීමේ නියෝගය කියවන ලදී.*
*இரண்டாம் மதிப்பிற்கான கட்டளை வாசிக்கப்பட்டது.*
*Order for Second Reading read.*

[පූ.භා. 11.17]

**ගරු අනුර කරුණාතිලක මහතා (වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා)**
(மாண்புமிகு அனுர கருணாதிலக்க - துறைமுகங்கள் மற்றும் சிவில் விமான சேவைகள் அமைச்சர்)
(The Hon. Anura Karunathilaka - Minister of Ports and Civil Aviation)

ගරු කථානායකතුමනි, අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය වෙනුවෙන්, "පනත් කෙටුම්පත දැන් දෙවන වර කියවිය යුතුයි" යි මා යෝජනා කරනවා.

ගරු කථානායකතුමනි, අද දවසේ සාකච්ඡාවට බඳුන් වන විශ්වවිද්‍යාල (සංශෝධන) පනත් කෙටුම්පතෙන් අදාළ පනතේ වගන්ති කිහිපයක් තමයි සංශෝධනය කරන්න බලාපොරොත්තු වන්නේ. විශේෂයෙන් විශ්වවිද්‍යාල පද්ධතිය තුළ යහපත් ආණ්ඩුකරණය සඳහා වැදගත් වන වගන්ති කිහිපයක් තමයි මෙයින් සංශෝධනයට ලක් වන්නේ. දැන් පවතින ක්‍රමවේදය අනුව අධ්‍යයන අංශවල අංශාධිපතිවරුන් පත් කරන්නේ උපකුලපතිවරයා විසින්. නමුත්, ඒ පිළිබඳ නිශ්චිත ක්‍රමවේදයක් සඳහන් වන්නේ නැහැ. ඒ නිසා සමහර සිදුවීම් වාර්තා වෙනවා. තමන්ගේ අභිමතය පරිදි අංශාධිපතිවරුන් පත් කිරීමත් එක්ක ඇති වෙලා තිබෙන ගැටලු කිහිපයක් සම්බන්ධයෙන් පසුගිය කාලවල වාර්තා වෙලා තිබෙනවා. මේ පනත සංශෝධනය මඟින් බලාපොරොත්තු වෙනවා, අන්න ඒ අංශාධිපතිවරුන් පත් කිරීම සඳහා නිශ්චිත ක්‍රියාවලියක් හඳුන්වලා දෙන්න. මේ ක්‍රමයෙන් ජ්‍යෙෂ්ඨ මහාචාර්යවරයාගේ සිට අනුපිළිවෙළින් ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය - II තනතුර දක්වා වන අය අංශාධිපතිවරුන් ලෙස පත් කිරීම සඳහා නිශ්චිත ක්‍රියාවලියක් හඳුන්වා දෙන්න බලාපොරොත්තු වෙනවා. මේක ක්‍රියාත්මක වුණාට පස්සේ අභිමතව තිබෙන බලය -උපකුලපතිවරුන්ට තිබෙන අභිමතානුසාරී බලය - වෙනුවට නිශ්චිත ක්‍රමවේදයක් යටතේ ජ්‍යෙෂ්ඨත්වය මත පදනම් වෙමින් අධ්‍යයන අංශවල අංශාධිපතිවරුන් පත් කිරීම සඳහා ක්‍රමවේදයක් සකස් කරන්න පුළුවන්. ඒ වාගේම, ඒ පත් කිරීම එක වරකට සීමා කරනවා. එම තනතුරට එක දිගට පත් වෙන්න පුළුවන්කමක් නැහැ. ඒකට නිශ්චිත ක්‍රමවේදයක් තිබෙනවා. බොහෝ වෙලාවට මේ හරහා වාර්තා වන සිදුවීම් තිබෙනවා. සමහර අංශ ප්‍රධානීන් වසර තුනේ වාර සීමාවන් තුළ දිගු කාලයක් තිස්සේ රැඳී සිටීම නිසා එක පැත්තකින් තරුණ ආචාර්යවරුන්ට අලුත් අදහස් සමඟ අධ්‍යයන අංශයට දායකත්වය ලබා දෙන්න - contribute කරන්න - තිබෙන අවස්ථාව මඟ හැරෙනවා කියන එක පිළිබඳව චෝදනාවකුත් තිබුණා. ඒ වාගේම, දැනට තිබෙන ප්‍රතිපාදන අනුව උපකුලපතිවරයාට පුළුවන්, අංශ ප්‍රධානියා ඉවත් කරන්න. නමුත්,

මේ කෙරෙන සංශෝධනය මඟින් උපකුලපතිවරයාගෙන් කෙරෙන නිර්දේශයක් මත පාලක සභාවට තමයි අංශ ප්‍රධානියා ඉවත් කිරීමේ බලය ලැබෙන්නේ. එතකොට පාලක සභාවට ඒ පිළිබඳව උපකුලපතිවරයා ඉදිරිපත් කරන කරුණු සැලකිල්ලට ගනිමින්, නිවැරදි ක්‍රමවේද අනුගමනය කරමින් පරීක්ෂණයක් පවත්වා අංශාධිපතිවරයා ඉවත් කිරීමේ කටයුත්ත කරන්න පුළුවන් කියන ස්ථාවරය මෙතැනදී ලැබෙනවා.

විශේෂයෙන් මේ කාරණයත් මම සඳහන් කරන්න ඕනෑ. මෙහි වැදගත් වන දේ තමයි, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නිශ්චිතව දක්වනු ලැබිය හැකි නිශ්චිත කාර්ය පටිපාටියකට අනුකූලව පාලක සභාව විසින් මේ ක්‍රියාමාර්ග ගන්න ඕනෑය කියන එක. ඒ වාගේම, මේ පනත් සංශෝධනයේ තවත් වැදගත් කාරණයක් තිබෙනවා. පීඨාධිපතිවරණය හරහා ඒ, ඒ පීඨයේ අධ්‍යයන අංශවල ඉන්න අංශ ප්‍රධානීන් අතුරින් තමයි පීඨාධිපතිවරයා පත් කිරීම සිදු කරනු ලබන්නේ. නමුත්, සාමාන්‍යයෙන් අපි දන්නා විධියට කෙනෙකුට තර්කයක් ගෙනෙන්න පුළුවන්, උපකුලපතිවරයා විසින් අධ්‍යයන අංශයේ අංශාධිපතිවරයා පත් කරන නිසා ඔහුගේ අභිමතය අනුව එන කණ්ඩායමක කෙනෙකුට තමයි ඊළඟට පීඨාධිපති හැටියට පත් වෙන්න අවස්ථාව දෙන්නේ කියලා. මොකද, අධ්‍යයන අංශයේ ඉන්න සීමිත පිරිසක් වන එම අධ්‍යයන අංශයේ ප්‍රධානීන්ට පමණයි ඒ සඳහා අවස්ථාව ලැබෙන්නේ. නමුත්, මේ පනත් සංශෝධනය මඟින් ඒ සඳහා වඩාත් පුළුල්, ප්‍රජාතන්ත්‍රවාදී ඉඩකඩක් සපයනවා. ඒ කොහොමද? මේ අනුව ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය - I ශ්‍රේණිය සිට ජ්‍යෙෂ්ඨ මහාචාර්ය දක්වා ඉන්න අධ්‍යයන අංශයේ සියලු අධ්‍යයන කාර්ය මණ්ඩලයට එම පීඨාධිපතිවරණය සඳහා වූ ඒ නිලවරණයට ඉදිරිපත් වෙන්න අවස්ථාව ලැබෙනවා. ඒ අනුව අධ්‍යයන අංශ ප්‍රධානීන්ට විතරක් සීමා වෙච්ච පීඨාධිපතිවරණය පීඨය තුළ ඉන්න මහාචාර්යවරයාගේ ඉඳලා ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයා දක්වා වන සියලු අධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා විවර වෙනවා.

ගරු කථානායකතුමනි, යහපත් ආණ්ඩුකරණයක් පිළිබඳව විශේෂයෙන් විශ්වවිද්‍යාල පද්ධතිය තුළ කෙරෙන සාකච්ඡාවේදී කාලයක් තිස්සේ මේ සංශෝධන පිළිබඳ අවශ්‍යතාව තිබුණා. මට මතකයි, 2012දී විශ්වවිද්‍යාල ආචාර්ය සමිති සම්මේලනය ගත් ක්‍රියාමාර්ගවලින් පසුව ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල පද්ධතියේ යහපත් ආණ්ඩුකරණය ඇති කරන්න ගත යුතු ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් කොළඹ විශ්වවිද්‍යාලයේදී වැඩමුළුවක් පැවැත්වුණු බව. අන්න ඒ වැඩමුළුවේදීත් සාකච්ඡාවට බඳුන් වුණු කරුණු ඇතුළත් කරලා තමයි මේ පනතට අවශ්‍ය සංශෝධන ගෙනැල්ලා තිබෙන්නේ.

ඒ වාගේම මම මේ වෙලාවේදී මෙම කාරණයත් අවධාරණය කරන්න කැමැතියි. සාමාන්‍යයෙන් විශ්වවිද්‍යාල ආචාර්ය සමිති සම්මේලනය තමයි ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල පද්ධතියේ අධ්‍යයන කාර්ය මණ්ඩලය නියෝජනය කරන්නේ. එය කිසිම දේශපාලන පක්ෂයකට හෝ වෙනත් කිසිම තැනකට අනුගත වෙන්නේ නැතුව ස්වාධීනව පත් වන, ඒ ඒ පීඨවල තිබෙන වෘත්තීය සමිති හැටියට එන අයගෙන් පත් වෙලා හැදෙන federation එකක්. මේ පනත සම්බන්ධයෙන් FUTA එක ඉදිරිපත් කරන කරුණු මේ වෙලාවේ මම ප්‍රකාශයට පත් කරන්න කැමැතියි. In their letter dated 21st January, 2026, they say, I quote:

> "The proposed amendments introduce several progressive features, including the broadening of eligibility criteria for appointment to the post of Dean of Faculty by removing the requirement of being a siting Head of Department, the introduction of term limits for Deans and Heads of Departments (HoDs), and the facilitation of cross-disciplinary appointments. These measures clearly indicate the general intention of the amendments, and FUTA welcomes these positive directions."

Sir, I emphasize the words "FUTA welcomes these positive directions."

විශ්වවිද්‍යාල පද්ධතියේ බහුතරයක් අධ්‍යයන අංශ නියෝජනය කරන FUTA එක මේක progressive direction එකක් හැටියට, ප්‍රගතිගාමී පියවරක් හැටියට දකිනවා. හැබැයි, unconditional නොවෙයි. එහි තවදුරටත් සඳහන් වෙනවා, I quote:

> "FUTA is prepared to give its consent to proceed with the proposed amendments to the Universities Act, subject to the incorporation and due consideration of the key changes and safeguards proposed by FUTA."

ඔවුන් විස්තර කරනවා, මේ සංශෝධන ක්‍රියාත්මක වනවාත් එක්කම විශේෂයෙන්ම අවධානයට ලක් කළ යුතු කරුණු කිහිපයක්. මොකද, අපි දන්නවා පීඨාධිපතිවරයා පත් වන්නේ Faculty Board එකේ, පීඨයේ ඡන්දයෙන් බව. පීඨයේ ඡන්දයෙන් පත් වන පීඨාධිපතිවරයා පීඨයේ බහුතරයකගේ එකඟතාව නැතුව පාලක සභාව විසින් ඉවත් කරනවා කියන කාරණය ගත්තොත්, ඒ තුළ අර පරමාධිපත්‍ය බලය, පීඨයේ ඉන්නා ඒ academicsලාගේ තිබෙන පරමාධිපත්‍ය බලය කිසියම් අභියෝගයකට ලක් කිරීමක් තිබෙනවා. හැබැයි, පනතේ අදාළ වගන්ති මේ විධියට සංශෝධනය වනකොට, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවට - UGC එකට - පුළුවන්, ඊට අදාළ ක්‍රියා පටිපාටිය නිශ්චිතව සඳහන් කරන්න. එතකොට පීඨාධිපතිවරයා පාලක සභාවෙන් ඉවත් කරනවා නම්, ඒ සඳහා ගත යුතු, අනුගමනය කළ යුතු ක්‍රියාදාමයන් මොනවාද? උදාහරණයක් හැටියට ගත්තොත්, පීඨයේ බහුතරයකගේ ඉල්ලීමක් මත විශේෂ පීඨ සභාවක් කැඳවා, එම පීඨ සභාවේ තුනෙන් දෙකක අනුමැතිය අරගෙන, පීඨ සභාවේ නිර්දේශය පාලක සභාවට යොමු කිරීම වාගේ, අනුගමනය කළ යුතු නිශ්චිත පටිපාටි මොනවාද කියා හඳුන්වා දීමට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවට පුළුවන්කම ලැබෙනවා.

ඒ වාගේම අංශාධිපතිවරයා පත් කිරීමේදී ජ්‍යෙෂ්ඨත්වය මත තමයි එය සිදු කෙරෙන්නේ. කිහිප දෙනෙක් එකම තනතුරේ ජ්‍යෙෂ්ඨත්වයේ ඉන්නා සමහර අවස්ථා තිබෙන්න පුළුවන්. එවන් අවස්ථාවක ජ්‍යෙෂ්ඨත්වය තීරණය කරන්නේ කොහොමද? උදාහරණයක් හැටියට, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I කියන තනතුරේ කිහිප දෙනෙක් ඉන්නවා නම්, එම පුද්ගලයාගේ ප්‍රමුඛතාවය, ජ්‍යෙෂ්ඨත්වය තීරණය කරන්න පුළුවන්, එම පුද්ගලයා ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I කියන තනතුරට පත්වීම ලබපු දිනය අනුව. ඒ වාගේම එකම තනතුරට එකම දිනයේ පත් වුණු දෙදෙනෙක් ඉන්නවා නම්, ජ්‍යෙෂ්ඨත්වයට අමතරව ඔවුන්ගේ අධ්‍යයන විශිෂ්ටතා, පර්යේෂණ කටයුතු, ඉගැන්වීමේ කටයුතු වාගේම එම කාලය තුළ විශ්වවිද්‍යාල පද්ධතිය තුළ හොබවපු විවිධ තනතුරු ආදිය සැලකිල්ලට අරගෙන එම කටයුත්ත කරන්න පුළුවන්. කොහොම වුණත්, මේ සංශෝධන මඟින් විශ්වවිද්‍යාල පද්ධතියේ වඩාත් පුළුල්, ඒ වාගේම ප්‍රජාතන්ත්‍රවාදී අවකාශයක් නිර්මාණය වෙනවා කියලා අපි හිතනවා.

අපි මේ විධියට හිතනවා වාගේම, විශේෂයෙන්ම විශ්වවිද්‍යාල පද්ධතිය තුළ සිටින විවිධ අයත් මේ පිළිබඳව ධනාත්මක ප්‍රතිචාර දක්වා තිබෙනවා. මම ඒකට උදාහරණයක් දක්වන්නම්. ආචාර්ය සම්පත් රාජපක්ෂ කියන්නේ කැලණිය විශ්වවිද්‍යාලයේ සිටින ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයෙක්. මම හිතන විධියට ඔහු විපක්ෂයේ ඉදිරිපෙළ කණ්ඩායමේ ඉන්නා අයත් එක්ක බොහොම සහයෝගයෙන් වැඩ කටයුතු කරනවා. ඔහු අපේත් මිත්‍රයෙක්. ඔහු Facebook සටහනක මෙසේ සඳහන් කර තිබෙනවා.

"ඒක තීරණාත්මක ප්‍රතිසංස්කරණයක්. කාලීන සීමාවන් නායකත්වය පෞද්ගලීකරණය නොවන බව සහතික කරනවා. නැවුම් අදහස්, නැවුම් ප්‍රමුඛතා, නැවුම් වගවීම, ඇතැම් පීඨවලට පීඩා කර ඇති 'ජීවිතයේ පීඨාධිපති' සින්ඩ්‍රෝමය වළක්වනවා.

[ගරු අනුර කරුණාතිලක මහතා]

අධ්‍යයන නිදහස සඳහා ව්‍යවස්ථාපිත ආරක්ෂාව වන්නේ වාර සීමාවන්ය. ආයතනය කිසි විටෙකත් කිසිදු පුද්ගලයෙකුගේ දේපළක් බවට පත් නොවන බව එම ආයතන සහතික කළ යුතුයි.

මෙම සංශෝධනය ශ්‍රී ලංකාවේ උසස් අධ්‍යාපන ප්‍රතිසංස්කරණ සම්බන්ධයෙන් පුළුල් පණිවුඩයක් ලබා දෙනවා.

එයින් හැඟවෙන්නේ, අපි අවසානයේ දැඩි සත්‍යයක් පිළිගන්නා බවයි; ප්‍රජාතන්ත්‍ර විරෝධී ආයතන තුළ ප්‍රජාතන්ත්‍රවාදී පුරවැසියන් බිහි කළ නොහැක. විශ්වවිද්‍යාල විවේචනාත්මක චින්තනය උගන්වන නමුත් මධ්‍යකාලීන සංසද මෙන් ක්‍රියාත්මක වන්නේ නම්, කුහකකම ස්ථාවර වෙනවා.

නායකත්ව ව්‍යුහයන් ප්‍රජාතන්ත්‍රීකරණය කිරීමෙන්, මේ සංශෝධනය මඟින් විශ්වවිද්‍යාල පාලනය විශ්වවිද්‍යාල මඟින් මූර්තිමත් කළ යුතු බුද්ධිමය වටිනාකම් සමඟ පෙළගස්වනවා. අධිකාරිය උරුම කර ගත යුතු නොවේ, උපයා ගත යුතුය; නායකත්වය යනු සේවයක් මිස හිමිකමක් නොවේ."

විශ්වවිද්‍යාල පද්ධතිය තුළ ඉන්න බහුතරයක් මේ යෝජනා වන පනත් සංශෝධනය සමඟ එකඟයි කියන එක තමයි මේ තුළින් අපට පෙනෙන්නේ. මම ඔහුගේ ෆේස්බුක් සටහනෙන් තවත් එක කරුණක් උපුටා දක්වන්නම්.

"පළමුව, බලයේ සංකේන්ද්‍රණය අඩු කිරීම. නායකත්ව තනතුරු සඳහා වැඩි පිරිසකට තරග කළ හැකි නම්, තරගකාරිත්වය වැඩි කර ඒකාධිකාරයන් දුර්වල කරනවා, නායකත්වයේ ඒකාධිකාරය දූෂණයට තෝතැන්නක් වෙනවා. කුඩා කණ්ඩායමකට පමණක් නැඟී සිටිය හැකි විට ඔවුන් එකිනෙකා ආරක්ෂා කරනවා."

ඒ ආකාරයෙන් ඔහු සඳහන් කරනවා, මේ පනත සංශෝධනයේ වැදගත්කම. ඒ ඔහු අදහස් ප්‍රකාශ කරලා තිබුණේ ඇත්තටම, පීඨාධිපතිවරු පත් කර ගැනීම සඳහා ඒ පීඨය තුළ ඉන්න ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I මට්ටමේ ඉඳලා ජ්‍යෙෂ්ඨ මහාචාර්ය දක්වා අවකාශය සැලසීමෙන් වඩා පුළුල් ප්‍රජාතන්ත්‍රවාදයක් ඒ පීඨය තුළ ක්‍රියාත්මක වෙන්න අවස්ථාව ලැබෙන්නේ කොහොමද යන්න සම්බන්ධවයි.

ඒ වාගේම ගරු කථානායකතුමනි, අංශාධිපතිවරු පත් කිරීම පිළිබඳවත් මේ පනතේ සඳහන් වන බව මම පැවසුවා. ඇයි, මෙහෙම අවශ්‍යතාවක් පැන නැඟිලා තිබෙන්නේ? මම මේ කියන දේවල් සාමාන්‍යයෙන් විශ්වවිද්‍යාල පද්ධතිය තුළ පුළුල්ව සිදු වෙනවාය කියලා මම අදහස් කරන්නේ නැහැ. හැබැයි, සමහර හුදෙකලා සිද්ධීන් සිදුවීම සඳහා අවකාශ සැලසෙන විධියට තමයි පැරණි පනත තිබෙන්නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Hon. Minister, you have two more minutes.

**ගරු අනුර කරුණාතිලක මහතා**
(மாண்புமிகு அனுர கருணாதிலக்க)
(The Hon. Anura Karunathilaka)
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ පාලි හා බෞද්ධ අධ්‍යයන අංශයේ මහාචාර්ය ස්වාමීන් වහන්සේනමක් විසින් එවපු ලිපියක උපුටනයක් මම සඳහන් කරන්න කැමැතියි. පාලි හා බෞද්ධ අධ්‍යයන අංශයේ අංශාධිපති ධූරය සම්බන්ධව මතුව ඇති ගැටලුව මුල් කරගෙන යවපු එම ලිපිය අවසානයේ උන්වහන්සේ ඉල්ලීමක් කරනවා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙන් සහ උසස් අධ්‍යාපන ඇමතිවරයාගෙන්, සෑමදෙනාටම අංශ ප්‍රධාන තනතුරට පත්වීමට අවස්ථාව සැලසෙන පරිදි ජ්‍යෙෂ්ඨත්වයට ගරු කරමින් කටයුතු කරන ලෙස. උන්වහන්සේ ඉල්ලන අන්න ඒ ප්‍රතිපාදන තමයි ඇත්ත වශයෙන්ම මේ පනතින් අපි ලබා දෙන්න බලාපොරොත්තු වෙන්නේ, ගරු කථානායකතුමනි.

මම තවත් සිදුවීම් දෙකක් පිළිබඳව ප්‍රකාශ කරලා කථාව අවසන් කරන්නම්, ගරු කථානායකතුමනි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Hon. Minister, you get two additional minutes.

**ගරු අනුර කරුණාතිලක මහතා**
(மாண்புமிகு அனுர கருணாதிலக்க)
(The Hon. Anura Karunathilaka)
බොහොම ස්තුතියි, ගරු කථානායකතුමනි.

කැලණිය විශ්වවිද්‍යාලයේ සමාජීය විද්‍යා පීඨයේ ජාත්‍යන්තර අධ්‍යයන අංශයේ අංශාධිපති තනතුරට පත් කිරීම පිළිබඳව මානව හිමිකම් කොමිසමට පැමිණිල්ලක් ලැබුණා. ඒ පැමිණිල්ල විභාග කරලා, අවසානයේදී ඒ කොමිෂන් සභාව තීරණයක් ලබා දීලා තිබෙනවා. ඒ තීරණයේ අවසාන වශයෙන් සඳහන් වෙනවා, පැමිණිලිකරුට එරෙහිව වෙනස්කොට සැලකීම මඟින් අසාධාරණයක් සිද්ධ වෙලා තිබෙනවාය කියලා, ඒ අංශ ප්‍රධානියා පත් කිරීම සම්බන්ධයෙන්. ජ්‍යෙෂ්ඨත්වය නොසලකා ඒ අදාළ අංශ ප්‍රධානියා පත් කිරීම මඟින් ඔහුට අසාධාරණයක් සිද්ධ වෙලා තිබෙනවාය කියන එක තමයි එතැනදීත් සඳහන් වෙන්නේ. ඒ වාගේම තවත් එක උදාහරණයක් තිබෙනවා.

ඒ තමයි, පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ කෘෂිකර්ම පීඨයේ අංශ ප්‍රධානියා පත් කළ ක්‍රියාවලිය. පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ කෘෂිකර්ම පීඨයේ, ආහාර විද්‍යා සහ තාක්ෂණය දෙපාර්තමේන්තුවේ අංශ ප්‍රධානියා පත් කිරීම සම්බන්ධයෙන් ලැබුණු පැමිණිල්ලක් පරීක්ෂා කරන්න විශ්‍රාම ලත් මහාධිකරණ විනිසුරුවරයෙකු යටතේ පරීක්ෂණයක් සිදු කරනවා. එම පරීක්ෂණයේ අවසන් නිගමනය මම කියන්න කැමැතියි. එම නිගමනයේ සඳහන් වනවා, “The Vice Chancellor is empowered only to nominate a candidate for the post of Head of the Department. However, the final appointment must be fully approved by the University Council. In this instance, no such nomination was tabled for the Council’s consideration or approval during the Council’s meeting held in August, 2025. This omission is a serious breach of governance, protocols and a danger to the due process." යනුවෙන්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Hon. Minister, your time is over.

**ගරු අනුර කරුණාතිලක මහතා**
(மாண்புமிகு அனுர கருணாதிலக்க)
(The Hon. Anura Karunathilaka)
මම ඉක්මනින් කථාව අවසන් කරන්නම්, ගරු කථානායකතුමනි.

මෙහි තවදුරටත් සඳහන් වෙනවා, "Not only that, the appointed individual has a well-documented history of a series of misconducts including a formal inquiry, where he was found guilty of 10 out of 11 charges relating to intentional examination offences" යනුවෙන්. මෙන්න මේ වාගේ දේවල් නොසලකා හැරලා අංශාධිපතිවරුන් පත් කිරීම සඳහා අභිමතානුසාරි බලයක් උපකුලපතිවරුන්ට ලැබෙන නිසා විශ්වවිද්‍යාලයක පැවතිය යුතු යහපත් ආණ්ඩුකරණයේ ගති ලක්ෂණ මහ හැරෙනවා. එම නිසා තමයි මෙවැනි සංශෝධනයක අවශ්‍යතාව තිබෙන්නේ. ගරු කථානායකතුමනි, මම ඉක්මනින් කථාව අවසාන කරන්නම්.

කෙනෙකු තර්කයක් ගෙනෙන්න පුළුවන්, "අවුරුදු 46කට කලින් තමයි විශ්වවිද්‍යාල පනත ඉදිරිපත් වෙලා තිබෙන්නේ. එයට වරින් වර සංශෝධන ගෙනැල්ලා තිබෙනවා. ඇයි, මේ වගන්ති කිහිපයක් විතරක් සංශෝධනයට ලක් කරන්නේ?" කියලා. මම පැහැදිලි කළා වාගේ, ඒවා විශ්වවිද්‍යාල පද්ධතිය විසින් ඉල්ලා සිටින, සංශෝධනය විය යුතු වගන්ති. ඒවා අත්‍යවශ්‍ය සංශෝධන. අපි දැන් අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ක්‍රියාවලියක් ගැන කථා කරමින් ඉන්නවා. එය සාමාන්‍ය අධ්‍යාපනයට විතරක් සීමා විය යුතු දෙයක් නොවෙයි. අපි උසස් අධ්‍යාපන පද්ධතිය සඳහාත් අවශ්‍ය ප්‍රතිසංස්කරණ මේ රටේ අදාළ පාර්ශ්ව සහ මහ ජනතාව අතර සංවාදයකින් පසුව ඉතා ඉක්මනින් ගෙනෙන්න කටයුතු කරනවා. උසස් අධ්‍යාපන පද්ධතිය සඳහා ප්‍රතිසංස්කරණ ගෙනෙන කොට, උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයේ ප්‍රතිසංස්කරණ ක්‍රියාවලිය පවත්වාගෙන යැම සඳහා විශ්වවිද්‍යාල පනතත් සම්පූර්ණයෙන්ම සංශෝධනය කිරීමට අපි බලාපොරොත්තු වෙනවා. ඒ හරහා විශ්වවිද්‍යාල පද්ධතිය තුළ යහපත් ආණ්ඩුකරණයක් ඇති කිරීම සඳහා අප පියවර ගන්නවා කියන එකත් සඳහන් කරමින්, මම නිහඬ වෙනවා.

මට වෙලාව ලබා දුන්නාට ඔබතුමාට බෙහෙවින්ම ස්තුතියි.

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

The Hon. (Dr.) Kavinda Heshan Jayawardhana. You have ten minutes.

Order, please! The Hon. Deputy Speaker will now take the Chair.

***අනතුරුව ගරු කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කථානායකතුමා [ගරු (වෛද්‍ය) රිස්වි සාලි මහතා] මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு சபாநாயகர் அவர்கள் அக்கிராசனத்திலிருந்து அகலவே, பிரதிச் சபாநாயகர் அவர்கள் [மாண்புமிகு (வைத்தியர்) ரிஸ்வி சாலி] தலைமை வகித்தார்கள்.*

*Whereupon THE HON. SPEAKER left the Chair, and DEPUTY SPEAKER [THE HON. (DR.) RIZVIE SALIH] took the Chair.*

[පූ.භා. 11.37]

**ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා**
(மாண்புமிகு (வைத்தியர்) கவிந்த ஹேஷான் ஜயவர்தன)
(The Hon. (Dr.) Kavinda Heshan Jayawardhana)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ රටේ සුවහසක් රෝගීන් සුවපත් කළ වෛද්‍යවරයෙකු හැටියට ඔබතුමා විශේෂයෙන්ම දන්නවා අධ්‍යාපනයේ තිබෙන වටිනාකම. අපි දන්නවා, මේ රටේ දෙමව්පියන්ට තමන්ගේ දරුවන්ට දෙන්න පුළුවන් ඉහළම වස්තුව, හොඳ අධ්‍යාපනයක් ලබා දීම බව. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ලෝකය ජය ගන්න පුළුවන්, අධ්‍යාපනය තුළින්. මේ රටේ මේ තත්පරයේත්, මේ මොහොතේත් අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ගැන කථා කරනවා. විශේෂයෙන්ම එවැනි මොහොතක තමයි විශ්වවිද්‍යාල පනතට ගෙන ආ සංශෝධන පිළිබඳව අද දිනයේ අප මේ විවාද කරන්නේ. මෙහිදී අපට තිබෙන ගැටලුව බවට පත් වන්නේ, ආණ්ඩුව කටයුතු කරන්නේ විශ්වවිද්‍යාල පද්ධතිය දේශපාලනීකරණය කරන්නද කියන එකයි. ඒ සාධාරණ සැකය අපට එනවා. මේ රටේ විශ්වවිද්‍යාල පද්ධතිය ආරක්ෂා කරගෙන, දරුවන්ට නිර්දේශපාලනීකරණය වුණු විශ්වවිද්‍යාල පද්ධතියක ඉගෙන ගැනීමේ, උසස් අධ්‍යාපනය ලැබීමේ අවකාශය, අවස්ථාව ලබා දීමේ වගකීම අපට තිබෙනවා.

එහෙම තිබියදී මේ ආණ්ඩුව අද මොකක්ද කරන්න යන්නේ කියන සාධාරණ සැකය අපට ඇති වෙනවා. මේ කියපු පීඨාධිපති පත් කිරීම, අංශාධිපති පත් කිරීම, පීඨාධිපති හා අංශාධිපති ඉවත් කිරීම සහ කාල සීමා පැනවීම යන සියලු කාරණා මේ පාලක සභාවටත්, විශ්වවිද්‍යාලයේ උපකුලපතිවරයාටත් පැවරෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මේ පාලක සභාවට විශේෂයෙන්ම non-academicsලා, එහෙම නැත්නම් අධ්‍යාපන ක්ෂේත්‍රයෙන් පිට කණ්ඩායම්, ඇතුළත් කිරීම තුළින් ඒ අය යම් ආකාරයේ දේශපාලනීකරණයකට පත්වීම දකින්න පුළුවන් කියන පූර්ව නිගමනයට එන්න අපට සිදු වෙනවා. මා එහෙම කියන්නේ මොකද, ගරු නියෝජ්‍ය කථානායකතුමනි? විශේෂයෙන්ම උපකුලපතිවරයා පත් කරන කටයුතු සිදු වන්නේ ගරු ජනාධිපතිවරයා හරහායි. ඒ වාගේම, එහිදී අපට දකින්න තිබෙන පැහැදිලි කාරණයක් තමයි මේ වෙලාවේ මේ රටේ සියලුම ආයතන දේශපාලනීකරණය වෙමින් පැවතීම. උදාහරණයකට ගත්තොත්, විගණකාධිපතිවරයා පත් කරන්න මෙච්චර තටමන්නේ දේශපාලන පසුබිමක් තිබෙන පුද්ගලයෙක් පත් කර ගන්නයි කියන කාරණය අද මේ රටේ ඉන්න කුඩා දරුවෙකුට වුණත් පැහැදිලි වෙලා තිබෙනවා. එවන් මොහොතක උපකුලපතිවරුන් පත් කරන්න අවශ්‍ය කරන කටයුතු ක්‍රියාත්මක වන්නේත් ඒ ආකාරයටම තමයි. එවැනි තත්ත්වයකදී මේ පාලක සභාවට බලය ලැබුණාම; ඒකට අවශ්‍ය කරන නිලධාරීන් දේශපාලනීකරණය වුණාම; සමස්ත විශ්වවිද්‍යාල පද්ධතියම දේශපාලනීකරණය වීමේ ප්‍රවණතාවක් තිබෙනවා කියන අනතුරු ඇඟවීම අපි සිදු කරනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

අපි දැක්කා, ඉතිහාසයේ පාසල් ගිය, විශ්වවිද්‍යාලයට ගිය දරුවන් දේශපාලනීකරණයට ලක් වුණේ කොහොමද කියලා. නවක වදය ලබා දීලා, ඒ හරහා පන්ති භේදයක් ගොඩනැඟුවා. පළමු වසරට ඇතුළත් වන ගැහැනු ළමයින්ට චීත්ත රෙද්දෙන් ගවුම් ඇඳගෙන එන්න කියලා තිබෙනවා; පිරිමි ළමයින්ට සෙරෙප්පු දාගෙන එන්න කියලා තිබෙනවා. සමහර දරුවන් ඒ නවක වදය නිසා මරණයට පත් වුණා. සමහර අය දිවි නසාගත්තා. ඒ දේශපාලනීකරණය වෙච්ච විශ්වවිද්‍යාල පද්ධතිය සහ උසස් අධ්‍යාපනය අපි දැක තිබෙනවා. අප ඒකයි කියන්නේ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මේ ආණ්ඩුව පැමිණීමත් එක්ක මේ රටේ සමස්ත යන්ත්‍රණයම එක්තරා විධියකට දේශපාලනීකරණය කිරීමේ ක්‍රියාවලියක නියැළෙනවා අපි දැක්කා. ජාතික අධ්‍යාපන කොමිසමේ සාමාජිකයන් 12දෙනෙකු ඉන්න ඕනෑ. ඒ අය අතරින් 8දෙනෙක්ම දේශපාලන පත් කිරීම් කියන චෝදනාව අද පැහැදිලිව එල්ල වී තිබෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඒ වාගේම, ජාතික අධ්‍යාපන ආයතනය අද බින්දුවට වැටිලා තිබෙනවා.

අධ්‍යාපනය පිළිබඳව කථා කරන කොට, විශේෂයෙන්ම මේ රටේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ පිළිබඳව අපට කථා නොකරම බැහැ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. අද එක් පැත්තකින්

[ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා]

අධ්‍යාපනය දේශපාලනීකරණය කරන්න උත්සාහ ගන්නවා. අනික් පැත්තෙන් පොලීසියට, ගරු අධිකරණයට අත ගහනවා. ඒ වාගේම, අද නීතිපතිවරයාට දේශපාලන බලපෑම් එල්ල වෙමින් පවතිනවා. මේ රටේ ඉතිහාසයේ අපි දැකපු නැති ආකාරයට, දේශපාලන අත පෙවීම්, ඇඟිලි ගැසීම් සිදු වෙමින් පවතිනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ විතරක් නොවෙයි, දැන් මේ ආණ්ඩුව හැම දෙයක්ම reverse කර ගන්නවා අපි දකිනවා. මේ අය ශාරීරික දඬුවම් පිළිබඳව නීතියක්, සංශෝධනයක් ගෙන ආවා; ඒක reverse කරගත්තා. අධ්‍යාපන ප්‍රතිසංස්කරණ පිළිබඳව වැඩ පිළිවෙළක් ගෙන ආවා; ඒක reverse කර ගත්තා. ඒ වාගේම, පාසල් පවත්වන කාලය දීර්ඝ කර ගැනීමේ වැඩ පිළිවෙළක් මේ අය යෝජනා කළා; ඒක reverse කර ගත්තා. 6 ශ්‍රේණියේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ යටතේ පෙළ පොතට අසභ්‍යකරණය ඇතුළත් කරලා, අන්තිමට ඒකත් reverse කර ගන්න සිදු වුණා. ශ්‍රීමත් ජෝන් කොතලාවල රාජ්‍ය ආරක්ෂක විශ්වවිද්‍යාලයට ලාංකික වෛද්‍ය සිසු දරුවන් ඇතුළත් කර ගැනීම වළක්වා කටයුතු යොදා තිබුණා, ඒක reverse කර ගත්තා. මෙහෙම බැලුවාම මේ රටේ අධ්‍යාපන ක්ෂේත්‍රයට මේ අය ගෙනාපු තීන්දු තීරණ කීයක් අද වෙනකොට reverse කරගෙන තිබෙනවා ද?

**ගරු මනෝ ගනේසන් මහතා**
(மாண்புமிகு மனோ கணேசன்)
(The Hon. Mano Ganesan)
Reverse ආණ්ඩුවක් නේ.

**ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා**
(மாண்புமிகு (வைத்தியர்) கவிந்த ஹேஷான் ஜயவர்தன)
(The Hon. (Dr.) Kavinda Heshan Jayawardhana)
Reverse ආණ්ඩුවක්. හරියට හරි, reverse ආණ්ඩුවක්. ගරු මනෝ ගනේසන් මන්ත්‍රීතුමනි, මට තිබෙන ප්‍රශ්නය මේකයි. මේ ආණ්ඩුව reverse එකේ මේ අරගෙන යන්නේ අපේ රටේ අධ්‍යාපනය. අද කල් තියලා, මේ විවාදයත් reverse කර ගනීවිද දන්නේ නැහැ. අපේ රටේ අධ්‍යාපනය තමයි මේ ආකාරයෙන් පිටුපසට ගෙනියන්නේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමා වෛද්‍යවරයෙක් හැටියට දන්නවා, අපේ රටේ අධ්‍යාපනයට තිබෙන වටිනාකම ගැන.  මේ රටේ සියයට 90ක් සාක්ෂරතාවක් තිබෙන සමාජයක් ඉන්නේ. අවුරුදු 75කට ශාප කරලා බලය ලබා ගත්ත ආණ්ඩුවක් මේක.  නමුත් හත්දෙවියනේ, වසරක් තුළ මේ රටේ මිනිස්සුන්ගේ දරුවන්ගේ දෑස් අන්ධ කරලා ශාපයක් වෙච්ච ආණ්ඩුවක් බවට මේ ආණ්ඩුව පත්වෙලා තිබෙනවා. මේක තමයි අපට තිබෙන ප්‍රශ්නය.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ රටේ අධ්‍යාපන ක්ෂේත්‍රය ගැන කථා කරද්දී අපට තිබෙන ලොකුම සම්පත තමයි මානව සම්පත. මේ මානව සම්පත දියුණු කරලා ලෝකයට යවන්න පුළුවන් අවකාශය තිබෙන්නේ හොඳ අධ්‍යාපනයක් අපේ දරුවන්ට දුන්නොත් විතරයි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ තිබෙන අවකාශය තමයි අපේ දරුවන්ගෙන් මේ ආණ්ඩුව උදුරා ගන්නේ. 2025.11.19වැනි දා මේගොල්ලන් circular එකක් නිකුත් කරනවා, degree-awarding institutions සම්බන්ධව. It states, I quote:

> "2.3 Category III - DAIs that have not yet undergone a periodic institutional review
>
> These DAIs may propose only one new degree programme per year until their first periodic review is completed and passed."

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ circular එකේ හැටියට ගත්තොත් පෞද්ගලික විශ්වවිද්‍යාලයකට අවුරුද්දකට එක degree programme එකයි recognize කරන්න පුළුවන් වෙන්නේ. ඒ කියන්නේ, programmes 5ක් recognize කරන්න අවුරුදු 5ක් යනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, periodic review එක pass වෙච්ච universities ගැන මේ circular එකේ සඳහන්ව තිබෙන්නේ මෙහෙමයි, I quote:

> "2.1 Category 1 - DAIs that have successfully completed the periodic institutional review.
>
> DAIs in this category are eligible for recognition of up to two new degree programmes per year."

එහෙම pass වෙච්ච universitiesවලටත් අවුරුද්දකට දෙකයි දෙන්නේ. එතකොට ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒගොල්ලන් exclude කරලා තිබෙනවා, Science, Technology, Engineering and Mathematics කියලා. එතකොට අනෙක් ඒවාට මොකක්ද වෙන්නේ? මේ රටේ හැම දරුවෙකුටම රාජ්‍ය විශ්වවිද්‍යාලයකට ඇතුළත් වෙන්න බැහැ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. එතකොට මොකක්ද වෙන්නේ? "S" 3ක් සහිතව GCE A/L විභාගය පාස් වෙන හැම ළමයාටම අයිතියක් තිබෙනවා විශ්වවිද්‍යාලයකට ඇතුළත් වෙන්න. එතකොට options දෙකයි තිබෙන්නේ. එකක්, රටින් පිට යන්න ඕනෑ. මේ රටේ ඩොලර් ටික නාස්ති කරලා, ඉඩකඩම් විකුණලා, දෙමව්පියන් ණයකරුවන් බවට පත් කරලා මේ රටින් යන්න ඕනෑ. දෙවනුව මොකක්ද කරන්න තිබෙන්නේ? දෙවැනි එක තමයි, ලෝකයේ තිබෙන වෙනත් විශ්වවිද්‍යාලවලට මේ රටේ තිබෙන විශ්වවිද්‍යාල ලොකු franchise fee එකක් ගෙවලා, ඒ degrees award කරන එක. එතකොට ඒකට යන්න ඕනෑ. මේ දෙකෙන්ම රටේ විදේශ විනිමය තමයි අපට අහිමි වෙන්නේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ හරහා අපේ රටේ අහිංසක දරුවන්ගේ ඉගෙන ගැනීමේ අයිතිය නොවෙයි ද මේ අහිමි වෙන්නේ කියන ප්‍රශ්නය අපි අහනවා.

විශේෂයෙන්ම මේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ගැන කථා කරනකොට 2026 ජනවාරි 18වැනි දා "Sunday Observer" පත්තරේ ගිය article එකක් මම කියන්නම්: "Interim report on Grade Six module this week". එතකොට මේ සතියේ අද 23වැනි දා. මේ interim report එක පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරලා තිබෙනවා ද? නැහැ. ඒ විතරක් නොවෙයි, "CID to determine legal action under the Penal Code" කියලා කියනවා. දැන් මේ ආණ්ඩුවේ මන්ත්‍රීවරු ඊයේ කියනවා අපි දැක්කා, මේක එක පොතක, එක පිටුවක, එක අකුරක තිබුණු ප්‍රශ්නයක් කියලා. එහෙම නම් මේ Penal Code එක යටතේ නඩු දමන්නේ මොකටද? එහෙම නම් නීතිය ක්‍රියාත්මක කරන්නේ මොකටද?

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Kavinda  Jayawardhana, your time is up.

**ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා**
(மாண்புமிகு (வைத்தியர்) கவிந்த ஹேஷான் ஜயவர்தன)
(The Hon. (Dr.) Kavinda Heshan Jayawardhana)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙච්චර ම්ලේච්ඡ ක්‍රියාවලියක් කරපු, කුඩා දරුවන්ගේ පාසල් පොතට මේ වාගේ අසභ්‍ය website එකක් දාපු පුද්ගලයන් හෙළිදරව් කරලා නීතිය

ක්‍රියාත්මක කරන්න අද මේ ආණ්ඩුව අපොහොසත් වෙලා තිබෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ අසහායකරණයේ මහ මොළකරු අල්ලා ගන්න බැරි ආණ්ඩුව, පාස්කු ප්‍රහාරයේ මහ මොළකරු අල්ලන්නේ කොහොමද?

රටේ දරුවන්ගේ පාසලේ පළමුවෙනි පන්තිය පටන් ගන්නවා 29වෙනි දා. පාසල්වලින් සියයට 50කට computers නැහැ, smart TVs නැහැ. අපේ නායකතුමා, සජිත් ප්‍රේමදාස මහත්තයා පාසලක් පාසලක් ගාණේ ගිහින් සුහුරු පන්ති කාමර ලබා දෙනකොට අපට හිනා වුණා. අද මොකද වෙලා තිබෙන්නේ? ඒ හිනා වෙච්ච අයට අද ඇඬිලා තිබෙනවා. අද මේ රටේ දරුවන්ට ඉගෙන ගන්න අවශ්‍ය smart TVs ටික නැහැ, Internet නැහැ. ඒ වාගේම මේ ඉදිරිපත් කරලා තිබෙන අධ්‍යාපන ප්‍රතිසංස්කරණ යැයි කියා ගත්ත එකේ එක term එකක පොත් විතරයි අච්චු ගහලා තිබෙන්නේ. ගුරුවරු train කරලා තිබෙන්නේ term එකකට විතරයි. මේ රටේ දරුවෝ වෙනුවෙන් මේ ආණ්ඩුව කරන්නා වූ මේ ක්‍රියාවලිය පිළිබඳවයි අපට තිබෙන වේදනාව. ඒ නිසා අපි ගෞරවයෙන් ඉල්ලා සිටිනවා මේ ප්‍රතිසංස්කරණ හරියටම කරලා මේ රටේ දරුවන්ගේ දැස් ලෝකයට නිරාවරණය කරන්න කියලා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Kavinda Jayawardhana, would you please wind up?

**ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා**
(மாண்புமிகு (வைத்தியர்) கவிந்த ஹேஷான் ஜயவர்தன)
(The Hon. (Dr.) Kavinda Heshan Jayawardhana)
මම තව මොහොතකින් අවසන් කරනවා ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

ප්‍රංශයේ, එංගලන්තයේ, ඕස්ට්‍රේලියාවේ, යුරෝපයේ රටවල, ඇමෙරිකාවේ ෆ්ලොරිඩා වාගේ ප්‍රාන්තවල අද phone එක ඉවත් කරලා තිබෙනවා දරුවන්ගේ අධ්‍යාපනයට බාධාවක් වෙනවා කියලා. අවුරුදු 16 ළමයින්ට social media සහ ඒ වාගේ chat කරන systems ලබා දෙන්නේ නැහැ. එහෙම තිබෙද්දී අර "බඩී" දාන එකේ කිසිම තේරුමක් නැහැ කියලා මම මතක් කර දෙනවා.

ස්තුතියි.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Yes, Hon. (Dr.) Ramanathan Archchuna? Why are you on your feet?

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, நிலையியற் கட்டளை 92(2)(அ)இன்கீழ் ஒழுங்குப் பிரச்சினையொன்றை எழுப்ப விரும்புகின்றேன். இந்தப் பாராளுமன்றத்தில் பொய் சொல்வது தடைசெய்யப்பட்ட ஒன்றாகும். நேற்று காலையில் நான் 27(2)இன்கீழ் கேள்வி கேட்டபோது, கௌரவ சுகாதார அமைச்சர் அவர்கள் அக்கரைப்பற்று வைத்தியசாலையில் இருக்கின்ற வைத்திய அதிகாரியை இடமாற்றம் செய்ய மாட்டேன் எனச் சொல்லிவிட்டு, பின்னேரம் அந்த வைத்திய அதிகாரியை இடமாற்றம் செய்திருக்கிறார். நன்றி!

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
I now call upon the Hon. Nimal Palihena. You have 10 minutes.

[පූ.භා. 11.51]

**ගරු නිමල් පලිහේන මහතා**
(மாண்புமிகு நிமல் பலிஹேன)
(The Hon. Nimal Palihena)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විශ්වවිද්‍යාල අධ්‍යාපනය සුබ දිශානතියකට ගෙන යන්න රජයක් විධියට, ආණ්ඩුව විධියට අපට ලොකු වගකීමක් තිබෙනවා. උසස් පෙළ විෂය ධාරා යටතේ අධ්‍යාපනය ලබන දරුවන් විශ්වවිද්‍යාලයට එන්නේ තමන්ගේ වෘත්තීය ජීවිතය කොයි දිශානතියකින් නිම කරනවාද කියන යහපත් වූ අපේක්ෂාවකින්. ඒ සඳහා ශ්‍රී ලංකා රජය රාජ්‍ය විශ්වවිද්‍යාල 17ක් ස්ථාපිත කරලා පවත්වාගෙන යන අතර, ඒවා නියාමනය විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසම හරහා සිදු කරනවා. ඒ වාගේම රාජ්‍ය නොවන විශ්වවිද්‍යාල 17කුත් මේ අතර නියාමනය වෙමින් පවතිනවා. තවදුරටත් ඒ ක්ෂේත්‍රය හරහා උසස් අධ්‍යාපනය ලබා දෙන ආයතන නියාමනය කිරීම සඳහා වගකීමෙන් යුක්තව කටයුතු කරමින් ඉන්න මොහොතක තමයි අපි මේ විශ්වවිද්‍යාල (සංශෝධන) පනත් කෙටුම්පත අරගෙන එන්නේ.

NPP ආණ්ඩුව විධියට අපේ ප්‍රතිපත්ති ප්‍රකාශය තුළ ඉදිරියේදී ගනු ලබන ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් විශේෂ වූ කරුණු සාකච්ඡා කරනු ලැබුවා. ඒ අතර මේ විශ්වවිද්‍යාල පනතේ ප්‍රධාන වගන්ති දෙකක් සංශෝධනය පිළිබඳව තමයි අපේ අවධානය යොමු වෙන්නේ. විශ්වවිද්‍යාලයක පරිපාලනමය කටයුතු සහ අධ්‍යයන කටයුතු සම්බන්ධයෙන් ප්‍රධාන වගකීම් දරන තනතුරු දෙකක් තමයි පීඨාධිපති සහ අංශාධිපති කියන්නේ. 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 49 සහ 51වෙනි වගන්ති ඔවුන්ගේ පත් කිරීම් සඳහා අවශ්‍ය ප්‍රතිපාදන සලසා තිබෙන නමුත්, පැවති කාලය පුරාම ඒ ඔස්සේ ඇති වූ ගැටලු දරුවන්ගේ අධ්‍යයන කටයුත්තේදී, එහෙම නැත්නම් ඒ දරුවන්ගේ උපාධිය ලබා ගැනීම කියන කටයුත්තේදී යම් යම් වැරදිසහගත තත්ත්වයට සහ පීඩාකාරී තත්ත්වයට පත් වෙමින් තිබුණා. ඒ නිසා පරිපාලනමය වශයෙන්, අධ්‍යයනමය වශයෙන් සහ සිසුන් වශයෙන් යම් අපහසුතාවලට පත් වෙන අවස්ථා අපි ඉතිහාසය පුරා එමට දකිනවා. ඒ අනුව පනතේ 49වෙනි වගන්තිය සංශෝධනය කරමින් පීඨාධිපතිවරයා පත් කර ගැනීම සඳහා වන සීමා අපි පුළුල් කරලා තිබෙනවා. මෙතෙක් පැවති තත්ත්වය යටතේ මේ තනතුරු සඳහා යම් අධ්‍යයන අංශයක ප්‍රධානියෙකුට පමණයි, ඉල්ලුම් කළ හැකි වුයේ. නව සංශෝධනය අනුව එම පත් කිරීමට එම පීඨයේ සිටින අධ්‍යයන කාර්ය

[ගරු නිමල් පලිහේන මහතා]

මණ්ඩලයේ ජ්‍යෙෂ්ඨ මහාචාර්යවරයාගේ සිට ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය 1 ශ්‍රේණිය දක්වා සුදුසුකම් ලබන බව අපි වටහා ගන්න ඕනෑ. ඉතා සීමිත පිරිසකට තිබුණු අවස්ථාව පුළුල් පරාසයක් දක්වා ගෙන ගොස්, යහපත්, හැකියාව, වුවමනාව, උනන්දුව තිබෙන අයට ඒ සම්බන්ධයෙන් මැදිහත්වීමේ හැකියාව උදා කර දී තිබෙනවා. ඒ වාගේම ඔවුන්ගේ පත්වීම් කාලය පිළිබඳ ගැටලු ඉතිහාසය පුරා ඕනෑ තරම් පවතිනවා. යම් අවස්ථාවල විශ්වවිද්‍යාල තුළ පීඨාධිපතිවරයා අනාදිමත් කාලයක් තනතුරේ සිටිනකොට ඒ තනතුරෙන් අපි අපේක්ෂා කරන කාර්යය, කර්තව්‍යය ඉෂ්ට වෙන්නේ නැහැ, ගැටලු සහගත තත්ත්වයන් ඇති වෙනවා කියන එක අපි දැකලා තිබෙනවා. ඒ වාගේම තමයි තනි පුද්ගලයෙකු මත ගොනු වෙන බලය නිසාම, ඒ ආශ්‍රිතව ගොඩ නැඟෙන කණ්ඩායම් හරහා විවිධ වූ බලපෑම් සහගත තත්ත්වයන් තුළ ඒ පීඨයේ කටයුතු අකර්මණ්‍ය වෙන අවස්ථා තිබෙනවා. ඒ අනුව, මේ ලබා දුන් අවස්ථාව තුළින් වඩා යහපත් වූ, අලුත් අත්දැකීම් සහිත, නිර්මාණශීලී මිනිසුන්ට ඒ තනතුර හොබවන්න අවස්ථාව අරගෙන එන එක වඩා යහපත් තත්ත්වයක් විධියට මා දකිනවා.

ඒ වාගේම ඔහු ඉවත් කිරීම සම්බන්ධයෙන් මේ කොහේවත් කථා කරන්නේ නැහැ. මේ පනත අනුව ඒ සඳහා අවශ්‍ය බලය විශ්වවිද්‍යාලයේ පාලක සභාව වෙත දීලා තිබෙනවා. ඒ අනුව ඒ අවශ්‍ය බලය ප්‍රකාරව සුදුසු තත්ත්වයන් යටතේ සාකච්ඡා කරමින් ඔහු ඉවත් කිරීමට කටයුතු කිරීමටත්, ඒ වාගේම ඔහුගේ ධුර කාලය සම්බන්ධයෙන් නිශ්චිතව සඳහන් වෙනවා. සාමාන්‍යයෙන් වරකට අවුරුදු තුනක් බැගින් වාර දෙකක් සඳහා නිශ්චිත වශයෙන් ඔහුගේ කාලය සීමා කරලා තිබෙනවා. මේ තත්ත්වය තුළ අපි දකින්නේ, යම් විධියකට ඉතා ප්‍රජාතන්ත්‍රවාදීව මේ ආයතනය පාලනය කරන්න හැකියාව ලැබෙනවා කියන එකයි. විශේෂයෙන්ම පරිපාලන කටයුතු වාගේම අධ්‍යයන කටයුතු සම්බන්ධයෙන් විශේෂ වූ දක්ෂතා, හැකියා තිබෙන අධ්‍යයන කාර්ය මණ්ඩලයේ සුදුසුකම්ලත් සාමාජිකයන්ට ඒ සඳහා අවස්ථාව, අවකාශය ලැබීම මේ සංශෝධනය තුළ අපි දකින යහපත් ලක්ෂණයක් වෙනවා.

ඒ වාගේම විශ්වවිද්‍යාලයේ උපකුලපතිවරයාගේ පත්වීම දේශපාලනිකයි කියන අදහසක් විරුද්ධ පක්ෂයෙන් ගොඩ නැඟෙනවා. ඉතිහාසය පුරා විශ්වවිද්‍යාලවල උපකුලපතිවරුන් පත් කිරීම කරනු ලබන්නේ, විශ්වවිද්‍යාලයේ පාලක සභාව විසින් තෝරා පත් කරන සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නිර්දේශ මත ජනාධිපතිවරයා විසින්. එය ඒ විධියටම තවමත් සිද්ධ වෙන එක පිළිබඳව අපි පුදුම සහගත විය යුතු නැහැ. ඉදිරියේදී එවැනි තත්ත්වයන් සම්බන්ධව අවශ්‍ය සංශෝධන සහිතව ඉදිරිපත් කරමින්, ඒ ස්වාධීනත්වය ලබා දීමට කටයුතු කිරීම අපේ රජයේ එක් අරමුණක් වෙනවා. ඒ වාගේම විශ්වවිද්‍යාලයේ උපකුලපතිවරයා සතු බලය අනුව අංශ ප්‍රධානීන් පත් කිරීම පනතේ 51වන වගන්තියේ කියැවෙනවා. පත්වීම් බලධාරියා වන්නේ විශ්වවිද්‍යාලයේ උපකුලපති. එතකොට ඔහු කැමැති කෙනෙකුට හැරෙන්න වෙනත් කෙනෙකුට පත්වීම් ලබන්න බැහැ. මට එහෙම අත්දැකීමක් තිබෙනවා. ඒ සුදුසු නාමය තමන් මනාප නම් විතරක් අනුමත කරන අතර, අමනාප නම් ප්‍රතික්ෂේප කරන අවස්ථා ඉතිහාසය පුරා තිබිලා තිබෙනවා. ඒ නිසා අද මේ පනතේ 51වන වගන්තිය සංශෝධනය තුළින් ඒ අයිතිය පාලක සභාවට ලබා දීලා තිබෙනවා. විශ්වවිද්‍යාලයේ පාලක සභාව කියන්නේ, පරිපාලනමය සහ අධ්‍යයනමය වශයෙන් අවසාන තීන්දු තීරණ ගන්නා තැන. එතකොට පාලක සභාවේ දැනුවත්කමින් යුක්තව තමයි, ඒ පත්වීම සිද්ධ වෙන්නේ. එහිදී මේ කියන සුදුසුකම් ලත් ආචාර්යවරුන්ට, ජ්‍යෙෂ්ඨ මහාචාර්යවරයාගේ සිට ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II ශ්‍රේණිය දක්වා අයට, ඒ සඳහා ඉදිරිපත් වෙලා තමන්ගේ කුසලතා, දක්ෂතා, එහෙම නැත්නම් තමන් අත් කරගෙන තිබෙන අධ්‍යාපනික තත්ත්වයන් යටතේ ඉල්ලුම් කරලා, ඒ සඳහා අවශ්‍ය අවස්ථාව ලබා ගැනීමට මේ පනත හරහා ඉඩ සලසා තිබෙනවා.

ඒ වාගේම උසස්වීම් සඳහා වන සුදුසුකම් සම්පූර්ණ කර ගැනීමට පුළුල් පරාසයක් ඇතුළේ සියලු අධ්‍යයන කාර්ය මණ්ඩලයේ සාමාජිකයන්ට නව සංශෝධන ධනාත්මක විධියට බලපානවා කියන එකත් මේ අවස්ථාවේදී මතක් කරන්න කැමැතියි. ඒ වාගේම යම් ආකාරයකට බලහත්කාරයෙන් වැඩ කර ගැනීම, එහෙම නැත්නම් නතු කර ගැනීම කියන තත්ත්වය මේ තත්ත්වය තුළින් නිදහස් වන බව වටහා ගත යුතු වෙනවා. මොකද, උපකුලපතිවරයා සතු බලය පාලක සභාවට ලබා දීම තුළින්, උපකුලපතිවරයාට අවශ්‍ය පරිදි කටයුතු කිරීමේ හැකියාවක් ඇති වෙන්නේ නැහැ. ඒ නිසා ස්වාධීනත්වය තබා ගෙන, යම් සුදුසු අධ්‍යයන කාර්ය මණ්ඩලයේ සාමාජිකයෙකුට තම තනතුරේ වැඩ කටයුතු ඉතා ගෞරවයෙන් යුක්තව කිරීමේ හැකියාව සහ අවකාශය මේ සංශෝධනය හරහා ලබා දීලා තිබෙනවා කියන එක මම මේ අවස්ථාවේදී මේ ගරු සභාවට අවධාරණය කරන්න කැමැතියි. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ සිදුවන මේ මොහොතේ, ඇත්තටම විපක්ෂය මේ සියලු දේ දකින්නේ අර පරණ කණ්ණාඩියෙන්මයි. හැම දෙයක්ම reverse කියන කථාව තමයි කොතැනදීත් ඉස්මතු වෙන්නේ.

මෙච්චර කාලයක් අපේ රටේ අධ්‍යාපනය සීමා වෙලා තිබුණේ ඉතා කුඩා පන්තියකට. මුදල් තිබෙන කෙනාට, හැකියාව තිබෙන කෙනාට මිසක් සමස්ත ජනතාවටම අවශ්‍ය අධ්‍යාපනය ලබා ගන්න අවස්ථා තිබුණේ නැහැ. අවස්ථා ඇහිරිලායි තිබුණේ. ඒ නිසා තමයි අද අපේ රටේ පුරවැසියන් හය දෙනෙකුගෙන් එක්කෙනෙක් දිළිඳු බවට පත් වෙලා තිබෙන්නේ. අපි දරිද්‍රතාව ගැන කථා කරනවා නම්, ආර්ථික වශයෙන්, සෞඛ්‍ය වශයෙන් සහ අධ්‍යාපන වශයෙන් මේ කියන බහුමාන දරිද්‍රතාවෙන් පෙළෙන රටක් බවට අපි පත් වුණේ අධ්‍යාපනයේ තිබෙන මේ අඩුලුහුඬුකම් නිසා. රජයක් විධියට අද මේ රටේ ජනතාවට සම අවස්ථා, සම ප්‍රවේශ ලබා දෙමින් පුළුල් පරාසයක් තුළ සියලු දරුවන්ට වෘත්තීය සහ ශාස්ත්‍රීය අධ්‍යාපනය ලබා ගැනීමට අවශ්‍ය අවකාශ සැලසීමට අපි සූදානම්. ඉතින්, මේ නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණවල අඩුපාඩු ඇති. ඒවා පෙන්වා දෙන්න. ඒක වැදගත්. නමුත්, මේවා ක්‍රියාත්මක කළ යුතුයි. කොහේවත් reverse කරලා නැහැ.

අද වෙනකොට 1 වසර පන්තිවල වැඩ පටන් ගෙන මේ අලුත් සංශෝධන යටතේ ක්‍රියාත්මක වෙන අතර, අනෙකුත් කටයුතු සඳහා මේ වෙනකොට සියලු සංවිධාන තත්ත්වයන් යටතේ අදාළ මොඩියුල print කිරීම, ගුරුවරු පුහුණු කිරීම, සම්පත් සංවර්ධනය කිරීම සිදුවෙමින් පවතිනවා. ඉතින්, මේ දේවල් යහපත් විධියට දකින්න. අපි, සමාජයක ප්‍රගමනය, එහෙම නැත්නම් අභිවෘද්ධිය දිහා යහපත් විධියට බලන මිනිසුන් විධියට වැඩ කරමු. මේ නව විශ්වවිද්‍යාල පනතේ සංශෝධන අධ්‍යයන කාර්ය මණ්ඩලයට, සිසු දරුවන්ට වාගේම උපාධි අපේක්ෂකයින්ටත් යහපත් විධියට බලපානවා කියන අදහස අපි තුළ තිබෙනවා. ඒ නිසා අවශ්‍ය මැදිහත් වීම ආණ්ඩුව විධියට අපේ පැත්තෙන් දිගින් දිගටම කරනවා. මොකද, වරක් හැදූ පනතක් අදට වලංගු වුණාට හෙටට වලංගු නොවෙන්න පුළුවන්. හෙට දිනයේ යම් යම් සංශෝධන අවශ්‍ය නම්, තවදුරටත් මේවා සංවර්ධනය කරමින්, ඒ වුවමනාවන් සමඟ ගළපා ගනිමින් මේ රට අපේක්ෂා කරන තැනට ඔසවා තබන්න අවශ්‍ය මෙහෙවර කිරීමට ජාතික ජන බලවේගය ආණ්ඩුව විධියට අපි ක්‍රියා කරන බව සඳහන් කරමින්, මගේ අදහස් දැක්වීම අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Next, the Hon. Sajith Premadasa. You have seven minutes.

[අ.භා. 12.01]

**ගරු සජිත් ප්‍රේමදාස මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Sajith Premadasa - Leader of the Opposition)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විශ්වවිද්‍යාල ක්ෂේත්‍රයේ දැවැන්ත පරිවර්තනයක් ඇති කරනවා කියමින් අද මේ ක්‍රියාත්මක කරන අණ පනත්වලින් සිදු වන්නේ, ඇත්ත වශයෙන්ම එදා ජනතාවට පොරොන්දු වුණු system change එකද කියලා මම අහන්න කැමතියි. මේ අලුත් අණ පනත් හරහා පීඨාධිපතිවරු, අංශාධිපතිවරු පත් කර ගැනීමේ ක්‍රමවේදය 49වෙනි වගන්තියෙන්, 51වෙනි වගන්තියෙන් පෙන්වා දෙනවා. හැබැයි, උපකුලපතිවරු පත් කිරීමේ ක්‍රියාවලියට ඔබ අත තියන්නේ නැත්තේ ඇයි? ඔබ, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපතිවරයා සහ එම කොමිසමේ සාමාජිකයන් පත් කිරීමේ ක්‍රියාවලියට අත තියලා නැත්තේ ඇයි? විශ්වවිද්‍යාලයේ Council Membersලා පත් කිරීමේ ක්‍රියාවලියට අත තියලා නැත්තේ ඇයි? Institutesවල directorsලා පත් කිරීමේ ක්‍රියාවලියට අත තියලා නැත්තේ ඇයි? ඒවාට අත තියන්නේ නැතුව, අංශාධිපතිවරු, පීඨාධිපතිවරු පත් කිරීමේ ක්‍රියාවලිය තුළ ප්‍රජාතන්ත්‍රවාදය ක්‍රියාත්මක කිරීමක් නොවෙයි මේ කරන්නේ, ප්‍රජාතන්ත්‍රවාදය හකුළා ගැනීමක්. ඇයි මම එහෙම කියන්නේ? මම සාක්ෂි සහිතව ඉදිරිපත් කරනවා, මෙන්න මේ වාර්තාව. මොකක්ද මේ වාර්තාව? "University Governance, Autonomy and Accountability: Directions for Change". මේ, workshop එකක වාර්තාවක්. මම දන්නේ නැහැ, මේ ක්ෂේත්‍රය භාරව ඉන්න ඇමතිවරයා මේක කියවා තිබෙනවාද කියලා. මේකේ එක කර්තෘවරියක් තමයි වර්තමාන අග්‍රාමාත්‍ය, ගරු හරිනි අමරසූරිය මැතිනිය. මොකක්ද මේ වාර්තාවෙන් කියන්නේ? මේ වාර්තාවට අදාළ පිටු කිහිපයක් හැමෝගේම දැන ගැනීම පිණිස මම **සභාගත***කරනවා.

හරිනි අමරසූරිය මැතිනිය FUTA එකේ ඉන්නකොට කිව්වා, අධ්‍යාපනය ප්‍රතිසංස්කරණය කළ යුතුයි, අධ්‍යාපනයට දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 6ක් වෙන් කළ යුතුයි කියලා. ඒ ව්‍යාපාරයේ පුරෝගාමී පුද්ගලයෙක් හැටියට එතුමිය කියන්නේ මොකක්ද? එතුමිය කියනවා, උපකුලපති පත් කරන තැනේ ඉඳලා හැම දෙයක්ම නිර්දේශපාලනීකරණය විය යුතුයි කියලා. 2015දී එහෙම කියපු ගරු හරිනි මැතිනිය අද මේ රටේ අග්‍රාමාත්‍යතුමිය, උසස් අධ්‍යාපන ඇමතිතුමිය. නමුත් 2015දී කියපු දේ නොවෙයි අද ක්‍රියාත්මක කරන්නේ. මෙන්න සාක්ෂි. නොදන්නා අය මේ වාර්තාව කියවා බලන්න. 2015දී හරිනි මැතිනිය කිව්වා, උපකුලපති පත් කිරීමේ ඉඳලා හැමදේම නිර්දේශපාලනීකරණය විය යුතුයි, කුසලතාව, නිපුණතාව මත ඒවා විය යුතුයි කියලා. 2026දී අගමැතිතුමිය සහ උසස් අධ්‍යාපන අමාත්‍යතුමිය හැටියට එතුමිය කොහොමද ඒ කාරණා වෙනස් කරන්නේ? ඔිකද, ඔය පොරොන්දු වුණු system change එක? මේකද, ක්‍රමයේ වෙනස? 2015දී එක විදියකට රටට ප්‍රජාතන්ත්‍රවාදය ගැන ලොකුවට කථා කරනවා. System change ගැන කථා කරනවා. ජනාධිපතිවරණයේදීත්, මහ මැතිවරණයේදීත්, පළාත් පාලන

---

* පුස්තකාලයේ තබා ඇත.
* நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.
* *Placed in the Library.*

මැතිවරණයේදීත් මේ ඔක්කෝම දේවල් කරනවා කියලා, බලයේ ඉන්නකොට ක්‍රියාත්මක කරන්නේ විශ්වවිද්‍යාල පද්ධතිය තුළ තිබිය යුතු ඒ නිදහස, ඒ ස්වාධීනත්වය සම්පූර්ණයෙන්ම හකුළා ගැනීම; ඒ independence එක හකුළා ගැනීම. ඒ institutional autonomy එක සම්පූර්ණයෙන්ම හකුළා ගෙන තිබෙනවා. විශ්වවිද්‍යාලවල, Sir Ivor Jenningsගේ ඇතුළු පොදු රාජ්‍ය මණ්ඩලීය සංකල්ප ටික අමු අමුවේ උල්ලංඝනය කරලා තිබෙනවා. ඉතින් ඇත්තවශයෙන්ම කථික මහත්ම මහත්මීන් විවිධ දේවල් මේ සභාවේ කියන්න පුළුවන්.

මට එක දෙයක් කියන්නකෝ, හරිනි මැතිනිය එදා විශ්වවිද්‍යාල ආචාර්යවරියක් හැටියට ප්‍රජාතන්ත්‍රවාදීකරණය ගැන එක මතයක් දරන්නටත්, අද මේ අණ පනත් හරහා ඒකාධිපතිවාදය රජ කරවන්නටත් කටයුතු කිරීම කියන මේ වෙනස කොහොමද සිද්ධ වුණේ කියලා. ඒකට පොඩ්ඩක් උත්තරයක් දෙන්නකෝ. ඒක කරුණාකරලා කියන්නකෝ. මොකද, විශ්වවිද්‍යාල ක්ෂේත්‍රය තුළ සිදුවිය යුතු පරිවර්තන අද සිදු වෙන්නේ නැහැ නේ. අද ඒ සඳහා ප්‍රමාණවත් අරමුදල් ලැබෙන්නේත් නැහැ. දෙන අරමුදල් ටිකවත් හරියට වියදම් කරලා අධ්‍යාපනයේ ආයෝජනය සිද්ධ වෙන්නේත් නැහැ. සිදු විය යුතු බඳවා ගැනීම් සිද්ධ වෙන්නේත් නැහැ. හැම විශ්වවිද්‍යාලයකම අනධ්‍යයන අංශයේ ඉඳලා academic ක්ෂේත්‍රය දක්වා බරපතළ ලෙස පුරප්පාඩු තිබෙනවා. Student-teacher ratio එක - ශිෂ්‍ය-ගුරු අනුපාතය - දිගා බැලුවත්, ඒ වාගේම උපදේශන ලබා දෙන අනුපාතය දිහා බැලුවත්, බරපතළ විෂමතාවක්, ඌනතාවක් නිර්මාණය වෙලා තිබෙනවා. බුද්ධි ගලනය - brain drain - වැළැක්වීමට කිසිම වැඩ පිළිවෙළක් නැහැ. ඩිජිටල්කරණය බරපතළ ලෙස ඇනහිට තිබෙනවා. ඒ වාගේම ආයතනික නිදහස, ඒ ආයතනයේ ස්වාධීනත්වය අද විනාශ වෙලා තිබෙනවා. ශිෂ්‍ය පරපුරට අවශ්‍ය නේවාසික සම්පත් ටික නැහැ. භෞතික සම්පත් ටික නැහැ. මානව සම්පත නැහැ. ඒ අස්සේ මහා පරිවර්තනයක් සිදු වෙනවා කියලා මේ යෝජනා ඉදිරිපත් කරනවා.

අවසාන වශයෙන් මම මේ කාරණයත් කියන්න කැමැතියි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දැන් බලන්න, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව කොයි තරම් ඒකාධිපතියෙකු ලෙස ක්‍රියාත්මක වනවාද කියලා. මේ පාර්ලිමේන්තුව හරහා 2026 මේ පනත සම්මත වෙන්නටත් පෙර UGC Chairman උපකුලපතිවරුන්ට ලියනවා, කරුණාකරලා පවතින නීතිය තුළ පත් කිරීම් ඔක්කෝම නතර කරන්න, අංශාධිපතිවරු, පීඨාධිපතිවරු පත් කිරීම නතර කරන්න, අලුත් නීතියක් ඉදිරියට එනවා, ඒ නිසා ඒ නීතිය යටතේ ඒවා ක්‍රියාත්මක කරන්න කියලා. ඒ කියන්නේ, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපතිවරයා කියනවා, රටේ පවතින නීතිය ක්‍රියාත්මක කරන්න එපා කියලා. මේ අවස්ථාවේදී මම ඒ ලිපිය **සභාගත*** කරනවා.

කොහොමද එහෙම කියන්නේ? අපට කියන්න පුළුවන්ද, අපේ රටේ දැන් පවතින නීතියක් ඉදිරියේදී වෙනස් වනවා, ඒ නිසා පවතින නීතිය ක්‍රියාත්මක කරන්න එපා, අලුත් නීතිය එන තෙක් පවතින නීතිය තුළ ක්‍රියාත්මක විය යුතු විධිවිධාන නතර කරන්න කියලා? එහෙම කියන්න පුළුවන්ද? ඒක අනීතික -නීත්‍යනුකූල නොවන- ප්‍රකාශයක්. ඒක රටේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව උල්ලංඝනය කිරීමක්, අපේ රටේ අණ පනත් හෑල්ලුවට ලක් කිරීමක්. දැන් මොකක්ද ඒක ගැන කියන්නේ? UGC Chairmanට Vice Chancellorsලාට ලියුම් යවන්න පුළුවන්ද, අලුත් නීතියක්

---

* පුස්තකාලයේ තබා ඇත.
* நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.
* *Placed in the Library.*

[ගරු සජිත් ප්‍රේමදාස මහතා]

ඉදිරියට එනවා, එතෙක් පවතින නීතිය ක්‍රියාත්මක කරන්න එපා කියලා? මේකද මේ රජය පොරොන්දු වුණු system change එක, මේකද ක්‍රමයේ වෙනස කියා මම අහන්න කැමැතියි.

මේ පනත පිළිබඳව කරුණු කාරණා ඉදිරිපත් කරන සියලුදෙනාටම පැහැදිලිව මම කියන්න කැමැතියි, හරිනි මැතිනියම -ගරු අග්‍රාමාත්‍යතුමියම- එදා විශ්වවිද්‍යාල ආචාර්යවරියක හැටියට තවත් කණ්ඩායමක් එක්ක ඉදිරිපත් කරපු මේ වාර්තාව කියවලා බලලා මේ සභාවේ කථා කරන්න කියලා. ඒ ඉදිරිපත් කරපු යෝජනා ටික අද කුණු බක්කියට විසි කරලා. අද මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදී නිදහස අහිමි වෙලා තිබෙනවා. ඒ වාගේම මේ රටේ academicsලාට - විශ්වවිද්‍යාල ආචාර්යවරුන්ට, මහාචාර්යවරුන්ට, කථිකාචාර්යවරුන්ට - තිබෙන academic freedom එක සහමුලින්ම අහිමි කරලා ඒකාධිපතිත්වයකට යන ගමනක තවත් එක් පියවරක් තමයි අද තබන්න හදන්නේ. එදා - 2015දී - ප්‍රජාතන්ත්‍රවාදය ගැන මහා ඉහළින් කථා කරපු, academic freedom එක ගැන ලොකුවට කථා කරපු දේවල් ඔක්කෝම හමස් පෙට්ටියට දාලා, කුණු බක්කියට දාලා අද වෙනත් එකක් ගෙනෙනවා. හරියට සිවිල් ආරක්ෂක ක්ෂේත්‍රයේ කමිටු සාමාජිකයින් පත් කරන්න ලැයිස්තු යැව්වා වාගේ, යෞවන සමාජවල තනතුරුවලට පත් කරන්නට පක්ෂ ප්‍රධාන කාර්යාලයෙන් ලැයිස්තු යැව්වා වාගේ අද මේ university system එක තුළත් ක්‍රියාත්මක කරන්න හදන්නේ ඒකාධිපතිත්වය කරා යන ගමනේ තවත් පියවරක් බව කනගාටුවෙන් හෝ මා ප්‍රකාශ කර සිටිනවා.

ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

The Hon. Rajeevan Jeyachandramoorthy. You have 10 minutes.

[பி.ப. 12.12]

**ගරු රජීවන් ජෙයචන්ද්‍රමූර්ති මහතා**
(மாண்புமிகு றஜீவன் ஜெயச்சந்திரமூர்த்தி)
(The Hon. Rajeevan Jeyachandramoorthy)

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, 1978ஆம் ஆண்டின் 16ஆம் இலக்க, பல்கலைக்கழகங்கள் சட்டத்தைத் திருத்துவதற்கான சட்டமூலம் தொடர்பான விவாதத்தில் கலந்துகொள்வதையிட்டு மகிழ்ச்சியடைகின்றேன். இந்த பல்கலைக்கழகங்கள் சட்டமானது 1978இல் இயற்றப்பட்டது. இது கிட்டத்தட்ட 46 ஆண்டுகள் பழைமைவாய்ந்த ஒரு சட்டமாகக் காணப்படுகின்றது. இலங்கையிலுள்ள சட்டங்கள் பல ஆண்டு காலமாகத் திருத்தம் செய்யப்படாமல் இருக்கின்றன. இலங்கையில் பெரும்பாலும் பழைய சட்டங்களே நடைமுறையில் உள்ளன. இலங்கையில் காணப்படுகின்ற பல்வேறு பிரச்சினைகளுக்கும் நீதிமன்றங்களில் தொடரப்படுகின்ற வழக்குகளுக்கும் காரணமாக இருப்பது சட்டங்களில் திருத்தங்கள் மேற்கொள்ளப்படாமை ஆகும்.

பல்கலைக்கழகங்கள் சட்டம் உருவாக்கப்பட்ட 1978ஆம் ஆண்டு காலப் பகுதியில் தகவல் தொழில்நுட்பம் வளர்ச்சியடைந்து இருக்கவில்லை, உலகளாவிய ரீதியில் பல்கலைக்கழகங்களின் தரப்படுத்தல் காணப்படவில்லை, சர்வதேச ரீதியில் மாணவர்களை, பேராசிரியர்களை, விரிவுரையாளர்களைப் பரிமாற்றுகின்ற செயற்பாடு காணப்படவில்லை. அது மாத்திரமல்ல, அந்த நேரத்தில் உயர் கல்வியானது தேசிய பொருளாதார வளர்ச்சியில் பங்களிப்புச் செய்வதற்கான வாய்ப்புகளும் குறைவாகவே காணப்பட்டன. எனினும், 2026ஆம் ஆண்டில் இந்த நிலைமைகள் முற்றிலும் மாறுபட்டுக் காணப்படுகின்றன. எனவேதான் இந்தப் பல்கலைக்கழகங்கள் சட்டத்தில் பல்வேறு மாற்றங்களைக் கொண்டுவரவேண்டிய தேவை காணப்படுகின்றது. இலங்கையில் பல்கலைக்கழகங்கள்தான் அறிவார்ந்த வளர்ச்சியைக் காட்டுகின்ற உயர் பீடங்களாகக் காணப்படுகின்றன. இந்தப் பல்கலைக்கழகங்களில் இருந்து வெளிவருகின்ற பட்டதாரிகளிடம் உலகளாவிய ரீதியில் போட்டி போடுகின்ற தன்மை எந்தளவுக்குக் காணப்படுகின்றது என்பதை நாங்கள் பார்க்க வேண்டும். பல்கலைக்கழகங்கள் தொடர்பில் தற்போது காணப்படுகின்ற சட்ட ஏற்பாடுகள் காரணமாகத்தான் qualifiedஆன manpowerஐ உருவாக்க முடியாமல் உள்ளது.

இன்றைய நிலையில், பல்கலைக்கழகங்கள் அறிவை மட்டும் வளர்ப்பதற்கு இயங்கவில்லை. மாறாக, ஆராய்ச்சிகள், புதுமைகள், தொழில்நுட்ப வளர்ச்சி, தேசிய பொருளாதார வளர்ச்சி எனப் பல்வேறு விடயங்களை மேற்கொள்வதற்குப் பங்களிக்கின்றன. For example, we see research knowledge creation, human capacity development, community engagement exchange programmes, community responsibilities, cultural presentations and promotions, innovations, entrepreneurship, industrial linkages et cetera. Therefore, universities contribute a lot to the society on those aspects.

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, பல்கலைக்கழகங்களில் UGC எனப்படுகின்ற University Grants Commissionஇன் பங்களிப்பு மிகவும் முக்கியமானது. அதேபோன்று, பல்கலைக்கழகங்களில் காணப்படுகின்ற பேரவை, செனட் போன்றவையும் மிக முக்கியத்துவம் வாய்ந்தவை. UGC மற்றும் பல்கலைக்கழக செனட், பல்கலைக்கழகப் பேரவை என்பவற்றின் அதிகாரங்களைப் பலப்படுத்துவதன் ஊடாக பல்வேறு மாற்றங்களைக் காண முடியும். பல்கலைக்கழகங்களில் பீடாதிபதிகளை நியமிப்பதில் பாரிய பிரச்சினைகள் மற்றும் சவால்கள் காணப்படுகின்றன. குறிப்பாக, பிரிவுத் தலைவர்களை - Heads of the Departmentsஐ - நியமிப்பதில் பல்வேறு குளறுபடிகள் அல்லது அது தொடர்பான சட்டத்தில் தெளிவின்மை காணப்படுகின்றது. குறிப்பாக, மூன்று வருட கால அனுபவத்தைக்கொண்ட சிரேஷ்ட விரிவுரையாளர்கள், பொருத்தமான தகைமைகளைக் கொண்ட விரிவுரையாளர்கள் போன்றோர் பீடாதிபதி பதவிக்கு விண்ணப்பிப்பதில் தெளிவின்மை காணப்படுகின்றது.

எனவே, இதை நாங்கள் ஒரு வரைமுறைக்குள் கொண்டுவரவேண்டிய தேவை இருக்கின்றது. இதற்காக இதனுடன் தொடர்புடைய சட்ட ஏற்பாடுகளை நாங்கள் மாற்றம் செய்யவேண்டிய தேவை இருக்கின்றது.

பல்கலைக்கழகங்களில் பலர் ஒரே பதவியில் நீண்ட காலம் இருக்கிறார்கள். அவர்கள் இடமாற்றமோ, வேறு விதமான மாற்றங்களோ இல்லாமல் அந்தப் பதவியை அனுபவித்து வருகின்றார்கள். இந்நிலையில், பல்கலைக்கழக பீடாதிபதிகளை - Deansஐ - மாற்றுவதற்கு அல்லது அவர்களை

இடைநீக்குவதற்கான சட்ட ஏற்பாடுகளும் தெளிவில்லாமல் காணப்படுகின்றன. குற்றங்களைச் செய்கின்ற, பல்கலைக்கழகத்துக்குச் சிறந்த பங்களிப்பை வழங்காத தலைவர்களை நீக்குவதற்கான அதிகாரங்களை வழங்கவேண்டிய தேவைப்பாடு காணப்படுகின்றது. மூன்றில் இரண்டு பெரும்பான்மை ஆதரவோடு அத்தகையவர்களை நீக்குவதற்கான அதிகாரங்களை குறைந்தது பல்கலைக்கழகப் பேரவைக்கேனும் வழங்க வேண்டும்.

துணைவேந்தர்களை - Vice Chancellors - நியமிப்பதில் பெருமளவான பங்களிப்பைச் செய்கின்றவர்கள் பேரவை உறுப்பினர்கள்! அவர்கள் சிபாரிசு செய்கின்றவர்களைத்தான் பீடாதிபதிகளாக நியமிக்கின்ற நிலைமை காணப்படுகின்றது. தாங்கள் விரும்புகின்ற விரிவுரையாளர்களை அல்லது நபர்களை Heads of the Departmentsஆகவும் Deansஆகவும் நியமிக்கின்ற அதிகாரம் இவ்வாறு நியமிக்கப்படுகின்ற துணைவேந்தர்களுக்கு - Vice Chancellorsக்கு - இயல்பாகவே கிடைக்கின்றது. அதற்குக் கட்டுப்பாடுகளை விதிக்க வேண்டும் என்றால், UGCஇற்குக் கூடுதலான அதிகாரங்கள் வழங்கப்பட வேண்டும். ஏனெனில், University Grants Commissionதான் பல்கலைக்கழகக் கல்வியின் தரத்தை உறுதிசெய்வதில் முக்கிய பங்கு வகிக்கின்றது. எனவே, UGCஇன் பலமான கண்காணிப்போடு, பல்கலைக்கழக பேரவைக்கும் செனடுக்கும் அதிகாரங்களை வழங்குவதற்காகச் சட்டங்களில் மாற்றங்களைக் கொண்டுவர வேண்டிய தேவை இருக்கின்றது.

எமது பல்கலைக்கழகங்களின் செயற்பாடுகளைப் பார்ப்போமேயானால், கடந்த காலங்களில் உலகிலுள்ள ஏனைய பல்கலைக்கழகங்களோடு போட்டிபோடுகின்ற தன்மை குறைவாகவே இருந்திருக்கிறது. பல்கலைக்கழங்களில் இருந்து வெளிவருகின்ற பட்டதாரிகளின் output குறைவாகக் காணப்படுகின்றது. அவர்களுடைய தரம், மொழிப் புலமை, திறன்களை அதிகரிப்பதற்காக பல்கலைக்கழகச் செயற்பாடுகளிலும், பாடவிதானங்களிலும், அவற்றைக் கற்பிக்கின்ற முறைகளிலும் மாற்றங்களை ஏற்படுத்த வேண்டிய தேவை இருக்கின்றது. இன்றும் உலக தொழிற் சந்தையில் எந்தவிதமான தாக்கத்தையும் ஏற்படுத்தாத பாடத்திட்டங்களைக் கற்பிக்கின்ற பல்கலைக்கழகங்கள் எமது நாட்டில் காணப்படுகின்றன. எமது நாட்டிலுள்ள பல்கலைக்கழகங்கள் சிறப்பாகச் செயற்பட வேண்டுமென்றால், அங்குள்ள விரிவுரையாளர்களும் திணைக்களத் தலைவர்களும் நிருவாக ரீதியகாவும் கற்பித்தல் ரீதியாகவும் தங்களைத் தாங்களே வளப்படுத்திக்கொள்ள வேண்டும். தரமான, உரிய கல்வித் தகைமைகளைப் பூர்த்திசெய்திருக்கின்றவர்களை அல்லது நிருவாகத்தைச் சிறப்பாகச் செய்கின்றவர்களை உரிய பதவிகளுக்கு நியமிப்பதில்தான் பல்கலைக்கழகங்களின் வெற்றி தங்கியிருக்கின்றது.

இலங்கையில் ஒரு மாணவனோ, மாணவியோ படித்து, பல்கலைக்கழகத்துக்குச் செல்கிறார் என்றால், அது அவருடைய வாழ்க்கையில் புரியப்படுகின்ற மிகப் பெரிய சாதனையாகக் கருதப்படுகின்றது. அவர்கள் பல்கலைக்கழகத்தில் கற்றவற்றைச் சமூகத்துக்கு வழங்க வேண்டும். குறிப்பாக, அவர்கள் மிகச் சிறந்த முறையில் தங்களுடைய ஆற்றல்களை வளர்த்து, சமூகத்துக்குப் பாரிய பங்களிப்பை வழங்குகின்ற நபர்களாக மாற வேண்டும். 2022ஆம் ஆண்டு முதல் குறுகிய காலத்துக்குள் இந்த நாட்டை விட்டு 566 விரிவுரையாளர்கள் வெளியேறியுள்ளார்கள். அது மாத்திரமன்றி, பலரும் பல்வேறு காரணங்களால் பல்கலைக்கழகங்களில் இருந்து விலகியிருக்கின்றார்கள். இவற்றை எல்லாம் நிவர்த்தி செய்து, பல்கலைக்கழகங்கள் சட்டத்தை மாற்றியமைத்து, பல்கலைக்கழகங்களுக்குத் தேவையான ஆளணியினரை நியமிப்பதன் ஊடாக இலங்கையினுடைய உயர் கல்வியின் தரத்தை மேம்படுத்த வேண்டும்; சிறந்த பிரஜைகளை உருவாக்குகின்ற பல்கலைக்கழகங்களாக எமது பல்கலைக்கழகங்களை மாற்ற வேண்டும்.

தற்போது, பல்கலைக்கழகங்களுக்கென 5,680 ஆளணிக்கான அனுமதி கோரப்பட்டுள்ள நிலையில், குறிப்பாக 2,159 கல்விசார் ஊழியர்களுக்கும் 3,521 கல்விசாரா ஊழியர்களுக்குமான அனுமதி கோரப்பட்டுள்ள நிலையில், Cabinetஆனது 3,713 பேரை நியமிப்பதற்கான அனுமதியை வழங்கி இருக்கின்றது.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Member, your time is up.

ගරු රජීවන් ජෙයචන්ද්‍රමූර්ති මහතා
(மாண்புமிகு றஜீவன் ஜெயச்சந்திரமூர்த்தி)
(The Hon. Rajeevan Jeyachandramoorthy)
Sir, please give me one more minute.

2026.01.19ஆம் திகதி வரை 640 பேர் கல்விசார் மற்றும் கல்விசாரா ஊழியர்களாக நியமிக்கப்பட்டு இருக்கிறார்கள். ஏனையவர்களையும் வெகுவிரைவில் நியமித்து, எங்களுடைய பல்கலைக்கழகங்களின் தரத்தை உலகளாவிய ரீதியில் உயர்த்துவோமெனக் கூறி, இந்த வாய்ப்பை வழங்கிய கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களுக்கு நன்றி கூறி, விடை பெறுகின்றேன்.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Next, the Hon. Sivagnanam Shritharan. You have seven minutes.

[பி.ப. 12.22]

ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා
(மாண்புமிகு சிவஞானம் சிறீதரன்)
(The Hon. Sivagnanam Shritharan)
கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, இன்றைய தினம் பல்கலைக்கழகங்கள் (திருத்தம்) சட்டமூலம் தொடர்பான விவாதம் நடைபெற்றுக் கொண்டிருந்தாலும், நேற்றைய தினம் இதே சபையில் கௌரவ தயாசிறி ஜயசேக்கர அவர்கள் எனது பெயரைக் குறிப்பிட்டு என்மீது சில அவதூறுகளைத் தெரிவித்திருந்தார். அது தொடர்பாக இந்தச் சபையில் விளக்கமளிக்க வேண்டிய கடமை எனக்கு இருக்கின்றது. ஆகவே, தங்களுடைய அனுமதியோடு நான் இதைப் பதிவுசெய்கிறேன்.

கௌரவ தயாசிறி ஜயசேக்கர அவர்கள் 2026 ஜனவரி 08ஆம் திகதி ஊடகங்களுக்கு ஒரு கருத்தை வெளியிட்டிருந்தார். அதாவது, "அரசியலமைப்புப் பேரவையிலே சிறீதரன் MPஐ ஆளுந்தரப்பு பயன்படுத்துகிறது; இலங்கை தமிழரசுக் கட்சி நடவடிக்கை எடுக்க வேண்டும்" என்ற செய்தியை வெளியிட்டிருந்தார். கிழக்கு மாகாணத்தைச் சேர்ந்த தமிழ் MP நடாத்துகின்ற tamilceylon என்கின்ற இணையத்தளத்திலும் இந்தச் செய்தி வெளிவந்திருந்தது. அத்தோடு, "கிளிநொச்சியின் பல இடங்களிலே மக்கள் வசிப்பதற்கு இடமில்லாத நிலையில், 1,200 ஏக்கர் காணிகளை

[ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා]

சிறீதரன் தன்னகப்படுத்தி வைத்திருக்கிறார். பூநகரி சூரிய மின் சக்தி திட்டத்தின்போது 70 மில்லியன் ரூபாய் - கிட்டத்தட்ட 7 கோடி ரூபாய் - நிதியை சிறீதரன் தன்னுடைய பெயரிலும் மகன் பெயரிலும் வங்கியிலே வைப்புச் செய்திருக்கிறார்" என்றெல்லாம் நேற்று இந்த உயர்ந்த சபையிலே ஒரு மூத்த தலைவரான தயாசிறி ஜயசேக்கர அவர்கள் குறிப்பிட்டிருக்கின்றார்.

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, நான் இந்தப் பாராளுமன்றத்துக்கு வருகைதந்து கிட்டத்தட்ட 16 வருடங்கள் கடந்திருக்கின்றது. நான் இதுவரை காலமும் நீதியின்பால், தர்மத்தின்பால் என்னுடைய பணிகளை, என்னுடைய அரசியல் செயற்பாடுகளை முன்னெடுத்திருக்கின்றேன். என்னைப் பொறுத்தவரைக்கும், அரசியலமைப்புப் பேரவையில் சுயாதீனமாக நீதியோடும் தர்மத்தோடும் தமிழ் மக்கள் சார்ந்த ஒரு பிரதிநிதியாக என்னுடைய முடிவுகளை, தீர்மானங்களை நான் எடுத்திருக்கின்றேன். யாருடைய நிர்ப்பந்தமோ அல்லது அரசாங்கத்துக்கு வால் பிடிக்க வேண்டும் என்ற அவசியத் தேவைகளோ எனக்கு இருக்கவில்லை.

தயாசிறி ஜயசேக்கர அவர்கள் ஒரு மூத்த தலைவர். அவர் பல கட்சிகளுக்கு மாறி மாறி தாவியிருந்தாலும் நீண்டகால அரசியல் அனுபவமுள்ளவர். அவர் இவ்வாறு நேற்றைய தினம் பாராளுமன்றத்தில் பதிவு செய்துகொண்டமை மிகவும் பிழையானது. குறிப்பாக, அவர் அவ்வாறு சொல்லியிருந்தால் எந்த வங்கியில், எவ்வளவு பணம் யாரால், எந்தத் திகதியில் வைப்பிலிடப்பட்டதென்பதை அவர் வெளியிட வேண்டும். ஒரு சரியான சிங்கள பௌத்தனாக தயாசிறி ஜயசேக்கர அவர்கள் இருப்பாராக இருந்தால், அவர் நீதியான அரசியல் தலைவனாக இருந்தால், நாளை அல்லது அடுத்த பாராளுமன்ற அமர்வில்கூட, சிறீதரனுடைய பெயரிலோ அல்லது அவருடைய குடும்பத்தாருடைய பெயரிலோ இவ்வாறு ஏழு கோடி ரூபாய் - கிட்டத்தட்ட 70 மில்லியன் ரூபாய் - எந்த நாட்களில், எந்த வங்கியில், எவ்வாறு வைப்புச் செய்யப்பட்டதென்பதை பதிவு செய்ய வேண்டும். அவர் உண்மையிலேயே இந்தப் பாராளுமன்றத்துக்கு ஆடை அணிந்துகொண்டுதான் வந்து பேசுகின்றார் என்றால், இதனை அவர் செய்ய வேண்டுமென இந்த உயரிய சபையில் கௌரவ பிரதிச் சபநாயகர் அவர்களைக் கேட்கின்றேன்.

2025 யூலை 25ஆம் திகதி நிதிக் குற்றப் புலனாய்வுப் பிரிவில், 'சிவில் புத்தி பெரமுன' என்ற அமைப்பின் உறுப்பினரான சஞ்சய மஹவத்த என்பவர், சிறீதரன் சொத்துக்கள் வைத்திருக்கின்றார், bar licence வைத்திருக்கின்றார் என்று முறைப்பாடு செய்திருந்தார். அவ்வாறு முறைப்பாடு செய்து இன்று ஆறு மாதங்கள் முடிவடைந்திருக்கிறது. உங்களுடைய அரசாங்கம் என்ன செய்கிறது? இந்த நாட்டில் இருக்கின்ற நிதிக் குற்றப்புலனாய்வுப் பிரிவு அது தொடர்பில் விசாரணை செய்து ஏன் அறிக்கை வெளியிட முடியாமல் இருக்கிறது? கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, யோசித்துப் பாருங்கள்! ஆறு மாதங்கள் ஒருவர் மீதான குற்றத்தை விசாரிக்க முடியாத அரசாக உங்களுடைய அரசு இருக்கிறது என்றால், அது உங்களுடைய பலவீனம்.

அதேபோன்று, 2025 டிசம்பர் 31ஆம் திகதி இதே சஞ்சய மஹவத்த என்பவர், இலஞ்சம் அல்லது ஊழல் பற்றிய சார்த்துதல்களைப் புலனாய்வு செய்வதற்கான ஆணைக்குழுவுக்குச் சென்று மேற்படி முறைப்பாட்டைச் செய்திருக்கின்றார். கிழக்கு மாகாணத்தைச் சேர்ந்த ஒரு தமிழ் பாராளுமன்ற உறுப்பினர் நடாத்துகின்ற tamilceylon என்ற இணையத்தளத்தில் இந்தச் செய்தி வெளிவந்திருந்தது. சஞ்சய மஹவத்த அவர்கள் இந்த முறைப்பாட்டைச் செய்து கிட்டத்தட்ட ஒரு மாதமாகின்றது. அவரால் முதல் தடவை முறைப்பாடு செய்யப்பட்டு ஆறு மாதங்கள் நிறைவடைந்திருக்கின்றது. இன்னும் விசாரணைகள் நடைபெறவில்லை. நியாயம் எங்கே இருக்கப் போகின்றது? பூநகரி சூரிய மின் சக்தி திட்டம் தொடர்பில் அப்பிரதேச அரசாங்க அதிபரை, பிரதேச செயலாளரை இதுவரை ஏன் இந்த அரசாங்கம் விசாரணை செய்யவில்லை? அவர்களிடம் தயாசிறி ஜயசேக்கர அவர்கள், தகவல் அறியும் சட்டத்தின்மூலமாவது ஏன் விபரத்தைக் கேட்கவில்லை. தன்னை ஓர் அரசியல்வாதியாகக் காட்டிக்கொள்கின்ற ஒரு மூத்த அரசியல் தலைவர் அவர். அண்மையில் அவர் என்னுடன் உரையாடும்போது, எதிர்வரும் சனாதிபதி தேர்தலில் போட்டியிடப் போவதாகக் கூறி, தமிழ் மக்கள் தனக்கு ஆதரவளிப்பார்களா என்று? கேட்டார். அதற்கு நான், "உங்களுடைய முகம் தமிழ் மக்களுக்குப் பரிச்சயம் இல்லை; நீங்கள் முதலில் தமிழ் மக்களிடம் உங்களுடைய முகத்தைப் பரிச்சயமாக்குங்கள் அல்லது marketing பண்ணுங்கள்" என்று அவருக்குச் சொன்னேன். அது அவருக்குப் பிடிக்கவில்லை. அண்மையில் கௌரவ ஹரினி அமரசூரிய அவர்களுக்கு எதிராகக் கொண்டு வரப்பட்ட நம்பிக்கையில்லாப் பிரேரணைக்கு ஆதரவாகக் கையொப்பமிடுமாறு எதிர்கட்சியினர் என்னிடம் கேட்டிருந்தார்கள். நான் அதில் கையொப்பம் வைக்கவில்லை. அதை எங்களுடைய கட்சியினரும் விரும்பவில்லை; எங்களுடைய கட்சித் தலைவரும் அப்படித்தான் அறிவுறுத்தல் வழங்கியிருந்தார். அதற்காக எதிர்க்கட்சியினர் எங்கள் மீது சேறு பூசுவதென்பது மிகவும் மோசமானது.

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, கிவுல் ஓயா திட்டம் இன்று தமிழர்களுடைய நிலங்களைப் பறிக்கின்றது. ஏற்கெனவே 'மணலாறாக' இருந்த தமிழர்களுடைய நிலம் இன்று மாற்றப்பட்டிருக்கிறது. இவ்வாறான திட்டங்களுக்கு எதிராக தயாசிறி ஜயசேக்கரவோ, சஜித் பிரேமதாஸவோ ஏன் குரல் கொடுக்கவில்லை? தையிட்டி விகாரை பற்றி ஏன் அவர்கள் பேசவில்லை? அல்லது திருகோணமலையில் வைக்கப்பட்ட புத்தர் சிலை பற்றி ஏன் அவர்கள் பேசவில்லை? வடக்கு கிழக்கிலே 250,000 இராணுவத்தினர் குவிக்கப்பட்டிருக்கிறனர். தமிழ் மக்களுடைய நிலங்கள் விடுவிக்கப்படவில்லை. இன்றைக்கும் தமிழ் மக்கள் அகதிகளாக இருக்கின்றார்கள். இராணுவம் சலூன் நடாத்துகின்றது. இராணுவம் முன்பள்ளி நடாத்துகின்றது. இராணுவ ஆட்சிதான் அங்கு நடைபெறுகிறது. திறந்தவெளிச் சிறைச்சாலையாக யாழ்ப்பாணம் இருக்கிறது. சிறீதரன் தமிழ் மக்களுக்கு துரோகம் செய்து விட்டாரென்று கத்துகின்ற தயாசிறி ஜயசேக்கர அவர்களால் இவை பற்றி ஏன் கதைக்க முடியவில்லை? சம்பந்தப்பட்ட நியமனத்துக்கு இராணுவ அதிகாரி ஒருவரை நியமிப்பதற்கு சிறிதரன் ஆதரவளித்து விட்டார் என்று சொல்கின்றார்கள்.

2024 சனவரி 21ஆம் திகதி இலங்கைத் தமிழரசுக் கட்சியின் வரலாற்றில் கட்சித் தலைவரைத் தெரிவுசெய்வதற்காக முதன் முதலாக சனநாயக முறைப்படி தேர்தல் நடைபெற்றது. அப்போது நான் அக்கட்சியின் தலைவராகத் தெரிவு செய்யப்பட்டேன். இலங்கையில் வேறு எந்தக் கட்சியின் தலைவரும் இவ்வாறு தெரிவு செய்யப்பட்டிருக்க மாட்டாரென்றே நான் நினைக்கின்றேன். ஆனால், நான் அவ்வாறு தெரிவு செய்யப்பட்டேன். அதற்கு அடுத்தநாள்

கனடாவில் இருந்து டி. பி. எஸ். ஜெயராஜ் அவர்கள், "Is the new ITAK Leader Shritharan promoting separatism instead of federalism?" என்று எழுதுகின்றார். சிறீதரன் பிரிவினைவாதி! அவர் தலைவராக வந்திருக்கின்றார். இந்த நாட்டிலிருக்கின்ற federalism ஊடாக அவர் பிரிவினையைக் கோருகின்றார் என்று. சிங்கள மக்களிடம் என்னையொரு பிரிவினைவாதியாகக் காட்ட இவர்கள் முனைகிறார்கள். நான் இராணுவத்துக்கு ஆதரவானவர் என்பதுபோல தமிழ் மக்களிடம் காட்டுகின்றார்கள். பிரதிச் சபாநாயகர் அவர்களே, அப்படியென்றால், நான் யாருக்குரியவன்? நான் சிங்கள மக்களுக்கும் எதிரி! தமிழ் மக்களுக்கும் எதிரி! இதற்குப் பின்னால் இருக்கின்ற நிகழ்ச்சி நிரல் என்ன? தயாசிறி ஜயசேக்கர அவர்களும் சாமர சம்பத் அவர்களும் சொல்வது என்ன?

2011ஆம் ஆண்டு பங்குனி மாதம் அனுராதபுரம் உடுக்குளம் பகுதியிலே கோட்டாபய ராஜபக்ஷ தன்னுடைய இராணுவக் குழுவை வைத்து என்மீது சூடு நடத்தினார். அதிலே நான் மயிரிழையிலே உயிர் தப்பியிருந்தேன். அதேபோல, 2013ஆம் ஆண்டு சனவரி மாதம் என்னுடைய காரியாலயத்துக்குள் குண்டுகள் கொண்டு வந்து வைத்து, நூற்றுக்கும் மேற்பட்ட இராணுவத்தினரும் பொலிசாரும் அப்பொழுது இராணுவ ஒட்டுக்குழுவாக இருந்த முன்னாள் MP சந்திரகுமார் உட்பட்டோரும் என்னுடைய காரியாலயத்தைச் சுற்றிவளைத்து, என்னுடைய செயலாளராக இருந்தவரையும் இப்பொழுது தவிசாளராக - Chairman - இருக்கின்ற வேளமாளிதன் அவர்களையும் கைதுசெய்து, 13 மாதங்கள் சிறையிலே அடைத்து வைத்திருந்தார்கள். யார் இதைப் பற்றி பேசினார்கள்? அதற்குப் பிறகு, மே மாதம் நாங்கள் எங்களுடைய காரியாலயத்திலே ஒரு கூட்டத்தைக் கூட்டினோம். அதிலே காலஞ்சென்ற முன்னாள் பாராளுமன்ற உறுப்பினர் மாவை. சேனாதிராஜா மற்றும் முன்னாள் பாராளுமன்ற உறுப்பினர்களான சரவணபவன், சுமந்திரன் ஆகியோருடன் நானும் கலந்துகொண்டிருந்தேன். இவ்வளவு பேரும் இருக்கத்தக்கதாக, கிட்டத்தட்ட 500 பேர் சிங்கக் கொடிகளோடு வந்து எங்களுடைய காரியாலயத்தைத் தாக்கினார்கள். அப்பொழுது ஏன் தயாசிறி ஜயசேக்கர கதைக்கவில்லை? அப்பொழுது ஏன் சாமர சம்பத் கதைக்கவில்லை? அப்பொழுது ஏன் அம்பிகா சற்குணநாதன் கதைக்கவில்லை? அப்பொழுது ஏன் சுரேஷ் பிரேமச்சந்திரன் கதைக்கவில்லை? இப்பொழுது ஏன் சிறீதரன் மீது இவர்கள் எல்லோரும் வஞ்சம் தீர்க்கப் பார்க்கிறார்கள்? இப்பொழுது இவர்கள் சிறீதரன் மீது பாய வேண்டிய தேவை என்ன? ஏதோ ஒரு வகையில் சிறீதரனை அரசியலிலே இருந்து அப்புறப்படுத்த வேண்டும் என்று இவர்கள் கொஞ்சப் பேர் நினைக்கிறார்கள். அதேபோல, எங்களுடைய கட்சியிலும் சிலர் நினைக்கிறார்கள். என்னைப் பழிவாங்கி, ஏதோ ஒரு வகையில் என்மீது குற்றம் சுமத்தி என்னை அரசியலில் இருந்து வெளியேற்றிவிட்டு, அந்தப் பதவியைத் தாங்கள் பிடித்துக்கொள்ள இவர்கள் நினைக்கிறார்கள். ஆனால், அது ஒரு பகல் கனவாகத்தான் இருக்கும்.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Member, your time is up.

ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා
(மாண்புமிகு சிவஞானம் சிறீதரன்)
(The Hon. Sivagnanam Shritharan)
கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, எனக்கு ஒரு நிமிஷம் தாருங்கள்!

நான் இந்த உயர்ந்த சபையினூடாக ஓர் உண்மையைச் சொல்ல விரும்புகிறேன். என்னுடைய மக்கள் மிகத் தெளிவாக இருக்கிறார்கள். என்னுடைய மக்களுக்கான பணியை நான் மிகவும் நேர்த்தியோடு செய்திருக்கிறேன். எந்த வங்கியிலே, எவ்வளவு காசு வைப்பிலிடப்பட்டிருக்கிறது? சிறீதரனுக்கு என்னென்ன சொத்துக்கள் இருக்கின்றன? சிறீதரன் ஒரு bar permitஇற்கு சிபாரிசு செய்தாரா? கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, ஏன் இதனை விசாரணை செய்து உறுதிப்படுத்த முடியாது? உங்களால் முடியாது என்றால், உங்களுடைய அரசாங்கத்தினுடைய பலம் என்ன? ஏன் உங்களால் இவ்வளவு நாளும் அதைச் செய்ய முடியாமல் இருக்கின்றது?

அரசாங்கம் என்னை வைத்து ஏதோ அரசியல் செய்ய நினைக்கிறது. அதேபோல, எதிர்த்தரப்பில் இருக்கிறவர்களும் சரி, எங்களோடு இருக்கிறவர்களும் சரி, என்னைப் பழிவாங்குவதற்காக அல்லது மக்களிடமிருந்து என்னை அந்நியப்படுத்துவதற்காகத்தான் இந்த முயற்சி மேற்கொள்ளப்படுகிறதா? என்று நான் கேட்கின்றேன். இதற்கொரு நீதி வேண்டும்! தயவுசெய்து புரிந்து கொள்ளுங்கள்! நீங்கள் என் மீதான குற்றங்களை உறுதிப்படுத்தி நீதியை நிலைநாட்டுங்கள்! சஞ்சய மஹவத்த என்மீது குற்றம் சுமத்தி தற்போது ஆறு மாதங்கள் ஆகியிருக்கின்றன. மீண்டும் அவர் முறைப்பாடு செய்து ஒரு மாதம் முடிந்திருக்கிறது. இந்தச் சபையிலே நேற்று மிகப்பெரிய பொய்களை ஒரு மூத்த அரசியல்வாதியான தயாசிறி ஜயசேக்கர அவர்கள் சொல்லியிருக்கிறார். இவைகள் உண்மை என்றால், ஏன் இந்தச் சபை இதனை உறுதிப்படுத்தக் கூடாது? கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, உண்மையை வெளிப்படையாக உடனே வெளிக்கொண்டு வாருங்கள் என்பதைப் பகிரங்கமாக இந்தச் சபையினூடாக நான் வேண்டுகிறேன்.

ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Sir, I rise to a point of Order.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. (Dr.) Ramanathan Archchuna, what is your point of Order?

ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
பாராளுமன்ற நிலையியற் கட்டளை 92.(2) மற்றும் 23.(1) மற்றும் (2) தொடர்பாகத் தங்களுக்கு இதை முன்வைக்க வேண்டும். அத்துடன் பாராளுமன்ற உறுப்பினர்களுக்கு Code of Ethics என்ற ஒன்று இருக்கிறது. 92(2)இற்கும் 29(2)இற்கும் இடையிலே அது வரும். அதிலே 18 மற்றும் 19ஆவது விடயங்களை நான் வாசிக்கின்றேன்.

"உறுப்பினர் எவரும் எந்தப் பகிரங்க கொள்கையின் பணரீதியான அக்கறையை கொண்டுள்ளாரோ அந்தப் பகிரங்க கொள்கை தவிர்ந்த விடயம் ஒன்று தொடர்பில் கேள்வி ஒன்றின்மீது பிரிவில் வாக்களித்தல் ஆகாது."

"எவரேனும் உறுப்பினர் பாராளுமன்றத்தினால் அல்லது அதன் ஏதேனும் குழுவினால் கருத்திற்கெடுக்கப்படும் ஏதேனும் விடயம் தொடர்பில் நேரடியாகவோ அல்லது மறைமுகமாகவோ ஏதேனும் தனிப்பட்ட அல்லது பண

[ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා]

ரீதியான அக்கறையைக் கொண்டுள்ளவிடத்து அத்தகைய உறுப்பினர் பதிவேட்டில் அத்தகைய அக்கறை பதிவு

செய்யப்பட்டுள்ளது என்ற நிகழ்வு எவ்வாறிருப்பினும், அத்தகைய அக்கறையின் தன்மையை வெளிப்படுத்தல் வேண்டும். அத்துடன், அவர் இப்பந்தியினால்

தேவைப்படுத்தப்பட்டவாறாக அத்தகைய பிரகடனத்தைச் செய்தாலொழிய சபையில் அல்லது குழுவில் இடம்பெறும் ஏதேனும் விவாதத்தில் பங்குபற்றுதல் ஆகாது."

ஐயா! இது என்னுடைய சிறப்புரிமை என்பதைத் தயவுடன் தெரிவிக்கின்றேன். இந்தப் பாராளுமன்றத்திலே நான் ஒரு சிறுபான்மைக் கட்சியைச் சேர்ந்தவன் என்ற அடிப்படையிலும், ஒரு கட்சித் தலைவன் என்ற அடிப்படையிலும் இதைத் தெரிவிக்கின்றேன். சிறீதரன் அவர்களுக்குப் பணம் கொடுக்கல் வாங்கல் தொடர்பான வழக்குகள் இருக்கின்றபோதும், அரசியலமைப்புச் சபையிலே எங்களைப் பிரதிநிதித்துவப்படுத்திக்கொண்டு, அரசுக்கு ஆதரவாக இவர் வாக்குப் போடுவது எங்களைப் போன்ற சிறுபான்மைக் கட்சித் தலைவர்களை அவமதிக்கின்ற செயலாகும். ஆகவே, இதைத் சிறப்புரிமையின் கீழ்க் கொண்டுவர வேண்டும் என்பதை நான் கடிதம் மூலம் தருகிறேன். நன்றி!

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Member, I shall bring it to the notice of the Hon. Speaker.

**ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා**
(மாண்புமிகு சிவஞானம் சிறீதரன்)
(The Hon. Sivagnanam Shritharan)
Sir, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
What is your point of Order? We have to wind up for lunch, Hon. Shritharan.

**ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා**
(மாண்புமிகு சிவஞானம் சிறீதரன்)
(The Hon. Sivagnanam Shritharan)
Please give me a minute, Sir.

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, குறித்த பாராளுமன்ற உறுப்பினர் என்னுடைய பெயரைக் குறிப்பிட்டுப் பேசினார். ஏற்கெனவே அவர் இந்தப் பாராளுமன்றத்திலே என்னைப் பற்றி பிழையான, பொய்யான தகவல்களையும் சொல்லியிருக்கின்றார். நான் சுயாதீனமாக, நேர்மையோடு தேர்தலில் போட்டியிட்டதன் மூலம்தான் இந்தப் பாராளுமன்றத்திற்குத் தெரிவுசெய்யப்பட்டு அரசியலமைப்புப் பேரவையிலே ஓர் உறுப்பினராக இருக்கிறேன். எனக்கு அவர் வாக்களிக்கவும் இல்லை! என்னுடைய அரசியல் நியாயமானது! தர்மத்தின் பாற்பட்டது! ஆகவே, நீங்கள் விசாரணையைச் செய்து உண்மையைக் கண்டறிந்து நீதியை நிலைநாட்டுங்கள் எனக் கேட்டு நிறைவு செய்கின்றேன்.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Okay.

Order, please! The ongoing Proceedings of the House shall stay suspended till 1.00 p.m. for lunch.

*රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත්හිටුවන ලදින්, අ.භා. **1.00**ට නැවත පවත්වන ලදී.*
*அதன்படி அமர்வு இடைநிறுத்தப்பட்டு, பி.ப. 1.00 மணிக்கு மீண்டுந் தொடங்கிற்று.*
*Sitting accordingly suspended till 1.00 p.m. and then resumed.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
The Hon. (Dr.) Nalinda Jayatissa. You have 12 minutes.

[අ.භා. 1.00]

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා (සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍ය සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ - சுகாதாரம் மற்றும் வெகுசன ஊடக அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. (Dr.) Nalinda Jayatissa - Minister of Health and Mass Media and Chief Government Whip)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විශ්වවිද්‍යාල අධ්‍යාපනය ඇතුළු උසස් අධ්‍යාපනය සම්බන්ධයෙන් ඉතා කාලෝචිත සහ වැදගත් විවාදයක් පවත්වන මේ වෙලාවේ මට ලැබී තිබෙන කාලය මම යොදවන්න කැමැතියි, මේ වෙලාවේ රට තුළ පැන නැඟී තිබෙන, විශේෂයෙන් සෞඛ්‍ය ක්ෂේත්‍රය තුළ පැන නැඟී තිබෙන යම් අර්බුදයක් පිළිබඳව සාකච්ඡා කරන්නට.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමාත් දන්නවා ඇති, රජයේ වෛද්‍ය නිලධාරින්ගේ සංගමය අද උදෑසන සිට පැය 48ක දීප ව්‍යාප්ත වැඩ වර්ජනයක් ක්‍රියාත්මක කරමින් පවතින බව. අපේ රටේ සෞඛ්‍ය සේවාව -ප්‍රාථමික සෞඛ්‍ය සේවාවේ සිට තෘතීයික සත්කාර ඒකක දක්වාත්, රෝග නිවාරණ කටයුතු ඇතුළු සියල්ලත් - මේ මට්ටමට පවත්වා ගෙන යාමට අපේ රටේ වෛද්‍යවරු විශාල කාර්යභාරයක් කරනවා. එතැනදී සාමාන්‍ය සේවාවන් සඳහා පමණක් නොවෙයි, අප මෑත කාලයේදී මුහුණ දුන් "දිට්වා" සුළි කුණාටුව වැනි ස්වාභාවික ආපදාවලදීත්, සුනාමියේදීත්, ගංවතුරවලදීත්, නාය යෑම්වලදීත්, කොවිඩ් වැනි වසංගතවලදීත් වෛද්‍යවරුන් තමන්ගේ රාජකාරි සීමාවෙන් ඔබ්බට ගිහින්, තමන්ගේ කාලය කැප කරමින් ඉතා විශාල කාර්යභාරයක් කරන බව මම මේ වෙලාවේ කියන්න ඕනෑ. අප ලෝක සෞඛ්‍ය දර්ශකවල යම් ප්‍රමාණයකට ඉහළට පැමිණ තිබෙන්නේත් වෛද්‍යවරුන් ඇතුළු සෞඛ්‍ය සේවකයන්ගේ කැපවීම මතයි. ඒ වෙනුවෙන් රජය හැටියට අපි ඒ අයට අපේ ගෞරවය පුද කරනවා. විශේෂයෙන් විශේෂඥ වෛද්‍යවරුන් සහ වෛද්‍යවරුන් මේ රටේ රඳවා තබා ගැනීම වෙනුවෙන් සහ ඔවුන්ගේ සේවය හොඳින් පවත්වාගෙන යාමට අවශ්‍ය කරන පරිසරය නිර්මාණය කිරීම වෙනුවෙන් අපි වැඩ කටයුතු රාශියක් කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමා දන්නවා, අප භාර ගත්තේ ඉතාම සුමටව, සුව පහසුව පවත්වාගෙන ගිය ආර්ථිකයක් නොවෙයි කියලා. ඒ වන කොට ආර්ථික වශයෙන් රට බංකොලොත් කරලා, බංකොලොත්භාවය නිල වශයෙන්

ප්‍රකාශයට පත් කරලායි තිබුණේ; බංකොලොත්භාවය පිළිගෙනයි තිබුණේ. එවැනි අවස්ථාවකදී අපි ආර්ථිකය භාර අරගෙන අවුරුද්දකට වැඩි කාලයක් තුළ ආර්ථිකය ස්ථාවරත්වයකට ගෙන ආවා. 2025 පෙබරවාරි මාසයේ ඉදිරිපත් කරලා, මාර්තු මාසයේ සම්මත කර ගත්තු අය වැයට අනුව ආර්ථික ස්ථාවරත්වයට යමින් ඉන්න අතරතුරේදීම අපි විශේෂඥ වෛද්‍යවරුන්, වෛද්‍යවරුන් ඇතුළු සමස්ත රජයේ සේවකයන් වෙනුවෙන් දැනෙන මූලික වැටුප් වැඩි කිරීමක් කළා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමා හොඳින් විමසා බැලුවොත් පෙනේවි, 2024 සැප්තැම්බර් මාසයේ අනුර කුමාර දිසානායක මැතිතුමා ජනාධිපතිවරයා ලෙස බලයට පත් වීමෙන් පසුව, නොවැම්බර් මාසයේදී අපේ ආණ්ඩුව පිහිටුවීම හා ඊළඟට ගත වුණු මාස කිහිපය තුළ රජයේ සේවකයන්ගේ මූලික වැටුප් වැඩි කිරීම හෝ වැටුප් වැඩි කිරීම සම්බන්ධයෙන් වන උද්ඝෝෂණ, වැඩ වර්ජන, අරගළ තිබුණේ නැති බව. හැබැයි, රජයක් හැටියට අපි කල්පනා කළා, මේ ආර්ථිකය ගොඩ නඟන්න දායක වන සහ මෙතැනින් එහාට ආර්ථිකය ඉස්සරහට අරගෙන යන්නට දායකත්වය ලබා දිය යුතු රජයේ සේවකයන්ට ඒ මොහොතේ පැවැති ආර්ථිකයට සාපේක්ෂව යම් ප්‍රමාණවත් වැටුප් වැඩි වීමක් ලබා දෙන්න ඕනෑ කියලා. ඒ අනුව, කාලයකට පසුව අපි රජයේ සේවකයන්ට දැනෙන මූලික වැටුප් වැඩි කිරීමක් කළා. ඒ මූලික වැටුප් වැඩි කිරීමේදී 2025 අප්‍රේල් මාසයේදී පළමුවැනි කොටසත්, 2026 ජනවාරි මාසයේදී දෙවැනි කොටසත්, 2027 ජනවාරි මාසයේදී තුන්වැනි කොටසත් ලබා දීමට තමයි සැලසුම් කළේ. ඒ අනුව 2025 අප්‍රේල් මාසයේදී තමන්ගේ මූලික වැටුප් වැඩි වීමට උරුමකම් ඇතිව පළමුවැනි කොටස ලබා ගත් රජයේ සේවකයන් මේ මාසයේ, මේ ගත වන මොහොතේදී ඒ මූලික වැටුප් වැඩි වීමේ ඊළඟ කොටසට හිමිකම් කියනවා. දැන් ඒ කොටස ලැබෙන්න පටන් අරගෙන තිබෙනවා. ඊළඟ කොටස 2027 ජනවාරි මාසයේදී ලැබෙනවා. ඒ වාගේම, අපේ රටේ ඉතිහාසය තුළ කවදාවත් නොකරපු ආකාරයට 2027 ජනවාරිවලදී සම්පූර්ණ වන මූලික වැටුප් වැඩි වීමට සාපේක්ෂව අතිකාල දීමනා, නිවාඩු දින දීමනා, අමතර රාජකාරි දීමනා ආදි දීමනා 2025 අප්‍රේල් මාසයේ සිට අපි සකස් කළා. ඉතිහාසය දෙස බැලුවොත් අපට පෙනෙනවා, 2016, 2017 වසරවලදී යම් ප්‍රමාණයකට -මීට වඩා ඉතා අඩු ප්‍රමාණයකින්- මූලික වැටුප් වැඩි කිරීමක් කළත්, ඒ මූලික වැටුප් වැඩි කිරීමට අදාළ දීමනා සකස් කරන්න අවුරුදු දෙකක්, දෙකහමාරක් පමණ ගත වුණු බව. එතැන් සිට තමයි දීමනා ලබා දුන්නේ. හැබැයි, අපි එහෙම නොවෙයි. 2025 මැයි මාසයේ ලැබුණු මූලික වැටුපට නොවෙයි, 2027 ජනවාරි මාසයේදී ලැබෙන්න තිබෙන මූලික වැටුපට අදාළව තමයි එතැන් සිට වැටුප් සකස් කළේ.

ඒ අනුව, අපේ රටේ සිටින ශ්‍රේණි වෛද්‍යවරයෙකුට; සීමාවාසික පුහුණුව අවසන් වෙලා අපේ වෛද්‍ය සේවාවට, රාජ්‍ය සේවයට ඇතුළත් වන Preliminary Grade වෛද්‍යවරයෙකුට 2025 මාර්තු මාසයේ තිබුණු මූලික වැටුප වන රුපියල් 52,955 මේ වන විට රුපියල් 82,547 දක්වා වැඩි කරලා තිබෙනවා. රුපියල් 52,955 තිබුණු මූලික වැටුප රුපියල් 82,547 දක්වා වැඩි කරලා තිබෙනවා. වැටුපට එකතු වන ජීවන වියදම් දීමනාව ඇතුළු ඉතිරි දීමනා සියල්ල එක්ක 2025 මාර්තු මාසයේදී රුපියල් 155,080ක් ලබා ගත් වෛද්‍යවරයෙකුට 2026 ජනවාරි මාසයේ සිට රුපියල් 177,172ක් වන හැටියට වැටුප් වැඩි කිරීම කරලා තිබෙනවා. එතැන වැටුප් වැඩි වීම රුපියල් 22,092යි. ඒ වාගේම අපි ඒ අයගේ අමතර රාජකාරි දීමනාව ද ඊට සාපේක්ෂව වැඩි කළා. පැයකට රුපියල් 687ක්ව තිබූ ඔවුන්ගේ අමතර රාජකාරි දීමනාව රුපියල් 795 දක්වා රුපියල් 108කින් වැඩි කළා. පැය 120ක අමතර රාජකාරි කාලයකට අදාළ දීමනාවත් සාමාන්‍යයෙන් එකතු කර ගන්නවා. ඒ අනුව ඔවුන්ට රුපියල් 12,960ක extra duty allowance එකකුත් ලැබෙනවා. නිවාඩු දින දීමනාව ඇරුණාම සමස්ත වැටුප් වැඩි වීමයි, මේ. මෙම වැටුප් වැඩි වීමට කලින් රුපියල් 237,520ක් ගත්තා නම්, මේ මාසයේ ඉඳලා රුපියල් 272,572ක් ලැබෙනවා; PH එකත් එක්ක රුපියල් 35,052ක වැටුප් වැඩි වීමක් වෙලා තිබෙනවා. ඒ කියන්නේ, මූලික වැටුපත් එක්ක සකස් වන දීමනාවලින් රුපියල් 22,092කුත්, extra dutyවලින් රුපියල් 12,960කුත් එක්ක රුපියල් 35,052ක් වැඩිපුර ලැබී තිබෙනවා. ඒ අනුව එකතුව අරගෙන බලනකොට පෙනෙනවා, මෙම වැටුප් වැඩි වීමට කලින් තමන්ගේ take-home salary එක විධියට රුපියල් 237,520ක වැටුපක් ලැබුවා නම්, මේ ජනවාරියේ සිට එය රුපියල් 272,572 දක්වා වැඩි වෙලා තිබෙන බව.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ ආණ්ඩුව එන්න කලින් Grade II Medical Officer කෙනෙකුට මූලික වැටුප විධියට ලැබුණේ රුපියල් 58,305යි. අපි එය මේ ජනවාරි වනකොට රුපියල් 90,673 දක්වා වැඩි කළා. එම මූලික වැටුපත් එක්ක එකතු වන ඉතිරි දීමනා ගත්තොත්, අප එන්න කලින් රුපියල් 160,005ක් ගත්තු කෙනෙකුට දැන් රුපියල් 184,873ක් ලැබෙනවා. සාමාන්‍යයෙන් Grade II Medical Officer කෙනෙකුට extra duty allowance එකත් එක්ක ලැබෙන වැටුප් සහ දීමනාවල වැඩි වීම රුපියල් 45,388ක් වෙනවා. ඒකට PH එකකුත් එකතු වෙනවා. ඒ අනුව, අපේ ආණ්ඩුව එන්න කලින් Grade II Medical Officer කෙනෙක් රුපියල් 255,525ක් ගත්තා නම්, ඒ වෛද්‍යවරයාගේ take-home salary එක රුපියල් 300,913ක් දක්වා වැඩි වෙනවා.

Grade I Medical Officer කෙනෙකුගේ basic salary එක විධියට තිබුණේ රුපියල් 71,805යි. එය මේ ජනවාරි මාසයේ සිට රුපියල් 111,193 දක්වා වැඩි වෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඉතිහාසයේ පළමු වතාවට මේ ජනවාරි මාසයේ ඉඳලා තමයි Grade I Medical Officer කෙනෙකුට ඉලක්කම් 6ක basic salary එකක් - මූලික වැටුපක් - ලැබෙන්නේ. ඒ කියන්නේ, ඒ අයට මේ ජනවාරියේ සිට රුපියල් 111,193ක මූලික වැටුපක් ලැබෙනවා. 2027 ජනවාරි වනකොට ඒක රුපියල් 125,670ක් වෙනවා. මෙවර ලැබෙන රුපියල් 111,193ට ජීවන වියදම් දීමනාව එකතු වුණාම ඔහුගේ වැටුප සාමාන්‍යයෙන් රුපියල් 205,793ක් වෙනවා. ඒ කියන්නේ, 2025 මාර්තු මාසයේ තිබුණු රුපියල් 173,905ක වැටුප් ප්‍රමාණය රුපියල් 205,793 දක්වා වැඩි වෙනවා. එයට extra duty පැය 120ක දීමනාවත් එකතු වුණාම, PH එක නැතුව වැටුප් සහ දීමනා වැඩි වීම විතරක් රුපියල් 54,688ක් වෙනවා. මේ විධියට ගත්තාම, මීට කලින් රුපියල් 306,025ක වැටුපක් ලැබුණු Grade I Medical Officer කෙනෙකුගේ වර්තමාන take-home salary එක රුපියල් 360,713ක් වෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි මේ විධියට මූලික වැටුප වැඩි කළා; ඒ මත පදනම් වෙල දීමනා ද වැඩි කළා. එපමණක් නොවෙයි, APIT එකේ සීමාව රුපියල් 100,000 සිට රුපියල් 150,000 දක්වා වැඩි කිරීම තුළත් Grade I, Grade II, Preliminary Grade ආදි ශ්‍රේණි වෛද්‍යවරුන්ට පහසුකම් ලැබී තිබෙනවා; ඒකෙනුත් අමතර ආර්ථික වාසියක් ලැබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඊළඟට, පසුගිය අවුරුද්ද පුරාම රෝහල්වල පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා උපකරණ ලබා ගන්නට, ගොඩනැඟිලි හදන්නට සැලකිය යුතු මුදලක් වෙන් කර තිබෙනවා. දැන් ඒ කටයුතු කරගෙන යනවා.

ඒ වාගේම, පසුගිය වසර කිහිපය ගත්තොත්, 2024 වසරේදී වෛද්‍ය නිලධාරීන් 1,987දෙනෙකු සේවයට ඇතුළත් කර ගත්තා. 2025 අවුරුද්දේ 1,738දෙනෙකු අලුතින් ඇතුළත් කර ගත්තා. තව නොබෝ දිනකින් 460දෙනෙකු බඳවා ගැනීමට නියමිතයි. මම කලින් කිව්වා වාගේම මේ කටයුතු කිරීමෙන් අපි බලාපොරොත්තු

[ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා]

වෙන්නේ වෛද්‍යවරුන්ට වැඩ කිරීමට පහසු වාතාවරණයක් සමඟ ඒ අයට යම් වැටුප් දීමනා ප්‍රමාණයක් අපේ ආර්ථිකයට සාපේක්ෂව ලබා දෙන එකයි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Hon. (Dr.) Nalinda Jayatissa, you have been given four extra minutes and now, you are left with five more minutes altogether.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

Okay, Sir.

අපි අපේ ආර්ථිකයට සාපේක්ෂව ඒවා ලබා දෙන්න කටයුතු කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමාත් දන්නා පරිදි මීට දින 50කට කලින් අපි දැවැන්ත ආපදාවකට මුහුණ දුන්නා. ලෝක බැංකුව ගණන් හදලා තිබෙන විධියට ඒක ඩොලර් බිලියන 4.1ක ආපදාවක්. ඒ කියන්නේ සාමාන්‍යයෙන් රුපියල් බිලියන 1,200ක විතර හානියක් අපට සිදු වෙලා තිබෙනවා. මේ, යළි ගොඩනැඟීමේ - rebuilding - කටයුතු වෙනුවෙන් අපි අමතරව රුපියල් බිලියන 500ක් වෙන් කරලා තිබෙනවා. හැබැයි එහෙමයි කියලා අපි මේ මූලික වැටුපක්, දීමනාවක්, අමතර දීමනාවක් කිසිදු ආකාරයකින් කපන්න කටයුතු කරලා නැහැ. ඒවා එලෙසම ලබා දෙනවා. "දිට්වා" සුළි කුණාටුව ඇති වෙලා සති හයක් ගත වෙන මේ වෙලාවේ මේ ජනවාරි මාසයේ ඉඳලා වෛද්‍යවරුන්ගේ සිට අනෙකුත් හැම දෙනාගේම වැටුප් වැඩිවීම ලබා දීලා තිබෙන්නේ.

පසුගිය මාස දෙකක, දෙකහමාරක විතර කාලයක් තිස්සේ රජයේ වෛද්‍ය නිලධාරින්ගේ සංගමයෙන් තැන් කිහිපයක වැඩ වර්ජන දියත් කළා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. එකක්, දෙහිඅත්තකණ්ඩිය මූලික රෝහලේ. දෙහිඅත්තකණ්ඩිය රෝහල කියන්නේ බාහිර රෝගී අංශයට දිනකට 450ක්, 500ක් පමණ පිරිසක් පැමිණෙන, සතියකට clinicsවලට 1200ක පමණ පිරිසක් පැමිණෙන, දවසකට ඇතුළත් වන රෝගීන් - admissions - 120ක්, 140ක් පමණ වන නැඟෙනහිර පළාතේ, අම්පාර දිස්ත්‍රික්කයේ ජනතාවට සේවය සපයන්න අපට තිබෙන ඉතා වැදගත් රෝහලක්. මේ රෝහලේ කටයුතු ඔක්තෝබර් පළමුවෙනි දා ඉඳලා ඔක්තෝබර් හත්වන දා දක්වා දවස් හයක්, හයහමාරක් විතර වැඩ වර්ජනයක් නිසා අක්‍රිය වෙලා තිබුණා. මොකක්ද ඒකට හේතුව? ඒකට හේතු වුණේ එහි ඉන්න වෛද්‍යවරු දෙදෙනෙකුට ස්ථාන මාරු ලබා දීම. එක වෛද්‍යවරයෙක් තමයි ඩී.ඩබ්ලිව්.එම්. දහනායක මහතා. ඒ වෛද්‍යවරයා 2007 මාර්තු 22වන දා තමයි දෙහිඅත්තකණ්ඩියේ රෝහලට පත්වීම ලබා ගෙන තිබෙන්නේ. ඔබතුමා දන්නවා, සාමාන්‍යයෙන් මේ වෛද්‍යවරුන්ට අවුරුදු හතරෙන් හතරට ස්ථාන මාරුවීම් ලැබෙන බව. 2007 මාර්තු 22 දින මේ රෝහලට පත්වීම් ලබා ගත්ත මේ වෛද්‍යවරයා 2025 වෙනතෙක් මේ රෝහලේම සේවය කළා. ඔහුට 2013දී ස්ථාන මාරුවක් ලැබුණා. ඒ ස්ථාන මාරුව යළිත් එම රෝහලටම හදා ගෙන තිබෙනවා. 2017දී ඔහුට ස්ථාන මාරුවක් ලැබී තිබෙනවා ළිහිනියාගම ප්‍රාථමික සෞඛ්‍ය සත්කාර ඒකකයට. 2017.09.15 වන දින දෙහිඅත්තකණ්ඩිය රෝහලෙන් release වෙලා, 2017.09.16 ආයෙත් ඒ රෝහලටම ඇවිත් තිබෙනවා. 2021දී ඔහුට පොළොන්නරුව දිස්ත්‍රික් මහ රෝහලට ස්ථාන මාරුවක් ලැබෙනවා. එය ක්‍රියාත්මක වෙන්නේ නැහැ. ඒ අනුව, 2007 සිට 2025 වෙනකම් එක දිගට අවුරුදු 18ක් මේ රෝහලේ සේවය කරපු මේ වෛද්‍යවරයාට වැටුප් ගෙවන්නේ කොහොමද, අතිකාල ගෙවන්නේ කොහොමද කියලා ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරයාට ප්‍රශ්නයක් පැන නඟිනවා. ඒකට audit query එකක් එනවා. මෙන්න මේ audit query එක නිසා අම්පාරේ ප්‍රදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරයා විසින් මේ වෛද්‍යවරයා 2025 සැප්තැම්බර් 15වන දින නිදහස් කරනවා. ඊට කලින් ඔහු දෙහිඅත්තකණ්ඩිය මූලික රෝහලේ රාජකාරි ආවරණය කරන වෛද්‍ය අධිකාරි හැටියට කටයුතු කරමින් හිටියා. 2025 මැයි මාසයේ 24වැනි දා වෙන වෛද්‍යවරයෙක් වැඩබලන පදනමින් වෛද්‍ය අධිකාරි ලෙස පත් වෙනවා. අවුරුදු 18ක් එක තැනක හිටපු මෙන්න මේ වෛද්‍යවරයා මාරු කිරීමට එරෙහිව තමයි ඒ strike එක පටන් ගන්නේ. මම කියන්නේ ඒකේ සාධාරණයක් නැහැ කියලායි.

තව වෛද්‍යවරයෙක් හිටියා, පී.පී. විජේසිංහ කියලා. 2021 පෙබරවාරි 15 සිට ඔහු ඒ රෝහලේ සේවය කරනවා. අම්පාර දිස්ත්‍රික් මහ රෝහලේ High Dependency Unit එකේ - අපි දැඩි සත්කාර ඒකකය කියමුකෝ - ඇති වෙලා තිබුණු වෛද්‍යවරුන්ගේ හිඟය නිසා එහි කටයුතු පවත්වා ගැනීමට නොහැකියි කියලා අම්පාර දිස්ත්‍රික් මහ රෝහලේ අධ්‍යක්ෂවරයා කිව්වාම, ස්ථාන මාරුවීම්වලට සුදුසුකම් ලබා සිටි මේ වෛද්‍යවරයා ඒ රෝහලට මාරු කරනවා. මෙන්න මේ ස්ථාන මාරු දෙක පදනම් කරගෙන තමයි ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දෙහිඅත්තකණ්ඩිය ප්‍රදේශයේ ජනතාවට දවස් හයක්, හයහමාරක් සේවාව ලබා නොදෙන ආකාරයට රජයේ වෛද්‍ය නිලධාරින්ගේ සංගමය strike එකක් කරන්නේ. ඒක සාධාරණ නැහැ.

ඊට පසුව සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම්වරයා, ප්‍රාථමික සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරයා ප්‍රමුඛ තිදෙනෙකුගෙන් යුත් කමිටුවක් පත් කළා මේ ගැන බලන්න. ඔවුන් නිර්දේශ කළා, එක වෛද්‍යවරයෙක් - අවුරුදු 18ක් හිටපු වෛද්‍යවරයා - දිස්ත්‍රික් මහ රෝහලට ස්ථාන මාරු කරන්නත්, ඔහුට ස්ථාන මාරුව සඳහා මාසයක කාලයක් ලබා දෙන්නත්, අනෙක් වෛද්‍යවරයාගේ හදිසි ස්ථාන මාරුව නතර කරලා, ඊළඟ පශ්චාත් සීමාවාසික පත්වීම් දෙනකොට ස්ථාන මාරුව ලබා දෙන්නත්.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අම්පාර දිස්ත්‍රික් මහ රෝහලේ ප්‍රශ්නයක් පැන නැඟිලා තිබියදීත්, අවුරුදු 18ක් එකම ස්ථානයේ වැඩ කරපු වෛද්‍යවරයෙක් මාරුකිරීම මාසයකට කල් තියලා, ඒ වෛද්‍යවරයාගේ මාරුවීම තාවකාලිකව නතර කිරීමට සෞඛ්‍ය අමාත්‍යාංශය තීන්දුවක් ගත්තේ මේ වැඩ වර්ජනය නතර කරන්න වුවමනාව තිබෙන නිසායි. නැත්නම්, අවුරුදු 18ක් එකම ස්ථානයේ සේවය කළ කෙනෙක් මාරු කරනවා කියන එක හරිම සාධාරණයි. දෙහිඅත්තකණ්ඩිය ඇතුළු නැඟෙනහිර පළාතේ ජනතාවට දවස් 5ක්, 6ක් තිස්සේ දිගින් දිගටම සෞඛ්‍ය වැඩ වර්ජනයකට මුහුණ දෙන්න සිද්ධ වුණා. රෝහල් කටයුතු අකර්මණ්‍ය කරලා, අඩපණ කරලා තිබෙනකොට රෝහල් කටයුතු යළි ආරම්භ කිරීම සඳහා අපට ඒ තීන්දුව ගන්න සිද්ධ වුණා. ඒ ස්ථාන මාරුවීම් දෙකට තාවකාලික පදනමින් යම් යම් වෙනස්කම් කරන්න අපට සිද්ධ වුණා. අපි ඒවා කළේ ජනතාව ගැන හිතලා. හැබැයි, රජයේ වෛද්‍ය නිලධාරින්ගේ සංගමය මේ ස්ථාන මාරු දෙක පදනම් කරගෙන දවස් හයක් නැඟෙනහිර පළාතේ සෞඛ්‍ය කටයුතු අකර්මණ්‍ය කළා.

ඊළඟට ආවා, අක්කරෙයිපත්තුවට. මේ අක්රෙයිපත්තුවේ ප්‍රශ්නය අපි පාර්ලිමේන්තුවේ කථා කළා. අක්කරෙයිපත්තුවේ වෛද්‍ය අධිකාරිවරයා මාරු කරන්න කියලා, රජයේ වෛද්‍ය නිලධාරින්ගේ සංගමය මේ අවුරුද්දේ ජනවාරි 13වැනි දා සිට ජනවාරි 22 වැනි දා දක්වා ආයෙත් strike එකක් කළා. එතැන

දවස් අටකට වඩා වැඩියි. ඒත් නැඟෙනහිර පළාතේ. වෛද්‍යවරු හිඟයි. උපකරණ ප්‍රමාණයේ ප්‍රශ්නයක් තිබෙනවා. සම්පත්වල ප්‍රශ්නයක් තිබෙනවා. එහෙම තිබියදී නැවත වතාවක් නැඟෙනහිර පළාතේ අක්කරෙයිපත්තුවෙන් පටන් අරගෙන නැඟෙනහිර පළාතේම රෝහල් අකර්මණ්‍ය කරන ආකාරයේ වැඩ වර්ජනයක් දියත් කළා. මේ වෛද්‍ය අධිකාරිවරයාට එරෙහිව පැමිණිලි කිහිපයක් ලැබිලා තිබෙනවා. මම ඊයේ ඒ පැමිණිලි ටික පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළා. ඒ පැමිණිලි ගැන අපි විභාග කරමින් හිටියේ; පරීක්ෂණ කරමින් හිටියේ. ඒ පැමිණිලි ඉදිරිපත් කරන්නත් සම්බන්ධ වෙලා හිටියා, රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමයේ නිලධාරියෙක්. ඒ පැමිණිලි අනුව පමණක් ඒ වෛද්‍ය අධිකාරිවරයාගේ වැඩ තහනම් කරන්නත් බැහැ; මාරු කරන්නත් බැහැ. හැබැයි, ඒ රෝහලේ වැඩ කරපු වෛද්‍යවරු, "මේ වෛද්‍ය අධිකාරීත් එක්ක වැඩ කරන්න බැහැ, ඔහු තර්ජනය කරනවා" කියලා කියපු නිසා, ඒ මත පදනම් වෙලා, පරීක්ෂණ පැවැත්වෙන තෙක් සෞඛ්‍ය අමාත්‍යාංශය මේ වෛද්‍ය අධිකාරිවරයා තාවකාලිකව රෝහලෙන් ඉවත් කළා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අවශ්‍ය නම් සෞඛ්‍ය අමාත්‍යාංශයට හැකියාව තිබුණා, මේ වෛද්‍ය අධිකාරි එලෙසම තබාගෙන පරීක්ෂණ කරන්නත්. හැබැයි, නැඟෙනහිර පළාතේ ජනතාවට දිගින් දිගටම මුහුණ දෙන්න වෙන මේ ප්‍රශ්නය නිසා, රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය දවස් පහේ, හයේ, හතේ වැඩ වර්ජන කරපු නිසා අපි තාවකාලිකව ඒ වෛද්‍යවරයා වෙන තැනකට මාරු කරලා පරීක්ෂණ කඩිනම් කරන්න තීන්දු කළා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපට තේරෙනවා යන විධිය. මෙහෙම තිබියදී ඊයේ කොළඹ ජාතික අක්ෂි රෝහලේ - National Eye Hospital එකේ - හදිසියේ වැඩ වර්ජනයක් දියත් කරනවා. සාමාන්‍යයෙන් අක්ෂි රෝහලේ OPD එකට දවසකට රෝගීන් 700ක් විතර එනවා. Clinic එකට රෝගීන් 750ක් විතර එනවා. සාමාන්‍යයෙන් සඳුදා admissions 180ක් විතර තිබෙනවා. සාමාන්‍ය දවසකට admissions 100ක් විතර තිබෙනවා. Casualties 110ක් විතර එනවා. අක්ෂි රෝහලට රෝගීන් එන්නේ කොළඹ දිස්ත්‍රික්කයෙන් විතරක් නොවෙයි. ඔබතුමා දන්නවා, අනුරාධපුරයෙන්, පොළොන්නරුවෙන්, අම්පාරෙන් රට පුරා රෝගීන් උදේ පාන්දර, නැත්නම් ඊට කලින් දවසේ ඉඳලා ප්‍රතිකාර ගන්නට එන බව. එහෙම රෝගීන් ආපු වෙලාවක කිසිදු දැනුම් දීමකින් තොරව එක පාරට රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය වැඩ වර්ජනයක් දියත් කළා. ඔබතුමා දකින්න ඇති, ජනතාව දුන් voice-cuts. ඇත්ත, සාධාරණ කේන්තියක් එනවා. මොකක්ද හේතුව?

ඒකේ අධ්‍යක්ෂවරයාට audit query එකක් එනවා. Cadre එකට අනුව වෛද්‍යවරු 121යි ඉන්න ඕනෑ. නමුත්, වෛද්‍යවරු 125ක් ඉන්නවා. ඒ අනුව වෛද්‍යවරුන් දෙදෙනෙකුට ස්ථාන මාරුවීම් ලබා දුන්නා. එක්කෙනෙක් ඩොක්ටර් ඩබ්ලිව්.ජී.එස්. චතුෂ්ක. ඔහු 2018 ඉඳලා ජාතික අක්ෂි රෝහලේ සේවය කරනවා. ඔහුට 2022දී ජාතික රෝහලට ස්ථාන මාරුවක් ලැබිලා තිබුණා. ගිහින් නැහැ. ඔහුට ස්ථාන මාරුවක් ලබා දුන්නා. 2018 ඉඳන් හිටපු කෙනාට ඒ ස්ථාන මාරුව දුන්නේ. තව එක්කෙනෙක් ඉන්නවා, ඩොක්ටර් එස්.පී. කොළඹගේ; 2013.07.18 ඉඳලා අක්ෂි රෝහලේ සේවය කරන්නේ. 2013 ඉඳලා අවුරුදු 13ක්. එයා 2021දී සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් නිදහස් වෙලා කියලා කිව්වාට ඒක හරියට පැහැදිලි නැහැ. අවුරුදු 13ක් හිටපු කෙනෙක්, රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමයේ විධායක සභිකයෙක්. ඇත්ත. ඒ දෙදෙනා සේවය කරපු ඒකකවල විශේෂඥ වෛද්‍යවරුන්ගෙන් අහලා ඒ රෝහල් සේවා අඩපණ වෙන්නේ නැහැ කියන ස්ථිර සහතිකය මත තමයි රෝහල් අධ්‍යක්ෂවරයා තීන්දු කළේ මේ දෙන්නාට transfers දෙන්න. අවුරුදු දෙකක්, තුනක් ගිය කෙනෙක් නම් කමක් නැහැ. හැබැයි, ඒ අධ්‍යක්ෂවරයාට ප්‍රශ්නයක් තිබෙනවා, audit එකෙන්. ඒක නිසා තීන්දුවක් ගත්තා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සෞඛ්‍ය අමාත්‍යාංශය ඒ තීන්දුව මඳකට නතර කළා. ඇයි? මේ වැඩ වර්ජනය ඉදිරියට ගියා නම් රට පුරා ඉන්න අක්ෂි රෝහලට එන රෝගීන් පීඩාවට පත් වෙනවා. අක්කරෙයිපත්තුව රෝහලේ දවස් 18ක වැඩ වර්ජනයක් කරනවා. ඊට කලින් දෙහිඅත්තකණ්ඩිය රෝහලේ දවස් හයක වැඩ වර්ජනයක් කරනවා. දැන් හිටි ගමන් අක්ෂි රෝහලේ වැඩ වර්ජනයක් පටන් ගන්නවා. මේ රෝගීන් පීඩාවට පත් වෙන නිසාම අපි සමහර තීන්දු අකුළා ගත්තා. හැබැයි, අපට පෙනෙනවා, මේ යන්නේ මොකක්ද කියලා. තමන්ගේ සාමාජිකයන්, සමහර වෙලාවට තමන්ගේ විධායක සභිකයන් 2007 ඉඳලා අවුරුදු 13, 15, අවුරුදු 18ක් එක තැන ඉන්නවා. ඒගොල්ලන් transfer boardsවලත් ඉන්නවා. හැබැයි, දුෂ්කර රෝහල්වල අවුරුදු හතර, පහ, හය ඉඳලා transfer එන්න බැරි දහස් ගණනක් වෛද්‍ය සේවයේ ඉන්නවා.

අපි දෙසැම්බර් මාසයේ ලංකාවේම වෛද්‍යවරුන්ගේ ස්ථාන මාරුවීම් ක්‍රියාත්මක කරන්න හිටියේ. අවුරුදු ගණන් එකතැන ඉන්න අය ඉන්නවා. ඔවුන් ස්ථාන මාරුවීම් යන්නේ නැහැ. එතකොට වෙනත් වෛද්‍යවරයෙකුට ඒ තැන්වලට එන්න හම්බ වෙන්නේත් නැහැ. රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමයේ ඉල්ලීම මත අපි හතර සැරයක් ඒ ස්ථාන මාරු කරන දින ප්‍රමාණය කල් දැම්මා. සෞඛ්‍ය සේවාවට බලපෑම් වෙන්නේ නැතුව, ඒ කටයුතු අඩපණ කර ගන්නේ නැතුව, units වැහෙන්නේ නැතුව මේ ස්ථාන මාරු ටික කර ගන්න තමයි අපට ඕනෑකම තිබුණේ.

මම අපේ සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම්වරයාට කිව්වා, රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය ගෙනැල්ලා සාකච්ඡා කරලා පළාතෙන් පළාත මේ transfers සිදු වෙන්නේ කොහොමද කියලා බලන්න කියලා. අපි එහෙම නම්‍යශීලි වුණා. එහෙම තිබියදී හතර සැරයක් මේක කල් දැම්මා. මම දන්නවා, සමහර රෝහල්වල ඉන්න වෛද්‍යවරු තමන්ගේ දරුවා වෙනත් පාසලකට ඇතුළත් කරලා transfer එක අනුව යන්න ලැහැස්තියි. බඩු පටවලා ලැහැස්ති වෙලා, මාරුවෙන තැනට යන්න බලාගෙනයි ඉන්නේ. එහෙම තිබියදී අපි මේ මාරුවීම් කටයුතු තාවකාලිකව නවත්වන්න නම්‍යශීලි වුණා. හැබැයි, අපේ රට "දිට්වා" සුළි කුණාටුවෙන් ආපදාවට ලක් වෙලා දින 50ක් ඔන්න මෙන්න පිරෙන්නේ යන්තම්. ආර්ථික අර්බුදයෙන් ගොඩ එන්නේ යන්තම්.

අපි වැටුප් වැඩිවීම් ලබා දීලා තිබියදී අසාධාරණ ලෙස මේ වෙලාවේ දෙන්න බැරි ආර්ථික ඉල්ලීම් පදනම් කරගෙන කවුරු හරි රෝගීන් ඇපයට තබාගෙන පැය 48ක, සතියක, දෙකක වැඩ වර්ජනවලට යන්න හදනවා නම් ඒක සාධාරණ නැහැ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මම විපක්ෂයේ මන්ත්‍රීවරුන්ට කියනවා, ඒ අයට උඩගෙඩි දෙන්න එපා කියලා. විපක්ෂ නායකතුමා සහ ඒ පැත්තේ කට්ටිය මේ වැඩ වර්ජනය ගැන වැඩිය කථා කරන්නේ නැත්තේ ඇයි කියලා මම දන්නවා. ඔබතුමන්ලාගේ කෘත්‍යාධිකාරී මණ්ඩලයට අලුතින් ගත් දොස්තර, - අපි interdict කරලා, dismiss කරලා, පරීක්ෂණ කරන දොස්තර - මේකට සුබ පතලා; කට්ටියට එන්න කියලා වැඩ වර්ජනයට සහාය දෙන්න කියපු හැටි දැන් එළියට ඇවිල්ලා තිබෙනවා, මම දැක්කා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
කවුද ඒ?

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

චමල් සංජීව. ඔබතුමන්ලා දන්නවා නේ; දන්නවා නේ. *[බාධා කිරීම්]* අපිට තේරෙනවා. වෙනදා කොහේ හරි වැඩ වර්ජනයක් තිබුණාම මෙතැන ලොකු සද්දයක් දාන විපක්ෂ නායකතුමා අද, 'නොකර සද්ද' ඉන්නේ ඇයි කියලාත් අපි දන්නවා. මේ වෙලාවේ මම විශේෂයෙන් මෙතුමන්ලාට ස්තුතිවන්ත වෙනවා. මේ වැඩ වර්ජනයට අපේ රටේ විශේෂඥ වෛද්‍යවරු දායක වෙන්නේ නැහැ, අපේ රටේ සමහර රෝහල්වල සමහර වෛද්‍යවරු දායක වෙන්නේ නැහැ. මේක තේරුම් ගන්න. ඊයේ, අද, හෙට අතට ලැබෙන වැටුප වැඩි වෙලා තිබෙන්නේ. එහෙම වැඩි වැටුපක් අතට ලැබෙන වෙලාවේත් අසාධාරණ ලෙස ජනතාව, රෝගීන් අපහසුතාවට පත් කරමින් වැඩ වර්ජන පවත්වන එකේ කිසිම සාධාරණයක් නැහැ. අපේ ආණ්ඩුව එන්න කලින් රුපියල් 237,520ක් අතට ලැබිච්ච කෙනාට දැන් රුපියල් 272,572ක් ලැබෙනවා. කලින් රුපියල් 255,000ක් ලැබිච්ච කෙනාට දැන් රුපියල් 300,000ක් ලැබෙනවා. කලින් රුපියල් 300,000ක් ලැබිච්ච කෙනාට දැන් රුපියල් 360,000ක් ලැබෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ආර්ථිකය වර්ධනය වෙනකොට දෙන්න පුළුවන් තව සහන දෙනවා. මේ සියල්ල කරමින් නේ, මේවා කරන්නේ. ඒ නිසා රෝගීන් බිල්ලට තබාගෙන මේ වාගේ අසාධාරණ වැඩ වර්ජන කරන්න එපා කියලා මම රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමයට විශේෂයෙන් කියන්න කැමැතියි.

අපි අක්කරෙයිපත්තුවේ, දෙහිඅත්තකණ්ඩියේ, ජාතික අක්ෂි රෝහලේ පැවති වැඩ වර්ජනවල ඉල්ලීම අසාධාරණයි කියලා දැනගෙනත්, අවුරුදු 18ක්, අවුරුදු 10ක් හිටපු කෙනා transfer කරන්න ගත්ත තීන්දුව හරි කියලා දැනගෙනත් ඒ තීන්දුව තාවකාලිකව අකුළා ගත්තේ මේ රටේ ජනතාවට අඛණ්ඩ සේවාවක් ලබා දීමට තිබෙන වුවමනාව නිසා. සෞඛ්‍ය සේවාවේ ප්‍රශ්න තිබෙනවා; ඖෂධ සැපයීමේ ප්‍රශ්න තිබෙනවා, උපකරණවල ප්‍රශ්න තිබෙනවා. ඒ ඔක්කෝම තියාගෙන ජනතාවට සේවාවක් සැපයීම අරමුණු කරගෙන තමයි අපි සමහර තීන්දු අකුළා ගත්තේ. හැබැයි රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය මේ විදියට දිගටම වැඩ වර්ජන කරමින් ජනතාව බිල්ලට ගන්න කරන උත්සාහය ඇත්තටම අපි හෙළා දකිනවා. මම සමස්ත වෛද්‍යවරුන්ගෙන්; ශ්‍රේණි වෛද්‍යවරුන්ගෙන්, විශේෂඥ වෛද්‍යවරුන්ගෙන්, පරිපාලන වෛද්‍යවරුන්ගෙන් - ඒ හැමදෙනාගෙන්ම - ඉල්ලීමක් කරන්න කැමැතියි. ආර්ථික වර්ධනයත් එක්ක අපි ඔබට ලබා දිය හැකි සියලු දේවල් ලබා දෙන්න සූදානම්. ඒ නිසා කරුණාකරලා රෝගී ජීවිත බිල්ලට අරගෙන කරන වැඩ වර්ජන නතර කරන්න කියන ඉල්ලීම මම මේ වෙලාවේ කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Next, the Hon. Nalin Bandara. You have seven minutes.

Order, please! Before he starts, will an Hon. Member propose the Hon. Lakshman Nipuna Arachchi to the Chair?

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

Sir, I propose that the Hon. Lakshman Nipuna Arachchi do take the Chair.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි මහතා මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு லக்ஷ்மன் நிபுண ஆரச்சி அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon THE HON. DEPUTY SPEAKER left the Chair, and THE HON. LAKSHMAN NIPUNA ARACHCHI took the Chair.*

[අ.භා. 1.27]

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද අපේ සෞඛ්‍ය ඇමතිතුමාට, අපේ මිත්‍රයාට දෛවයේ සරදමක් සිදු වෙලා තිබෙනවා. ඒ දවස්වල අපි ආණ්ඩු කරන කාලයේ GMOA එක උද්ඝෝෂණය කරද්දි,

*[බාධා කිරීමක්]* පොඩ්ඩක් ඉන්නකෝ නලින්ද ජයතිස්ස ඇමතිතුමනි. රෝගීන් ඇපේට තියලා මේ දේ කරන්න එපා කියලා අපි දොස්තර මහත්වරුන්ට කිව්වා. අද අපේ සෞඛ්‍ය ඇමති නලින්ද ජයතිස්ස දොස්තර මහත්මයා ඒ දේම කියනවා. එහෙම නේද?

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)

කියන්න වෙලා.

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)

එතුමාට ඒ දේම කියන්න වෙලා. පසුගිය කාලයේ GMOA එකත් එක්ක තිබුණු දීගේ දැන් ඉවර වෙලා හෝ ඉවර වේගෙන, වේගෙන යනවා, යනවා, යනවා වාගේ එකක් තමයි අපට නිකම් තේරෙන්නේ.

අනෙක් කාරණය මෙයයි. අපේ සෞඛ්‍ය ඇමතිතුමාට තිබෙන ප්‍රධාන ප්‍රශ්නය තමයි එතුමාට සෞඛ්‍ය අමාත්‍යාංශය බලන්න වෙලාවක් නැති එක. නලින්ද ජයතිස්ස ඇමතිතුමනි, යන්න එපා. පොඩ්ඩක් ඉන්නකෝ.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)

කොහේද දුවන්නේ?

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)

එතුමා ඔය දුවන්නේත් අධ්‍යාපන අමාත්‍යාංශය සුද්ධ කරන්න. නලින්ද ජයතිස්ස මහත්මයා ඔය දුවලා යන්නේ සෞඛ්‍ය අමාත්‍යාංශයට නොවෙයි.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)

අතේ තිබෙන්නේ ඔක්කෝම පෙළ පොත්.

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)

පෙළ පොත් ටිකත් අරගෙන ඔය දුවලා යන්නේ අධ්‍යාපන අමාත්‍යාංශයට. පෙළ පොත් ටික අරගෙන යන නලින්ද ජයතිස්ස මහත්මයා දකිද්දී පිටකොටුවේ බස් ස්ටෑන්ඩ් එකේ ඉන්න පොත් විකුණන අය, pavement එකේ පොත් විකුණන අය තමයි මට මතක් වෙන්නේ. Pavement එකේ පොත් විකුණන අය වාගේ පෙළ පොත් ටික ගෙනැල්ලා, ඒකේ පිට කවරේ පෙන්වලා, ඒකේ පාට පෙන්වලා, ඒ පාට හොඳයි, එහෙම නැහැ; මෙහෙම නැහැ කියමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ වැඩ කරන්නේ නැතුව අධ්‍යාපන අමාත්‍යාංශය සුද්ද කරන වැඩේ තමයි අද නලින්ද ජයතිස්ස මහත්මයා කරන්නේ. අද අමාත්‍යාංශ බොහොමයක කරන්නේ ඒක තමයි. චාමර සම්පත් මන්ත්‍රීතුමනි, ඒ අය තමන්ගේ අමාත්‍යාංශයේ වැඩ කරන්නේ නැහැ. බුද්ධශාසන අමාත්‍යාංශයේ වැඩ, අධ්‍යාපන අමාත්‍යාංශයේ වැඩ තමයි අපේ ලාල් කාන්ත ඇමතිතුමා කරන්නේ. වාරිමාර්ග අමාත්‍යාංශයේ කටයුතුවල ගන්න දෙයක් නැහැ. ජලාශ ටික ඇරලා ගම්පොළ ඇතුළු නගර ටික සේරම හේදිලා ගිහිල්ලා. ඒවාට උත්තර නැහැ. සියලුදෙනා එහෙම තමයි කරන්නේ.

විශේෂයෙන්ම අපේ රටේ අධ්‍යාපන ක්ෂේත්‍රය ගැන කථා කරද්දී, පසුගිය දවස් ටිකේම ජාතික අධ්‍යාපන ආයතනය තුළ සිදු වුණු දේවල් අපි දැක්කා නේ. ඒකේ DGව අයින් කළා, DDGව අයින් කළා. හැබැයි, ඒකේ සභාපතිවරයා විධියට ඉන්නේ අමාත්‍යාංශ ලේකම්වරයා, ඔහුව අයින් කළේ නැහැ. අද මේ ආයතනවල මොනවාද වෙන්නේ? අපි දන්නවා, 1985දී ගෙනා පනතක් මඟින් ජාතික අධ්‍යාපන ආයතනය ස්ථාපිත කළේ අධ්‍යාපනයට වැඩි යමක් ගෙනෙන්න, අලුත් දේවල් හඳුන්වා දෙන්න, අධ්‍යාපන ප්‍රතිසංස්කරණ කරන්න බව. එම ආයතනය තුළ හිටියේ බොහොම වැදගත්, බුද්ධිමත් ආචාර්යවරුන්, මහාචාර්යවරුන්. හැබැයි, අද මේ අයට කරන්න වෙලා තිබෙන්නේ මොකක්ද? අපට ආරංචියි, අද මේ අයට inventories check කරන්න තමයි දීලා තිබෙන්නේ කියලා; පුටු ටික, මේස ටික, බංකු ටික, පිඟන් ටික ගණන් කරන්න දීලා තිබෙන්නේ. ඒ මට්ටමට අද පරිපාලනය ගිලිහිලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැන් මේ හැම තැනකටම මේගොල්ලන්ගේ පක්ෂයේ කාඩර්වරු දමාගෙන ඔවුන්ට ඕනෑ දේවල් කරන්න දීලා තිබෙන්නේ. ඒ නිසා තමයි අද මේ හැම දෙයක්ම කඩාකප්පල් වෙලා තිබෙන්නේ. NIE පාලක සභාවේ ඉන්න සමහර අය මේ අයගේ පක්ෂයේ කාඩර්වරු. ඒ නිසා මම හිතන විධියට අද ජාතික අධ්‍යාපන ආයතනය අයාලෙ යන තැනක් බවට පත් වෙලා තිබෙනවා.

ඊයේ මහින්ද ජයසිංහ නියෝජ්‍ය ඇමතිවරයා අපට දේශනයක් කළා. එතුමා මේ "buddy" කියන වචනය අල්ලාගෙන අපට දේශනයක් පැවැත්වූවා. හැබැයි "ebuddy.net" කියන එක ගැන කියලා එතුමා කිව්වා, ඒක link එකක් කියලා. ඒක link එකක් නොවෙයි, communication tool එකක්. කෙටියෙන් කියනවා නම්, ඒක app එකක්. App එකේ සහ website එකක link එකේ වෙනස හඳුනා ගන්න බැරි මහින්ද ජයසිංහ මහත්තයා ගැන කථා කරලා වැඩක් නැහැ. ඔහු මෙතැන අපට lectures දෙන්න එනවා. අපිට lectures දෙන්නේ කොහොමද, මම දන්නා තරමට අඩු ගණනේ ඔහු ඉස්කෝලෙකදීවත් lecture එකක් දීලා නැහැ. මමත් ගුරුවරයෙක්, ඔහුත් ගුරුවරයෙක්. 6 වසර module එකේ තිබුණේ ඒක නොවෙයි. ඒකෙන් ඇතුළු වන්න තිබෙන්නේ අසභ්‍ය වෙබ් අඩවියකට. ඒ "ebuddy.net" එකයි, මේකයි හඳුනා ගන්න බැරි මහින්ද ජයසිංහ මහත්තයා ගැන කියලා වැඩක් නැහැ. එදා ඉඳලාම ගුරුවරයෙක් කියලා කිව්වාට, අපිට නම් ඇත්තටම ඔහු ගුරුවරයෙක් කියලා කියන්න බැහැ. මට වැරදුණා. මමත් ගුරුවරයෙක්. මම ටික කාලයක් ඉගැන්නුවා. හැබැයි, ව්‍යාපාරයි, ගුරු වෘත්තියයි දෙකම කරන්න ගියොත් දරුවන්ට අසාධාරණයක් වෙන නිසා මම ඒ රැකියාවෙන් අයින් වුණා, ගයන්ත කරුණාතිලක මැතිතුමනි. ඔහු නම් අවුරුදු ගණනක් පඩි ගත්තා. හැබැයි, දරුවන්ට ඉගැන්නුවේ නැහැ. ඒ නිසා ඔහුගේ ගුරුකමයි, මගේ ගුරුකමයි අතර ලොකු වෙනසක් තිබෙනවා. හැබැයි, මහින්ද ජයසිංහ මහත්තයාට අපි කියන්නේ, ඔයගොල්ලන් ගුරුවරුන්ව රවටා, ඒ වාගේම සංවර්ධන නිලධාරින්ව රවටා කරපු බොරුව තවදුරටත් කරන්න උත්සාහ කරන්න එපා කියන එකයි.

දැන් රණ්ඩුවක් නේ තිබෙන්නේ. දැන් ඒගොල්ලන් කියනවා නේ, මේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණය මේ අවුරුද්දේම ගේන්න ඕනෑය කියලා. ගේන්නකෝ ඉතින්, හොඳයි නේ. ඊළඟ කාර්තුවේ ඉඳලා ගේන්න. අපිද විරුද්ධ වෙන්නේ?

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි 2ක කාලයක් තිබෙනවා.

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)

මම ඉක්මනින් කථාව අවසන් කරන්නම්.

බොරුවට පැලවත්තේ රණ්ඩුවක් හදලා, බොරු උද්ඝෝෂණ හදලා, ඒගොල්ලන්ම කණ්ඩායම් යවලා, වැඩේ ඉවර වෙනකොට පඩිත් ගෙවලා. ඉතින් මේ ප්‍රතිසංස්කරණ ගේන්න; අනේ ගේන්න. මේ අවුරුද්දේම ගේන්නකෝ. ගෙනැල්ලා බලන්නකෝ මොකක්ද වෙන්නේ කියලා. ගෝඨාභයට වෙච්ච එකේ ඊළඟ එක තමයි ඊට පස්සේ වෙන්නේ. දෙමව්පියන් තමයි ඔයගොල්ලන්ට ගහලා එළවන්නේ.

අපි අසූවේ දශකයේ ඉඳලා අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වෙනුවෙන් පෙනී හිටින මිනිස්සු; ධවල පත්‍රිකාව ගෙන ඒමේ ඉඳලා පෙනී හිටපු මිනිස්සු. හැබැයි, මේ ගෙනැවිත් තිබෙන්නේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණයක්ද? බහුබූතයක් නේ. 6 වසරේ ඉන්න දරුවන්ගේ වයස කීයද? 6 වසරේදී මොනවාද තේරෙන්නේ? ලිංගිකත්වය ගැන තේරෙනවාද? කුඩා මනසක් තිබෙන ඒ දරුවන්ගේ ඔළුවලට නේ මේ ලිංගිකත්වය ඇතුළු කරන්න හදන්නේ. ඒක ලිංගිකත්වයත් නොවෙයි, විකෘති ලිංගිකත්වය. දරුවන්ගේ ඔළුවලට විකෘති ලිංගිකත්වය ඇතුළු කරන්න ගිහිල්ලා දැන් හත්පොළේ ගා ගෙන තව අපට පාට් එක දමනවා. ඉතින් ගේන්න. දෙවැනි කාර්තුවේ ඉඳලා ගේන්නකෝ, ගෙනැල්ලා බලන්නකෝ මොකක්ද වෙන්නේ කියලා. දෙමව්පියන්ගෙන් ගුටි කාලා, රටේ ජනතාවගෙන් ගුටි කාලා ඔයගොල්ලන්ට ගෙදර යන්න වෙන්නේ නැද්ද කියලා බලන්න. දැනටමත් තැන් තුන හතරකින් ගුටි කාලා තිබෙනවා. හූ කියා තිබෙනවා. හූ කියා එළවා තිබෙනවා. මේක ගේන්න. විපක්ෂය විධියට අපටත් හොඳයි, එහෙම කරනකොට. ගෙනැල්ලා බලන්න. ඒ නිසා මිනිස්සු යවා බොරු අභ්‍යන්තර රණ්ඩු නිර්මාණය කරනවා වාගේ සන්දර්ශන දමන්න එපා.

මම දැක්කා, අපේ මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමා ඊයේ කිව්වා, පැලවත්තට නොවෙයි, ඉසුරුපායට නොවෙයි, ජනාධිපති ලේකම් කාර්යාලයටයි මේ අය යන්න ඕනෑ කියලා. දැන් ජනාධිපතිතුමාගේ මතයයි, අධ්‍යාපන ඇමතිතුමිය වන අගමැතිතුමියගේ මතයයි, ටිල්වින්ගේ මතයයි, කාඩර්වරුන්ගේ මතයයි හතර පොළේ නේ තිබෙන්නේ. දැන් හැම තැනකටම -

[ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා]

ප්‍රාදේශීය සභාවේ ඉඳලා, අමාත්‍යාංශවල ඉඳලා - කාඩර්වරු දමාගෙන. ඒ තැන්වල ඉන්න කාඩර්වරු නේ, මේවා කරන්නේ.

අධ්‍යාපන අමාත්‍යාංශයේ ඉන්න කාඩර්වරුද මේවා විකෘති කළේ කියලා අපි දන්නේ නැහැ. ඒ නිසා අපි කියනවා, අනේ ගේන්න, අධ්‍යාපන ප්‍රතිසංස්කරණය ගේන්න කියලා. මේ ගෙනෙන එක ගෙනාවොත් ඔබතුමන්ලාට ඉතාම ඉක්මනින් -මම පෝය ගණන කියන්නේ නැහැ- ජනතාවගෙන් විතරක් නොවෙයි, තමන්ගේ දෙමව්පියන්ගෙනුත්, තමන්ගේ සහෝදරයන්ගෙනුත් ගුටි කාලා ගෙදර යන්න වෙනවා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු උපාලි පන්නිලගේ අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 14ක කාලයක් තිබෙනවා.

[අ.භා. 1.35]

**ගරු (ආචාර්ය) උපාලි පන්නිලගේ මහතා (ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යතුමා)**
(மாண்புமிகு (கலாநிதி) உபாலி பன்னிலகே - கிராமிய அபிவிருத்தி, சமூகப் பாதுகாப்பு மற்றும் சமூக வலுவூட்டுகை அமைச்சர்)
(The Hon. (Dr.) Upali Pannilage - Minister of Rural Development, Social Security and Community Empowerment)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දින අපි විවාදයට ගන්නේ 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත සංශෝධනය සඳහා වූ කෙටුම්පතයි. ඔබතුමාත් දන්නා පරිදි මෙම විශ්විද්‍යාල පනත මේ වනකොට අවුරුදු 48ක් පැරණියි. උසස් අධ්‍යාපන ක්ෂේත්‍රය පිළිබඳව අද දවසේ අවධානය යොමු කරනකොට මේ විශ්වවිද්‍යාල පනත වර්තමාන සන්දර්භයට ගැළපෙන විධියට සංශෝධනය කිරීම අත්‍යවශ්‍ය කාරණයක් වනවා. මේ පනත අවසන් වතාවට සංශෝධනය කළේ 2016දී. ඒ අවස්ථාවේදීත් සංශෝධනය කළේ කාර්ය මණ්ඩලවල විශ්‍රාම යාමේ වයස වැනි කාරණාවකට මිසක් මේ වාගේ ප්‍රජාතාන්ත්‍රික සංශෝධනයක් පසුගිය අවුරුදු 48 පුරාවටම ගෙන එන්න හැකි වෙලා නැහැ. ඒ නිසා අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය විශ්වවිද්‍යාල පනතට ගෙන එන මෙම සංශෝධන ඉතාම කාලෝචිත, ඒ වාගේම අත්‍යවශ්‍ය සංශෝධන විධියට මම පළමුවෙන් හඳුන්වා දෙන්න කැමැතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මේ සංශෝධනවල අරමුණු මොනවාද? ප්‍රධාන වශයෙන්ම අංශාධිපතිවරු පත් කිරීම සහ අංශාධිපතිවරුන්ගේ ධුර කාලය නිර්ණය කිරීම, පීඨාධිපතිවරුන් පත් කිරීම සහ ඔවුන්ගේ ධුර කාලය නිර්ණය කිරීම, ඒ වාගේම පීඨාධිපතිවරුන් ඉවත් කිරීම වැනි කටයුතු සම්බන්ධයෙන් මෙතෙක් පැවති ක්‍රමය වඩාත් ප්‍රජාතන්ත්‍රීය ව්‍යුහයකට ගෙන එන එක තමයි මේ සංශෝධනවල ප්‍රධාන අරමුණ වන්නේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. නමුත් මේ උසස් අධ්‍යාපන විෂයය පිළිබඳව අපි කථා කරනකොට අද උදේ ඉඳලා කථා කළ විපක්ෂයේ ඇතැම් මන්ත්‍රීවරු අධ්‍යාපනය ගැනවත් කථා කරන්න දන්නේ නැහැ කියලා හිතුණා. ඒගොල්ලන් හිතාගෙන ඉන්නවා, උසස් අධ්‍යාපනය කියන්නේ පාසල් අධ්‍යාපනය කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඉතින් ඒ නිසා මම මුලින්ම පැහැදිලි කරන්න ඕනෑ, මෙහි තිබෙන වැදගත්කම සහ මොනවාද අපි මේ කථා කරන්නේ කියන එක පිළිබඳව. ලංකාවේ විශ්වවිද්‍යාලයක පීඨ මණ්ඩලයක් කියන්නේ මොකක්ද, සනාතන සභාවක් කියන්නේ මොකක්ද, පාලක සභාවක් කියන්නේ මොකක්ද කියලා අධ්‍යයනය කරලා එන්නේ නැතුව, ඒ පිළිබඳව කිසිම දෙයක් දන්නේ නැතුව, "යන්නෙ කොහෙද?" ඇහුවාම, "මල්ලෙ පොල්" කිව්වා වාගේ කථා තමයි උදේ ඉඳලා විපක්ෂයේ ඇතැම් මන්ත්‍රීවරුන්ගෙන් අපට අහන්න ලැබුණේ. ඒ ගැන මම ඉතාම කනගාටු වනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. උසස් අධ්‍යාපනය පිළිබඳව ඉදිරිපත් කරන ඉතාම වැදගත් සංශෝධන පිළිබඳව මේ රටේ ජනතාව අවධානයෙන් ඉන්න මොහොතක, උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයේ කරන මේ සංශෝධන මොනවාද, ඒවා හරහා ඔවුන්ගේ අනාගත දරුවන්ට මොන වාගේ සෙතක්, සුබසිද්ධියක් සැලසෙනවාද කියන එක පිළිබඳව අපි ඔවුන්ගේ අවධානය යොමු කරවන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශ්වවිද්‍යාලයක් සමන්විත වන පීඨ ගණනාවක් තිබෙනවා. ඒ පීඨයක් සමන්විත වනවා, පීඨාධිපතිවරයෙකුගෙන්, ඒ පීඨයට අදාළ අධ්‍යයනාංශවල අංශාධිපතිවරුන්ගෙන් සහ ස්ථිර අධ්‍යයන කාර්ය මණ්ඩලයෙන්. ඊට අමතරව පීඨයකට නියෝජනයක් ලැබෙනවා, අධ්‍යයන සහායක කාර්ය මණ්ඩලයේ තවත් සාමාජිකයන් දෙදෙනෙකුගෙන් සහ ඒ ප්‍රදේශයෙන් හෝ ජාතික වශයෙන් අධ්‍යාපන ක්ෂේත්‍රයට දායකත්වයක් දක්වන්න පුළුවන් ක්ෂේත්‍රයේ තවත් ප්‍රවීණයන් තුන්දෙනෙකුගෙන්. ඒ අයගෙන් තමයි පීඨ මණ්ඩලයක් සමන්විත වන්නේ.

ඒ වාගේම පීඨාධිපතිවරයා පත් කර ගැනීමේදී දැනට පවතින ක්‍රමය කුමක්ද? දැනට පවතින ක්‍රමය අනුව පීඨ මණ්ඩලයේ ඡන්දයෙන් පීඨාධිපතිවරයෙක් පත් කර ගන්න පුළුවන්. නමුත් දැනට තිබෙන ගැටලුව කුමක්ද? ගැටලුව තමයි, පීඨාධිපති නිලවරණයට ඉදිරිපත් විය හැක්කේ ඒ පීඨයේ අධ්‍යයනාංශ ප්‍රධානීන්ට පමණක් වීම. එහෙම නම් ඒක ප්‍රජාතන්ත්‍ර විරෝධී වෙන්නේ කොහොමද? දැන් විපක්ෂ නායකතුමාත් කිව්වා, මෙය ප්‍රජාතන්ත්‍ර විරෝධී සංශෝධනයක් කියලා. දැනට අංශාධිපතිවරුන්ට විතරක් පීඨාධිපති තනතුරට ඉල්ලන්න තිබෙන අවස්ථාව වෙනස් කරලා, අධ්‍යයන අංශයක ඉන්න ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරුන්, සහාය මහාචාර්යවරුන් හා මහාචාර්යවරුන් ඇතුළු සියලුදෙනාටම පීඨාධිපති නිලවරණයට ඉල්ලන්න අවස්ථාවක් ලබා දීම මඟින් අපි තීරණ ගැනීමේ ක්‍රියාවලිය ප්‍රජාතාන්ත්‍රික කරලා තිබෙනවා. විශ්වවිද්‍යාල පනත සංශෝධනය වීමෙන් පසුව කිසියම් පීඨයක ඉන්න අංශාධිපතිවරුන්ට පමණක් නොවෙයි, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරුන්ට (I වන ශ්‍රේණිය), එතැනින් එහාට ඉන්න සහාය මහාචාර්යවරුන්ට, මහාචාර්යවරුන්ට සහ ජ්‍යෙෂ්ඨ මහාචාර්යවරුන්ට පීඨාධිපති නිලවරණය සඳහා ඉදිරිපත් වීමේ හැකියාව ලැබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙය තවදුරටත් ප්‍රජාතන්ත්‍රවාදී වෙන්නේ කොහොමද? දැනට පීඨාධිපතිවරයෙකුගේ නිල කාලයේ සීමාවක් නැහැ. වසර තුනකට තමයි පත් කරන්නේ. වසර තුනකින් පසුව නැවත නැවතත් ඕනෑම වාර ගණනක් එම ධුරයට පත් කරන්න පුළුවන්. ඉදිරිපත් කර තිබෙන මේ සංශෝධනය මඟින් අපි පීඨාධිපතිවරයාගේ ධුර කාලයට යම් සීමාවක් පනවා තිබෙනවා. ඒ හරහාත් විශ්වවිද්‍යාලවල තීරණ ගැනීමේ ක්‍රියාවලිය අපි තවදුරටත් ප්‍රජාතාන්ත්‍රික කරලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අධ්‍යයන අංශ ප්‍රධානවරුන් දැනට පත් කරනු ලබන්නේ උපකුලපතිවරයා විසින්. ඒ ඕනෑම පත් කිරීමක් අවසානයේ පාලක මණ්ඩලයෙන් අනුමත විය යුතුයි.

නමුත්, අපි පනතට සංශෝධනයක් ඉදිරිපත් කරලා තිබෙනවා, උපකුලපතිවරයාගේ නිර්දේශය මත පාලක සභාව විසින් අධ්‍යයන අංශ ප්‍රධානවරුන් පත් කළ යුතුයි කියලා. අධ්‍යයන අංශ ප්‍රධානවරුන් පත් කිරීම කෙරෙහිත් අපි තවදුරටත් පුළුල් විධියට ප්‍රජාතන්ත්‍රවාදී වෙලා තිබෙනවා. තනි පුද්ගලයෙකු විසින් ගනු ලබන තීරණ වෙනුවට අපි සාමූහික තීරණ කෙරෙහි අවධානය යොමු කරලා තිබෙනවා. දැන් තිබෙන ක්‍රමය කුමක්ද? අධ්‍යයන අංශ ප්‍රධානවරුන් පත් කරනවා, උපකුලපති විසින්. ඒ අධ්‍යයන අංශ ප්‍රධානවරුන් අතුරින් එක්කෙනෙක් පීඨාධිපති වශයෙන් පත් කරනවා. පීඨාධිපතිවරුන්ගෙන්, අංශාධිපතිවරුන්ගෙන් තමයි ප්‍රධාන වශයෙන් සනාතන සභාව සමන්විත වන්නේ. සනාතන සභාව සමන්විත වන්නේ පීඨාධිපතිවරු සහ අංශාධිපතිවරුන්ගෙන්. මහාචාර්යවරුන්ගෙන් විතරයි විශ්වවිද්‍යාලයක සනාතන සභාවක් සමන්විත වන්නේ. එතකොට මොකද වෙන්නේ? එක් පුද්ගලයෙකුට සම්පූර්ණ බලය හිමි වනවා, අංශාධිපතිවරු පත් කරන්න. ඒ අය අතුරින්ම පීඨාධිපතිවරු පත් කරනවා. ඒ අය අතුරින්ම විශාල ප්‍රමාණයක් සනාතන සභාව නියෝජනය කරනවා. ඒ විධියට අපි මෙතැන ප්‍රජාතන්ත්‍රවාදී කරලා තිබෙනවා. අංශාධිපති තනතුරටත් විශාල ප්‍රමාණයකට ඉදිරිපත් වෙන්න පුළුවන්. ඒ වාගේම පීඨාධිපති තනතුරටත් ඉදිරිපත් වෙන්න ඒ පීඨයේ ඉන්න ආචාර්යවරුන්ටත් අපි අවස්ථාවක් ලබා දීලා තිබෙනවා. විශ්වවිද්‍යාලයක සනාතන සභාව තමයි, අධ්‍යයන කාර්යයන් පිළිබඳව තීරණ ගන්නා ප්‍රධානතම මණ්ඩලය. ඒ මණ්ඩලය, විශ්වවිද්‍යාලයේ සියලු පීඨාධිපතිවරු, සියලු අංශාධිපතිවරු, සියලු ජ්‍යෙෂ්ඨ මහාචාර්යවරු හා මහාචාර්යවරු, පීඨ මණ්ඩලය විසින් නම් කරන පීඨයේ අනෙක් ආචාර්යවරු නියෝජනය කරන නියෝජිතයන්ගෙන් සමන්විත වනවා. මෙන්න මේ සංශෝධනය මඟින් අපි ප්‍රජාතන්ත්‍රවාදී දිශාවට එය ගෙනැල්ලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පාලක සභාව කියන්නේ මොකක්ද? පාලක සභාව සමන්විත වෙන්නේ විශ්වවිද්‍යාලයේ ඉන්න සියලු පීඨාධිපතිවරුන්, උපකුලපතිවරයා හා නියෝජ්‍ය උපකුලපති ඉන්නවා නම් නියෝජ්‍ය උපකුලපති, සනාතන සභාව නියෝජනය කරන නියෝජිතයින් දෙදෙනෙක් සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන සාමාජිකයින්ගෙන්. ඒ නිසා නැවතත් මම කියනවා, තිබුණු ක්‍රමය යටතේ අංශාධිපතිවරු පත් කරන්නේ උපකුලපතිවරයා තමන්ගේ තනි කැමැත්තට නම්, පීඨාධිපතිවරු පත් කරන්නේ ඒ අය අතුරින් නම්, පාලක සභාවට යන්නේ ඒ පීඨාධිපතිවරු නම් අත්තනෝමතික, කතිපයාධිකාරි තීරණ ගැනීමේ ක්‍රමයක් තිබුණාය කියන එක. ඒ වෙනුවට වඩාත් ප්‍රජාතාන්ත්‍රික වාගේම සාමූහික තීරණ ගැනීමේ ක්‍රියාවලියක් සඳහා උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයේ ව්‍යුහාත්මක වෙනසක් ඇති කිරීමට තමයි අපි මේ සංශෝධන ගෙනෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විපක්ෂයේ අයට උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයේ තිබෙන මේ කාරණා ගැන කථා කරන්න බැරි ඇයි කියන එක සම්බන්ධයෙන් විශේෂයෙන්ම මට තේරුම් ගන්න පුළුවන්. මම මේ කාරණා කථා කරන්නේ මේ කියන සෑම යන්ත්‍රණයකම හිටපු පුද්ගලයෙක් විධියටයි. අංශාධිපතිවරයෙක් විධියටත්, පීඨාධිපතිවරයෙක් විධියටත්, සනාතන සභා සාමාජිකයෙක් විධියටත්, පාලක සභා සාමාජිකයෙක් විධියටත් වසර ගණනාවක් වැඩ කරලා මේ පිළිබඳව අත්දැකීම් තිබෙන පුද්ගලයෙක් විධියටයි මම මේ ගැන කථා කරන්නේ. ඒ වාගේම අපේ ආණ්ඩු පක්ෂයේ විශ්වවිද්‍යාල ආචාර්යවරු 12දෙනෙක් ඉන්නවා. ඒ සියලුදෙනාටම මේ ගැන හොඳ අත්දැකීමක් තිබෙනවා. අපි සැබෑ අත්දැකීම් භාවිත කරලා, විශ්වවිද්‍යාල ප්‍රජාවගෙන් අවශ්‍ය සහයෝගය ලබාගෙන, ඔවුන්ගේ අදහසුත් එක්ක තමයි මේ සංශෝධනය ගෙනෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ එක්කම මම මේ කාරණයත් මතක් කරන්න ඕනෑ. මෙතැනදී කථා කළා, පසුගිය වසරක කාලය තුළ අපි මේ විශ්වවිද්‍යාල ක්ෂේත්‍රයේ ඉටු කරපු කාර්යයන් පිළිබඳව. ඒ වාගේම විශේෂයෙන්ම මතු කළා, විශ්වවිද්‍යාල ක්ෂේත්‍රයේ පුරප්පාඩු පැවතීම පිළිබඳව. මම ඒ ගැනත් කියන්න ඕනෑ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. රාජ්‍ය සේවයේ ලක්ෂ 4කට අධික පුරප්පාඩු ප්‍රමාණයක් පසුගිය කාලයේ සිටි පාලකයින් විසින් වසර ගණනාවක් බඳවා නොගැනීම මඟින් ඇති කළා. එහි ප්‍රතිඵල විශ්වවිද්‍යාලවලටත් භුක්ති විඳින්න සිදු වෙලා තිබෙනවා. අපි බලයට පත් වෙනකොට විශ්වවිද්‍යාලවල පුරප්පාඩු 5,680ක විතර ප්‍රමාණයක් තිබුණා. ඒ පුරප්පාඩු අතුරින් මේ වනකොට අපි විශේෂයෙන්ම අධ්‍යයන ක්ෂේත්‍රයේ පුරප්පාඩු 1,384කුත්, අනධ්‍යයන ක්ෂේත්‍රයේ පුරප්පාඩු 2,329කුත් වශයෙන් පුරප්පාඩු 3,713ක් සඳහා බඳවා ගැනීමට අවශ්‍ය අනුමැතිය ලබා දී තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. එය වසර ගණනාවක් තිස්සේ බඳවා නොගැනීම හේතුවෙන් ඇති වුණු පුරප්පාඩුවලින් සියයට 65ක්. නමුත් අපි දන්නවා, විශ්වවිද්‍යාලවලට බඳවා ගැනීම අමාත්‍යාංශයකට, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසමට එහෙම නැත්නම් ඇමතිවරයෙකුට කරන්න බැහැ කියලා. විශ්වවිද්‍යාලවලට බඳවා ගැනීම කරන්නේ ඒ විශ්වවිද්‍යාලයේ පාලක සභාව විසින්. අන්න ඒ ක්‍රියාවලියේදී බඳවා ගැනීම් ප්‍රමාද වෙලා තිබෙනවා නම්, ඉක්මනට බඳවා ගන්න අපි අනුමැතිය ලබා දීලා තිබෙනවා කියන එකත් මම මේ අවස්ථාවේදී ඒ විශ්වවිද්‍යාලවලට මතක් කරනවා.

ඒ වාගේම මෙතැනදී තවත් කාරණයක් මතු වුණා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. විශේෂයෙන්ම පසුගිය වසර තුළ අප විසින් ඉටු කරපු යම් යම් සුබසාධන කටයුතු අවතක්සේරුවට ලක් කිරීමක් සිදු වුණා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම විශේෂයෙන්ම කියන්න ඕනෑ, අපි බලයට පත්ව ගත වුණු වසරක කාලය තුළ උසස් පෙළ සමත් ශිෂ්‍යයින්ට වාගේම විශිෂ්ට දක්ෂතා දක්වන අයට විදේශීය විශ්වවිද්‍යාලවල උපාධි හැදෑරීම සඳහා ශිෂ්‍යත්ව ක්‍රමයක් ආරම්භ කර මේ වෙනකොට ඒ කටයුතු කරගෙන යන බව. ඒ ඔස්සේ විශේෂයෙන්ම විශිෂ්ටතා දක්වන උසස් පෙළ සමතුන්ට විදේශීය අත්දැකීම් ලබාගෙන, ජාත්‍යන්තර තලයේ පිළිගත් විශ්වවිද්‍යාලවල අධ්‍යාපනය ලබා, ඒ දායකත්වය, අත්දැකීම් සහ දැනුම අපේ රටට දායක කරන්න අපි අවස්ථාව හිමි කර දී තිබෙනවා. ඒ වාගේම, අපි බලයට පත් වනකොට රුපියල් 5,000ක්ව තිබුණු මහපොළ දීමනාව රුපියල් 10,000 දක්වා වැඩි කළා. ඒ වාගේම, ශිෂ්‍යාධාර දීමනාව රුපියල් 4,000 සිට රුපියල් 9,000 දක්වා වැඩි කළා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ශිෂ්‍යයින්ගේ නේවාසිකාගාර ප්‍රශ්න වසර ගණනාවක් තිස්සේ තිබුණු බව අපි දන්නවා. අපි මේ වසරේදී විතරක් අලුතින් නේවාසිකාගාර ඉදිකිරීම සඳහා රුපියල් මිලියන 1,500ක් වෙන් කර තිබෙනවා. ඒ විතරක් නොවෙයි, අපි සාමාන්‍ය ජනතාව ගැන, විශේෂයෙන්ම සමාජයේ ආන්තික ජනතාව ගැන හිතන රජයක් විධියට ආබාධ සහිත සිසුන් විශ්වවිද්‍යාලවලට ඇතුළත් කර ගැනීම සඳහා අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ තිබෙන උසස් අධ්‍යාපන අනුකාරක සභාව විසින් මේ වෙනකොට වෙනම ප්‍රතිපත්තියක් සකස් කරලා, ඒ වෙනුවෙන් කටයුතු කරගෙන යනවා. ඒත් එක්කම, ආබාධ සහිත සිසුන් විශ්වවිද්‍යාලවලට ඇතුළත් වීමේදී ඔවුන්ට රුපියල් 5,000ක අමතර ආධාරයක් ලබා දීමට මෙවර අය වැයෙන් අපි මුදල් වෙන් කළා. ඒ වාගේම, විශ්වවිද්‍යාලවල ආපණ ශාලා, පුස්තකාල පහසුකම්, ක්‍රීඩා වැනි දේවල් වැඩිදියුණු කිරීම සඳහා රුපියල් මිලියන 1,800ක් වෙන් කළා.

විශ්වවිද්‍යාල තුළින් නව දැනුම ජනනය කරන්න ඕනෑ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ අනුව, නව දැනුම ජනනය

[ගරු (ආචාර්ය) උපාලි පන්නිලගේ මහතා]

කිරීම සඳහාත්, නව පර්යේෂණ ඇති කිරීම සඳහාත් 2026 අය වැයෙන් විතරක් අපි රුපියල් මිලියන 11,500ක් වෙන් කළා. ඒ වාගේම උසස් පෙළ සමතුන්ට පොලී රහිත ණය ලබා දීම සඳහා 2025 වර්ෂයේදී රුපියල් මිලියන 2,785කුත්, 2026 වසරේදී රුපියල් මිලියන 3,057කුත් වෙන් කිරීම තුළින් අපි ඒ අයට ණය පහසුකම් ලබා දීම හරහා උසස් අධ්‍යාපන අවස්ථා පුළුල් කර තිබෙනවා.

අවසාන වශයෙන් මම මේ කාරණයත් කියන්න ඕනෑ. විශ්වවිද්‍යාල ඩිජිටල්කරණය කිරීම සඳහා අපි මේ වසරේ සැලකිය යුතු මුදලක් වෙන් කළා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මේ සංශෝධනය තුළින් අපි සිදු කරන්නේ විශ්වවිද්‍යාල පද්ධතිය තුළ වඩාත් ප්‍රජාතාන්ත්‍රික විධියට තීරණ ගැනීමේ ක්‍රියාවලිය පුළුල් කරන එකයි. ඒ ඔස්සේ අනාගතයට ගැළපෙන විධියේ විශ්වවිද්‍යාල පද්ධතියක් අපේ රටේ නිර්මාණය කරන්න පුළුවන්. එයින් බිහි වන උපාධිධාරින්, පශ්චාත් උපාධිධාරින් අපේ රටට සුවිශාල දායකත්වයක් දක්වන්න පුළුවන් පුරවැසියන් බවට පත් කිරීම තමයි අපේ ඒකායන අරමුණ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු චාමර සම්පත් දසනායක මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් තිබෙනවා.

**[අ.භා. 1.49]**

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද news එක ගිහින් තිබෙන්නේ චාමර සම්පත්ට අධිචෝදනා භාර දුන්නාය කියායි. නමුත්, ඒක news එකක් නොවෙයි. ආණ්ඩුවට පුළුවන් නම් එල්ලුම්ගහ ගෙනැල්ලා අහවල් දවසේ චාමර සම්පත් එල්ලනවා කිව්වොත්, ඒක news එකක්. ඒකට අපි සූදානම්. මම මේ රටේ ජනතාවට කියනවා, එල්ලුවත්, මැරුවත්, වෙඩි තිබ්බත්, මොනවා කළත් මේ ආණ්ඩුවට විරුද්ධව ජනතාව දෙන තොරතුරු මේ පාර්ලිමේන්තුවේදී අපි ඉදිරිපත් කරනවා කියන එක. ජනතාවට විරුද්ධව වැඩ කරන මේ ආණ්ඩුවේ තිබෙන සෑම ප්‍රශ්නයක්ම මේ පාර්ලිමේන්තුවට ඇවිල්ලා නොබියව, කිසිම භයක් නැතිව කියනවා. හිරේ නොවෙයි මොකේ දැම්මත් ඒවාට මුහුණ දෙන්න සූදානම් කියන එකත් මේ වෙලාවේදී මතක් කරන්න ඕනෑ.

අද අධ්‍යාපන අමාත්‍යාංශය ගැන තමයි කථා කරන්නේ. අධ්‍යාපන අමාත්‍යාංශය ගැන කථා කරන මේ වෙලාවේදී මම මේකත් කියන්න ඕනෑ. අවුරුදු විසි ගණනක්, තිස් ගණනක් අපි පළාත් සභාවල මහ ඇමතිකම් කරද්දී, අපි ආණ්ඩු කරද්දී, අපි වැඩ කළේ ඔයගොල්ලන්ගේ unionsවලින් අහලා, ඔයගොල්ලන්ගේ unions ගෙන්වලා එක මේසේ තියලා සාකච්ඡා කරලා. ඒ විධියට ආපු ඔයගොල්ලන් අද කරන්නේ කොහොමද දන්නවා ද? මේ වෙනකොට දකුණු පළාතේ අධ්‍යාපන පරිපාලන සේවයේ සියලුම දෙනා මාරු කරලා. කිසිම ප්‍රතිපත්තිමය තීන්දුවක් නැතිව, දේශපාලන තීන්දු අරගෙන දකුණේ ඉන්න අධ්‍යාපන පරිපාලන සේවයේ නිලධාරින් මාරු කරනවා; ගුරුවරු මාරු කරනවා. ඒ කාලයේ ඔයගොල්ලන් අපිට ඇවිල්ලා කිව්වේ, මම මහ ඇමති වෙලා හිටපු කාලයේ ඔයගොල්ලන් අපිට ඇවිල්ලා කිව්වේ, ගුරුවරයෙක් මාරු කරනවා නම්, පරිපාලන සේවයේ කවුරු හරි මාරු කරනවා නම් අපේ තිබෙන unions එක්කත් සාකච්ඡා කරලා, එක මේසයේ ඉඳන් කරන්න කියලයි. හැබැයි, අපි ඒ කාලයේ ඔයගොල්ලන්ට ඇහුම්කන් දුන්නා. අද ඔයගොල්ලන් ඒවාට ඇහුම්කන් දෙන්නේ නැහැ. ඒ ගැනත් මේ වෙලාවේදී මතක් කරන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඊළඟට තව කාරණයක් කියන්න ඕනෑ. මම අගමැතිතුමියට මාස දෙකකට කලින් කිව්වා, උසස් පෙළ ආර්ථික විද්‍යාව ප්‍රශ්න පත්‍රයට සමාන ආකාරයේ ප්‍රශ්න පත්‍රයක්; ප්‍රශ්න කිහිපයක් නුගේගොඩ "සක්යා" ආයතනයෙන් ලබාදීලා තිබෙන නිසා, ඒකෙන් අපේ රටේ අනෙක් දරුවන්ට අසාධාරණයක් සිද්ධ වුණා කියලා. "සක්යා" ආයතනයේ පන්ති ගිය ළමයින්ට නොවෙයි, උසස් පෙළ ආර්ථික විද්‍යාව ප්‍රශ්න පත්‍රයට මුහුණ දීපු අනෙක් ළමයින්ට ඒ නිසා අසාධාරණයක් වුණා. අද වනතුරු මේ අගමැතිතුමිය, අධ්‍යාපන ඇමතිතුමිය ඒ වෙනුවෙන් පරීක්ෂණයක් පවත්වා නැහැ. ඒක ගැන පරීක්ෂණයක් පවත්වනවා කියලා කිව්වා. නමුත්, තවම ඒ සම්බන්ධයෙන් පරීක්ෂණයක් පවත්වලා නැහැ. මේ වෙනකොට paper markingත් යනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, හෙට-අනිද්දා වෙනකොට ඒ උසස් පෙළ විභාගයේ ප්‍රතිඵලත් එළියට එනවා.

ඊළඟ එක තමයි, ගුරුවරුන්ගේ දුෂ්කර දීමනාව. දැන් ඔයගොල්ලන් Budget එකේදී කිව්වා, ගුරුවරුන්ගේ දුෂ්කර දීමනාව වැඩි කර දෙනවා කියලා. මට ඊයේ-පෙරේදා කථා කළා, මොනරාගල දිස්ත්‍රික්කයේ සියඹලාණ්ඩුවේ පාසල්වල සේවය කරන ගුරුවරු; දුෂ්කර පාසල් තිබෙන සියඹලාණ්ඩුවේ සේවය කරන ගුරුවරු. ඒ දුෂ්කර දීමනාවත් දැන් ඔයගොල්ලන් ලබන මාසයේ ඉඳන් නවත්වන්න යන්නේ. ඒ දුෂ්කර දීමනාව අපි අද-ඊයේ ලබා දුන්නු එකක් නොවෙයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සියඹලාණ්ඩුව, මහියංගණය, වව්නියාව, ත්‍රිකුණාමලය, පොළොන්නරුව වාගේ ප්‍රදේශවලට ගුරුවරු ගියේ ඔය දුෂ්කර දීමනාවෙන් තමයි. දැන් ඒ දුෂ්කර දීමනාවත් ඔයගොල්ලන්ගේ ආණ්ඩුවෙන් නවත්වලා තිබෙනවා. හැබැයි, ගුරුවරුන්ගෙන් සියයට 90ක් විතර මාලිමාවට ඡන්දය දීලා හොඳට ටික, ටික සනීප කර ගන්නවා. තව ටිකක් කල් යනකොට තමයි ගුරුවරුන්ට හොඳටම සනීප වෙන්නේ. ඒකත් මම මේ වෙලාවේදී මතක් කරන්න ඕනෑ.

ඒ වාගේම, ළමයින් 50ට අඩු දුෂ්කර පාසල් වසා දමන්නත් සූදානම් වෙනවා. ඊයේ-පෙරේදාත් මට පානදුර පැත්තෙනුත් කිව්වා පාසල් වහන්න යනවා කියලා. උදාහරණයක් මම කියන්නම්. මම ප්‍රාදේශීය සභාවේ සභාපති වෙච්ච, මන්ත්‍රී වෙච්ච ඇල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ තිබෙනවා, ඉලුක්පැලැස්ස සහ දොඩම්ගොල්ල කියලා පාසල් දෙකක්. ඔයගොල්ලන් ඇල්ල වැල්ලවාය පාරේ යනකොට බලන්න පුළුවන්, කන්ද පාමුල තිබෙන පාසල් දෙකක්. මේකේ දැන්නම් පොඩ්ඩක් යන්න පුළුවන්. මම ඒ පාර ටිකක් හදලා තිබෙනවා. ඉස්සර ඒ ප්‍රදේශවල මිනිස්සු බල්ලකෙටුව කියන නගරයට බඩු අරගෙන ආවේ කර බරින් නැත්නම් හරකුන්ගේ බරින්. දැන් එතැන පාසල් දෙකක් තිබෙනවා. ඒ පාසල් දෙකම ළමයින් 50ට අඩු පාසල් දෙකක්. හැබැයි, මේ ළමයින්ට එන්න හරිම අපහසුයි. දැන් ඒ පාසල් වහන්න හදනවා. ඒ පාසල් වැහුවාම ඒ ළමයින්ට ආපහු යන්න තැනක් නැහැ. ඒක මේ අය හොඳටම දන්නවා. හල්දුම්මුල්ල ප්‍රදේශයේත් ඒ වාගේ දුෂ්කර පාසල් තිබෙනවා. හල්දුම්මුල්ල බලන අපේ රවීන්ද්‍ර බණ්ඩාර මන්ත්‍රීතුමාත් මේ සභාවේ ආණ්ඩුව පැත්තේ වාඩිවෙලා දැන් ඉන්නවා. එතුමාට ඒක නැහැ කියන්න බැහැ. හල්දුම්මුල්ල කියන්නේ මහා දුෂ්කර ප්‍රදේශයක්. එක පැත්තකින් බලන්ගොඩට මායිම් වෙලා, අනෙක් පැත්තෙන් වැල්ලවායට මායිම් වුණු ප්‍රදේශයක්. ළමයින් 50ට අඩුයි කියලා

එම පාසල් වැහුවාම ඒ ළමයින් අනාථ වෙනවා. ඒ ගැනත් මේ වෙලාවේදී කියන්න ඕනෑ.

ඊළඟට, චන්ද්‍රිකා කුමාරතුංග මහත්මිය ඒ කාලයේ රැකියා විරහිත උපාධිධාරින් 50,000කට රජයේ රැකියා දුන්නා. මහින්ද රාජපක්ෂ මහත්මයාත් ඒ කාලයේ රැකියා විරහිත උපාධිධාරින් 50,000කට රජයේ රැකියා දුන්නා. ගෝඨාභය රාජපක්ෂ මහත්මයාත් රැකියා විරහිත උපාධිධාරින් 50,000කට රජයේ රැකියා දුන්නා. කෙළින්ම රැකියා 150,000ක් දුන්නා, රැකියා විරහිත උපාධිධාරින්ට. ඔයගොල්ලන්ගේ මන්ත්‍රීතුමන්ලාටත් දුන්නා. වි.ජ.මු. ලොකු බණ්ඩාර ඒ කාලයේ පත්වීම් 1,000ක් දුන්නා. එහෙම එක්කෙනෙක් තමයි ඊයේ පෙරේදා ඉංග්‍රීසි කථා කළේ; අවුරුදු 38ක් කටයුතු කර තිබෙන මාතර පැත්තේ මහත්තයෙක්. ඒ කාලයේ රැකියා විරහිත උපාධිධාරින්ට පත්වීම් දුන්නා. මට මතකයි මහින්ද මහත්තයා පත් වීම් දුන්නේ Sugathadasa Stadium එකට ගෙනැල්ලා. චන්ද්‍රිකා මැඩම් පත්වීම් දුන්නා. 1998දී චන්ද්‍රිකා මැඩම් තමයි පළමුවෙනි වතාවට සංවර්ධන නිලධාරි පත්වීම් දුන්නේ. ගෝඨාභය මහත්තයා පත්වීම් දුන්නා. ඒ ඔක්කෝමලා පත්වීම් දුන්නා. ඒ ඔක්කෝම අන්තිමට ගොඩ වුණේ ඔයගොල්ලන්ට, ඒ ඔක්කෝම canvassing ගියේ ඔයගොල්ලන්ට, ඒ ඔක්කෝම ඡන්දය දුන්නේ ඔයගොල්ලන්ට.

දැන් මම ඔයගොල්ලන්ගේ ආණ්ඩුවෙන් ඉල්ලීමක් කරනවා. අනෙක් ආණ්ඩුත් දුන්නා නම් ඔයගොල්ලනුත් දෙන්න. අපි ඔයගොල්ලන්ට පත්වීම් දෙන්න එපා කියන්නේ නැහැ. මම අත් දෙකම උස්සනවා උපාධිධාරින්ට පත්වීම් දෙනවා නම්. මම සභාව මැදට ගිහිල්ලා පුළුවන් විධියට, - මගේ ඇඟ මහත වැඩියි - ඔළුවෙන් හිටගෙන, කකුල් දෙකත් උස්සලා පෙන්වන්නම්. ඔයගොල්ලනුත් උපාධිධාරින් 50,000කට රස්සාවල් දෙන්නකෝ. මොකද, ඔයගොල්ලන්ට විශ්වවිද්‍යාලවලදී කඩේ ගිය මිනිස්සු තමයි උපාධිධාරින්. ඒ උපාධිධාරින්ට දෙන්නකෝ රක්ෂාවල් 50,000ක්. මොකද, ඔයගොල්ලන්නේ ඒ මිනිස්සුන්ගෙන් වැඩ ගත්තේ. ඒ ගොල්ලන්නේ කඳුළු ගෑස් කෑවේ, ඒ මිනිස්සුනේ පණ යනකම් කඳුළු ගෑස් කකා ඔයගොල්ලන්ගේ ආණ්ඩුව ගේන්න වැඩ කළේ. *[බාධා කිරීමක්]*

ඊළඟ කාරණය තමයි, ඉපලෝගම රණජයපුර පොලිස් ස්ථානාධිපතිතුමා ගෙදර රට කෑම උයන්න කියලා කාන්තාවක් අරගෙන ගිහින් එළිවෙනකම් තියාගෙන ඉඳලා. එහෙම ඉඳලා මොකක්දෝ ලොකු මඟුලක් කරලා ඒ මනුස්සයා ඒ ගැන "හිරු" එකේ කිව්වා. දැන් facts report කරලා තිබෙනවා. ඒ පොලිස් ස්ථානාධිපතිතුමාට විරුද්ධව අනුරාධපුරයේ නියෝජ්‍ය පොලිස්පතිවත්, පොලිස්පතිතුමාවත් තවම පියවර අරගෙන නැහැ. අර කාන්තාව වැරදිද, කැමැත්තෙන්ද, අකැමැත්තෙන්ද අපිට වැඩක් නැහැ. කාන්තාව ඇවිල්ලා දැන් newsවලට කියනවා "මාව අරගෙන ගියා, මට මෙහෙම කළා, මෙහෙම කළා, මෙහෙම වුණා" කියලා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. නමුත් මේ ඉපලෝගම රණජයපුර පොලිස් ස්ථානාධිපතිතුමා තවම පොලිස් ස්ථානාධිපති හැටියට ඉන්නවා. මෙහෙම වෙන්න බැහැ. එයාට දැන් facts report කරලා තිබෙනවා. හැබැයි මට ආරංචියි ඒ, පොලීසිය භාර ඇමතිතුමාගේ ඥාතියෙක් හෝ හිතවතෙක් කියලා. මේවා මේ රටේ වෙන්න බැහැ. ඔයගොල්ලන් පිරිසිදු මිනිස්සු. ඔයගොල්ලන්ගෙන් මෙහෙම වෙන්නේ නැහැ කියලා තමයි ජනතාව ඡන්දය දුන්නේ. ඒ නිසා මේකත් හොඳට මතක තියා ගන්න. ඒ පොලිස් ස්ථානාධිපතිතුමා තවම ඒ පොලීසියේ ස්ථානාධිපති හැටියට යහතින් ඉන්නවා. ඒකත් මම මේ වෙලාවේදී මතක් කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා බස්නාහිර නේ. බස්නාහිර පළාතේ 11 වසරේ වාර විභාගයේ ඉතිහාසය paper එක එළියට ඇවිල්ලා. විභාගය තියන්න දවස් තුනකට කලින් වාර විභාග paper එක එළියට ඇවිල්ලා. අධ්‍යාපනය මෙහෙම විනාශ කරන්න එපා. අගමැතිතුමියට අධ්‍යාපනය කරන්න බැරි නම් අගමැතිතුමියට දෙන්න වෙන අමාත්‍යාංශයක්. එතුමියට කැමැති අමාත්‍යාංශයක් දීලා අධ්‍යාපනය කරන්න පුළුවන් කෙනෙකුට ඒක බාර දෙන්න.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමා.

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
ජාතික ලැයිස්තුව කියලා එකක් හදලා තිබෙන්නේ ඡන්දයෙන් පැරදුණු මිනිස්සු ගන්න නොවෙයි, හිතවතුන් ගන්න නොවෙයි, ඥාති සහෝදරයෝ ගන්න නොවෙයි උගත් බුද්ධිමතුන් ගන්න. *[බාධා කිරීමක්]* හරි ඉන්න පොඩ්ඩක්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට දෙන්න පුළුවන්නේ අධ්‍යාපන අමාත්‍යාංශය, ඔබතුමාත් හොඳ ගුරුවරයෙක්නේ. මේ විධියට ගියොත් අධ්‍යාපන අමාත්‍යාංශයට මොකක් වෙයිද? විභාග papers එළියට එනවා, අරවා එළියට එනවා; හරි අමුතු වැඩක් වෙලා තිබෙන්නේ. අධ්‍යාපනය විනාශ වෙනවා. මේ අධ්‍යාපනය හදනවා නම් මේ අමාත්‍යාංශය මාරු කරලා කාට හරි දීලා- *[බාධා කිරීමක්]*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමා. *[බාධා කිරීමක්]*

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
කපන්න එපා, පවු. එතුමියට වෙන අමාත්‍යාංශයක් දීලා- *[බාධා කිරීමක්]*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු රවීන්ද්‍ර බණ්ඩාර මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 1.58]

**ගරු රවීන්ද්‍ර බණ්ඩාර මහතා**
(மாண்புமிகு ரவீந்திர பண்டார)
(The Hon. Ravindra Bandara)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දවසේ ඉතාම වැදගත් පනත් කෙටුම්පතක් වන විශ්වවිද්‍යාල (සංශෝධන) පනත් කෙටුම්පත පිළිබඳ විවාදය පැවැත්වෙනවා. අපි දැක්කා විපක්ෂ නායකතුමා කියනවා මේක තුළ ඒකාධිපතිවාදයට තමයි යන්නේ කියලා. නැහැ. මේ තුළින් තමයි ප්‍රජාතන්ත්‍රවාදය ස්ථාපිත වෙන්නේ. මොකද, අපි දන්නවා මුලින් තිබුණු පනත අනුව උපකුලපතිතුමා අංශාධිපතිවරුන්ගෙන් තමයි පීඨාධිපතිව - Deanව - තෝරා ගන්නේ. ජ්‍යෙෂ්ඨ මහාචාර්යවරු, ආචාර්යවරු බොහොමයක් සිටිනවා. මේ සංශෝධනය හරහා ඒ සියලුදෙනාටම මෙය විවෘත කර තිබෙනවා. ඉතින් ඒක ප්‍රජාතන්ත්‍රවාදය නේද?

ඊළඟ කාරණය තමයි, පීඨාධිපතිවරයෙකුට අවුරුදු 2යි ඉන්න පුළුවන්. කලින් ක්‍රමය අනුව අවුරුදු 2ක් ඉන්නවා, නැවත ඒක

[ගරු රවීන්ද්‍ර බණ්ඩාර මහතා]

කඩනවා, ආපහු අවුරුදු 2ක් ඉන්නවා. දිගටම වුණත් ඒ විධියට පීඨාධිපති තනතුරේ ඉන්න පුළුවන්. ඒක තමයි ඒකාධිපතිත්වය. ඒ ඒකාධිපතිත්වය නැති කරලා ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රමයකට දැන් ඒක කරන්නයි යන්නේ.

ගරු විපක්ෂ නායකතුමා ම කියනවා, අධ්‍යාපනය අසභ්‍යකරණය කිරීමක් ගැන කථාවක්. අසභ්‍යකරණය කියන එක බලා ගන්න පුළුවන්, මේ පාර්ලිමේන්තුවේ ඉඳන් පිටුපස බැලුවා නම්. ඒ සම්බන්ධයෙන් තිසකුට්ටි ගැන තමයි කලින් අප අහලා තිබෙන්නේ. නමුත් මේ කියන්නේ, අනුරාධපුර දිස්ත්‍රික්කයේ "මන්ත්‍රීවරයෙක්" - දිස්ත්‍රික්කයේ නම කියන්න වෙනවා නේ - කථා කරපු විධිය ගැනයි. එතුමා අන්තිම අසභ්‍ය, ග්‍රාම්‍ය වදන්වලින් කථා කළා මේ පාර්ලිමේන්තුව තුළ. ඒක තමයි අසභ්‍යකරණය.

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
මන්ත්‍රී කෙනෙක් නොවෙයි.

**ගරු රවීන්ද්‍ර බණ්ඩාර මහතා**
(மாண்புமிகு ரவீந்திர பண்டார)
(The Hon. Ravindra Bandara)
මන්ත්‍රී කෙනෙක් නොවෙයි ලු. මා දන්නා විධියට, පාර්ලිමේන්තුව ඇතුළේ ඉන්නවා නම්, මන්ත්‍රී කෙනෙක් තමයි. රෝහණ ද කවුද කියලා ගරු මන්ත්‍රීවරයෙක්. මට "ගරු" කියලාත් කියැවුණා. ඒ වාගේම, අසභ්‍යකරණය ගැන ගරු කවින්ද ජේෂාන් ජයවර්ධන මන්ත්‍රීතුමාත් කථා කළා. මේ විධියට අද විපක්ෂය අසභ්‍යකරණය ගැන කථා කරනවා. කාන්තාවකට කාර් එකක යන්න තිබෙන නිදහස නැති කරමින් සමහර අසභ්‍ය දේවල් වෙනවා නම් ඒවාත් අසභ්‍යකරණය තමයි.

ඒ වාගේම, පාර්ලිමේන්තුව තුළ මාතලේ දිස්ත්‍රික්කයේ ගුරුවරියක් කියනවා, පසුගිය "දිට්වා" සුළි කුණාටුව ඇති වුණේ දේව ශාපයක්, දේව කෝපයක් නිසා කියලා. එතුමිය ඉගැන්වූයේ මොනවාද කියලා හොයලා බැලුවාම, විද්‍යාව හෝ ගණිතය කියලා තමයි ආරංචි වුණේ. මම ඒක හරියටම දන්නේ නැහැ. "දිට්වා" සුළි කුණාටුව ආවේ දේව ශාපයක්, දේව කෝපයක් නිසා කියලා විද්‍යාව උගන්වන ගුරුවරියක් කියනවා නම්, මා හිතන්නේ එතැනින්ම පෙනෙනවා අධ්‍යාපනය ප්‍රතිසංස්කරණය වෙන්න ඕනෑ කියලා.

ඒ වාගේම තමයි, සජබ තරුණ නායකයන් පිරිසක් එම පක්ෂයේ කෘත්‍යාධිකාරී මණ්ඩලයට පත් කරලා ඉදිරියට ගන්නවා අපි දැක්කා. තරුණයන්ට එහෙම තැනක් දෙනවා නම්, අපිත් සතුටු වෙනවා. අධ්‍යාපනය නව්‍යකරණය කරන්න ඕනෑ කියන මතයේ අප ඉන්න කොට ඒ තරුණයෝ ගිහිල්ලා අන්න පොල් ගහනවා. මේ 21වැනි සියවසෙන් ඔබ්බට දරුවන් නිර්මාණය කරන්න යන අපි පොල් ගහන සංස්කෘතියක් තිබියදී තමයි මේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ඉදිරියට ගෙන යන්නේ. අධ්‍යාපන අසභ්‍යකරණයක් ගැන කියන අය අතරේම අසභ්‍යකරණය වෙච්ච අය ඉන්නවා. අර ඉහතින් කියපු මන්ත්‍රීතුමිය වතු කම්කරු ජනතාවගේ වැටුප් වැඩි කරන කොට කලින් දවසක කිව්වා, "පාරේ මළත් ඒකට විරුද්ධයි" කියලා. මේ පෙබරවාරි 10වැනි දා ලැබෙන වැටුපට වතු කම්කරු ජනතාවට රුපියල් 400ක් වැඩිපුර ලැබෙනවා. රුපියල් 200ක් ලැබෙනවා, ඊට අමතරව රජය වෙතින් තවත් රුපියල් 200ක් ලැබෙනවා. ගරු ජීවන් තොන්ඩමන් මන්ත්‍රීතුමා මේ වෙලාවේ ගරු සභාවේ ඉන්නවා. එතුමා අය වැය විවාදයේදී ඒකට පක්ෂව කථා කළා.

**ගරු ජීවන් තොන්ඩමන් මහතා**
(மாண்புமிகு ஜீவன் தொண்டமான்)
(The Hon. Jeevan Thondaman)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු රවීන්ද්‍ර බණ්ඩාර මහතා**
(மாண்புமிகு ரவீந்திர பண்டார)
(The Hon. Ravindra Bandara)
ගරු මන්ත්‍රීතුමනි, මම ඔබතුමාගේ හොඳක් කිව්වේ, එයට පක්ෂව කථා කළා කියලා.

තව දෙයක් කියන්න තිබෙනවා. ගරු විපක්ෂ නායකතුමා අපේ ගරු සමන්ත විද්‍යාරත්න ඇමතිතුමා කථා කරන කොට කිව්වා, වතු කම්කරු ජනතාව කියලා කථා කරන්න එපා, "කම්කරු" කිව්වාම ඒකෙන් පහත් ස්වභාවයක් හැඟවෙනවා කියලා. මේක හොඳට අහගන්න, ගරු මන්ත්‍රීතුමා. ඊට පස්සේ ඒ කථාවම ඉස්සරහට කරගෙන යද්දී කියනවා, "කම්කරු ජනතාව වතු හිමියන් කරන්න තමයි මා උත්සාහ කළේ" කියලා. එහෙම කියන කොට අපි දන්නවා, වතු ප්‍රජාවගේ, වතු කම්කරු ජනතාවගේ වැටුප් වැඩි කිරීමට,- *[බාධා කිරීමක්]*

**ගරු ජීවන් තොන්ඩමන් මහතා**
(மாண்புமிகு ஜீவன் தொண்டமான்)
(The Hon. Jeevan Thondaman)
Sir, I rise to a point of Order.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ point of Order එක මොකක්ද?

**ගරු ජීවන් තොන්ඩමන් මහතා**
(மாண்புமிகு ஜீவன் தொண்டமான்)
(The Hon. Jeevan Thondaman)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, கௌரவ உறுப்பினர் அவர்கள் என்னுடைய பெயரைக் குறிப்பிட்டார். கௌரவ உறுப்பினர் அவர்களே, எனக்கு அங்கீகாரம் கொடுத்ததற்கு நன்றி! தோட்டத் தொழிலாளர் களின் சம்பளத்தை அதிகரித்திருக்கிறோம் என்று மார்தட்டிக் கொள்ள வேண்டாம். *[இடையீடு]* நீங்கள் சம்பளத்தை மட்டும் அதிகரிக்கவில்லை. பறிக்க வேண்டிய கொழுந்தின் அளவையும் அதிகரித்திருக்கிறீர்கள். *[இடையீடு]* -

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, ඊළඟට ඔබතුමාගේ කථාව. ඔබතුමා ඒකෙදි උත්තර දෙන්න. ගරු රවීන්ද්‍ර බණ්ඩාර මන්ත්‍රීතුමා කථාව කරගෙන යන්න.

**ගරු රවීන්ද්‍ර බණ්ඩාර මහතා**
(மாண்புமிகு ரவீந்திர பண்டார)
(The Hon. Ravindra Bandara)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාගේ කථාවේදී ඔබතුමා උත්තර දෙන්න.

තව දෙයක් කියන්නම්. පුළුවන් නම් රුපියල් 10කින් වැටුප් වැඩි කරන්න කියලා මෙතැනදී අභියෝග කළා. රුපියල් 10කින් නොවෙයි, රුපියල් 400කින් වැටුප් වැඩි කරලායි තිබෙන්නේ. ඒගොල්ලෝ එහෙම අභියෝග කළේ, ඒගොල්ලන්ට වතු හිමියන්

එක්ක මොකක් හරි deal එකක් තිබෙනවා ඇති. ඒ නිසා තමයි, රුපියල් 10කින් වැටුප් වැඩි කරන්න කියලා අභියෝග කළේ. නමුත්, අපි රුපියල් 400කින් වැටුප් වැඩි කළා. ඒ විතරක් නොවෙයි. ආයෙත් බොරු කථා කියනවා; දලු කිලෝ දෙකක් වැඩියෙන් කඩන්න ඕනෑ කියලා, දවස් 25ක් වැඩ කරන්න ඕනෑ කියලා. ඒ වාගේ කථාත් කියනවා.

මම තව දෙයක් කියන්න ඕනෑ. ගරු විපක්ෂ නායකතුමා වතු ප්‍රජාව ගැන කියද්දී මලෙයහම් ජනතාවට "මලයාලම් ජනතාව" කියලායි කියන්නේ. අන්න ඒවා ගැන කථා කරන්න.

"මලයාලම්" ජනතාව කියලා තමයි කඳුකරයේ කියන්නේ. අපි කියන්නේ, "මලෛයගම් ප්‍රජාව" කියලා. එතුමන්ලා කියන්නේ, "මලයාගම්" කියලා. මේක හොඳට අහගන්න. ඉස්සෙල්ලාම -අංක එකටම- ඒවා ගැන කථා කරන්න කියලා මම මතක් කරනවා.

සජබ තරුණ මන්ත්‍රීවරුන් ගැන මම කථා කළා නේ. අධ්‍යාපන ධවල පත්‍රිකාව ගැනත් විපක්ෂය කථා කළා. ඒ කාලයේ ඒ ධවල පත්‍රිකාවට විරුද්ධ වෙන්න අපට පදනමක් තිබුණා; හේතු තිබුණා. එකක් තමයි, අධ්‍යාපනය පෞද්ගලීකරණය. එහි තිබුණා, ඒකීය පාසල් කියලා වර්ගයක්. ඒවාට රජයෙන් ප්‍රතිපාදන දෙන්නේ නැහැ, දෙමව්පියන් තමයි වියදම් කරන්න ඕනෑ. අනෙක් පැත්තෙන්, පෞද්ගලික විද්‍යාල. ඒවායේ ගුරුවරුන්ට ආණ්ඩුවෙන් වැටුප් ගෙවනවා. අන්න ඒවාට තමයි අපි ඒ කාලයේ එරෙහි වුණේ. දැන් ඒකයි මේකයි compare කරන්න බැහැ. ඒක අධ්‍යාපනයේ බර සම්පූර්ණයෙන්ම දෙමව්පියන්ට දෙන ප්‍රතිසංස්කරණයක්. ඉතින්, ඒකට විරුද්ධ වුණේ ත්‍රස්තවාදීන් කියලා විපක්ෂයේ සමහරු කියනවා. ඒකට විරුද්ධ වුණේ කවුද? අකුරටියේ අමරවංශ හාමුදුරුවෝ, මඩිහේ පඤ්ඤාසීහ හාමුදුරුවෝ ඇතුළු ස්වාමීන් වහන්සේලාත් විරුද්ධ වුණා. එතකොට උන්වහන්සේලාත් ත්‍රස්තවාදීන් ද? මහාචාර්ය මැන්දිස් රෝහණදීර මහත්මයා, මහාචාර්ය විශ්වා වර්ණපාල මහත්මයා වාගේ අයත් විරුද්ධ වුණා. ඒ විතරක් නොවෙයි, ඒක ඉදිරිපත් කරපු දවසේ එවකට ආණ්ඩු පක්ෂයේත් බහුතරයක් විරුද්ධ වුණා. ඒක තමයි ඒක අකුළා ගත්තේ. එහෙම නම්, ඒ සියලුදෙනාම "ත්‍රස්තවාදීන්" කියලා තමයි හඳුන්වන්න වෙන්නේ. ත්‍රස්තවාදීන් කවුද කියලා මම කියන්නම්.

1981දී යාපනයේ සංවර්ධන සභා ඡන්දය පැවැත්වුණා. ඒ ඡන්දය පරදිනවා කියලා එවකට ආණ්ඩුව දන්නවා. ඒක දැනගෙන මොකක්ද කළේ කියලා මම කියන්නම්. 1979දී අවුරුදු 17ක තරුණියක් සමූහ දූෂණයට ලක් කරලා හිරේට ගිය පාතාල මැරයෙක් හිටියා. ඒ, 1977 ඡන්දයේදී විශේෂයෙන්ම රනිල් වික්‍රමසිංහ මහත්මයාට උදවු කළ කෙනා. මොකද වුණේ? ඔහු 1981දී නිදහස් කළා, ජනාධිපති සමාව දීලා. නීති වෙනස් කරලා, ස්ත්‍රී දූෂණයක් කරපු කෙනෙකු නිදහස් කරපු පළමුවැනි වතාව ඒක. ඔහු අවුරුදු 15කටයි හිරේ ගියේ. අභියාචනාධිකරණයෙනුත් ඒ දඬුවම ස්ථිර වෙලා තිබෙන කොට ඒ ස්ත්‍රී දූෂකයා නිදහස් කළා. නිදහස් කරලා ඔහුට සාම විනිසුරුකමකුත් දුන්නා; ග්‍රාමෝදය සභාපති තනතුරටත් පත් කළා. ඔහුත් යාපනයට යැව්වා. ඇමතිවරු කිහිප පොළක්ම එහි ගියා. යාපනයේ පුස්තකාලය ගිනි තිබ්බා; කෝවිල් ගිනි තිබ්බා; පත්තර කන්තෝරු ගිනි තිබ්බා. ඒවා ගිනි තියන කොට ඇමතිවරු හතරදෙනෙක් එහේ තානායමේ හිටියා. ඒ අතරත් හිටියා, ඔය අධ්‍යාපන ධවල පත්‍රිකාව ගෙනාපු රනිල් වික්‍රමසිංහ මහත්මයා. එහෙම නම්, පුස්තකාලයක් ගිනි තියපු කෙනෙක් අධ්‍යාපනය ගැන නිවැරදි සංශෝධනයක්, ඉදිරිගාමී සංශෝධනයක් ගෙනෙයිද කියා මම ඒගොල්ලන්ගෙන් අහනවා. ඒ ත්‍රස්තවාදීන් තියාගෙන තමයි එදා ඒ කටයුතු කළේ.

ඒ වාගේම තමයි ඒ ඡන්ද දූෂණය. දූෂිතම ඡන්දය තමයි යාපනයේ සංවර්ධන සභා ඡන්දය. මා හිතන විදියට, දමිළ මන්ත්‍රීවරු ඒ ඉතිහාසය ගැන දන්නවා. ඒකත් එක්ක තමයි, ආපහු එන ඡන්දය පරදිනවා කියලා දැනගෙන 1982දී තියන්න ඕනෑ ඡන්දය වෙනුවට ලාම්පු කළගෙඩි සෙල්ලමක් ගෙනාවේ. ඒක ලංකා ඉතිහාසයේ අන්ත දූෂිතම මැතිවරණය වුණා. ඒකටත් යොදා ගත්තා, අර කියපු පාතාල මැරයන්. ඒගොල්ලන් තමයි ත්‍රස්තවාදීන්. ඉතින්, එදා ඒ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ගෙනැල්ලා, ඒක ඉස්සරහට ගන්න කියලා ආපු බලවේගවලට විරුද්ධ වුණු මඩිහේ පඤ්ඤාසීහ හාමුදුරුවන්ට, අකුරටියේ අමරවංශ හාමුදුරුවන්ට, ඒ මහාචාර්යවරුන්ට ත්‍රස්තවාදීන් කියලා කියනවා නම් මොකක්ද ඒ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ? එහෙම කියන තරුණ නායකයන් නම් අද එන්නේ, පොල් ගෙඩි ගහන තරුණ නායකයන් නම් අද එන්නේ, අංක එකටම මුල් ළමා විය සංවර්ධනය කරන්න වෙනවා, විපක්ෂයේ ඒ තරුණ මන්ත්‍රී කණ්ඩායමේ.

අද මෙහිදී වැටුප් ගැන, වැටුප් වැඩිවීම් ගැනත් කථා කළා. එදා විපක්ෂය මොනවාද කිව්වේ? "2028 වනකල් වැටුප් වැඩි කරන්න බැහැ" කිව්වා; "මේ රට ගොඩ යන්නේ 2048දී" කිව්වා. එහෙම කියපු වටපිටාවක් තුළ අපි රාජ්‍ය සේවකයන්ගේ, ගුරුවරුන්ගේ වැටුප් වැඩි කළා. ඒ වාගේම තමයි, වතු කම්කරු ප්‍රජාවගේත් වැටප් වැඩි කළා.

අද දවසේ වුණත් වෙච්ච දේ බලන්න. ඒ අය අද ප්‍රවෘත්ති බැලුවා ලු, නේ. ප්‍රවෘත්ති බලන කොට ඇහුණු ඔය අධිචෝදනා කථා, අරවා මේවා අතරේ අපි දැක්කා, ඔන්න රටේ ආයෝජන වැඩි වෙලා; වාර්තා තියලා කියන ප්‍රවෘත්තිත්. සියයට 72කින් ආයෝජන වැඩි වෙලා. සංචාරක ක්ෂේත්‍රය ගත්තොත්, ඉතිහාසයේ වැඩිම සංචාරකයන් පැමිණි අවුරුද්ද බවට 2025 පත් වුණා. 2025 ඉතිහාසයේ වැඩිම විදේශ ප්‍රේෂණ ලැබුණු අවුරුද්ද බවට පත් වුණා. කොටස් වෙළඳ පොළ ඉතිහාසයේ තිබුණු සියලුම වාර්තා බිඳ හෙළමින් ඉදිරියට ආවා. ඉතින්, ඕවා සම්බන්ධයෙන් රිදෙනවා. අධ්‍යාපනයත් ප්‍රතිසංස්කරණය වෙලා ඉදිරියට යනකොට රිදෙනවා. මා කලිනුත් කිව්වා වාගේ ඒගොල්ලන්ගේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණවල පදනම වුණේ, අධ්‍යාපනයේ බර මිනිසුන්ට දෙන එකයි. අපේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණවල පදනම වන්නේ, අධ්‍යාපනයේ බර ජනතාවට නොදෙන එකයි. විදුලිබල පනත මඟින් වුණේත් ඒකම නේ. ඒගොල්ලන් සැලසුම් කර තිබුණා, සේවකයන් 12,000ක් අයින් කරන්න. අපි එහෙම අයින් කළාද? නැහැ. ඒගොල්ලන් ආයතන පෞද්ගලීකරණය කරන්න සැලසුම් කළා. අපි තිබෙන ආයතන පෞද්ගලීකරණය කළාද? නැහැ. අන්න ඒක තමයි වෙනස. ඒ කාලයේ ආයතන කීයක් නම් විකුණන්න සැලසුම් කරලා තිබුණාද? දැන් ගොඩක් දෙනෙක් කියනවා නේ රනිල් වික්‍රමසිංහ මහත්මයා තමයි අධ්‍යාපනය ගොඩ ගත්තේ කියලා. අධ්‍යාපනය ගොඩ ගත්තු හැටි, පුස්තකාලය ගිනි තියපු හැටි අපි දන්නවා. ඒවායේ ඉතිහාසය සොයා බලන්න. අපි විදුලිබල මණ්ඩලය සම්බන්ධයෙන් කටයුතු කළේ කොහොමද? අපි එහි සේවකයන් එළියට දැම්මේ නැහැ. අපි එය පෞද්ගලීකරණය කළේ නැහැ. එහි වැඩ ටික ලස්සනට වෙනවා. එහෙම නම් අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ගැනත් අන්න ඒ විශ්වාසය තබා ගන්න. අපි මේ අධ්‍යාපනය ගොඩ නඟන්න ඕනෑ. අධ්‍යාපනය ගොඩ නඟන්න ඕනෑ කියන එක තමයි අප දකින දේ. එහෙම දකින්න හේතු තමයි මම අර කිව්වේ.

පාර්ලිමේන්තුව සම්බන්ධයෙන් ගත්තත් වෙනසක් වෙන්න ඕනෑ. අපට ඕනෑ පාර්ලිමේන්තුව තුළ එදා පැවැති අර මිරිස් කුඩු සංස්කෘතිය වෙනස් කරන්නයි; තිසකුට්ටිලා කියපු කථා ආයෙත් කියන එක නවත්වන්නයි. ඒ කථා මට මෙතැන කියන්න බැහැ. ඒවා දැන් යළි මෙතැන ප්‍රතිරාව දෙනවා. අන්න ඒක නවත්වන්න ඕනෑ.

[ගරු රවීන්ද්‍ර බණ්ඩාර මහතා]

විද්‍යාව උගන්වන ගුරුවරියෝ කියනවා, දේව ශාපය තින්දා තමයි සුළි කුණාටුව ආවේ කියලා. එතකොට මොනවාද ළමයින්ට සන්නිවේදනය වෙන්නේ? ඒ වාගේම ඔයගොල්ලෝ ගිහිල්ලා, පොතක කවරයක් පෙන්නලා කියනවා, "මෙන්න දේදුන්න" කියලා. වර්ණ ගැන, ලස්සන පාට ගැන දන්නවා නේද? ඉතින්, දරුවන්ට කොහොමද ඒවා නුසුදුසු වෙන්නේ? ඒ වාගේම තමයි ඒ හැම දේටම "අසහායකරණය" කියලා ඒ සියල්ලටම ප්‍රසිද්ධිය ලබා දුන්නේ ඔයගොල්ලෝ. අසහායකරණයට විරුද්ධ නම්, අංක එකටම පාර්ලිමේන්තුවේදී ඔයගොල්ලන් සහාය හැසිරෙන්න ඉගෙන ගන්න කියා ඉතාම ආදරයෙන් ඉල්ලමින්, මට කාලය ලබා දීම ගැන ස්තුතිවන්ත වෙමින් මගේ කථාව අවසන් කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ජීවන් තොන්ඩමන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 5ක කාලයක් ලැබෙනවා.

[பி.ப. 2.09]

**ගරු ජීවන් තොන්ඩමන් මහතා**
(மாண்புமிகு ஜீவன் தொண்டமான்)
(The Hon. Jeevan Thondaman)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, எனக்கு முன்னர் உரையாற்றிய கௌரவ உறுப்பினர் அவர்கள் எனது பெயரைக் குறிப்பிட்டார். அதனால்தான் நான் point of Orderஐ எழுப்பினேன். எனக்குப் பதில் அளிப்பதற்கு ஒரு நிமிடம் கால அவகாசம் இருக்கிறது. எனினும், இடையில் என்னைப் பேசவிடாது நிறுத்தினீர்கள். அதை நான் வன்மையாகக் கண்டிக்கின்றேன்.

எனக்கு முன்னர் உரையாற்றிய கௌரவ உறுப்பினர் அவர்கள் நூலகத்தை எரித்தவர்கள் பற்றி பேசினார். நாட்டை எரித்தவர்களே இங்கு முன்னால் உட்கார்ந்து இருக்கும்போது, நூலகத்தை எரித்தவர்கள் பற்றி பேசி என்ன பிரயோசனம்? சிலர் சொல்லிக் கொடுத்து வேண்டுமானால் பேச முடியும். ஒரு விடயத்தை எல்லோரும் தெளிவாகப் புரிந்து கொள்ளுங்கள்! "தோட்டத் தொழிலாளர்களின் சம்பளத்தைக் கூட்டியிருக் கிறோம், கூட்டியிருக்கிறோம்" என்று நீங்கள் எல்லோரும் சொல்கிறீர்கள். சம்பளத்தைக் கூட்டியிருப்பது சரி! ஆனால், சம்பளத்தோடு சேர்த்து அவர்கள் மீதான சுமையையும் அதிகரித்திருக்கிறீர்கள். நீங்கள் போய் விசாரிக்க வேண்டும். நீங்கள்தானே அரசாங்கம்! தொழில் அமைச்சர் போய் விசாரிக்க வேண்டும். பல்வேறு தோட்டங்களில் 20 - 22 கிலோகிராம் கொழுந்து பறித்தவர்களை இன்றைக்கு 23 - 26 கிலோகிராம் பறிக்க வேண்டிய நிலைக்கு ஆளாக்கி யிருக்கிறீர்கள்.

ஏன் நான் இன்றைக்குப் பேசுவதற்கான வாய்ப்பைக் கேட்டேன் என்றால், காலையில் சௌமியமூர்த்தி தொண்டமான் ஞாபகார்த்த மன்றம் பற்றிய விடயம் இங்கு பேசப்பட்டதனால்தான். நான் ஒரு விடயத்தைத் தெளிவாகச் சொல்ல விரும்புகின்றேன். 2005இல்தான் இந்த ஞாபகார்த்த மன்றம் உருவாக்கப்பட்டது. அப்போதைய அரசாங்கத்தில் உங்களுடைய சனாதிபதி அவர்கள் அமைச்சராக இருந்தார். அவரும் சோர்ந்துதான் இதனை உருவாக்கினார். அதை மறந்து பேசாதீர்கள்! 2005இல் உருவாக்கப்பட்ட இந்த ஞாபகார்த்த மன்றத்தில் குடும்ப உறுப்பினர்கள் எப்படி இருக்க முடியும்? என்று ஒரு கேள்வி கேட்கப்பட்டது. சனாதிபதிக்கு வால்பிடித்து, தேர்தலில் நின்று ஜெயித்து, இங்கு வந்து உட்காருவது மட்டும் புத்திசாலித்தனம் கிடையாது. அரசாங்கம் என்றால் என்ன? என்பதைத் தெரிந்துகொள்ள வேண்டும்.

நீங்கள் சற்று யோசித்துப் பாருங்கள்! பண்டாரநாயக்க ஞாபகார்த்த மன்றம் இருக்கின்றது. அதற்குத் தலைவர் யார்? முன்னாள் சனாதிபதி சந்திரிக்கா அம்மையார். அதேபோன்று, காமினி திஸாநாயக்க ஞாபகார்த்த மன்றம் இருக்கின்றது. அதற்குத் தலைவர் யார்? முன்னாள் பாராளுமன்ற உறுப்பினரும் முன்னாள் அமைச்சருமான நவீன் திஸாநாயக்க அவர்கள். அதேபோல், தந்தை செல்வாவின் பெயரில் ஒரு ஞாபகார்த்த மன்றம் இருக்கின்றது. அதன் தலைவர் யார்? அவரின் பேரனான கௌரவ இளங்கோவன் அவர்கள். அதேபோல், லக்ஷ்மன் கதிர்காமர் பெயரிலும் ஞாபகார்த்த மன்றம் இருக்கின்றது. இவ்வாறு இந்த நாட்டில் பல்வேறு ஞாபகார்த்த மன்றங்கள் இருக்கின்றன. மக்கள் உங்களுக்கு வாக்களித்தது, இங்கு வந்து சௌமியமூர்த்தி ஞாபகார்த்த மன்றம் பற்றியோ, அதன் பெயர் மாற்றம் பற்றியோ பேசுவதற்கு அல்ல. மாறாக, புயலால் பாதிக்கப்பட்ட மக்களுக்கும் உங்களை நம்பி வாக்களித்த மக்களுக்கும் உதவி செய்வதற்காகத்தான்.

இன்றைக்கு நீங்கள் சொல்கிறீர்கள், சௌமியமூர்த்தி தொண்டமானின் பெயரில் ஞாபகார்த்த மன்றம் அமைத்தது சாபக்கேடு என்று. என்ன தைரியத்தில் அப்படிச் சொல்கிறீர்கள்? அவர் பிரஜாவுரிமை பெற்றுக் கொடுத்ததனால்தான் இன்றைக்கு வாய்கிழிய இந்தச் சபையில் பேசிக்கொண்டு இருக்கிறீர்கள். மலையகத்தைப் பிரதிநிதித்துவப்படுத்துகின்ற உறுப்பினர் அவர்களே, அதை மறந்து பேசாதீர்கள்! நான் இந்த இடத்தில் இன்னொரு விடயத்தையும் சொல்ல விரும்புகின்றேன். 'சாபக்கேடு' என்று சொன்னார்கள். சிலர் நினைக்கலாம், சமூக வலைத்தளங்களில் இப்படி எமது முன்னாள் தலைவர்களைக் கேவலமாகப் பேசினால், அது வீரம் என்று. அதற்குப் பெயர் வீரம் கிடையாது. அது அரசியல் சுயநலம் மற்றும் தலைக்கனத்தால் வரும் முட்டாள்தனம்! அதைப் புரிந்து கொள்ளுங்கள்!

அண்மையில் ஏற்பட்ட புயலால் மலையக மக்கள்தான் அதிகமாகப் பாதிக்கப்பட்டு இருக்கிறார்கள். அவர்களுக்கு என்ன வழி இருக்கிறது என்று இன்னும் சொல்லவே இல்லை. காணி இல்லாதவர்களுக்கும் வீடு இல்லாதவர்களுக்கும் 50 இலட்சம் ரூபாய் வழங்கப்படுமென அன்றைக்குச் சொல்லப் பட்டது. மலையகத்தில் 90 சதவீதமான மக்களுக்குக் காணியும் இல்லை; வீடும் இல்லை. 50 இலட்சம் ரூபாய் எங்கு வழங்கப்பட்டது? அதற்குப் பிறகு, 5 இலட்சம் ரூபாய் வழங்குவதாகச் சொன்னீர்கள். அதுவும் வழங்கப்படவில்லை. அதற்குப் பிறகு, 25,000 ரூபாய் வழங்குவதாகச் சொன்னீர்கள். சிவில் அமைப்புகளுடன் பேசி, நான் அன்றைக்கே ஒரு விடயத்தை வலியுறுத்தினேன். பாதிக்கப்பட்ட மக்களுக்கு மாற்று இடத்தைக் கொடுக்குமாறு சிவில் அமைப்புகள் கோரிக்கை முன்வைத்தன. அதையும் நீங்கள் செய்யவில்லை. இன்றைக்கு மலையக மக்கள் பிரதிநிதித்துவத்தை இழந்துதான் மலையகத்தில் இருக்கிறார்கள். இந்த மாதிரியான பிரதிநிதிகளை நம்பி அவர்களுக்கு எந்தவிதப் பிரயோசனமும் கிடையாது. அதுதான் உண்மை!

நான் இன்னொரு விடயத்தையும் சொல்ல விரும்புகின்றேன். குறைசொல்லும் அரசியலை முதலில் நிறுத்துங்கள்! உங்களுக்குப் பேசத் தெரியும் என்றால், எனக்கு அதைவிட பேசத் தெரியும்! இன்று காலையிலே இச்சபையில் schoolஇல் இருக்கின்ற இரண்டு மாணவர்கள்போல், ஒருத்தருக்கு ஒருத்தர் கேள்வி கேட்டு, பதில் சொல்லிக்கொண்டு இருந்தார்கள். அங்கு போய் ஒழுங்காக வேலையைப் பார்ப்பதை விட்டுவிட்டு, இங்கு வந்து ஒருத்தருக்கு ஒருத்தர் கேள்வி கேட்டு, பதில் சொல்லிக்கொண்டு இருக்கிறார்கள். இப்படித்தான் ஒரு காலத்தில் சௌமியமூர்த்தி தொண்டமானின் பெயர் அகற்றப்பட்டது. அதை சர்வதேச தலைவர்கள் வன்மையாகக் கண்டித்தார்கள். தயவுசெய்து, உங்களுடைய அரசியல் சுயநலத்துக்காக முன்னாள் தலைவர்களின் பெயரைக் கொச்சைப்படுத்தாதீர்கள்!

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களிடம் நான் கோரிக்கையொன்றை முன்வைக்க விரும்புகின்றேன். இன்று காலையில் மலையகத்தைப் பிரதிநிதித்துவப்படுத்துகின்ற கௌரவ பிரதி அமைச்சர் அவர்கள், மலையகத் தியாகியான கௌரவ முல்லோயா கோவிந்தனின் பெயரைத் தவறுதலாக 'முல்லேரி கோவிந்தன்' என்று சொல்லிவிட்டார். தயவுசெய்து, ஹன்சாட் அறிக்கையில் 'முல்லேரி கோவிந்தன்' என்ற பெயருக்குப் பதிலாக 'முல்லோயா கோவிந்தன்' என்று பதிவு செய்யுங்கள்!

ஆளும் கட்சியைச் சேர்ந்த தலைவர்களின் பெயர்களை இவ்வாறான ஞாபகார்த்த மன்றங்களுக்கு இடவில்லை என்ற கோபம் உங்கள் எல்லோருக்கும் இருக்கலாம். நாட்டுக்காக, மக்களுக்காக கஷ்டப்பட்டவர்களின் பெயர்களை இவற்றுக்கு இடமுடியும். நாடு அழிய வேண்டுமென நினைத்தவர்களின் பெயர்களை எல்லாம் இவற்றுக்கு இடமுடியாது. தயவுசெய்து, இவ்வாறான விடயங்களைத் தவிர்த்துக் கொள்ளுங்கள்! முதலில், தொழில் அமைச்சினூடாக பெருந்தோட்ட நிறுவனங்கள்மூலம் ஒரு வர்த்தமானியை வெளியிட வையுங்கள்! 1,750 ரூபாய் நாட்சம்பளத்தில் 1,550 ரூபாய் அடிப்படைச் சம்பளம்! அதேநேரம், பறிக்க வேண்டிய கொழுந்தின் அளவும் கூட்டப்பட்டு இருக்கிறது. தயவுசெய்து, அதற்கு இடம்கொடுக்காதீர்கள்! உங்களின் வழியைத் திருத்திக் கொள்ளுமாறு கேட்டு விடைபெறுகின்றேன். நன்றி.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු නිලූෂා ලක්මාලි ගමගේ මන්ත්‍රීතුමිය. ඔබතුමියට විනාඩි 10ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 2.14]

**ගරු නීතිඥ නිලූෂා ලක්මාලි ගමගේ මහත්මිය**
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) நிலூஷா லக்மாலி கமகே)
(The Hon. (Mrs.) Nilusha Lakmali Gamage, Attorney-at-Law)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශ්වවිද්‍යාල සංශෝධන පනත් කෙටුම්පත සම්බන්ධයෙන් අදහස් දැක්වීමට මට අවස්ථාව ලැබීම ගැන සතුටු වෙනවා. මේක ඉතාම ප්‍රගතිශීලී සංශෝධන පනතක් කිව්වොත් මම නිවැරදියි. විශ්වවිද්‍යාල සම්බන්ධයෙන් ක්‍රියාත්මක වෙන 1978 අංක 16 දරන වත්මන් විශ්වවිද්‍යාල පනත ඇත්තටම වසර 46කට වඩා වැඩි කාලයක් පැරණියි. ඒ හින්දා ඇත්තටම අපට නව පනතක අවශ්‍යතාව පිළිබඳව කතිකාවක් තිබුණා. අපේ ගරු අග්‍රාමාත්‍යතුමිය ප්‍රමුඛ ඒ විශ්වවිද්‍යාල ආචාර්යවරුන් මේ පිළිබඳව විවිධ අවස්ථාවලදී සාකච්ඡා පවත්වලා අදහස් ඉදිරිපත් කරලා තිබෙනවා. ඒ අනුව, ආයතනික අත්දැකීම් සහ වෙනස් වෙමින් පවතින පරිපාලන අවශ්‍යතා සැලකිල්ලට ගත් විට ඇත්තටම අඩුපාඩු වාගේම ප්‍රායෝගික ගැටලු කිහිපයක් මතු වෙලා තිබෙනවා, මේ පැරණි පනතේ. ඉතින් ඒ හින්දා අපේ මැතිවරණ ප්‍රකාශයේ දක්වා ඇති ප්‍රතිපත්තිමය මඟ පෙන්වීම අනුව, විවිධ පරිපාලන තනතුරු සඳහා පුද්ගලයන් තෝරා ගැනීමේදී සහ පත් කිරීමේදී පනතේ ඇතැම් ප්‍රතිපාදනවල අපහැදිලි තත්ත්ව තිබෙන බවත් තේරුම් අරගෙන තිබුණා, දීර්ඝ කාලයක් තිස්සේ. මේ අපහැදිලිකම් සමහර වෙලාවලදී නෛතික කටයුතු දක්වා විහිදු ගිය අවස්ථා අපට පැහැදිලිව පෙනෙන්න තිබෙනවා. ඒ හින්දා මේ පිළිබඳව දැඩි ඉල්ලීම් හා සාකච්ඡා සමාජයේ ඇතිවී තිබෙනවා. ඒ අනුව ඒ අවශ්‍යතා මත තමයි මෙම සංශෝධන පනත් කෙටුම්පත ගෙන එන්නේ.

විශ්වවිද්‍යාලවල සිටින අංශ ප්‍රධානීන් හෝ අවම වශයෙන් වසර තුනක පළපුරුද්දක් ඇති ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ධුරයේ සුදුසුකම්ලත් පීඨ සාමාජිකයන්ට පීඨාධිපති ධුරයට පත්වීමට අවස්ථාව ලබාදිය යුතු බවට වත්මන් රජයේ මැතිවරණ ප්‍රකාශයේ සඳහන් වෙනවා. ඒ අදහස වාගේම පීඨාධිපතිවරයෙකුගේ ධුර කාලය උපරිම ලෙස අඛණ්ඩ වාර දෙකකට සීමා කිරීම ද මෙම ප්‍රතිපත්ති ප්‍රකාශනයෙන් යෝජනා කර තිබෙනවා. එකී සියලු කරුණු සැලකිල්ලට අරගෙන විශ්වවිද්‍යාල පනතේ 49 වගන්තියට අදාළව, පීඨයක ජ්‍යෙෂ්ඨ මහාචාර්යවරුන්, මහාචාර්යවරුන්, ආශ්‍රිත මහාචාර්යවරුන් සහ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරුන් (I වන ශ්‍රේණිය) අතුරෙන් පීඨාධිපතිවරයකු තෝරා පත් කර ගැනීමට පීඨ මණ්ඩලයට හැකියාව ලබා දීම, ඒ වාගේම පීඨාධිපතිවරයෙකුගේ ධුර කාලය අවසන්වීමට පෙර ඔහු ධුරයෙන් ඉවත් කිරීමට පාලක සභාවට බලය ප්‍රදානය කිරීම සහ පීඨාධිපතිවරයෙකුගේ ධුර කාලය පිළිබඳව සීමා හඳුන්වාදීමත් මෙම සංශෝධන පනත් කෙටුම්පත මඟින් සිද්ධ වෙනවා.

ඒ වාගේම විශ්වවිද්‍යාල පනතේ 51වන වගන්තියට අදාළව, අධ්‍යයන අංශයක ප්‍රධානියෙකු පත් කිරීමේදී පාලක සභාව විසින් අනුගමනය කළ යුතු ක්‍රියාපටිපාටිය නිශ්චිත කිරීමටත්, අධ්‍යයන අංශයක ප්‍රධානියා ඔහුගේ ධුර කාලය අවසන්වීමට පෙර ධුරයෙන් ඉවත් කිරීමට පාලක සභාවට බලය ලබාදීමටත්, අධ්‍යයන අංශවල ප්‍රධානීන්ට අදාළ වන ධුර කාලය පිළිබඳව සීමා හඳුන්වාදීමටත් මෙම සංශෝධන පනත් කෙටුම්පත මඟින් කරුණු ඉදිරිපත් කර තිබෙනවා.

ඇත්තටම මෙම සංශෝධන පනත් කෙටුම්පතේ ප්‍රතිපාදන අනුව අංශ ප්‍රධානීන් පත් කිරීමේදී තිබිය යුතු අවම සුදුසුකම් දක්වා තිබෙනවා. ඒ වාගේම ධුර කාලය උපරිම අඛණ්ඩ වාර දෙකකට සීමා කර තිබීම ඉතා වැදගත් වනවා. මොකද, අසමත් අංශ ප්‍රධානියෙකු යටතේ විශ්වවිද්‍යාලයක් දීර්ඝ කාලීනව ක්‍රියාත්මක වෙන්න ගියාම ඒ අංශයේ දුර්වලතා ඇති වෙන්න පුළුවන්. ඒ වාගේම තරුණ මහාචාර්යවරුන්ටත් මේ මඟින් වැඩි අවස්ථාවක් ලබා දීමක් සිද්ධ වනවා. ඒ නිසා මම හිතනවා මේක ප්‍රශස්ත සංශෝධනයක් කියලා. ඒ වාගේම මහාචාර්ය ධුරයෙන් ඉවත් කරන ආකාරය ඇතුළත් කිරීමත් වැදගත් වනවා.

පෙර පැවති ක්‍රමය අනුව උපකුලපතිවරයාට අංශ ප්‍රධානීන් පත් කිරීමේ අයිතිය තිබුණා. එවිට ඔහුට පක්ෂපාතී මහාචාර්යවරුන් පත් කිරීමේ අවස්ථාව වැඩිපුර ලැබුණා. ඒ එක්කම යම් උපකුලපතිවරයෙකු සමඟ ගැටුමක් ඇති කරගත් දක්ෂ මහාචාර්යවරුන්ට එකී අවස්ථාව මඟ හැරී යෑමේ හැකියාවකුත් තිබුණා. සමහර වෙලාවට යෝජනා කරන මහාචාර්යවරුන්ට ධුරය

[ගරු නීතිඥ නිලූෂා ලක්මාලි ගමගේ මහත්මිය]

පිරිනැමීම වළක්වා සිටීමේ අවස්ථාවත් උපකුලපතිවරයාට තිබුණා. මේ සංශෝධනය මඟින් ඒ අපහසුතා සියල්ලම ඉවත් කර තිබෙනවා. ඇත්තටම මෙම සංශෝධනය විශ්වවිද්‍යාල පද්ධතිය සඳහා ඉතා සුබදායී ධනාත්මක ආරම්භයක් ලෙස අපට හඳුන්වා දෙන්න පුළුවන්. ජාතික ජන බලවේගය ආණ්ඩුවේ අපි අධ්‍යාපන ක්ෂේත්‍රයට කිසිසේත්ම දේශපාලනය සම්බන්ධ කර ගන්නේ නැහැ. විපක්ෂය අද දේශපාලනය සඳහා අධ්‍යාපන ක්ෂේත්‍රය භාවිත කරනවා. ඒක අපි පිළිකුළින් හෙළා දකිනවා. අපි විපක්ෂයෙන් ඉල්ලන්නේ අධ්‍යාපනය වෙනුවෙන් ඉදිරිපත් වන ඉතා ඵලදායි සංශෝධන, ප්‍රතිසංස්කරණවලට අකුල් හෙළන්න එපා, අධ්‍යාපනය දේශපාලනීකරණය කරන්න එපා කියලායි. ඒ වාගේම දරුවන්ගේ අධ්‍යාපනය, ඔවුන්ගේ ඉදිරි අනාගතය නැති කරන්න උත්සාහ කරන්න එපා කියලාත් අපි විපක්ෂයෙන් ඉල්ලනවා. ඔබතුමන්ලාගේ දේශපාලන බංකොලොත්භාවය වහගන්න අධ්‍යාපනය යොදා ගෙන, අධ්‍යාපනය සඳහා වන සාධනීය ඵලදායි ප්‍රතිසංස්කරණවලට, සංශෝධනවලට විරුද්ධව බිල්ලෝ මවන්න එපා කියලාත් අපි විපක්ෂයෙන් ඉල්ලනවා. ජනතාව ඔබ ගැන තීරණය කරයි. අපට ඊළඟ පාර්ලිමේන්තු සභා ගර්භයේ විපක්ෂයක් දක්නට නැති වෙයි. ඒ නිසා රටේ දරුවන්ගේ ඉදිරි අනාගතය වාගේම ඔබගේ ඉදිරි දේශපාලන අනාගතය ගැන හිතලා අධ්‍යාපනය දේශපාලනය සඳහා යොදා ගැනීම නවත්වන්න කියලා මම විපක්ෂයට යෝජනා කරනවා.

විශේෂයෙන්ම මානව සම්පත දියුණු කරන්න ජනාධිපතිතුමා ප්‍රමුඛ මේ ආණ්ඩුව බලාපොරොත්තු වෙනවා. මානව සම්පත දියුණු කිරීමෙන් ඉදිරියේදී විදේශ විනිමය වැඩි වශයෙන් ළඟා කර ගන්න බලාපොරොත්තු වනවා. මේ ගෙන එන සංශෝධනවලිනුත් ඒකට විශාල පිටුවහලක් ලැබේවි කියා මා හිතනවා. ඒ නිසා මෙවැනි ප්‍රගතිශීලී සංශෝධන සඳහා පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් විධියට අපි වැඩි වශයෙන් සහයෝගය ලබා දෙමු කියන යෝජනාව කරමින් මා නිහඬ වෙනවා.

මට මේ අවස්ථාව ලබා දුන්නාට බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.20]

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම සතුටු වෙනවා, අපේ ගරු මන්ත්‍රීතුමියගේ කථාවෙන් පස්සේ කථා කරන්න අවස්ථාව ලැබීම ගැන. එතුමිය ඉතා හොඳ ප්‍රකාශ ගණනාවක් කළා. එතුමිය අපෙන් ඉල්ලුවා, මේක දේශපාලනීකරණය කරන්න එපා කියලා.

ඔබතුමිය කොහොම මේ කථාව ලියා ගත්තාද, නැත්නම් කවුරු හරි ලියලා දුන්නාද කියලා මම දන්නේ නැහැ. නමුත්, ලියලා තිබෙන ඒවා නේ කියවන්නේ, නේද? මේ දේශපාලනීකරණය ඔබතුමන්ලාම ඔප්පු කර පෙන්වා දීලා තිබෙනවා. මම එයින් එකක් කියන්නම්.

ඔබතුමන්ලාගේ "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" කියන ප්‍රතිපත්ති ප්‍රකාශයේ 17වන පිටුව බලන්න. එහි සඳහන් වනවා, "දේශපාලන හා වෙනත් සබඳතා මත උපකුලපතිවරුන් පත් කිරීම වෙනුවට නව ක්‍රමවේදයක්" යනුවෙන්. මම තව කාරණයක් කියන්නම්. කැලණිය විශ්වවිද්‍යාලයේ සමාජ විද්‍යා අධ්‍යයන අංශයේ හිටපු ඔබතුමන්ලාගේ ජාතික ජන බලවේගයට වැඩ කරපු මැතිනියක් තමයි අද යක්කල ආයුර්වේද වෛද්‍ය විශ්වවිද්‍යාලයේ වැඩ බලන උපකුලපති. කොළඹ විශ්වවිද්‍යාලයේ උපකුලපතිතුමා ඔබතුමන්ලාගේ වෘත්තීය සමිතියේ හිටපු සභාපතිතුමා. ඒ ගැන මම ඊට වඩා කියන්න යන්නේ නැහැ. ඒ නිසා මේක දේශපාලනීකරණය කරලා තිබෙන්නේ අපි නොවෙයි. ඒක මෙච්චර කාලයක් කළේත් ඔබතුමන්ලා. ඔබතුමන්ලාගේ පක්ෂයෙන් තමයි ඒක කළේ.

ඒ වාගේම මම මේ කාරණයත් කියන්න කැමැතියි. දැන් හරිනි අමරසූරිය මැතිනිය මේ ගරු සභාවේ හිටියා නම් හොඳයි. Colombo University එකේ තිබුණු "University Governance, Autonomy and Accountability: Directions for Change" කියන workshop එකේ report එක හදන්න මහන්සි වුණු එක ප්‍රධානියෙක් තමයි, අපේ අගමැතිතුමිය, ඒ කාලයේ විවෘත විශ්වවිද්‍යාලයේ වැඩ කළ ආචාර්යතුමිය. කරුණාකරලා එම වාර්තාවේ 25 වන පිටුව, 26 වන පිටුව බලන්න කියලා මම කියන්න කැමැතියි. එහි තිබෙන්නේ මොකක්ද? "Appointment of UGC, Vice Chancellors, Councils and Academic Administrators". එහි තිබෙනවා, appointment of University Grants Commission and University Councils, appointment of Vice Chancellors, ඊළඟට, appointment of Deputy Vice Chancellors. ඊළඟට තමයි එන්නේ, appointment of Deans and Heads of Departments. දැන් මේවා ඔක්කෝම තිබියදී තමුන්නාන්සේලා එක පාරටම එකක් උස්සා ගෙන එනවා Heads of Departments, deansලාව පත් කරන්න. සම්පූර්ණයෙන් politicize කරන වැඩක් මේ කරන්නේ. සාමාන්‍යයෙන් ඉස්සර කොහොමද මේ පත් කිරීම කළේ? ඔබතුමිය කිව්වා උපකුලපති කැමති අයව පත් කරන්න පුළුවන් කියලා. එහෙම කරන්නේ නැහැ. මම හිතන විධියට, ඔබතුමියත් විශ්වවිද්‍යාලයට ගිහිල්ලා ඇති. අපිත් විශ්වවිද්‍යාලයේ ශිෂ්‍ය දේශපාලනය කරපු අය. ඒ කාලයේ අධ්‍යයන අංශයේ ප්‍රධානියා පත් කරන්නේ කොහොමද කියලා අපි දන්නවා. කෙළින්ම අධ්‍යයන අංශයේ අය අතරින් යෝජනාවක් කරන්න කියලා, උපකුලපතිට කියනවා. ඒ අයව පත් කරලා එවනවා. එහෙම නැතිව එයාට ඕනෑ ඕනෑ අයව පත් කරන්නේ නැහැ. ඊට පස්සේ පීඨාධිපති පත් කරන්නේ කොහොමද? විශ්වවිද්‍යාලයේ අංශ 12ක් තිබෙනවා නම් අංශ ප්‍රධානීන්ගේ එකතුවෙන් එන ඡන්දයෙන් තමයි පීඨාධිපති පත් කරන්නේ, elect කරන්නේ. ඒ විධියට elect කරලා තමයි ගන්නේ. ඒක දැන් ඔබතුමන්ලා නැති කරලා තිබෙනවා. අද වෙනකොට මේක පහළටම ගෙනැල්ලා තිබෙනවා. අපි දන්නවා කථිකාචාර්ය, සහාය ආචාර්ය, මහාචාර්ය, ජ්‍යෙෂ්ඨ මහාචාර්ය, කථිකාචාර්ය, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය 1, 2 ආදී වශයෙන් තිබෙන බව. දැන් මේක පහළට වෙනකන් යනවා. දැන් තමුන්නාන්සේලා ගෙනැල්ලා තිබෙන විධිය අනුව යම් කිසි සීමාවක් දාලා තිබෙනවා, එකපාරක් කළා නම් නැවත කරන්න බැහැ කියලා. ඔව්, ඒක හොඳයි. හැබැයි, මහාචාර්යවරයෙක්, නැත්නම් සහාය මහාචාර්යවරයෙක් කරලා ඉවර වුණාට පස්සේ අංශ ප්‍රධානී එක්කෝ පීඨාධිපති තනතුරක, සමහර විශ්වවිද්‍යාලවල කවුරුත් නැහැ. මහාචාර්යවරු 500ක් නැහැ, මේක කරන්න. ඊට පස්සේ මොකද වෙන්නේ? මේ තනතුරු පහළට යනවා. පළමුවෙන් කථිකාචාර්ය, ඊළඟට ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය. මේ විධියට ගියාට පස්සේ විශ්වවිද්‍යාල පරිපාලනයේ අවුරුදු 25ක්, 30ක් වැඩ කරලා පළපුරුද්ද තිබුණු මිනිස්සු වෙනුවට juniorsලා ටිකක් තමයි විශ්වවිද්‍යාල පරිපාලනය කරන්නේ. මෙහෙම කරන්න බැහැ.

මේක විශාල අර්බුදයක්. මේක කරුණාකරලා තේරුම් ගන්න. මේක තමයි දිගටම කිව්වේ.

අපි හරිනි අමරසූරිය මැතිනියට කියන්නේ ඔබතුමියගේ Report එක අනුව ක්‍රියා කරන්න කියලායි. ඔබතුමියලා නේ මේක ගෙනාවේ, මේ රටේ අධ්‍යාපනය හදන්න. දැන් මොකක්ද කරලා තිබෙන්නේ? තමුන්නාන්සේලාගේ දේශපාලනයේ හෙංචයියන්ට පීඨාධිපති තනතුරු දෙන්නයි, අංශ ප්‍රධානී තනතුරු දෙන්නයි තමුන්නාන්සේලා ව්‍යවස්ථා සංශෝධනයක් ගෙනෙනවා. මේක FUTA එකෙන් ඇහුවාම FUTA එකේ අය කැමැතියි. මොකද, තමන්ගේ වෘත්තීය සමිතියේ ඉන්න කට්ටියට කොහෙන් හෝ තනතුරක් ලැබෙනවා නම් ඒගොල්ලන් කැමතියි නේ. ඒගොල්ලන් ජ්‍යෙෂ්ඨද, කණිෂ්ඨ ද අපට අදාළ නැහැ කියලා ඒගොල්ලෝ කියයි. මතක තියා ගන්න, මේකෙන් වෙන්නේ මේකයි. 2025 වසරේ QS World University Rankings එකේ කොළඹ විශ්වවිද්‍යාලය පළමුවැනි විශ්වවිද්‍යාල 1,000 අතරයි ඉන්නේ. අද - 2026දී - ඒක ගිහිල්ලා තිබෙනවා 1,200ට. ඊළඟට, ජ'පුර තිබුණේ 1,500 ගණන්වලින් පහළ. දැන් අද 1400 plus ගිහිල්ලා තිබෙනවා. ඒ විතරක් නොවෙයි. දකුණු ආසියාවේ ගත්තොත් කොළඹ විශ්වවිද්‍යාලය ඉන්නේ කොතැනද? ඉන්දියාවේ universities 42ක් කොළඹ විශ්වවිද්‍යාලයට වඩා උඩින් තිබෙනවා. පාකිස්තානයේ 15ක් තිබෙනවා. බංග්ලාදේශයේ 5ක් තිබෙනවා. අපි ආපස්සට යන්නේ. ආපස්සට යනකොට ආපහු මේක දේශපාලනීකරණය කරන්නේ අපි නොවෙයි, තමුන්නාන්සේලා. ඒ නිසා කරුණාකරලා මේක හොඳින් අවබෝධ කරගෙන වැඩ කරන්න කියලා මම ඉල්ලා සිටිනවා. මොකද, ඇත්ත වශයෙන්ම මේක නොවෙයි කරන්න තිබෙන්නේ. මම මුල ඉඳන්ම කිව්වා, විශ්වවිද්‍යාල පනත සංශෝධනය කරන්න කියලා. මුළු පනතම. පනතේ කෑලි කෑලි අරගෙන සංශෝධනයට දාන්න එපා. මේකෙන් තමයි මේ විනාශය වෙන්නේ. විශ්වවිද්‍යාල පනත සංශෝධනය කරනවා නම්, අපිට පුළුවන් නියෝජ්‍ය උපකුලපතිව දාන්න. ලෝකයේ අනෙක් තැන්වල තිබෙනවා, පර්යේෂණ හා සංවර්ධන නියෝජ්‍ය උපකුලපති. ඊළඟට, අධ්‍යයන හා ශිෂ්‍ය නියෝජ්‍ය උප කුලපති. ජාත්‍යන්තර කටයුතු පිළිබඳ නියෝජ්‍ය උප කුලපති. ඒ වාගේ පීඨාධිපතිවරුනුත් ඉන්නවා. පර්යේෂණ හා සංවර්ධන අධ්‍යයන, ජාත්‍යන්තර යනාදී වශයෙන් මේ අය ඔක්කෝම එකතු වෙලා තමයි විශ්වවිද්‍යාලයක් ගොඩගන්නේ. තමුන්නාන්සේලා කණිෂ්ඨ - junior - අයට මෙහි පාලනය දීලා සම්පූර්ණයෙන්ම විනාශ කරන්න හදන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඊළඟට මම මේ කාරණය කියන්න කැමැතියි. විශේෂයෙන්ම අධිකරණය සම්බන්ධව අපේ අධිකරණ සේවා සංගමය නිවේදනයක් නිකුත් කරලා තිබෙනවා. අපි ඉතා සන්තෝෂ වෙනවා. එතුමන්ලා කියලා තිබෙනවා අසත්‍ය සහ පදනම් විරහිත විවේචන මඟින් අධිකරණයේ පත්වීම් සම්බන්ධයෙන් ඇති මහජන විශ්වාසය පලුදු කිරීමට උත්සාහ කරනවා කියලා. අපි පැහැදිලිව කියන්න කැමැතියි, මේ රටේ විනිශ්චයකාරවරුන්ට අපහාස කරන අයට විරුද්ධව අනිවාර්යයෙන්ම ක්‍රියාමාර්ග ගන්න ඕනෑ බව. මොකද, මෙය ආරක්ෂා කිරීම අපේ යුතුකමක්. හැබැයි, දැන් මොකද වෙලා තිබෙන්නේ? දැන් ලංකාවේ කවදාවත් සිද්ධ වුණේ නැති දෙයක් සිද්ධ වෙලා තිබෙනවා. මහාධිකරණ විනිශ්චයකාරවරයෙක් - High Court Judge කෙනෙකු - වන පී.එම්.ටී. බණ්ඩාර මහතා අධිකරණ අමාත්‍යාංශයේ Additional Secretary - Judicial Services ලෙස පත් කරලා තිබෙනවා. Judicial Service Commission එකෙන් judgesලා ඔක්කෝටම දාලා තිබෙනවා, මෙයාව contact කරන්න කියලා. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 52වන ව්‍යවස්ථාවේ බොහොම පැහැදිලිව තිබෙනවා, අමාත්‍යවරයා යටතේ තමයි ලේකම්වරයා සහ අනෙක් කට්ටිය ඉන්නේ කියලා. අතිරේක ලේකම් කියන්නේ අමාත්‍යවරයාට ඍජුව වග කියන්න ඕනෑ කෙනෙක්. එතුමා ගිහිල්ලා කෙහෙළිය රඹුක්වැල්ල නඩුව අහනවා. මහින්දානන්ද අලුත්ගමගේ නඩුව අහනවා. ඒ නඩු දෙකම අහන්නේ එතුමා. අනෙක් පැත්තෙන් Sri Lanka Judges' Institute එකේ ඉන්නවා, අපේ ප්‍රියන්ත ලියනගේ මැතිතුමා. ඒ අය ගැන මට පෞද්ගලික ප්‍රශ්නයක් නැහැ. ඒ අය ඉතාම වැදගත් මහත්වරු. ඒ අය කිසි දවසක ජරා වැඩ කරලා, වැරදි වැඩ කරලා තිබෙනවා කියලා මම කවදාවත් කියන්නේ නැහැ. හැබැයි, ඒකෙන් මොකක්ද වෙන්නේ? මේ රටේ යුක්තිය, සාධාරණත්වය ඉෂ්ට වෙන්නේ කොහොමද? කෙහෙළිය රඹුක්වැල්ල වැරැදිකාරයෙක් කියලා ඔප්පු කරන වැඩේ දැන්මම මෙතැනින් කරලා ඉවරයි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
දැන් අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමා.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ඒක නිසා කරුණාකරලා මේක නතර කරන්න. මේ විධියට තමයි Judicial Service Commission එක අද දේශපාලනීකරණය කරලා තිබෙන්නේ. විනිශ්චයකාරවරුන්ට තිබුණු, යුක්තිය ක්‍රියාත්මක කරන්න අවශ්‍ය කරන වැඩ පිළිවෙළ කරන්නේ නැහැ.

ඊයේ පෙරේදා දවසක අපේ ලාල් කාන්ත ඇමතිතුමා කියනවා මම දැක්කා, ආණ්ඩු බලය ගත්තාට තවම රාජ්‍ය බලය ගත්තේ නැහැ කියලා. රාජ්‍ය බලය ගන්න 13 ලක්ෂයක් රාජ්‍ය සේවකයන් ඒ අයගේ සාමාජිකයන් වෙන්න ඕනෑ. ඒකද කියන්නේ? තමන්ට කැමැති නීතිපති කෙනෙක් දාගන්න ඕනෑ. මාස දෙකක් විතර තිස්සේ විගණකාධිපති කෙනෙක් නැහැ. COPE එක රැස්වුණේ නැහැ. තමුන්නාන්සේලාට කැමති කෙනෙක් දා ගන්න, ඒකටද රාජ්‍ය බලය ඕනෑ කියන්නේ?

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
අග්‍ර විනිශ්චයකාරතුමා අයින් කරලා තව කෙනෙක් දා ගන්නද? අග්‍ර විනිශ්චයකාරතුමා ලවා තමන්ට කැමති judgesලා තමන්ට කැමති කැමති තැන්වලට දා ගන්නද? ඒ අය දාලා මේ වාගේ නඩු අහන්නද? ඒකද දැන් තමුන්නාන්සේලාට ඕනෑ වෙලා තිබෙන්නේ?

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
කාලය අවසානයි, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ඒ විතරක් නොවෙයි. මම කියන්න කැමැතියි, -

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
කාලය අවසානයි, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
මට තව විනාඩියක් දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

RM Parks (Private) Limited එක ගැන මම අවස්ථා ගණනාවකදීම කරුණු මතු කළා. මෙට්‍රික්ටොන් 23,000ක් නුසුදුසු තැන්වල ගබඩා කරලා තිබෙනවා. මේ පිළිබඳව අපි පරීක්ෂණයකුත් කළා. අද වෙනකොට මොකක්ද වෙලා තිබෙන්නේ? ඒකට ගියා අහිංසක නිලධාරිනියක්. අද ඇයගේ වැඩ තහනම් කරලා. වැඩ තහනම් කරලා විතරක් නොවෙයි, ඇයව - *[බාධා කිරීමක්]* ගරාජ් එකකට දාලා තිබෙන්නේ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
කාලය අවසන්, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
මට තත්පරයක් දෙන්න.

අපේ කුමාර ජයකොඩි ඇමතිතුමා ඊයේ පාර්ලිමේන්තුවේදී කිව්වා, එතුමා රුසියාවට ගිහිල්ලා කිසි කෙනෙක් හම්බ වුණේ නැහැ කියලා. එතුමා SUEK එක හම්බ වුණා. මා ළඟ ඒ විස්තර තිබෙනවා. මේ අවස්ථාවේ මා එම තොරතුරු **සභාගත*** කරනවා. දවල් 1.00ට එතුමා SUEK කොම්පැනිය අයිති අයව හම්බ වෙනවා. ඒ සම්බන්ධව ඔබතුමන්ලාගේ අවධානය යොමු කරන්න කියලා ඉල්ලා සිටිමින් මගේ කථාව අවසන් කරනවා. ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු (ආචාර්ය) හිනිදුම සුනිල් සෙනෙවි ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 12ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.30]

**ගරු(ආචාර්ය) හිනිදුම සුනිල් සෙනෙවි මහතා (බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு (கலாநிதி) ஹினிதும சுனில் செனெவி - புத்தசாசன, சமய மற்றும் கலாசார அலுவல்கள் அமைச்சர்)
(The Hon. (Dr.) Hiniduma Sunil Senevi - Minister of Buddhasasana, Religious and Cultural Affairs)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඉතාම වැදගත් පනතක් සංශෝධනය කරන වෙලාවේ යම් අදහසක් පළ කරන්නට අවස්ථාව ලැබීම ගැන ඉතාම සතුටු වෙනවා. ඒ වාගේම ශ්‍රී ලංකාවේ රාජ්‍ය විශ්වවිද්‍යාලයක අඛණ්ඩව වසර 25ක් ආචාර්යවරයෙක් හැටියට කටයුතු කරන්නට ලැබුණු කෙනෙක් හැටියටත් මේ අදහස් පළ කරන්නට අවස්ථාව ලැබීම එක අතකට සතුටක්; අනෙක් අතට දෛවෝපගත වාසනාවක් ලෙස හිතනවා. මම එහෙම කියන්නේ, දශක ගණනාවක් තිස්සේ සංශෝධනය නොවුණු මේ පනත නිසා අසාධාරණයන්, අක්‍රමිකතා විශ්වවිද්‍යාල ඇතුළේ ක්‍රියාත්මක වෙන හැටි, පනත නිසා ඒකට මහ සැලසෙන හැටි කාලයක් තිස්සේ දැකපු කෙනෙකු හැටියටයි. ඒක නිසා ඒ ආනුභාවික අත්දැකීම් මගේ මේ අදහස් දෙක, තුනට බලපානවා.

දැනට පළ වුණු අදහස්වලට සවන් දෙනකොට විශ්වවිද්‍යාලයක ව්‍යුහය, ඒ කාර්යභාරය, ඒ සමහර භූමිකාවන්වල බලය ගැන තොරතුරු කියැවුණා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශ්වවිද්‍යාලයක අධ්‍යයන, අනධ්‍යයන, ශිෂ්‍ය කියන ප්‍රධාන ක්ෂේත්‍ර තුනක් දකින්න පුළුවන්. අනධ්‍යයන කියන ක්ෂේත්‍රය ඇතුළේ අපට හම්බ වෙනවා, පරිපාලන කියන ක්ෂේත්‍රයක්. ඒ පරිපාලන කියන කොටස අපට කොටස් දෙකකට බෙදන්න පුළුවන්. එකක්, PEO administration. අනෙක් එක, academic administration. ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරිවරයෙකු ගත්තොත්, එම තනතුර පූර්ණ වශයෙන් පරිපාලන තනතුරක්. නමුත් අද අපි කථා කරන අධ්‍යයන අංශ ප්‍රධාන සහ පීඨාධිපති කියන තනතුරු අපට සලකන්න වෙන්නේ, ශාස්ත්‍රීයත්වය සහිත පරිපාලන - academic administration - තනතුරු හැටියට.

විශ්වවිද්‍යාලයක ප්‍රධාන ශාස්ත්‍රීය නිලධාරිවරයා වෙන්නේ උපකුලපතිවරයා. ඉන් පසුව තමයි අපට පීඨාධිපතිවරු, අංශාධිපතිවරු කියන අද දවසේ කථා බහට ලක්වන ප්‍රධාන තනතුරු දෙක හම්බ වෙන්නේ. ඊට අමතරව අධ්‍යක්ෂවරු, සමායෝජකවරු විශාල වශයෙන් දකින්නට පුළුවන්. මේ සංශෝධනය තුළින් විශ්වවිද්‍යාල පරිපාලනයේ ප්‍රජාතාන්ත්‍රික අවකාශය බරපතළ විධියට පුළුල් වන බව තමයි මට පෙන්වා දීමට ඕනෑ කරන්නේ. විශ්වවිද්‍යාල පනතේ 49 වැනි වගන්තිය සහ 51 වැනි වගන්තියයි අද සංශෝධනයට ලක් වන්නේ සහ අප විවාද කරන්නේ. මොකද, මේ ප්‍රජාතාන්ත්‍රික අවකාශය පුළුල් නොවීම නිසා විශ්වවිද්‍යාල වාගේ ශාස්ත්‍රීය ආයතනවල ප්‍රශ්න ඇතිවනවා.

විපක්ෂ නායකතුමා අයිවර් ජෙනිංග්ස් පඬිවරයා ගැන සඳහන් කළා. මේ රටේ ශාස්ත්‍රීයත්වය, නැත්නම් ශාස්ත්‍රීය නිදහසේ බලකොටු කියලා ජෙනිංග්ස්ම හඳුන්වපු විශ්වවිද්‍යාලවල තත්ත්වය කාලාන්තරයක් තිස්සේ බෙහෙවින් කඩා වට්ටවා තිබෙනවා. ඒක සිද්ධ කරන්නේම තමන්ට අවශ්‍ය පරිමාව ඇතුළේ විතරක් දේශපාලනීකරණය කියලා පෙන්වා දෙන්න හදන, අද වනකොට අපි අත්විඳින, විශ්වවිද්‍යාල අත්විඳින ව්‍යසන නිසායි. ඒවා වළක්වා ගැනීමට තමයි මේ පනත් කෙටුම්පත මඟින් ඉතා තාර්කිකව මේ සංශෝධන දෙක ගෙනෙන්නේ. මොකද, මේ සංශෝධන මඟින් අංශාධිපති, පීඨාධිපති කියන පත් කිරීම් පිළිබඳ අවස්ථාව නිරවුල් වනවා, වඩාත් පුළුල් වනවා, සම අවස්ථාව ලැබෙනවා, සාධාරණ අවස්ථාවක් ලැබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සාධාරණ ප්‍රවේශයක් කියන්නේ, විශ්වවිද්‍යාල ආචාර්යවරයෙකුගේ ශාස්ත්‍රීය ගමන් මඟට එය ලොකු ආලෝකයක් වන නිසායි. අග්‍රාමාත්‍යතුමිය ඇතුළු අපි බොහෝදෙනෙක් -12දෙනෙකුගෙන් විතර සමන්විත කණ්ඩායමක්- නිශ්චිත මොහොතකදී විශ්වවිද්‍යාල ශාස්ත්‍රීය අධ්‍යාපනය මඳකට පසෙක තබා මේ විධියට දේශපාලනය පූර්ණ කාලීනව තෝරා ගත්තාට, අපේ සහෝදර සහෝදරියන් දහස් ගාණක් මේ ක්ෂේත්‍රයේ ඉන්නවා. මේ කියන අංශාධිපති, පීඨාධිපති කියන තනතුරු නිසි වෙලාවට, නිසි ලෙස, සිත් නොරිදවා, සාධාරණ විධියට, යුක්ති යුක්ත විධියට ඔවුන්ගේ ජීවිතයට ලැබෙනවා නම්, ඒ අවස්ථාව උදා වෙනවා නම් ඒ අයගේ ශාස්ත්‍රීය ගමන් මඟට ලොකු ආලෝකයක් ලැබෙනවා. ඍජුව කිව්වොත්, තරුණ විශ්වවිද්‍යාල ආචාර්යවරයෙකු ක්‍රමිකව මහාචාර්ය තනතුරට පත් වීමේදී අංශ ප්‍රධාන තනතුරේ සහ පීඨාධිපති තනතුරේ කටයුතු කර තිබීම සහ අත්දැකීම් තිබීම එහිදී බෙහෙවින්ම වැදගත් වනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඊට අමතරව මෙතැනින්ම මතු වන තව පොඩි කාරණයකට අවධානය යොමු කරන්න මම කැමැතියි. අද අපේ පනත් කෙටුම්පත මඟින් ගෙනෙන සංශෝධන

---

**** පුස්තකාලයේ තබා ඇත.***
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

දෙක ඇතුළේ ප්‍රජාතාන්ත්‍රික අවකාශය පුළුල් වන හැටි අපි කරුණු වශයෙන් පෙන්වා දීලා තිබෙනවා. 49 වැනි වගන්තියෙන් කථා කරන්නේ පීඨාධිපති තනතුර ගැන. පීඨයේ ජ්‍යෙෂ්ඨ මහාචාර්යවරුන්, මහාචාර්යවරුන්, ආශ්‍රිත මහාචාර්යවරුන් සහ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරුන් (I වන ශ්‍රේණිය) කියන අය අතරින් පීඨාධිපතිවරයෙක් තෝරා ගන්න බලය පවරන්නේ පීඨ මණ්ඩලයටයි. ඒක ඉතාම සාධාරණ ප්‍රවේශයක්. පීඨාධිපතිවරයෙකුගේ ධුර කාලය අවසන් වීමට පෙර ඔහු ධුරයෙන් ඉවත් කිරීමට පාලක සභාවට බලය ප්‍රදානය කිරීම මොන තරම් සාධාරණ, ප්‍රජාතාන්ත්‍රික ඉඩ දීමක්ද?

මට කලින් කථා කළ මන්ත්‍රීවරුන් පෙන්වා දුන්නා, සමහර විශ්වවිද්‍යාලවලට උපකුලපතිවරුන් පත් කරපු හැටි. ඒක අපේ රජය කරපු වරදක් විධියට, හරියට යහළුවන්ට තනතුරු බෙදනවා වාගේ හැඟීමක් තමයි ඇති කළේ. ගරු මන්ත්‍රීවරුනි, පාලක සභා නිර්දේශ අනුව විශ්වවිද්‍යාලවල උපකුලපතිවරුන් පත් කිරීමට දීර්ඝ ක්‍රියාදාමයක් තිබෙනවා. එහෙම නැතිව හිතවතුන්ට තනතුරු බෙදන විධියට මේ තනතුරුත් බෙදනවා කියන හැඟීම සමාජගත කරන එක ඉතාම වැරදියි. පීඨයක පීඨාධිපතිවරයෙකුගේ ධුර කාලය පිළිබඳව සීමා හඳුන්වා දීම මොන තරම් සාධාරණද? ඔබතුමන්ලා දන්නේ නැතිව ඇති, ඔය නිදහසේ බල කඳවුරු කියලා කියපු විශ්වවිද්‍යාල ඇතුළේ මේ ධුර කාලයේ සීමාවක් නැතිකම නිසා සිද්ධ වෙලා තිබෙන ව්‍යසන ගැන. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සමහර විශ්වවිද්‍යාලවල අංශාධිපති, පීඨාධිපති කියන තනතුරුවල එකම පුද්ගලයින් terms දෙක, තුන, හතර ඉන්න අවස්ථා දැක ගන්න පුළුවන්. අවුරුදු තුනේ ඒවා හතරක් විතර එකතු වෙලා අවුරුදු 10ක්, 12ක් එකම පුද්ගලයෙක් එකම තනතුර දරනකොට එතැන ජනිත වෙන්න පුළුවන් තත්ත්වය ගැන මම අමුතුවෙන් කියන්න ඕනෑ නැහැ.

එහෙම නම් මේකෙන් වෙන්නේ, ප්‍රජාතන්ත්‍රවාදී අවකාශය හැකිළෙන එකද, ප්‍රසාරණය වීමද? එම නිසා අතිශය සාධාරණ සංශෝධනයක් අපි මේ ගෙන එන්නේ. 51වැනි වගන්තියෙන් අංශ ප්‍රධාන තනතුර ගැන කියවෙන්නේත් මේ විධියටමයි. අධ්‍යයනාංශයක අංශ ප්‍රධානියෙක් පත් කරන්න පාලක සභාව විසින් අනුගමනය කළ යුතු ක්‍රියා පටිපාටිය නිශ්චිතව හඳුන්වා දීම තමයි මේ තුළින් කියන්නේ. මේක නේද, වෙන්නට ඕනෑ? මේක තමයි විශ්වවිද්‍යාලයේ නොතිබුණු දේ. මෙතැනදී කියැවුණා, උපකුලපතිවරයාට තිබෙන හිතවත්කමට අංශ ප්‍රධානීන් පත් කරන්න පුළුවන්ද වාගේ කථාවක්. ඔව්, පුළුවන්. විශ්වවිද්‍යාල දිහා බලන්න විතරයි තිබෙන්නේ. උපකුලපතිවරයා තමන්ගේ තනි මතයට තමයි අංශ ප්‍රධානීන් පත් කරන්නේ. ඕනෑ නම් අධ්‍යයන අංශයෙන් ඒ පිළිබඳව අහන්න පුළුවන්. නමුත්, එහෙම අහන්න බැඳිලා නැහැ. විශ්වවිද්‍යාල දෙසට හැරිලා බලන්න, ඒකෙන් සිදුවෙලා තිබෙන අගතිය කොච්චරද කියලා. අන්තිමට තමන්ට උදව් උපකාර කරන, තමන්ගේ මතය ගෙන යන -දේශපාලන මතය වාගේ පුළුල් මතයක් නොවෙයි- උපකුලපතිවරයාට හිස නමන, උපකුලපතිවරයාගේ අනුගාමිකයෙක් පත් කරන තැනට මේ කටයුතු පත්ව තිබෙනවා. ඒක වළක්වන්නයි මේ සංශෝධන අරගෙන එන්නේ. ඒ හින්දා මේ වාගේ දේවල් ගැන තර්ක කරන එක, පාලම්, බෝක්කු ගැන තර්ක කරන තරම් ලෙහෙසි වන්නේ නැහැ. ආනුභවික අත්දැකීමක් එක්ක හරියටම සොයාගෙනයි මේ ගැන කථා කරන්න ඕනෑ. මොකද, මේ සාධාරණ සංශෝධනයෙන් ප්‍රතිලාභ ලබන්නේ අනාගත විශ්වවිද්‍යාලමයි, ඒ පරිසරයමයි.

අපි දන්නවා, පීඨාධිපති තනතුරට වාගේම අධ්‍යයනාංශවල ප්‍රධානීන්ට අදාළ වන ධුර කාලය හා සම්බන්ධ සීමා පිළිබඳවත් මෙහි අවසානයේ කියන බව. මේක වැදගත් වන්නේ ඇයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි? සමහර අංශ ප්‍රධානීන් කොච්චර කාලයක් ඒ තනතුරේ ඉඳලා තිබෙනවාද කිව්වොත්, සමහර ඒවා ගිනස් වාර්තාවලට කිට්ටු වෙලා තිබෙන්නේ. මේකේ තිබෙන බලපෑම මෙතැනින් ඔබ්බට යන හැටි මම විනාඩියක් ඇතුළත පෙන්වා දෙන්න කැමැතියි.

අංශ ප්‍රධාන සහ පීඨාධිපති කියන තනතුරු අසීමාන්තිකව තමන්ගේ හිතවතුන් අතරේ බෙදාගෙන පවත්වාගෙන යෑම ඇතුළේ අධික බලයක් පරිහරණය කරන්න අවස්ථාව ලැබෙනවා. ඒ අයගේ අතට අත්තනෝමතික බලයක් ලැබෙනවා. පෞද්ගලික ප්‍රවේශ හා රුචි අරුචිකම්වලට සුජාත බවක් දෙන්න ඒගොල්ලන්ට අවස්ථාව ලැබෙනවා. ඒක තමයි වළක්වන්න හදන්නේ, පීඨ මණ්ඩලයට සහ පාලක සභාවට බලය පවරලා. පත් කිරීම සහ ඉවත් කිරීම තනි පුද්ගලයෙක් අතට පත් නොවී, පාලක සභාව කියන විශ්වවිද්‍යාලයක තිබෙන supreme governing body එක, විශ්වවිද්‍යාලක් පරිපාලනය වන ඉහළම මණ්ඩලය අතට පත් කරන එක සාධාරණ නැත්නම්, මොකක්ද සාධාරණ ප්‍රවේශය? අංශ ප්‍රධාන සහ පීඨාධිපති කියන්නේ, නව බඳවා ගැනීම්වලදී නිශ්චිතව බලපෑම් කරන තනතුරු දෙක.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඇමතිතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

**ගරු (ආචාර්ය) හිනිදුම සුනිල් සෙනෙවි මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹினிதும சுனில் செனெவி)
(The Hon. (Dr.) Hiniduma Sunil Senevi)
මම ඉක්මනින් කථාව අවසන් කරන්නම්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

උසස්වීම්, අධ්‍යයන නිවාඩු, සම්මුඛ පරීක්ෂණ, ඒ වාගේම සම්මුඛ පරීක්ෂණවලට එන ඉල්ලුම් පත්‍ර කෙටි ලැයිස්තුගත කිරීම, විදේශ ශිෂ්‍යත්ව පිරිනැමීම්, විනය පරීක්ෂණ ආදී තැන්වලට සෘජුව බලපෑම් කිරීමේ අවස්ථාව මේ තනතුරු දෙකට ලැබෙනවා. ඒ නිසා තමයි, වඩාත්ම බලගතු පිරිසක් අතරින් අපි ඒ තනතුරු දෙක නිශ්චිත ක්‍රමවේදයකට තෝරාගන්න කථා කරන්නේ.

ගරු අග්‍රාමාත්‍යතුමිය ඉදිරිපත් කළ වාර්තාවක් ගැන විපක්ෂ නායකතුමා ප්‍රශ්න කරලා ගියා. ඒ වාගේම සියයට 6 ගැනත් ප්‍රශ්න කරලා ගියා. මේවා එක්ක අපි සෙල්ලම් කරලා නැති බව පැහැදිලිවම කියන්නට ඕනෑ. විශ්වවිද්‍යාල ස්වාධිපත්‍යය ගැන සඳහන් අගමැතිතුමියගේ වාර්තාවට කිසි අභියෝගයක් නැහැ. අපි සියලුදෙනා ඒ වෙනුවෙන් පෙනී සිටිනවා, එතුමියත් ඒ වෙනුවෙන් වැඩ කරනවා.

ඒත් එක්කම මම මතක් කරලා දෙන්න කැමැතියි, "External Influences to the University Autonomy" කියන බොහොම විශිෂ්ට ලියවිල්ලක් ගැන. C V C D කියන්නේ, උපකුලපතිවරුන්ගේ සහ අධ්‍යක්ෂවරුන්ගේ කමිටුව. ගරු අගමැතිතුමියනි, එහි ලේකම් තනතුරේ කලක් කටයුතු කළ නිශ්ශංක වරකාවුල්ල කියන හොඳ රෙජිස්ට්‍රාර් මහත්මයා -ලේඛකාධිකාරීතුමා- ලියලා තිබෙනවා, විශ්වවිද්‍යාල පරිපාලනයට බාහිර බලපෑම් එල්ල වන හැටි. කියවලා බලන්න, හැමෝම එකතු වෙලා විශ්වවිද්‍යාල ස්වාධිපත්‍යය නැති කරපු හැටි ඒකේ තිබෙනවා.

ඒ වාගේම මම අවසන් වශයෙන් තවත් කාරණයක් කියන්න ඕනෑ. විශ්වවිද්‍යාල පද්ධතියේ නිර්මාතෘ අයිවර් ජෙනිංග්ස් මහතා පිළිබඳව ගරු විපක්ෂ නායකතුමා සඳහන් කරලා ගියා. මම විපක්ෂ නායකතුමාට කියනවා, අයිවර් ජෙනිංග්ස්ගේ ජීවිත කථාව කියවා

[ගරු (ආචාර්ය) හිනිදුම සුනිල් සෙනෙවි මහතා]

බලන්න කියලා. "The Road to Peradeniya" කියන කෘතියේ එතුමා පැහැදිලිව සඳහන් කරනවා, ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාලවල එතුමා ඇති කරන්න බලාපොරොත්තු වන නිර්ණායක සහ ඒවායේ ප්‍රමිති කොයි වාගේද කියලා. ඒකේ තිබෙන එක දෙයක් ගැන විතරක් කියලා මම කථාව අවසන් කරන්නම්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අයිවර් ජෙනිංග්ස් මහතා ලංකා විශ්වවිද්‍යාලයේ උපකුලපතිතුමා වශයෙන් කටයුතු කළ කාලයේ විශ්වවිද්‍යාලයට ඇතුළත් වීම සඳහා ශිෂ්‍යාවක් ඉදිරිපත් කළ අයදුම්පත්‍රයක් එතුමාට ලැබුණා. ඒක පරීක්ෂා කරලා එතුමා සඳහන් කරනවා, "ලංකා විශ්වවිද්‍යාලයට ඇතුළත් වෙන්න ඔබට සුදුසුකම් මදි, මහන්සි වෙලා තව වැඩ කරලා එන්න" කියලා. ඒ ශිෂ්‍යාව වැඩේ අත්හරිනවා. ඊට අවුරුදු කිහිපයකට පස්සේ ඒ ශිෂ්‍යාවම ඒ අයදුම්පත්‍රයම කේම්බ්‍රිජ් සරසවියේ උපකුලපතිවරයාට ඉදිරිපත් කරනවා, ගරු අගමැතිතුමියනි. ඒ මොහොතේ කේම්බ්‍රිජ් සරසවියේ උපකුලපතිවරයා වුණේ මේ අයිවර් ජෙනිංග්ස් පඬිවරයාම තමයි. ඔහු පරීක්ෂා කර බලලා කියනවා, "හරි. දැන් හොඳයි, මේ අයදුම්පත. ඔබ සුදුසුකම් ලබනවා, ප්‍රමාණවත්" කියලා. කවුද දන්නවාද මේ? අයිවර් ජෙනිංග්ස්ගේම දියණිය වන ක්ලෙයාර් ජෙනිංග්ස්ගේ අයදුම්පතට තමයි එතුමා එහෙම කියන්නේ. එහෙම ප්‍රමිතියක් තමයි ශ්‍රීමත් ජෙනිංග්ස් ලංකාවේ විශ්වවිද්‍යාල අධ්‍යාපනයේ හැදුවේ. මේ පාර්ලිමේන්තුවට තවමත් එන එක බෙබි කෙනෙකුගේ නිර්දේශය මත, අමාත්‍යවරයෙකුගේ නිර්දේශය මත අවුරුදු දෙකක් පරණ උසස් පෙළ ප්‍රතිඵලවලින් ළමයෙක් රුහුණ විශ්වවිද්‍යාලයට යවන්න හැදුවා. ආචාර්ය සමිති සම්මේලනයට ඒක අහු වෙලා නැවැත්වුවා. එහෙම තමයි විශ්විද්‍යාල ස්වාධිපත්‍යයට සහ ජෙනිංග්ස් හදපු ප්‍රමිතීන්වලට මේ විපක්ෂයේ ඉන්න, අවුරුදු ගණන් ආණ්ඩු හොබවපු කට්ටිය කළේ. මේ ජාතියේ අඳුරු පරිච්ඡේදයක් නිම කරන්න තමයි මේ විශිෂ්ට සංශෝධන ගෙනෙන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට මම ස්තුතිවන්ත වෙනවා, මට කථා කරන්න කාලය ලබා දීම සම්බන්ධයෙන්.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු එම්.ඒ.එම්. තාහිර් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් තිබෙනවා.

[பி.ப. 2.43]

**ගරු එම්.ඒ.එම්. තාහිර් මහතා**
(மாண்புமிகு எம்.ஏ.எம். தாஹிர்)
(The Hon. M.A.M. Thahir)
*பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.*

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இந்த நாட்டில் மாற்றத்தை ஏற்படுத்த வேண்டுமென்ற அடிப்படையில், இந்த நாட்டு மக்கள் பெரும் எதிர்பார்ப்புடன் உருவாக்கிய இந்த அரசாங்கத்துக்கு அவர்களின் முழு அங்கீகாரமும் கிடைக்கப்பெற்று இருக்கின்றது. எங்களுடைய சமூகம் சார்ந்த, பிரதேசம் சார்ந்த பிரச்சினைகளைத் தீர்ப்பதற்காக மட்டுமல்ல, நாட்டின் எழுச்சிக்கும் நாட்டின் சிறந்த எதிர்காலத்துக்கும் ஒத்துழைப்பு கிடைக்குமென்ற எதிர்பார்ப்பில் மக்கள் எங்களுக்கும் வாக்களித்து இச்சபைக்கு அனுப்பியிருக்கிறார்கள்.

மிகப் பொறுப்புவாய்ந்த ஆளும் கட்சியின் முதன்மையானவர்களும் அமைச்சர்களாக இருக்கின்றவர்களும் கடந்த வாரங்களில் பாராளுமன்றத்திலும் பாராளுமன்றத்துக்கு வெளியிலும் பல்வேறு கருத்துக்களை வெளியிட்டிருக்கிறார்கள். "2040ஆம் ஆண்டு வரைக்கும் எங்களுடைய ஆட்சிதான் இருக்கும்; யார் எதைச் சொன்னாலும் நாங்கள் நினைத்ததைத்தான் நிறைவேற்றுவோம்" என்று ஒருவர் கூறுகின்றார். " அரசாங்கத்தின் அதிகாரத்தை நாங்கள் எடுத்துவிட்டோம்; அரச அதிகாரம் எங்களுடைய கைகளுக்கு இன்னும் வந்து சேரவில்லை; அதையும் நாங்கள் எடுப்போம்" என்று இன்னொருவர் கூறுகின்றார். " எதிர்க்கட்சியிலிருந்து யார் எதைச் சொன்னாலும் நாங்கள் வைப்பதுதான் சட்டம்; நாங்கள்தான் அதை நிறைவேற்றுவோம்" என்று கூறுகின்ற அமைச்சர்களும் இந்தப் பாராளுமன்றத்தில் இருக்கின்றனர். நாங்கள் எதற்காக இந்தப் பாராளுமன்றத்துக்கு வந்திருக்கிறோம் என்று கவலைப்பட வேண்டியுள்ளது. இருந்தாலும், எங்களுடைய மனநிலையைப் பாதிக்கின்ற வகையில் "எதிர்க்கட்சிகள்" என்று பொதுவாக விரல் நீட்டுகின்றனர். எதிர்க்கட்சியிலே பிரதான எதிர்க்கட்சியும் இருக்கின்றது; சிறுபான்மைச் சமூகத்தின் அபிலாஷைகளை நிறைவேற்றுவதற்காக வந்திருக்கின்ற கட்சிகளும் இருக்கின்றன. இந்த நாட்டின் தேசிய அரசியலிலும் சரி, கீழ்மட்ட அரசியலிலும் சரி, தவறாக வழிநடத்தப்பட்டுவிடக் கூடாதென்பதற்காக அரசியலுக்குள் உள்வாங்கப்பட்டு இருக்கின்ற எங்களைப் போன்றவர்களுக்கு இது ஒரு மாற்றுக் களமாக அமைய இருக்கின்றது. உங்களுக்கு இருப்பதுபோல, எங்களுக்கும் கோபமும் ஆத்திரமும் இனரீதியான தேவைப்பாடுகளும் பற்றும் இருக்கின்றன என்பதைச் சொல்லிவைக்க விரும்புகின்றேன்.

கல்வித் திட்டத்தில் மாற்றங்களைக் கொண்டுவருகின்ற இந்த வேளையில், பல்கலைக்கழகங்களின் கல்விசார் நடவடிக்கைகளும் பாடசாலைகள் சார்ந்த விடயங்களும் முன்னெடுக்கப்படுகின்றன. இருந்தாலும், இன்றும் எமது பிரதேசங்களிலுள்ள பாடசாலைகளில் தளபாடங்கள் பற்றாக்குறையாக இருக்கின்றன. ஏனைய பிரதேசங்களிலுள்ள பாடசாலைகள் பற்றி கூற முடியாது. நகரப் புறங்களைவிட, கிராமப் புறங்களிலுள்ள மக்களுடைய பிரச்சினைகளுக்குத் தீர்வு காண்பதற்காக, அவற்றை உங்களிடம் முன்னிலைப்படுத்துவதற்காகவே நாங்கள் இங்கு வந்திருக்கிறோம். எங்களுக்கு முன்பு எங்களுடைய கட்சியைச் சார்ந்தும் ஏனைய கட்சிகளைச் சார்ந்தும் பல அரசியல்வாதிகள், அமைச்சர்கள் இருந்திருக்கிறார்கள். அவர்கள் இவை பற்றியெல்லாம் பேசவில்லை. மாறாக, அவர்களுக்குத் தேவையான கொந்தராத்துகளையும் 'கமிஷன்' களையும் பெற்றுக் கொண்டார்கள். அத்துடன், அவர்களின் குடும்ப அரசியலையும் அதற்கான பின்புலத்தையும் பலப்படுத்துவதற்கான சந்தர்ப்பங்களைத்தான் பெற்றுக் கொண்டார்கள். நாங்கள் அவ்வாறில்லை. 76 வருடங்கள் இந்த நாட்டை மாறி மாறி ஆட்சி செய்த அரசாங்கங்கள் பிழை செய்திருக்கின்றன என்று நீங்கள் எவ்வாறு கூறினீர்களோ, அதேபோன்று நாங்களும் அவர்கள் முன்னிலையில் கூறிவிட்டு இங்கு வரவில்லை.

இங்கு கல்விச் சீர்திருத்தம் மற்றும் ஏனைய விடயங்கள் சம்பந்தமாகப் பேசப்படுகின்றது. இன்றும் பாடசாலைகளில் பெற்றோர்கள் மூலமாகத் தளபாடங்களுக்குரிய நிதி அறிவீடு செய்யப்பட்டு, பாடசாலை நிருவாகத்தினர் மற்றும் பாடசாலை சமூகத்தின் முன்னிலையில் பெரிய விழாக்களை ஏற்பாடு செய்து, அந்தத் தளபாடங்களைக் கையளிக்கின்ற நிகழ்வுகளை

உங்களுடைய கட்சியைச் சார்ந்தவர்கள், குறிப்பாக 'பிரஜா சக்தி'இன் தலைவர்கள் செய்வதென்பது வெட்கக்கேடாக இருக்கின்றது. இவ்வாறான விடயங்களில் மாற்றத்தைக் கொண்டுவருவோம், 76 வருடங்களாக இவ்வாறான பின்னணியில்தான் பாடசாலைகள் இயங்கி வருகின்றன என்றெல்லாம் கூறிய நீங்கள்கூட, இன்று பெற்றோரிடமிருந்து பணம் அறவிட்டு மேற்கூறியவாறு விழாக்களை நடாத்துவதை நாங்கள் பார்க்கின்றோம். நீங்கள் Smart board பற்றி பேசுகின்றீர்கள். அது என்னவென்றுகூட எங்களுடைய மாணவர்களுக்குத் தெரியாமல் இருக்கின்றது. எனவே, இவ்வாறான விடயங்களில் நீங்கள் முன்னுதாரணமாகச் செயற்பட வேண்டும்.

தற்போது, நாட்டின் காலநிலையில் மாற்றங்கள் ஏற்பட்டு இருக்கின்றன. காலையில் மிகவும் குளிராக இருக்கின்றது. மாணவர்கள் பாடசாலைக்குச் செல்ல முடியாத சில சந்தர்ப்பங்களும் இருக்கின்றன. எனவே, இதில் ஒரு மாற்றத்தைக் கொண்டுவர வேண்டும். ஏனெனில், காலை 8.00 மணிக்குப் பிறகும்கூட குளிரான காலநிலை நிலவுகின்றது. இந்த நிலை ஒரு வருடத்துக்கு நீடிக்குமென காலநிலை அவதானிகள் கூறுகின்றார்கள். எனவே, இந்த விடயத்தையும் கவனத்தில்கொள்ளுமாறு கேட்டுக் கொள்கின்றேன்.

கிழக்கு மாகாணத்தில் ஏற்பட்டுள்ள பாரிய கடலரிப்பு சம்பந்தமாக அந்தப் பிரதேசத்தைச் சேர்ந்த ஆளும் கட்சி, எதிர்கட்சி உறுப்பினர்கள் அனைவரும் இங்கு பேசுகின்றார்கள். அதை நீங்கள் கவனத்தில் எடுக்கின்றீர்களா, இல்லையா? என்பது தெரியவில்லை. நாங்கள் ஒலுவில் துறைமுகம் சம்பந்தமான பிரச்சினைகளைப் பேசும்பொழுது, நீங்கள் அவற்றைச் செவிமடுத்தீர்கள்! ஆனால், எதுவுமே நடக்கவில்லை. இன்று கடலரிப்பு காரணமாக மாளிகைக்காடு பிரதேசத்தில் இருக்கின்ற மையவாடியில் அடக்கம் செய்யப்பட்டிருக்கின்ற ஜனாஸாக்கள் வெளியே கொண்டுவரப்பட்டு இருக்கின்றன. நாங்கள் இது சம்பந்தமாக உரிய அதிகாரிகளிடம் குறிப்பாக, பிரதேச செயலாளரிடம், CCDஇன் பொறியியலாளரிடம் சொன்னபொழுது, அவசரமாக அதற்கான வேலைத்திட்டங்களை முன்னெடுப்பதாகச் சொன்னார்கள். தற்பொழுது அதற்குரிய வேலைத்திட்டங்களைச் செய்கின்றார்கள். இருந்தாலும், அந்த வேலைத்திட்டங்கள் துரிதப்படுத்தப்படவில்லை. அதேபோல், நிந்தவூர் - அட்டப்பள்ளம் பிரதேசத்தில் இருக்கின்ற தமிழ் சகோதரர்களுடைய சவக்காலையில் இருந்த உடலங்களும் கடலரிப்பு காரணமாக வெளியே கொண்டுவரப்பட்டு இருக்கின்றன. நான் நிந்தவூர் பிரதேச சபையின் தவிசாளராக இருந்த 2022-2023 காலப்பகுதியில் இதற்கான முன்னெச்சரிக்கை நடவடிக்கைகளை எடுத்தேன். தற்பொழுது, அந்தச் செயற்பாடு நிறைவடைந்து இருக்கின்றது. அதற்காக நான் கடந்த அரசாங்கத்துக்கு நன்றி கூறுகின்றேன். கல்முனை, மருதமுனை, காரைதீவு, சாய்ந்தமருது, மாளிகைக்காடு, ஒலுவிலின் வடபுறத்தில் இருக்கின்ற பிரதேசங்கள் என்பன கடலரிப்பால் பாதிக்கப்பட்டு இருக்கின்றன. எனவே, இதனைத் தடுப்பதற்கான துரித வேலைத்திட்டம் ஒன்றை இந்த அரசாங்கம் முன்னெடுக்க வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමා දැන් කථාව අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු එම්.ඒ.එම්. තාහිර් මහතා**
(மாண்புமிகு எம்.ஏ.எம். தாஹிர்)
(The Hon. M.A.M. Thahir)
எனக்கு ஒரு நிமிடம் தாருங்கள்!

இங்கு எனக்கு முன்னர் கலாசார அமைச்சர் அவர்கள் பேசினார். தற்பொழுது, அவர் இச்சபையில் இருக்கும்போது ஒரு விடயத்தைக் கூற விரும்புகின்றேன். கடந்த காலங்களில் பௌத்த, இந்து, இஸ்லாம், கிறிஸ்தவ சமயம் சார்ந்து தனித்தனி அமைச்சுகள் இருந்தன. அவை சிறப்பாக இயங்கின. இன்று எங்களுடைய மார்க்கம் சம்பந்தமான பல விடயங்களில் அரசியல்வாதிகள் தலையிடுவதைப் பார்க்கின்றோம். குறிப்பாக, பள்ளிவாசல் நிருவாகத்தில் தலையிடுகின்ற, முஸ்லிம் கலாசார திணைக்களப் பணிப்பாளரின் அதிகாரத்தைப் பயன்படுத்தி குளறுபடிகளையும் பிரச்சினைகளையும் ஏற்படுத்துகின்ற நிலைமையைப் பார்க்கின்றோம். நீங்கள் கல்வி மற்றும் ஏனைய துறைகளில் மாற்றங்களைக் கொண்டுவருவதைப் போன்று, இதிலும் மாற்றங்களைக் கொண்டுவாருங்கள்! இந்த விடயத்தில் அரசாங்கம் தலையிட்டு, பள்ளிவாசல்களுக்கு நிரந்தர நிருவாகிகளை நியமிப்பதற்குரிய அதிகாரங்களை உரிய திணைக்களத்துக்கு வழங்க வேண்டும் அல்லது அங்கு இருப்பவர்களை அகற்றி, அவ்விடத்துக்குப் பொருத்தமானவர்களை நியமிக்க வேண்டுமென அன்பாகக் கேட்டு, விடை பெறுகின்றேன். நன்றி!

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු සුගත් වසන්ත ද සිල්වා මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 9ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.52]

**ගරු සුගත් වසන්ත ද සිල්වා මහතා**
(மாண்புமிகு சுகத் வசந்த த சில்வா)
(The Hon. Sugath Wasantha de Silva)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ජර්මන් ජාතික බර්ටෝල් බ්‍රෙෂ්ට්ගේ කෘතියක් හෙන්රි ජයසේන "හුණුවටයේ කථාව" නමින් වේදිකාවට ගේනවා. ඒකේ තේමාව තමයි, "දෙයක් වේ නම් යම් සුදුස්සාටම අයිති විය යුතු" කියන එක. ගොවි දන මනා වූ ලැබිය යුතු සේම ගම් බිම්, සුදුස්සෙකුට සුදුසු දෙයක් පිරිනැමීම, ඔහු හරහා අවශ්‍ය මෙහෙවර සිද්ධ කර ගැනීම ඉතා වැදගත් කටයුත්තක්. මේ සංශෝධනය හරහා විශ්වවිද්‍යාල පද්ධතියේ පරිපාලනය තුළ පීඨාධිපතිවරයා පත් කිරීම සහ ඒ ආශ්‍රිත කාරණා සම්බන්ධයෙන් ඉතාම ඉහළ ප්‍රජාතාන්ත්‍රික ගුණාංග සහිතව කෙරෙන මේ යෝජනාවට, මේ සංශෝධනයට සුබ පතමින් කථාව ආරම්භ කරන්න මම සතුටුයි.

අපි දන්නවා, ප්‍රජාතන්ත්‍රවාදී භාවිතාව තමයි මේ මිහිතලය මත ඉතාම යෝග්‍ය මානවවාදී වැඩ පිළිවෙළ විධියට සලකන්නේ කියලා. ඒ අනුව තමයි මේ සංශෝධනය ඉදිරිපත් කරමින් විශ්වවිද්‍යාල පරිපාලනය තුළ මෙතෙක් තිබිච්ච අත්තනෝමතිකභාවය, ඥාති සංග්‍රහය, හිතවත් සංග්‍රහය අහෝසි කරමින් තමන් වටා ඒකාධිපතිත්වයක් සහ කතිපයාධිකාරිත්වයක් ගොඩනහා ගන්නා වූ උපකුලපතිවරුන්, පීඨාධිපතිවරුන් පත් වෙන ක්‍රමවේදය වෙනස් කරන්නේ. මේකද ත්‍රස්තවාදය? නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේක තමයි ප්‍රජාතන්ත්‍රවාදය. මේ ප්‍රජාතාන්ත්‍රවාදී භාවිතාවන් විශ්වවිද්‍යාල තුළට එකතු කිරීමේ ව්‍යායාමය අපි අපේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ ඉතා පැහැදිලිව කියා

[ගරු සුගත් වසන්ත ද සිල්වා මහතා]

තිබෙනවා. ඒ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ ප්‍රතිපත්ති භාවිතාවට ගැනීම සඳහා අපට ඓතිහාසික ජන වරමක් ලැබිලා තිබෙනවා. ඒ ජන මතය; ජන වරම අනුව තමයි මේ සංශෝධනය ඉදිරිපත් කරන්නේ. මේක එක් පියවරක් පමණයි. මෙතැනින් එහාට උපකුලපතිතුමා පත් කිරීම දක්වා වූ සියලු පරිපාලන තනතුරු පත් කිරීම සඳහා මේ ප්‍රජාතන්ත්‍රවාදී භාවිතාවන් ඉදිරියේදී ගෙනෙන බව ජනතාව ඉදිරියේ සපථ කර කියන්න කැමැතියි.

එමෙන්ම, විශ්වවිද්‍යාල පරිපාලනය ප්‍රජාතාන්ත්‍රිකරණය වෙනවාත් එක්කම විශ්වවිද්‍යාල අධ්‍යයන ක්ෂේත්‍ර ප්‍රජාතාන්ත්‍රිකරණය වීමේ අවශ්‍යතාව අපි අවධාරණය කරන්න ඕනෑ. මා නියෝජනය කරන ලක්ෂ 16කට අධික ආබාධ සහිත ප්‍රජාව විශ්වවිද්‍යාල තුළ තමන්ට සම අයිතීන් සහිතව උපාධිය දිනා ගැනීමේ වුවමනාවෙන් පෙළෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශ්වවිද්‍යාල තුළ මෙතෙක් විෂය ධාරා 4කට පමණයි ආබාධ සහිත ශිෂ්‍යයන්ට ඇතුළත් වෙලා විද්‍යාර්ථීන් විධියට අධ්‍යාපනය ලබන්න අවස්ථාව තිබුණේ. ඒක ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රමයද? නැහැ. ඒක තමයි අධ්‍යාපනික ත්‍රස්තවාදය. අපි ඒක අයින් කරලා සුදුසුකම් සහිතව, යෝග්‍යතා සහිතව ඉදිරිපත් වන ආබාධ සහිත ශිෂ්‍යයන්ට මේ සියලු විෂය ධාරා විවෘත කර තිබෙනවා. ඒක නේද, ප්‍රජාතන්ත්‍රවාදය? දෘෂ්‍යාබාධිත පුද්ගලයන් විධියට අපි බලාපොරොත්තු වන්නේ එයයි. "දෑසේ අඳුරට නැණ පහන් දල්වමු" කියන තේමාවෙන් එක්දහස් නවසිය හැටගණන්වල අගභාගයේ තමයි විශ්වවිද්‍යාලය තුළ ආබාධ සහිත ප්‍රජාව අතුරින් පළමුවැනි උපාධිධාරිනිය බිහි වන්නේ. ඒ මාගේ ගුරු මෑණිවරියක් වන වයලට් යකන්දාවල මැතිනිය. එදා මෙදා තුර විශ්වවිද්‍යාල තුළ කිසිදු පහසුකමක් නැතුව ප්‍රථම පන්තියේ සාමර්ථ සහිතව ඉතා ඉහළ විස්මිත හැකියාවන් ප්‍රදර්ශනය කරපු කණ්ඩායමක් තමයි ආබාධ සහිත කණ්ඩායම.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මගේ මිත්‍රයෙක් රුහුණ විශ්වවිද්‍යාලයේ හිටියා. ඔහු චලනාබාධිත පුද්ගලයෙක්. රෝද පුටුවෙන් දේශන ශාලාවට ඇතුළත් වෙන්න බැරි නිසා -විශ්වාස කරන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. දුක හිතෙනවා, ඇඬෙනවා- පඩිපෙළ පාමුල ඉඳන් දේශනවලට සවන් දීලා ඒ අධ්‍යාපනය හදාරලා සම්මාන සහිත උපාධියක් දිනාගත්තා. එවැනි සහෝදර කැලක් තමයි මෙතෙක් ආබාධ සහිත ප්‍රජාව තුළ හිටියේ. අපට සීමාවන් තිබුණා, පාඨමාලාවල. අපට සීමාවන් තිබුණා, දේශන ශාලාවල. අපට සීමාවන් තිබුණා, පුස්තකාලවල. අපට සීමාවන් තිබුණා, නේවාසිකාගාර තුළ. අපි ආබාධිත බවත් එක්ක පොර බදමින් අපොස (සාමාන්‍ය පෙළ) සහ අපොස (උසස් පෙළ) විභාගවලින් ඉහළ ප්‍රතිඵල අරගෙන විශ්වවිද්‍යාල තුළට ආවත්, ඒ අධ්‍යාපනයේ සාරය උරාගන්න අපිට තිබ්බෙ බාධක අපේ හෘදය වස්තුව දන්නවා; අපේ මොළයේත් ඒවා සටහන් වෙලා තිබෙනවා. ඒ ගැන මතක් කරනකොට අපිට තවමත් දුකයි, වේදනාවයි. හැබැයි, මේ බාධක ඉවත් කිරීමේ වගකීම ජාතික ජන බලවේගයේ රජය යටතේ, උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විධියට භාර ගෙන තිබෙනවා. ආබාධ සහිත වූවන් සම්බන්ධව උසස් අධ්‍යාපනය තුළ නව ප්‍රවණතා ඇතුළත් කර ගනිමින් ප්‍රතිපත්තියක් ගොඩනඟලා තිබෙනවා. ඒ ප්‍රතිපත්තිය තුළ සහ ඒ වැඩ පිළිවෙළ තුළ තමයි ආබාධ සහිත ප්‍රජාවට; ශිෂ්‍යයන්ට; විද්‍යාර්ථීන්ට සියලු විෂය ධාරාවලට ඇතුළත් වෙලා ඉගෙනුම ලබන්න තිබෙන අවකාශය පුළුල් කරන්නේ.

අනෙක තමයි, මුදල් අමාත්‍යවරයා විධියට ගරු ජනාධිපතිතුමා මෙවර අය වැය තුළ පැහැදිලිව මුදල් වෙන් කළා, විශ්වවිද්‍යාලවල ඉගෙනුම ලබන විද්‍යාර්ථීන් සඳහා මහපොළ ශිෂ්‍යාධාරයට අමතරව තවත් රුපියල් 5,000ක දීමනාවක් දෙන්න. ඇයි ඒ? ආබාධිත බවත් එක්ක පොරබදන මේ ශිෂ්‍ය කණ්ඩායමට ආර්ථික වශයෙන් වන පාඩුව, ආර්ථික වශයෙන් වන පසුගාමීත්වය අවම කරන්න. මේ අවම කිරීම් හරහා අපි බලාපොරොත්තු වෙනවා, අධ්‍යාපනය සඳහා තිබෙන සියලු බාධා ඉවත් කර ගනිමින් ඉතා ඉහළ ප්‍රතිඵල ගෙන එමින් ආබාධ සහිත විද්‍යාර්ථීන් බුද්ධිමතුන් විධියට, උගතුන් විධියට සමාජයට සම්බන්ධ කරන්න. ඒ තුළ අපි බලාපොරොත්තු වෙන්නේ මොකක්ද? ආබාධ සහිත පුද්ගලයන් තවදුරටත් සමාජයේ දෙවන පෙළ පුරවැසියෙක් විධියට නොවෙයි, වෙනස් කොට සැලකීමට ලක් විය යුතු පුද්ගලයෙක් විධියට නොවෙයි, ඔවුන් සමාජයේ සම පුරවැසියන් විධියට, සම බුද්ධිමතුන් විධියට වියතුන් සභා මැද හැසිරෙන්න පුළුවන් කණ්ඩායමක් බවට පත් කරන්නයි. මේකද ත්‍රස්තවාදය? නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේක තමයි අධ්‍යාපනයේ ප්‍රජාතාන්ත්‍රීකරණය. විශ්වවිද්‍යාල පරිපාලනය සඳහා ප්‍රජාතාන්ත්‍රිකරණය හඳුන්වා දෙන ගමන්ම, කායික අසංඥතා තිබෙන සියලුම සමාජ කණ්ඩායම්වලට මේ අධ්‍යාපන ධාරාවේ අවස්ථාව ලබා දෙන්න අපි බලාපොරොත්තු වෙනවා. අද මමත්, ගරු සෞඛ්‍ය අමාත්‍යවරයාත් ලංකා තැලසීමියා සංවිධානයේ සභාපතිවරයා ඇතුළු කණ්ඩායමක් එක්ක සාකච්ඡාවක් සිදු කළා. ඔවුන් කිව්වා, ඉදිරි කාලය තුළදී තැලසීමියා තත්ත්වයෙන් පෙළෙන ඔවුන්ගේ සාමාජික භවතුන්ටත් විශ්වවිද්‍යාලවලට ඇවිල්ලා ඉගෙනුම ලැබීමට තිබෙන අවකාශය පුළුල් කර දෙන්න කියලා. එම කටයුතු සිදු කිරීමට අපි බලාපොරොත්තු වෙනවා; අපි අපේක්ෂා කරනවා. දැනටමත් කිහිප දෙනෙක් ඉගෙනුම ලබා තිබෙනවා; උපාධි ලබා තිබෙනවා. මේ උසස් අධ්‍යාපනයේ ප්‍රජාතාන්ත්‍රික භාවිතාවන් ගෙන මේ සමාජයට බුද්ධිමත්, උගත්, ප්‍රබුද්ධ ජනතාවක් විධියට ඇතුළත්වීමට ආබාධ සහිත ප්‍රජාවටත් අවකාශය සලසන බවට; ඉඩහසර පළල් කරන බවට සහතික කරමින්, මට මේ අවස්ථාව ලබා දීම සම්බන්ධව මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමාට බෙහෙවින්ම ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ජී.ජී. පොන්නම්බලම් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 9ක කාලයක් තිබෙනවා.

[3.00 p.m.]

**ගරු ජී.ජී. පොන්නම්බලම් මහතා**
(மாண்புமிகு ஜீ.ஜீ. பொன்னம்பலம்)
(The Hon. G.G. Ponnambalam)
Hon. Presiding Member, you know that when we speak in this House and take positions with regard to various laws or various policies the Government brings in, we try not to be confrontational. We try our best not to oppose, but we criticize. Obviously, that is one of the most important tasks the Opposition has to do. We try our level best to be constructive and in that respect, the Hon. Prime Minister and Minister of Education, Higher Education and Vocational Education knows that when there were very vindictive campaigns against her regarding a highly debated policy document that she, as Minister, had authored, we stood very firmly against those moves. Though we might disagree on certain things, there is a way of going about disagreements. So, what I am trying to say here is that whilst we have stood against the Government and criticized the Government at times, we have not tried to derail the Government's efforts. We have only tried our level best to criticize those in the hope that our criticism would be taken seriously and that the Government, if not at that very

instance, but at least in the future, would take note of the matters we had raised and ensure that those are addressed at some point.

In that respect, I wish to raise a point with the Hon. Prime Minister and Minister of Education. She herself, I think, stood against and signed a statement with regard to the previous Government's decision to prevent law practitioners from being lecturers in universities. She herself opposed that. The Hon. Prime Minister is now the Minister and I suggest that she acts very swiftly to correct that utterly ridiculous decision. A very respected, young person, Dr. Kumaravadivel Guruparan, was, as a result, severely affected. I think the Prime Minister knows him personally as well. I am just saying that these are things that the Hon. Prime Minister could certainly look into.

The ways and means by which the Vice-Chancellors are appointed - the marking schemes - I think, are quite ridiculous. There must be openness, there must be fairness, but, unfortunately, that is not the case.

The way in which external members of University Councils are appointed, again, I believe, is not open; there is a lot of secrecy. Therefore, I think these are serious changes that must happen because all that involves the culture we are trying to change and which the Government says it is committed to change. So, the point I am making is that when we make these comments, we make them in the best interest of what the Government says its objectives are and hoping that the Government would take on board certain things that we suggest.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "ගරු සුජිත් සංජය පෙරේරා මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

**ගරු එම්.එස්. උදුමාලෙබ්බෙ මහතා**
(மாண்புமிகு எம்.எஸ். உதுமாலெப்பை)
(The Hon. M.S. Uthumalebbe)

***විසින් ස්ථිර කරන ලදී.***
*ஆமோதித்தார்.*
*Seconded.*

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු සුජීව දිසානායක මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු කේ. සුජිත් සංජය පෙරේරා මහතා මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு சுஜீவ திசாநாயக்க அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு கே. சுஜித் சஞ்ஜய பெரேரா அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon THE HON. SUJEEWA DISSANAYAKE left the Chair, and THE HON. K. SUJITH SANJAYA PERERA took the Chair.*

[අ.භා. 3.58]

**ගරු රුවන් මාපලගම මහතා**
(மாண்புமிகு ருவன் மாபலகம)
(The Hon. Ruwan Mapalagama)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ස්තුතියි. 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත සංශෝධනය කිරීමේ පාර්ලිමේන්තු විවාදයට අදහස් දැක්වීමට අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් ඔබතුමාට ස්තුතිවන්ත වෙන ගමන් යම් කරුණක් මතක් කරගෙනම යන්න මට අවසර දෙන්න. ඒ තමයි මට පෙර කථා කළ ගරු රාසමාණික්කම් මන්ත්‍රීතුමා එතුමාගේ කථාවේදී පැහැදිලි කරමින් කිව්වා, ලංකාවේ පාසල් අධ්‍යාපනයේ ඉතිහාසය විෂයය තුළ මෑත කාලීන ඉතිහාසය, ඒ කියන්නේ විශේෂයෙන් අධිරාජ්‍යවාදීන්ගෙන් නිදහස ලැබුණාට පස්සේ, -1948න් පස්සේ- මෑත කාලීන ඉතිහාසය අපේ දරුවන්ගේ අධ්‍යාපන ක්‍රමයෙන් ඉවත් කරලායි තිබෙන්නේ කියන එක. ගරු මන්ත්‍රීතුමනි, ඇත්ත වශයෙන්ම ඒක සිංහල හෝ දෙමළ ජාති මුල් කරගෙන නොවෙයි, සමස්තයක් විධියටම ගත්තාම 1948න් පස්සේ ලංකාවේ මෑත කාලීනව නූතන ඉතිහාසයේ සිදු වූ බොහෝ කරුණු පාසල් විෂය නිර්දේශයෙන් හංගලා තිබෙන්නේ. මම ආරාධනා කරනවා වැඩිහිටියන්ට සහ ගුරුවරුන්ට ඒ පිළිබඳව බලන්න කියලා. මොකද, අදටත් ලංකාවේ සාමාන්‍ය පෙළ, 11 ශ්‍රේණියේ ඉතිහාසය පෙළ පොතේ "නිදහසින් පසු ශ්‍රී ලංකාව" කියන පාඩමට අන්තර්ගත වෙන්නේ 1977 දක්වා පමණයි. ඉන්පසු මෑත ඉතිහාසය අන්තර්ගත කරලා නැහැ. එස්.ඩබ්ලිව්.ආර්.ඩී. බණ්ඩාරනායක මහත්මයා පිළිබඳව සඳහන් වෙනවා, එතුමාගේ ඝාතනය ගැනත් සඳහන් වෙනවා. නමුත්, ජීවිතය අහිමි වුණා කියලා විතරයි කියන්නේ. ඝාතනය වුණේ කොහොමද, කළේ කවුද කියලා සඳහනක් නැහැ. ඉන් අනතුරුව 1970න්, 1977න් පසුව එල්ටීටීඊ සංවිධානය නිර්මාණය වුණේ කොහොමද, ඒකට අවශ්‍ය කරන ප්‍රතිපාදන සැපයුවේ කවුද, අවශ්‍ය දේශපාලන වටපිටාව මොන දේශපාලන පක්ෂ විසින්ද නිර්මාණය කළේ, 1983 කළු ජූලිය නිර්මාණය කළේ කවුද, යාපනය පුස්තකාලයට ගිනි තිබ්බේ කවුද කියන ඒ තොරතුරු කිසිවක් පාසල් අධ්‍යාපනයට තවම ඇතුළත් කර නැහැ. අපි ප්‍රාර්ථනා කරනවා සහ අපි බලාපොරොත්තුවෙන් ඉන්නවා අනාගතයේ දවසක ලංකාවේ පාසල් තුළ මේ නූතන ඉතිහාසයත් උගන්වාවි කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ලෝක ප්‍රකට අධ්‍යාපනඥයෙකු වන නෙල්සන් මැන්ඩෙලා පවසනවා ලෝකය වෙනස් කිරීම සඳහා ඔබට භාවිත කළ හැකි බලවත්ම අවිය අධ්‍යාපනයයි කියලා. අද අප මේ සාකච්ඡා කරන මේ උත්තරීතර සභා ගර්භය තුළ විවාදයට ගන්නේ හුදෙක් එක පනතක වගන්ති කිහිපයක් සංශෝධනය කිරීම පමණක් නොවෙයි, මේ රටේ මතු පරපුරේ චින්තනය මෙහෙයවන, මේ රටේ මතු පරපුරේ අනාගතය තීරණය වන විශ්වවිද්‍යාල පද්ධතියේ හෙට දවස පිළිබඳවයි; 1978 සිට අද දක්වා වසර 47ක් පුරා මේ යල් පැන ගිය පනත, -අවස්ථා කිහිපයකදී සංශෝධනය වුණත්- අනාගතයට ගැළපෙන ලෙස සංශෝධනය කිරීම පිළිබඳවයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ජාතික ජන බලවේගය ලෙස අපේ අධ්‍යාපන ප්‍රතිපත්තිය පැහැදිලියි. "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" කියන අපේ ප්‍රතිපත්ති ප්‍රකාශනය ඇතුළේත්, මැතිවරණයට දිගු කාලයකට පෙර සිටත් එය මහ ජනතාව සමඟ සබුද්ධික සංවාදයකට ලක් වූ කාරණාවක්. අධ්‍යාපනයට කරන වියදම රටක් අනාගතය සඳහා කරන ආයෝජනයයි. දියුණු රටවල් තමන්ගේ දළ ජාතික නිෂ්පාදනයෙන් විශාල ප්‍රමාණයක් අධ්‍යාපනයට වැය කරන්නේ ඒ නිසායි. රටක් ලෙස, රජයක් ලෙස අපට අවශ්‍ය වෙන්නේ උපාධියක් ලබාගෙන රැකියාවක් බලාපොරොත්තුවෙන් පෝළිමේ සිටින උපාධිධාරින් වෙනුවට නව ලෝකයට, නව තාක්ෂණයට, නව දැනුමට ගැළපෙන, අනාගතය සමඟ ගනුදෙනු කළ හැකි බුද්ධිමතුන් බිහි කරන විශ්වවිද්‍යාල අධ්‍යාපන ක්‍රමයක්. මේ අදහසම තමයි ආසන්න දවසක සභානායක ගරු බිමල් රත්නායක ඇමතිතුමාත් මේ සභාවේදී කිව්වේ; රටක් ලෙස ලංකාව සතු න්‍යෂ්ටික ආයුධය තමයි නිදහස් අධ්‍යාපනය කියලා. අපේ රට සතු වටිනාම සම්පත, අපේ රට සතු බලවත්ම ආයුධය නිදහස් අධ්‍යාපනය බව එතුමා කිව්වා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද උදෑසන සිටම අපි සාකච්ඡා කළේ විශ්වවිද්‍යාල (සංශෝධන) පනත් කෙටුම්පත පිළිබඳවයි. උදේ සිට අපි මේ විවාදය අහගෙන හිටියා. මේ සභාවේ විපක්ෂයේ කිසිම මන්ත්‍රීවරයෙක් මේ පනත් කෙටුම්පතට අදාළව, පනත් කෙටුම්පතේ වගන්තිවලට අදාළව සාධාරණ, සාධනීය විවේචනයක් නම් ගේනවා අපි දැක්කේ නැහැ. මේ පනත් කෙටුම්පතට අනුව ප්‍රධාන යෝජනා කිහිපයක් තිබෙනවා. පීඨාධිපති තනතුරට පත් කිරීම සඳහා වන සුදුසුකම්, අදාළ නිර්ණායක පුළුල් කිරීම, විශ්වවිද්‍යාල පද්ධතියේ ප්‍රධාන අධ්‍යාපන පරිපාලන තනතුරු සඳහා සුදුසුකම් ලත් අපේක්ෂකයන්ගේ සංචිතය පුළුල් කිරීම, උසස් අධ්‍යාපනය පාලනය, නවීකරණය කිරීම හා කුසලතා මත පදනම් වූ නායකත්ව ව්‍යුහයක් හඳුන්වා දීම සහ පනතේ අපැහැදිලි භාෂාව සංශෝධනයට ලක් කිරීම යන කාරණා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙන්න මේ දේවල් එක්ක ගත්තාම අධ්‍යාපනය පිළිබඳව ජාතික ජන බලවේගයේ දෘෂ්ටිය, ideology එක පැහැදිලියි. රජයක් ලෙස අපි විශ්වාස කරනවා, අධ්‍යාපනය යනු වෙළෙඳ භාණ්ඩයක් නොවෙයි කියලා; අධ්‍යාපනය යනු වාණිජ ව්‍යාපෘතියක් නොවෙයි කියලා; අධ්‍යාපනය යනු, ලංකාවේ මීළඟ සමාජ පරිවර්තනයට අවශ්‍ය කරන ප්‍රධානම ආයුධයයි කියලා. ඒ නිසා ඊට ගැළපෙන ලෙස තමයි, මේ විශ්වවිද්‍යාල (සංශෝධන) පනත් කෙටුම්පත ගෙන එන්නේ.

විපක්ෂයේ කථා දිහා බැලුවාම කියන්න අවශ්‍යයි, ලංකාවට යෝජනා කර තිබෙන නව රජයේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණයේ කොටසක් අල්ලා ගෙන, ඉතාම ක්ෂුද්‍ර, සියුම් අංශුවක් අල්ලා ගෙන, මේ ප්‍රතිසංස්කරණ ආපස්සට අදින්න ඔවුන් උත්සාහ කරන බව. මේ අවුරුද්දේ 6 ශ්‍රේණියේ දරුවෝ, ඒ දරුවන්ගේ දෙමාපියෝ ශාප කරනවා, මේ විපක්ෂයට. ඒ ශාපයෙන් ගැලවෙන්න බැරි වෙනවා. දරුවන්ගේ අධ්‍යාපනය, සම්පූර්ණ පරම්පරාවක අධ්‍යාපනය, ඔවුන්ගේ අනාගතය ආපස්සට ඇදලා දමන්න උත්සාහ කරනවා, මේ විපක්ෂය. ඒ අස්සේ එහෙන් මෙහෙන් මේ පාර්ලිමේන්තුව තුළ කථා වෙනවා ඇහෙනවා, අධ්‍යාපන ධවල පත්‍රිකාව පිළිබඳව. එදා විශ්වවිද්‍යාල සිසුන්, පාසල් සිසුන් සිය ගණනක්, දහස් ගණනක්, දසදහස් ගණනක් පාරට බැහැලා පරාජය කරපු, සිසු විරෝධී, නිදහස් අධ්‍යාපනය විනාශ කරපු, ඒ ධවල පත්‍රිකාව ගැන ආයෙත් මේ දේශපාලන හොල්මන්, අවතාර සාකච්ඡා කරන්න පටන් අරගෙන තිබෙනවා. ඒක ඓතිහාසිකව පරාජය කර අවසන්. නැවත මේ රටට අවශ්‍ය කරන්නේ ධවල පත්‍රිකාවක් නොවෙයි, අනාගතයට ගැළපෙන අධ්‍යාපන පත්‍රිකාවක්. අපට මතකයි, රුහුණ විශ්වවිද්‍යාලයේ සත්‍යපාල වන්නිගම සහෝදරයා තමන්ගේ මුළු ජීවිතය කැප කරලා, ඒ මිනී මරුවන් අතින් මරණයට පත් වුණේ මේ යුග වෙනස, අධ්‍යාපන වෙනස බලාපොරොත්තුවෙන් බව. ඒ වාගේ සියයක්, දහසක්, දසදහසක් සහෝදරවරුන් මරණයට පත් කළා. ඔවුන් එසේ ජීවිත පරිත්‍යාගයෙන් අපේක්ෂා කළ මේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ නැවත ධවල පත්‍රිකා යුගයකට ගෙන යන්න නම්, ජාතික ජන බලවේගය රජය හා මේ රටේ ප්‍රගතිශීලී ජනතාව ඉඩ දෙන්නේ නැති බව කියන්න ඕනෑ.

[ගරු රුවන් මාපලගම මහතා]

අවසාන වශයෙන් මේ කාරණයත් කියන්න අවශ්‍යයි. මේ සුන්බුන් විපක්ෂයත් එක්ක, මේ පජාත විපක්ෂයත් එක්ක, කුහක විපක්ෂයත් එක්ක, අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ගැන කථා කිරීම නොවෙයි කළ යුත්තේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම යෝජනා කරනවා, මුලින්ම විපක්ෂයට අධ්‍යාපනය දීලා අවසන් කරමු කියලා.

ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු රවී කරුණානායක මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.05]

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට මේ අවස්ථාව ලබා දුන්නාට ස්තුතියි. මේ අවස්ථාවේදී විශ්වවිද්‍යාල (සංශෝධන) පනත් කෙටුම්පත ගැන වචන ස්වල්පයක් කථා කිරීම සඳහා මම ඉතාම සතුටින් ඉදිරිපත් වෙනවා.

මම ආරම්භයට ගියොත්, අධ්‍යාපනය කියන්නේ රටක් හදන්න පුළුවන් ගාමක බලවේගය ලෙස තමයි, ලෝකය පුරා හැමදෙනාම උදාහරණ සහිතව පෙන්වා දී තිබෙන්නේ. අපි අවුරුද්දක් අරගෙන බැලුවොත්, හැම අවුරුද්දකම ශිෂ්‍ය ශිෂ්‍යාවන් 530,000ක් විතර සාමාන්‍ය පෙළ දක්වා අධ්‍යාපනය හදාරනවා. ඒ අතරින් සියයට 70ක් පමණ ඒ විභාගය සමත් වෙලා, උසස් පෙළ හැදෑරීම සඳහා සුදුසුකම් ලබනවා. ඒ වාගේම සාමාන්‍යයෙන් ශිෂ්‍යයින් 250,000ත්, 300,000ත් අතර ප්‍රමාණයක් උසස් පෙළ අධ්‍යාපනය හදාරනවා. ඒ අය අතරින් 170,000ක් පමණ විශ්වවිද්‍යාලයට යන්න සුදුසුකම ලබනවා. අන්තිමට ඒ 170,000න් 55,000කට විතර තමයි අපේ විශ්වවිද්‍යාල පද්ධතියෙන් උපාධිධාරින්ගේ ගොඩට එකතු වෙන්න අවස්ථාව ලැබෙන්නේ. නමුත්, 115,000කගේ මානව අයිතිවාසිකම් උල්ලංඝනය වෙනවා කියන එක මේ අවස්ථාවේදී මතක් කරන්න ඕනෑ. ඒ 115,000ට මේ රටේ වෙන්නේ මොකක්ද? ඒ වෙන දේ ගැන තමයි, මම මේ අවස්ථාවේ කථා කරන්නේ.

ජේ.ආර්. ජයවර්ධන හිටපු ජනාධිපතිතුමා 1978දී ගෙනාපු මේ විශ්වවිද්‍යාල පනත තුළින් ඇති වූ අලුත් නවීකරණය මත ඒ ගමන අවුරුදු ගණනාවක් ආවා. ඊට පස්සේ ඒ පනත සංශෝධනයට ලක් වුණා. අද නැවත සංශෝධනයට ලක් වෙනවා. මා හිතන්නේ, ඒ වෙනස්වීම අත්‍යවශ්‍ය කාර්යයක් කියලායි. නමුත්, අපි මතක් කරන්න අවශ්‍යයි, මීට පෙර අප මේ රටට ඉංග්‍රීසි භාෂාව හඳුන්වා දෙන්න හදන කොට තිබුණු ප්‍රශ්නය. ඒ ප්‍රශ්නය නිසා, අප රට නිකරුණේ ආපස්සට ගියා කියන එක අද හැමදෙනාම පිළිගන්නවා. ඒ වාගේම, 1978දී වෛද්‍යවරුන් SLMC - Sri Lanka Medical Council - එක ඇති කරන්න හදන කොට, ඒකට කරපු අපරාධය නිසා, අපි වෛද්‍යවරුන් මේ රටේ බිහි කරලා පිටරට යවනවාට වඩා, පිටරටින් මේ රටට ගෙන්වන්න පටන් ගත්තා. අනෙක් එක තමයි, computer literacy, smart classrooms ඇති කරන්න යනකොට තිබුණු ප්‍රශ්නය. මම මේවා මතක් කරන්නේ, අපට දැන් ඇති වෙලා තිබෙන ප්‍රශ්න නිසායි. ගරු අගමැතිතුමිය ස්විට්සර්ලන්තයේ ඩාවෝස් නුවර සිට ඇවිල්ලා, අද මේ අන්තිම මොහොතේ හෝ අධ්‍යාපනය ගැන අප මේ කථා කරන දේවල් අහන්න, මේ ගරු සභාවට පැමිණීම අපි අගය කරනවා. දැන් මේ ආණ්ඩුව වෙනස් වෙමින් යන ස්වරූපය දකින විටත් මම සතුටු වෙනවා. මොකද, එදා අපි රට පාලනය කරන කොට තිබුණු දේවල් දැන් ඉදිරියට යනවා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
අද ස්වරූපය වෙනස්.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඔව්, අද ස්වරූපය වෙනස් වෙලා. එදා අපට බැන්නාට අද තේරිලා තිබෙනවා, විපක්ෂයේ ඉන්න කොට කෑ ගහන එක සුන්දරයි, නමුත් ආණ්ඩු පක්ෂයට ආවාට පසුව රට ඉදිරියට ගෙන යන එක එතරම් ලේසි කාර්යභාරයක් නොවෙයි කියලා. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමඟ අත්සන් කළ ගිවිසුම ඒ ආකාරයෙන්ම ඉදිරියට ගෙන යන එක අපි අගය කරනවා. මම කියන්නේ නැහැ, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල අවශ්‍යයි කියලා. නමුත්, රටක් බංකොලොත් වුණාට පසුව එයින් එළියට එන්න තිබෙන හොඳම ආයතනය -අල්ලා ගන්න තිබෙන හොඳම ආයතනය- තමයි, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල. දැන් මේ ආණ්ඩුව ඒක වැළඳ ගෙන තිබෙනවා; ඒ විධියට වෙනස් වෙලා තිබෙනවා. එදා ජේ.ආර්. ජයවර්ධන ගෙනාපු විවෘත ආර්ථිකයට බැණ බැණ හිටියාට, "මේක තමයි හෙණේ" කිව්වාට අද ඒකම ඒ ආකාරයෙන්ම ඉදිරියට ගෙන යන්න කටයුතු කරනවා. ඒ ක්‍රමයම තමයි අද පිළිගෙන තිබෙන්නේ. ඉතින්, ජනතා විමුක්ති පෙරමුණ කිව්වත්, NPP කිව්වත් ඒ ක්‍රමය වැළඳ ගෙන ඉදිරියට ගෙන යෑම අපි අගය කරනවා. හැබැයි, ඒ සම්බන්ධයෙන් කටයුතු කරන්නේ කොයි ආකාරයෙන්ද කියන එකත් අපට ප්‍රශ්නාර්ථයක්.

EPF එක, ඒ අරමුදල අද pension එකක් බවට පරිවර්තනය කරන්න හදනවා කියලා ප්‍රකාශ කර තිබෙනවා, ගරු මහින්ද ජයසිංහ නියෝජ්‍ය ඇමතිතුමා. ඒකේ යම් යම් සංශෝධන කර තිබෙනවා කියලා ඊට පසුව කිව්වා. නමුත්, ඒක වෙනස් කරන්න හිතන එකත් අලුත් අදහසක් ලෙස තමයි සලකන්නේ. *[බාධා කිරීමක්]* මගේ වෙලාවෙන් පසුව ඔබතුමා කථා කරන්න. ග්‍රෑන්ඩ් හයට් හෝටලය දැන් විකුණන්න සූදානම් කරලා තිබෙනවා. අපි ඒක අගය කරනවා. දැන් විවෘත ආර්ථික ක්‍රමය පිළිගෙන තිබෙනවා නම් අපි ඒක අගය කරනවා. ඒ වාගේම තමයි Mattala Rajapaksa International Airport එක. දැන් ඒක පෞද්ගලීකරණයට යොමු කරන්න හදනවා. මෙහෙම යන්න කියලා තමයි අපි එදා කිව්වේ. ඒ යන ගමන හොඳයි. ඒ වාගේම "දිට්වා" ව්‍යසනයෙන් ලංකා විදුලිබල මණ්ඩලයට ඇති වුණු රුපියල් බිලියන 20ක පාඩුව පාරිභෝගිකයා වෙතින් අරගෙන පිරිමසා ගන්න කටයුතු කරන්න යනවා. මම මේකෙන් පෙන්වන්න හදන්නේ මේකයි. ඔබතුමන්ලා එදිනෙදා ජන ජීවිතය ගත කරන්න පුළුවන් දේවලට අදාළව වෙනස්කම් කළ යුතුය කියා පිළිගන්නවා නම් හොඳයි.

අපේ ගරු අගමැතිනිය මේ අධ්‍යාපන ක්‍රමය තුළින් ලොකු පරිවර්තනයක් කරන්න හදනවා. අපි ඒක අගය කරනවා. We want to see a radical reform. But, it also needs to be done with our feet on the ground, maintaining our cultures and rectifying errors, and then, take it forward. Why I mentioned that was because there is a change that is taking place and if that change is done sticking on to their radical communist-oriented approaches and trying to take Sri Lanka down that path, all that would not gel well.

Sir, the "Daily Mirror" newspaper on the 20th of January, 2026 reported "Artificial Intelligence to threaten 22.8 per cent of employed people in Sri Lanka". මෙක ඉතාම දැවැන්ත ප්‍රශ්නයක්. ඒ නිසා අපි සූදානමින් සිටින්නට අවශ්‍යයි, කොයි ආකාරයෙන්ද අපි මේක හඳුන්වා දෙන්නේ කියලා.

Also, look at the World Bank's forecast on Sri Lanka. On the 20th of January, the World Bank projected a slow growth for Sri Lanka in 2026. That same World Bank, in October, 2025, mentioned, "Sri Lanka's economic recovery remains incomplete as key challenges remain." Again, that same World Bank, when they wanted to basically rev-up the Government, on 10th September, 2025 stated, "Sri Lanka's recovery remarkable, among fastest worldwide". Hon. Prime Minister, why I used the forecasts of the World Bank is because it is an institution that all of us look up to. But, their position on our economy changed within three months and it is worse than the atmospheric changes that take place in this country. I mean, the World Bank is an institution which talks with facts in hand. If in September, 2025, they said that our economic recovery was remarkable, then, to say there was a change in October and in January, that it is slowing down, there is something radically wrong with the World Bank. Those are the institutions that we look up to as if gospel truth is being spoken by them.

Sir, in a very short time, the matters in a very important Bill like the Universities (Amendment) Bill cannot be discussed. But, I am trying to give examples in order to justify my claim that these changes should take place. Today, the main problems in the education system are, outdated curriculum, mismatch with the labour market, exam-centric pressure, teacher-skills gaps, the digital divide, weak vocational pathways, language imbalance, politicization of reforms, erosion of values and centralized bureaucracy. The reason why you need these education and higher education reforms is to prepare the students for the digital and global economy. Otherwise, unemployment among graduates would be created. Also, innovation and entrepreneurship must be encouraged, international competitiveness should be brought in, urban-rural inequality must be taken care of, national development goals need to be set, technical and vocational sectors must be focused on, foreign investment must be attracted, knowledge-based industries should be developed, the tuition culture needs to be eliminated and human capital needs to be created. Those are the reasons why I said that these education reforms should take place. I am happy that the Hon. Prime Minister is making an attempt, but I do not know whether she is trying to do it alone. Hon. Prime Minister, you must have a team that comes along with you. Sometimes, you take the flak. Why should you take it personally, if it is something to be done on an institutional basis? This is not something that had been created yesterday; this has been happening over the past few years. Education Ministers come and go, but the policies cannot change. That is why there is a necessity to have a radical reform.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Hon. Member, your time is over.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Sir, just give me two or three minutes and I will wind up.

මේ ජේ.ආර්. ජයවර්ධන මහත්මයා 1978දී ගෙනාපු සංශෝධනයට ප්‍රතිසංශෝධනයක් කිරීම. මේක අපි එදා කරන කොට, President J.R. Jayewardene had checks and balances going on. Then, there was a subsequent change, which lost those checks and balances and tilted towards politicization.

ඒ කාලයේ කවුන්සලය පත් කරනකොට ඇමතිතුමාට හැකියාව තිබුණා, සියයට 50කට වැඩිය පත් කරන්න. ඒ තුළ එහි ප්‍රජාතන්ත්‍රවාදය නැති වෙලා තිබෙනවා. ඔබතුමන්ලා දැන් ඒ කවුන්සලය පත් කරන එක ප්‍රජාතන්ත්‍රවාදී රාමුවක කරන්න හදනවා. නමුත් ඊට වැඩිය හොඳයි ඇමතිට සියයට 51, 55 අතර පත් කරන්න පුළුවන් ප්‍රමාණය සියයට 40, 45ට ගෙනාවා නම්. එතකොට එතැනට ප්‍රජාතන්ත්‍රවාදී අයිතිය ගේන්න පුළුවන් හැකියාව එනවා. ඊට පස්සේ දක්ෂයෝ එකතුවීම තුළ ඒ කවුන්සලයේ යම් විධියක සමබරතාවක් ඇති වෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
තව මිනිත්තුවකින් මම අවසන් කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

එදා උපකුලපති පත් කළාට පසු, ඔක්කෝම Headsලා එතුමා තමයි පත් කරන්නේ. දැන් ඒකට ප්‍රජාතන්ත්‍රවාදී මුහුණුවරක් දීලා තිබෙනවා. අද එහෙම කරනකොට මේ තිබෙන අවස්ථාව පුළුල් කරලා lecturer කෙනෙකුටත් - above Grade II කියන එකට,- මට ආරංචියි, ඒ තනතුරටත් තරග කරන්න පුළුවන් Dean තනතුරට. ඒක හොඳයි. හැබැයි, පළපුරුද්ද ඇති කෙනෙක් පත් කිරීම අවශ්‍යයි. තින් උප කුලපතිට තනිව කරන්න පුළුවන් දේ අද කවුන්සලයක් තුළින් කරන්න යන එක තමයි මේ අවස්ථාවේ කරන්න යන්නේ. ඉතින් මේ සංශෝධනයේ හොඳ ගුණාංග තිබෙනවා. හැබැයි, ඒ ගුණාංගවලට වැඩිය,-

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, අවසන් කරන්න.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මට තව පොඩි වෙලාවක් දෙන්න.

එක පුද්ගලයෙක් තුළින් කරනවාට වඩා ඒ කවුන්සිල් එකේ ප්‍රජාතන්ත්‍රවාදයත් තව ඇති කළා නම්, මේක අංග සම්පූර්ණ වෙනවා කියන එක තමයි මේ අවස්ථාවේ කියන්නේ.

මට වෙලාවත් එක්ක සටනක් තිබෙන නිසා, I conclude my speech with a quote from an article written by Ms. Jamila Husain, the Editor of the "Daily Mirror", and published in that newspaper on the 19th of January, 2026.

[ගරු රවි කරුණානායක මහතා]

"Today, Sri Lanka's bureaucracy is not merely inefficient. It has become a curse on governance, development and investor confidence. It is the silent partner in corruption, the breeding ground of delays, files, signatures and 'come tomorrow' attitudes that quietly kill projects, destroy trust and drive investors away without a single protest slogan ever being shouted.

Foreign investors do not leave Sri Lanka because of speeches in Parliament or street protests. They leave because approvals take months, sometimes years. They leave because permits require endless back and forth between departments that do not communicate with each other."

මම මේ අවස්ථාවේ කියන්න කැමතියි, අපි මේ අධ්‍යාපන system එකේ සහ අපේ විශ්වවිද්‍යාල පද්ධතියේ ලොකු වෙනසක් කරන්න ඕනෑය කියන එක. අද එංගලන්තයට 15,000ක්, 20,000ක් යන අපේ ශිෂ්‍යයන් නවත්වා ගෙන අපේ විශ්වවිද්‍යාල පද්ධතියක් ඇති කරලා, අපට ඒ විශ්වවිද්‍යාල මෙහේට ගෙනැල්ලා කටයුතු කරන්න පුළුවන් නම්, අපේ විදේශ විනිමයත් ඉතුරු කරන්න පුළුවන්. අපේ රටේ දරුවන්ටත් මීට වඩා හොඳ අධ්‍යාපනයක් රටේම ඉඳගෙන ලබා ගන්න පුළුවන්. එසේ වේවා කියා ප්‍රාර්ථනා කරමින් මා නිහඬ වෙනවා.

ස්තුතියි.

**ගරු මහින්ද ජයසිංහ මහතා (කම්කරු නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு மஹிந்த ஜயசிங்ஹ - தொழில் பிரதி அமைச்சர்)
(The Hon. Mahinda Jayasinghe - Deputy Minister of Labour)
Sir, I rise to a point of Order.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාගේ point of Order එක මොකක්ද? කාලය ඉක්මවා ගිහිල්ලා තිබෙන්නේ, ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා. අපට කාලය කළමනාකරණය කර ගැනීම අවශ්‍යයි.

**ගරු මහින්ද ජයසිංහ මහතා**
(மாண்புமிகு மஹிந்த ஜயசிங்ஹ)
(The Hon. Mahinda Jayasinghe)
ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමා මගේ නම සඳහන් කරමින් ප්‍රකාශයක් කළා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
එතුමා ඔබතුමාගේ නම සඳහන් කළේ නැහැ නේ.

**ගරු මහින්ද ජයසිංහ මහතා**
(மாண்புமிகு மஹிந்த ஜயசிங்ஹ)
(The Hon. Mahinda Jayasinghe)
එතුමා අවස්ථා ගණනාවකදී මේ ප්‍රකාශය කළා. ඒ නිසා මම කල්පනා කළා, ඒ ගැන සඳහන් කරන්න. *[බාධා කිරීමක්]* හරිම පැහැදිලියි. මම පසුගිය 6වෙනි දා අපේ ගරු ඕෂානි උමංගා මන්ත්‍රීතුමිය අහපු ප්‍රශ්නයකට උත්තරයක් දුන්නේ. ඒ උත්තරයේ දී නිවැරදිව මම කිව්වා, EPF සහ ETF කියන funds දෙකේ වෙනස. EPF එක විශ්‍රාම වැටුපකට පරිවර්තනය කරනවා කියලා මම කිව්වේ නැහැ. මම කියපු එක වැරදි විධියට ඔබතුමා අවස්ථා ගණනාවකදී කිව්වා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
හොඳයි පැහැදිලියි, ගරු අමාත්‍යතුමා.

**ගරු මහින්ද ජයසිංහ මහතා**
(மாண்புமிகு மஹிந்த ஜயசிங்ஹ)
(The Hon. Mahinda Jayasinghe)
ඒ නිසා පැහැදිලිව මම කියනවා, EPF එක තිබෙන්නේ සමාජ ආරක්ෂණය - social security - වෙනුවෙන් බව. අපි අවධානය යොමු කරලා තිබෙනවා, පෞද්ගලික අංශයටත්, අර්ධ රාජ්‍ය අංශයටත් විශ්‍රාම වැටුපක් ලබා දීම වෙනුවෙන්. එහෙම නැතුව අපි මේ EPF එක විශ්‍රාම වැටුපකට පරිවර්තනය කරනවා කියලා කිව්වේ නැහැ, ගරු මන්ත්‍රීතුමා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු සුජීව දිසානායක මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 6ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.17]

**ගරු සුජීව දිසානායක මහතා**
(மாண்புமிகு சுஜீவ திசாநாயக்க)
(The Hon. Sujeewa Dissanayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතට අදාළ විවාදය තමයි මේ මොහොතේ සිද්ධ වෙන්නේ. ඒකට සම්බන්ධවීමට ලැබීම සතුටට කාරණයක්. රටේ අනාගත අධ්‍යාපනය හා සම්බන්ධ වැදගත් පනත් කෙටුම්පතක් සම්මත කරන්නයි අපි මේ උත්සාහ කරන්නේ. එය අප ලද මහත් භාග්‍යයක් සේ විශ්වාස කරනවා.

හැබැයි අප අද සූදානමින් හිටියේ, විපක්ෂය විසින් අපේ අග්‍රාමාත්‍ය, අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියට විරුද්ධව ගෙනෙන්න සූදානම් වුණු විශ්වාස භංගයට ප්‍රතිචාර දක්වන්නයි. ඊයේ දවසේ විපක්ෂයේ මන්ත්‍රීතුමෙක් ඇහුවා, "මනමාලි නැතුව මොන විශ්වාසභංග ද?" කියලා. ස්විට්සර්ලන්තයේ ඉඳන් අපේ ගරු අග්‍රාමාත්‍යතුමිය දැන් ඇවිල්ලා ඉන්නේ. මනමාලි ඇවිල්ලායි ඉන්නේ. හැබැයි, විශ්වාස භංගය නැහැ. විශ්වාස භංගය තියා විපක්ෂයේත් සියයට 95ක් විතර නැතිව තමයි- *[බාධා කිරීමක්]* අපට බාධා කරන්න එපා, විපක්ෂයේ ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීතුමන්ලා.

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතට සංශෝධන තමයි අද මේ ගෙනෙන්නේ. එම පනත සම්මත කරලා දළ වශයෙන් අවුරුදු 48කට වාගේ ආසන්න කාලයක් ගත වෙලා තිබෙනවා. අද අප ඉන්නේ 2026 අවුරුද්දේ. හැබැයි, දශක 5කට එහා තිබුණු ලෝකයයි, අද තිබෙන ලෝකයයි ගොඩක් වෙනස්.

ඔබතුමන්ලාට මතක ඇති, 1977දී හයෙන් පහක බලයක් අරගෙන ජේ.ආර්. ජයවර්ධන මහත්මයා ප්‍රමුඛ එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව කටයුතු කරපු හැටි. ගැහැනියක් පිරිමියෙක් කරන්නත්, පිරිමියෙක් ගැහැනියක් කරන්නත් හැර වෙන ඕනෑම දෙයක් කරන්න පුළුවන් කියපු වටාපිටාවක තමයි මෙවැනි පනත් සම්මත වුණේ. සමහර විට, ආණ්ඩුවේ මන්ත්‍රීවරුන්ගේ ඉල්ලා අස්වීමේ ලිපි සාක්කුවේ දමාගෙන, මන්ත්‍රීවරුන් බය ගන්වා වෙන්න ඇති මේ වාගේ පනත්වලට පක්ෂව ඡන්දය භාවිත කරවන්න ඇත්තේ. එදා ජේ.ආර්. ජයවර්ධන ආණ්ඩුව යටතේ

ගෙනාපු පනත් තුළින්, එහෙම නැත්නම් ඒ නීති රීතිවලින් ඔවුන් බලාපොරොත්තු වුණේ තමන්ගේ පන්තිමය අවශ්‍යතා ඉටු කර ගන්නයි. හැබැයි, ඔවුන් හිතුවේ නැති දේශපාලන පරිවර්තනයක් මේ රටේ ජනතාව එකතු වෙලා සිද්ධ කළා. මේ රටේ සාමාන්‍ය ජනතාවගේ ආණ්ඩුවක් අද නිර්මාණය කරලා තිබෙනවා. ඒ තමයි, ජාතික ජන බලවේගය ආණ්ඩුව. මෙය නිකම්ම නිකම් ආණ්ඩුවක් නොවෙයි. ශ්‍රී ලාංකීය දේශපාලන ඉතිහාසයේ තුනෙන් දෙකකට එහා ගිය බලයකින් යුතුව මේ ගරු සභාව නියෝජනය කරන මන්ත්‍රීවරු 159දෙනෙකුගේ නියෝජිතත්වයෙන් තමයි මේ පාර්ලිමේන්තුව සකස් කරලා තිබෙන්නේ. මේ රටේ අතිබහුතරයක් ජනතාව 2024 නොවැම්බර් මාසයේදී ඡන්දය භාවිත කළේ දුක් විඳින ජනතාවගේ අවශ්‍යතා වෙනුවෙන් නීති රීති සම්පාදනය කරන්නයි; පහළම ඉන්න මනුස්සයාට ඉහළට එන්න පුළුවන් වන ආකාරයේ නීති රීති සම්පාදනය කරන්නයි. ඒ නිසා ජනතාව දීලා තිබෙන මේ බලය අපි කිසි විටෙකත් අවභාවිත කරන්නේ නැහැ. නිදහස් අධ්‍යාපනයෙන් ඉදිරියට ගිහිල්ලා ඉන්න මේ රටේ සුජාත දූ පුතුන්ගේ අයිතීන් වෙනුවෙන් තමයි අපට ලබා දීලා තිබෙන මේ බලය -මේ ජනතා වරම- පාවිච්චි කරන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ රට කියන්නේ, ඉතාම දියුණු අධ්‍යාපනයක් තිබුණු රටක්. අපේ රටේ අදටත් තිබෙනවා, සාම්ප්‍රදායික අධ්‍යාපනය. ඒ කියන්නේ, අනුරාධපුර, පොළොන්නරු, කෝට්ටේ ආදි යුගවල සිට පැවැත එන පිරිවෙන් කේන්ද්‍ර කරගත්තු අධ්‍යාන ක්‍රමය. ඒ වාගේම තිබෙනවා, නූතන අධ්‍යාපන ක්‍රමය. විශේෂයෙන්ම වර්ෂ 1505දී ලංකාවට ආපු පෘතුගීසින්, 1658දී ලංකාවට ආපු ලන්දේසින්, 1796දී ලංකාවට ආපු ඉංග්‍රීසින් තමන්ගේ අවශ්‍යතාවට, තමන්ගේ පන්තිමය අවශ්‍යතාවට, මේ රටේ සම්පත් සූරාගෙන යෑමේ අවශ්‍යතාවට මේ රටේ තිබුණු අධ්‍යාපන ක්‍රමය වෙනස් කළා. වෙනස් කරලා ඔවුන්ට ඕනෑ ආකාරයට අධ්‍යාපන ක්‍රමය හැදුවා. අපි මොන තැනක හිටියත් ඒක පිළිගන්න වෙනවා. ඒ හදපු අධ්‍යාපනය තමයි, අද මේ රටේ බහුතරයක් දෙනා ඉගෙන ගන්න අධ්‍යාපනය ක්‍රමය. එම අධ්‍යාපනය ලබා දීමේ ක්‍රියාවලිය තුළ අපේ රටේ අද තිබෙන ඉහළම අධ්‍යාපන ආයතනය තමයි, විශ්වවිද්‍යාලය. මම හිතන විදියට, 1870දී තමයි ලංකාවේ පළමුවැනි වෛද්‍ය විද්‍යාලය ආරම්භ වුණේ. ඒ වාගේම 1921දී විශ්වවිද්‍යාල කොලීජි ආරම්භ වුණා. 1942දී ලංකා විශ්වවිද්‍යාලය ආරම්භ වුණා. මේ ගරු සභාවේ කථා වුණා, සර් අයිවර් ජෙනිංග්ස් මැතිතුමා තමයි ලංකා විශ්වවිද්‍යාලයේ පළමු උපකුලපතිවරයා හැටියට තේරී පත් වුණේ කියලා.

විශේෂයෙන්ම අපේ රටේ සාම්ප්‍රදායික අධ්‍යාපන ක්‍රියාවලියක් තිබුණේ. 1873දී විද්‍යෝදය පිරිවෙන ආරම්භ කළා. එය ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය බවටත්, 1875දී ආරම්භ කළ විද්‍යාලංකාර පිරිවෙන කැලණිය විශ්වවිද්‍යාලය බවටත් පත් වුණා. අද වනකොට රාජ්‍ය මැදිහත්වීම යටතේ, නැත්නම් රජය යටතේ විශ්වවිද්‍යාල 17කට ආසන්න ප්‍රමාණයක් ක්‍රියාත්මක වෙනවා. මේ විශ්වවිද්‍යාල තුළ ප්‍රධාන වශයෙන්ම බලවේග තුනක් ක්‍රියාත්මක වන ආකාරය අපි දකිනවා. එකක් තමයි, අධ්‍යයන ක්‍රියාවලිය හා සම්බන්ධ ඒකකය. දෙවැනි එක තමයි, අනධ්‍යයන කාර්ය මණ්ඩලය. තුන්වැනි එක තමයි ශිෂ්‍ය ප්‍රජාව. මෙහිදී අපි දකින්නේ ශිෂ්‍යයන් වෙනුවෙන්වත්, අනධ්‍යයන කාර්ය මණ්ඩලය වෙනුවෙන්වත් නොවෙයි; අධ්‍යයන කාර්ය මණ්ඩලය වෙනුවෙන් උසස් තනතුරු සඳහා අවශ්‍ය ආචාර්යවරු, මහාචාර්යවරු, අංශාධිපතිවරු, පීඨාධිපතිවරු පත් කර ගැනීම සඳහා වූ පනතේ සංශෝධනයක් තමයි අද දවසේ කථා බහ කරන්නේ.

විශේෂයෙන්ම විශ්වවිද්‍යාලයක් ගත්තාම, විශ්වවිද්‍යාලයේ කුලපතිතුමෙක්, කුලපතිතුමියක් එහෙම නැත්නම්, කුලපති හිමිනමක් ඉන්න පුළුවන්. හැබැයි ඒ කුලපතිතුමාට, තුමියට හෝ හිමිනමට විධායක බලයක් නැහැ, නාමික බලයක් තිබෙන්නේ. විශ්වවිද්‍යාල ක්‍රියාවලිය තුළ උපකුලපති කෙනෙකු හෝ ඇතැම් විශ්වවිද්‍යාල තුළ නියෝජ්‍ය උපකුලපති තනතුරු දරන විශ්වවිද්‍යාල ආචාර්ය, මහාචාර්යවරු ඉන්නවා. ඒ වාගේම තමයි පීඨාධිපතිවරු, අංශාධිපතිවරු, එතැනින් පහළට ජ්‍යෙෂ්ඨ මහාචාර්යවරු, මහාචාර්යවරු, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරු, පළමුවන ශ්‍රේණිය සහ දෙවන ශ්‍රේණිය කථිකාචාර්යවරු, ඒ වාගේම කථිකාචාර්යවරු (ආධුනික) ඉන්නවා. නමුත්, 1978 පනත හරහා හදලා තිබුණු නීති රීති අනුව විශ්වවිද්‍යාලයෙහි උපකුලපතිතුමාට පුළුවන්, තමන්ගේ පීඨය තුළ ඉන්න පීඨාධිපතිතුමා සහ අංශාධිපතිතුමා පත් කරන්න. අන්න ඒ තනි පුද්ගලයකුගේ හිතුමතයට විශ්වවිද්‍යාලයක් පරිපාලනය කිරීම සඳහා වූ ක්‍රියාමාර්ගය නතර කිරීම සඳහා තමයි අද දවසේ මේ පනත් කෙටුම්පත සම්බන්ධ විවාදය කරන්නේ. මේ ගන්නා වූ උත්සාහය අදට පමණක් නොවෙයි, තවත් අවුරුදු සියයකට, දෙසියයකට වටිනා තීන්දුවක් බව ප්‍රකාශ කරමින් මගේ අදහස් දැක්වීම සමාප්ත කරනවා.

ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ෆයිසර් මුස්තාපා මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 5ක කාලයක් ලැබෙනවා.

**ගරු ජනාධිපති නීතිඥ ෆයිසර් මුස්තාපා මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி பைஸர் முஸ்தபா)
(The Hon. Faiszer Musthapha, PC)
මට විනාඩි 8ක් තිබෙනවා නේ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
විනාඩි 5යි.

**ගරු ජනාධිපති නීතිඥ ෆයිසර් මුස්තාපා මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி பைஸர் முஸ்தபா)
(The Hon. Faiszer Musthapha, PC)
මට විනාඩි 8ක් තිබුණා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
කාලය අඩු වෙලා තිබෙන්නේ, ගරු මන්ත්‍රීතුමා.

[4.24 p.m.]

**ගරු ජනාධිපති නීතිඥ ෆයිසර් මුස්තාපා මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி பைஸர் முஸ்தபா)
(The Hon. Faiszer Musthapha, PC)
Hon. Presiding Member, firstly, I would like to thank you for giving me this opportunity to speak on the Universities (Amendment) Bill.

Sir, I would like to ask the Hon. Prime Minister why she is lowering the bar with regard to the appointment of a Dean of a university. I am also happy that she has a global perspective on matters and I hope that she would look at education from a global perspective as well. That is what is needed now.

[ගරු ජනාධිපති නීතිඥ ෆයිසර් මුස්තාපා මහතා]

Hon. Prime Minister, I would like to mention that the cost of producing a doctor over a period of five years is over Rs. 5.5 million and for the education of a dental surgeon, the cost is Rs. 8.6 million and for an engineer, it is Rs. 2.7 million. අපේ ලංකාවේ සම්ප්‍රදායයක් තිබෙනවා, ආණ්ඩුව මොනවාද අපට දෙන්නේ කියන එක ගැන. ඒ, නිදහස් අධ්‍යාපනය; නොමිලේ අධ්‍යාපනය, ගරු අගමැතිතුමියනි. අපේ ජනතාව නිදහස් අධ්‍යාපනයෙන් ප්‍රයෝජන ගත් අවස්ථාවක ඔවුන්ට වගකීමක් තිබෙනවා, සමාජයටත් යමක් දෙන්න. නමුත්, බොහෝ අවස්ථාවලදී නිදහස් අධ්‍යාපනයෙන් ප්‍රයෝජනය ගන්නා දරුවන් රට හැර විදේශ රටවලට යනවා, ඒගොල්ලන්ගේ දියුණුව තකා. ගරු අගමැතිතුමියනි, හැබැයි නිදහස් හෝ නොමිලේ අධ්‍යාපනයෙන් ඉගෙන ගන්නා අපේ දරුවන් විශේෂයෙන් වෛද්‍ය වෘත්තිය, ඉංජිනේරු වෘත්තිය සහ විද්‍යා හා තාක්ෂණ ක්ෂේත්‍රයේ උපාධිධාරින් යම් විධියකින් යම් කාලපරිච්ඡේදයක් ලංකාවේ සේවය කිරීම සම්බන්ධයෙන් අනිවාර්යයෙන් ක්‍රමවේදයක් අවශ්‍යයි. නිදහස් අධ්‍යාපනයෙන් ඒගොල්ලන්ට උපාධියක් ලැබුණා නම්, බැඳුම්කරයක් යටතේ ඒ උදවියගෙන් යම් කාලපරිච්ඡේදයක් ප්‍රයෝජන ගත යුතුය කියා මා විශ්වාස කරනවා.

අපි දන්නවා, අනෙකුත් රටවල නිදහස් අධ්‍යාපනය සඳහා loan එකක් දෙන බව. යම් කාලපරිච්ඡේදයක් තුළ එය ගෙවිය යුතුයි. මෙහිදී අපි නොමිලේ අධ්‍යාපනය ලබා දෙන්නේ රටට ප්‍රතිලාභ ලබා ගන්න. ඒ නිසා මම ඔබතුමියගෙන් ඉල්ලා සිටිනවා, නිදහස් අධ්‍යාපනයෙන් ඉගෙන ගන්නා උදවියගෙන් රටට සේවයක් වන ක්‍රමවේදයක් ඇති කරන්න කියලා. බිමල් රත්නායක ඇමතිතුමනි, විශේෂයෙන් අපි වෛද්‍ය වෘත්තිය දිහා බලනකොට වෛද්‍යවරුන් 1,500ක් පමණ පිට රට යනවා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ඔබතුමන්ලා වාගේ PC තාත්තලා හිටියා නම් ලංකාවේ free education ඕනෑ නැහැ. අනෙක් අයට, -

**ගරු ජනාධිපති නීතිඥ ෆයිසර් මුස්තාපා මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி பைஸர் முஸ்தபா)
(The Hon. Faiszer Musthapha, PC)
නැහැ, මම කියන්නේ free education හොඳයි. ගරු ඇමතිතුමනි, මම කියන්නේ නිදහස් අධ්‍යාපනයෙන් ප්‍රයෝජන ගත් උදවිය රටට යම් කාල පරිච්ඡේදයක් සේවය කළ යුතුය කියන එක. හුඟක් අය නිදහස් අධ්‍යාපනය ලබා පිට රට යනවා, ප්‍රතිලාභ ලබා ගන්න. හැබැයි, අපි බදු ගෙවනවා. අපි ගෙවන බදුවලින් තමයි නිදහස් අධ්‍යාපනය ලබා උපාධිය ගන්නේ. ගරු බිමල් රත්නායක මැතිතුමනි, මම කිව්වේ ඒකයි. ඒ කියන්නේ නිදහස් අධ්‍යාපනයෙන් ප්‍රයෝජන ලැබූ කෙනෙකුට මේ රටේ යම් කාල පරිච්ඡේදයක් සේවය කිරීම අනිවාර්ය කළ යුතුයි. විශේෂයෙන් වෛද්‍ය වෘත්තිය ගැන බලනකොට, වෛද්‍යවරු 1,500ක් පමණ රට දාලා යනවා. ඒගොල්ලන් බලන්නේ ඒගොල්ලන් ගැන විතරයි. හැබැයි, ඒගොල්ලන් මේ රටේ ඉගෙන ගෙන, -

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
No-Confidence Motion එකට අත්සන් කළාද, ඔබතුමා?

**ගරු ජනාධිපති නීතිඥ ෆයිසර් මුස්තාපා මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி பைஸர் முஸ்தபா)
(The Hon. Faiszer Musthapha, PC)
මගේ කථාවට අවස්ථාවක් දෙන්න. මම No-Confidence Motion එක ගැන කථා කරන්නේ නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තව විනාඩි දෙකක් අවශ්‍යයි.

එසේම, අපේ විශේෂඥ වෛද්‍යවරු, -

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Hon. Member, you have only two minutes more.

**ගරු ජනාධිපති නීතිඥ ෆයිසර් මුස්තාපා මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி பைஸர் முஸ்தபா)
(The Hon. Faiszer Musthapha, PC)
Sir, I need another three minutes because my time was taken by the Hon. Bimal Rathnayake.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
How can I give you that much of time?

**ගරු ජනාධිපති නීතිඥ ෆයිසර් මුස්තාපා මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி பைஸர் முஸ்தபா)
(The Hon. Faiszer Musthapha, PC)
විශේෂඥ වෛද්‍යවරු අද රට දාලා යනවා. හැබැයි, ඒ වරම ලැබෙන්නේ ඒගොල්ලන්ගේ පුහුණුව තකා. ඒ අවස්ථාව ලැබෙන්නේ රටට. හැබැයි, ඒගොල්ලන් පිට රට ගිහින් ඒ බැඳුම්කරයට අදාළ මුදල ගෙවනවා. ඒ නිසා ආණ්ඩුව මේ ගැන සොයා බලන්න ඕනෑ. ඒ වරම ලැබෙන්නේ ඒ උදවියට නොවෙයි, රටට. ඒ නිසා විශේෂඥ වෛද්‍යවරු වශයෙන් පුහුණුවක් ලබපු උදවිය නැවත ලංකාවට ඇවිල්ලා සේවය කිරීම අනිවාර්ය කළ යුතුයි. ඒ වාගේම ඒ රටවල් එක්ක සාකච්ඡා කර ඒගොල්ලන්ට දිගින් දිගටම ඒ රටවල රැකියාව කරන්න බැරි වෙන්න, ඒ සම්බන්ධයෙන් මොකක් හරි ක්‍රමවේදයක් හදනවා නම් හොඳයි. ඒගොල්ලන් පුහුණුව ලබා අවසන් කර, ලංකාවට ඇවිල්ලා යම් සේවයක් කළ යුතුයි. Bond එකක් අත්සන් කරන එක නොවෙයි. ගිහින් මාස 3කින් ඒ bond එකට අදාළ මුදල ගෙවන්න පුළුවන්. ම ම ගරු අගමැතිතුමියගෙන් ඉල්ලා සිටිනවා, කරුණාකර ඒ ගැන සොයා බලා යම් නෛතික ක්‍රමවේදයක් හදන්න කටයුතු කළ යුතුයි කියලා. විශේෂයෙන්ම ලංකාවේ විශේෂඥ වෛද්‍යවරුන්ගේ හිඟයක් තිබෙනවා. හැබැයි, බදු ගෙවන මිනිසුන්ගේ මුදලින් ඉගෙන ගෙන පිට රට ගිහින් ඒගොල්ලන් ඒ බැඳුම්කරයට අදාළ මුදල ගෙවනවා. ඒ ප්‍රශ්නයට අපට අනිවාර්යයෙන් විසඳුමක් ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ රටේ දරුවන් විශාල ප්‍රමාණයක් විදේශ රටවල ඉගෙන ගන්නවා. අවුරුද්දකට බිලියන 3ක් විතර එම දරුවන්ට වැය වෙනවා. දේශපාලනයේ හුඟක් අවස්ථාවලදී පෞද්ගලික විශ්වවිද්‍යාල සම්බන්ධයෙන් නොයෙක් අය නොයෙක් අදහස් දැරුවා. අවාසනාවට වාගේ, ලංකාවේ විශ්වවිද්‍යාලවල ඉගෙනගත හැක්කේ දරුවන් 40,000කට පමණයි. හැබැයි, අවුරුද්දකට ඊට වඩා ප්‍රමාණයක් උසස් පෙළ විභාගය සමත් වෙලා විශ්වවිද්‍යාල අධ්‍යාපනයට සුදුසුකම් ලබනවා. මම ගරු අගමැතිතුමියට කියන්න කැමැතියි, මේ රටේ පෞද්ගලික විශ්වවිද්‍යාල පිහිටෙව්වා නම් අපේ දරුවන්ට අඩු මුදලට ඉගෙන ගැනීමේ වරම ලැබෙනවා නේද කියලා.

ඒ වාගේම, අපි දැන් vehicles import කිරීම තුළින් විශේෂ මුදල්,-

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට නියමිත කාලය අවසන්, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු ජනාධිපති නීතිඥ ෆයිසර් මුස්තාපා මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி பைஸர் முஸ்தபா)
(The Hon. Faiszer Musthapha, PC)
මට තව විනාඩි දෙකක් ලබා දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
විනාඩි දෙකක් ලබා දෙන්න හැකියාවක් නැහැ, ගරු මන්ත්‍රීතුමනි. කාලය අවසන්.

**ගරු ජනාධිපති නීතිඥ ෆයිසර් මුස්තාපා මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி பைஸர் முஸ்தபா)
(The Hon. Faiszer Musthapha, PC)
විදේශ අධ්‍යාපනය සඳහා අපේ විශාල මුදලක් වැය වෙනවා. ඒ නිසා මේ රටේ පෞද්ගලික විශ්වවිද්‍යාල බිහි කිරීමට අවස්ථාවක් දෙන්න කියා ගරු ඇමතිතුමියගෙන් මා ඉල්ලා සිටිනවා.

හේතුව, උසස් පෙළ විභාගය සමත් වන උදවියට උපාධියක් ලබා දෙන්න ආණ්ඩුවට අවස්ථාවක් උදා කර දෙන්න බැහැ. ඒ නිසා ඒකටත් යම් ක්‍රමවේදයක් අවශ්‍යයි කියන එක මම මේ අවස්ථාවේදී මතක් කරන්න කැමැතියි.

ඒ වාගේම GDP එකෙන් සියයට 5ක් අධ්‍යාපනය වෙනුවෙන් වෙන් කළ යුතුයි. මේ අවුරුද්දේ ඔබතුමන්ලා අධ්‍යාපනය වෙනුවෙන් වෙන් කරලා තිබෙන්නේ සියයට 2යි. ඔබතුමන්ලා කියලා තිබෙන්නේ, over a period of time, you will increase it කියලා. හැබැයි රටේ ලොකු අවශ්‍යතාවක් තිබෙනවා, අධ්‍යාපනය දියුණු කරන්න. එහෙම නම්, GDP එකෙන් සියයට 5ක්වත් අධ්‍යාපනයට වෙන් කිරීම අනිවාර්යයෙන් කළ යුතුයි කියන ඉල්ලීම කරමින් මම නිහඬ වනවා.

ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු (ආචාර්ය) අනිල් ජයන්ත ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 6ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.31]

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා (කම්කරු අමාත්‍ය සහ මුදල් සහ ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த - தொழில் அமைச்சரும் நிதி, திட்டமிடல் பிரதி அமைச்சரும்)
(The Hon. (Dr.) Anil Jayantha - Minister of Labour and Deputy Minister of Finance and Planning)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම අද දින විවාදයට ගැනෙන්නේ 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතට ගෙනෙන සංශෝධන පිළිබඳවයි. මෙය පැති ගණනාවකින් ගැට ගැහිලා තිබෙනවා, අපේ ප්‍රතිපත්ති එක්ක සහ අපේ රටේ ආර්ථිකය සංවර්ධනය කරන ක්‍රියාවලියත් එක්ක. අනෙකුත් කාරණාවලට අමතරව අපි නිරන්තරයෙන් මතු කරන කාරණාවක් තමයි, අධ්‍යාපනයේ තිබෙන වැදගත්කම, අධ්‍යාපනය මොන වාගේ කාර්යභාරයක්ද ඉෂ්ට කරන්නේ කියන එක. ඒ වාගේම මේ සම්බන්ධව අපට මොන වාගේ හැකියාවක්ද, විභවතාවක්ද තිබෙන්නේ කියන කාරණය අපි තේරුම් අරගෙන ඉන්නවා. එහිදී මේ සිද්ධ කරන ලද පරිපාලනමය වෙනස්කම් පවතින නීතිමය රාමුවට හිතුමතේ ඇතුළත් කරපු ඒවා නොවෙයි. විශ්වවිද්‍යාල ප්‍රජාවත් සමඟ සාකච්ඡා කිරීම, අදහස් හුවමාරු කිරීම තුළින් හොඳ අවබෝධයකින් හා දැනුවත්භාවයකින් යුතුව කටයුතු කිරීම කියන කාරණා අපේ ප්‍රතිපත්තිවලත් ඇතුළත් කරලා තිබුණා. ඒ අනුව තමයි මේ අදාළ සංශෝධන කරන්නේ. අපි දන්නවා, සමහර කරුණු නීතියේ ලියලා තිබුණාට, ඒවා ක්‍රියාත්මක වීමේදී, එහෙම නැත්නම් භාවිතාවේදී විවිධ ගැටලු පැන නඟින්න පුළුවන් බව. අපේ රට ඇතුළේ, විශ්වවිද්‍යාලවල විතරක් නොවෙයි, අනෙක් හැම තැනකදීම බොහෝදුරට සිදුව ඇති දේවල් තමයි ඉහළ සිට පහළට එන hierarchical order ඇතුළේ යම් බල කඳවුරු - power centres - නිර්මාණය වීමේ තත්ත්වයක් පැවතීම. ඒ නිසා මේ කරන සංශෝධනයෙන් අපි තිබුණාට වඩා හොඳ තත්ත්වයක් ඇති කරනවා වාගේම අනාගතයේදී තවත් වෙනස්කම් කරන්න අපට පුළුවන් වනවා, තිබුණාට වඩා වඩාත් ප්‍රජාතන්ත්‍රවාදී විධියට, විශ්වවිද්‍යාල පරිපාලන ව්‍යුහයට උදව් වන විධියට එහි පරිපාලන කාර්යක්ෂමතාව - administrative efficiency එක - වැඩි කිරීමේ දිශාවට තමයි මේ කාරණය තිබෙන්නේ. මම ඒක පැහැදිලි කරන්නම්. මේ ප්‍රස්තුත කාරණයේදී මේ සංශෝධන ගෙන එන්නේ පීඨාධිපති පත් කිරීමත්, අංශ ප්‍රධානීන් පත් කිරීමත් සම්බන්ධයෙනුයි.

මෙහි තිබෙනවා, ආකාර දෙකක්. එකක්, පීඨාධිපති පත් කිරීමක් නොවෙයි එන්නේ තෝරා ගැනීමක් - election එකක්. අනෙක් එක, අංශාධිපති පත් කිරීමක් - appointment. දැනට තිබෙන ක්‍රමයේ පුංචි හැකිළීමක් තිබෙනවා. එම පත් කිරීම් සිදු කිරීමේදී එකඟතාව මත අදහස් විමසා තිබුණත්, එතැනදී ඒ තෝරා ගැනීමේ යම් ඉඩකඩ ඇහිරීමක් සිදු වනවා. ඒ නිසා තමයි ඒ අදාළ බලතල ඒ පාලක මණ්ඩලයට ලබා දීලා එතැනදීත් විශ්වවිද්‍යාල උපකුලපතිවරයාගේ නිර්දේශය මත අදහස් විමසා ඒ සඳහා ඉල්ලුම් කරන්න පුළුවන්, ඒ සඳහා මැදිහත් වන්න පුළුවන් කාණ්ඩය පුළුල් වෙලා තිබෙන්නේ.

ඊළඟ කාරණය මෙයයි. මේ පත් කිරීමකදී ගැටලු පැන නඟින්න පුළුවන්. ඒ සඳහා හිතවත්කම් වාගේම මම කලින් කිව්වා වාගේ වෙනත් බල කඳවුරු සම්බන්ධ වෙන්න පුළුවන්, ඒක subjective වෙන්න පුළුවන්. නමුත්, ඒක පුළුල් කළාම එතැන වැඩි ඉඩ ප්‍රස්ථාවක් ලැබෙනවා. ඒ වාගේම අධ්‍යයන අංශයක කාර්යභාරය වන්නේ, ඒ විෂය ක්ෂේත්‍රයට අදාළ කටයුත්ත වඩාත් හොඳින් කරගෙන යන්න පුළුවන් දැනුවත්භාවයෙන්, විද්වත්භාවයෙන් ඉහළම කෙනෙක් පත් කිරීම. ඒ නිසා තමයි එය ජ්‍යෙෂ්ඨ මහාචාර්යවරයාගේ සිට පහළට ගමන් කරමින් තිබෙන්නේ.

දෙවැනි කාරණය, පීඨාධිපති පත් කිරීම. එම කාරණයේදී ඡන්දයක් තිබෙනවා. එතැනදී දැනට ඉදිරිපත් වෙන්න පුළුවන් වන්නේ අංශාධිපතිවරුන්ට විතරයි. එතැනදී ප්‍රජාතන්ත්‍රවාදී ඉඩකඩ ඇහිරෙන නිසා තමයි එය ඉවත් කරලා ඔහුටත්, ඒ වාගේම ඒ ජ්‍යෙෂ්ඨ මහාචාර්යවරයාගේ ඉඳලා පහළට මහාචාර්යවරුන්, ආශ්‍රිත මහාචාර්යවරයා, පළමුවෙනි ශ්‍රේණියේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරුන් කියන මට්ටමට එම තනතුරට පත් කිරීම විවෘත කරලා තිබෙන්නේ. එතැනදී බලහත්කාරයෙන් අපට ඕනෑ කෙනෙක් පත් කිරීමක් වෙන්නේ නැහැ. ඒ කියන්නේ, තරගය සඳහා වැඩි ඉඩ ප්‍රස්ථාවක් ලබා දීම සිදුවනවා. මම හිතනවා, ප්‍රජාතන්ත්‍රවාදය පැත්තෙන් ඒක තමයි හොඳ කියලා. අපි දන්නවා, තරුණ ආචාර්යවරුන්, මහාචාර්යවරුන් විශ්වවිද්‍යාලවල වැඩ කරලා ලබා ගත් අවුරුදු ගණනාවක අත්දැකීමටත් අමතරව විවිධ

[ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා]

වූ හැකියාවන්, දක්ෂතා, කුසලතා, ඒ වාගේම ඒ විශ්වවිද්‍යාල ප්‍රජාවේ අනුදැනුම හා හැකියාවන් මත බොහෝ වැඩ කටයුතු කර තිබෙන බව. ඔවුන්ට අවස්ථාවක් ලබා දීම තමයි මෙහිදී සිදු වන්නේ. ඒ නිසා මෙය ඉතාම ප්‍රගතිශීලි පියවරක් ලෙස මම දකිනවා. අපට ඉදිරියේදී මේ තත්ත්වය තවත් වර්ධනය කරන්න පුළුවන්. ඉන් සිදුවන ප්‍රධාන කාරණයක් තමයි, මේ පරිපාලන කාර්යක්ෂමතාව වැඩි කිරීමත්, ප්‍රජාතන්ත්‍රවාදී වටපිටාව වෙනුවෙන් වැඩි ඉඩ ප්‍රස්ථාවක් ලබා දීමත්.

මේ සමඟ ගැටගැහිලා තිබෙන අධ්‍යාපන ප්‍රතිසංස්කරණ පිළිබඳවත් පුංචි වචනයක්, දෙකක් මම සඳහන් කරන්න ඕනෑ. මෙහිදී අපට අවස්ථාව ලැබුණා, ගරු අග්‍රාමාත්‍යතුමියත් එක්ක World Economic Forum එකට සම්බන්ධ වන්න. එහිදී අපට පුද්ගලයින් ගණනාවක් හම්බ වුණා. රාජ්‍ය නායකයින් වාගේම ආයතන ගණනාවක නියෝජිතයිනුත් හම්බ වුණා. විශේෂයෙන් රටකට වෘත්තීය අධ්‍යාපනය කොතරම් වැදගත් වනවාද කියන එක අපි වාගේ රටකට ඉතාම වැදගත් වනවා. රටේ ජනගහනයෙන් සියයට 70ක් විතර වෘත්තීය වශයෙන් උසස් මට්ටමට ගෙනෙන තත්ත්වයන් ඒ රටවල නිර්මාණය වෙලා තිබෙනවා. ඒ සම්බන්ධව සාකච්ඡා කළාම අපට දැනගන්න ලැබුණු කරුණු තමයි අපි මේ ප්‍රතිසංස්කරණවලට ඇතුළත් කරලා තිබෙන්නේ. එම නිසා මේ ඇගැයීමේ ක්‍රමවේදය හරහා වෘත්තීය විෂය පථය පුළුල් කරන්න තබපු එම පියවර ඉතාම ප්‍රගතිශීලියි. අපි කියන්නේ නැහැ, මේකෙන් සමස්තයම වෙනස් වනවා කියලා. නමුත් නියමිත දිශාවට, ලෝකය ගමන් කරන දිශාවට අපිත් යන්න අවශ්‍යයි. අධ්‍යාපනය අවශ්‍ය වන්නේ ඇයි? ඒ, හුදෙක්ම රැකියාවක් ලබා ගැනීමට පමණක් නොවෙයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ලෝකය දකින්න, ප්‍රශ්න කරන්න, විශ්ලේෂණය කරන්න පුළුවන් විධියේ කුසලතා පාදක, නිපුණතා පාදක අධ්‍යාපන ක්‍රමයක් තමයි මේ ක්‍රියාත්මක වෙමින් තිබෙන්නේ.

අපේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ සම්බන්ධව පසුගිය සති දෙක, තුන ඇතුළේ කරපු විවේචන හුදෙක්ම පදනම් විරහිත විවේචන. ඒ නිසා තමයි ඔවුන් පසුබැහැලා තිබෙන්නේ. මම මේ අවස්ථාවේදී යෝජනා කරනවා, ඒ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ අපි යෝජනා කළේත් සැබෑ දියුණු මානව සම්පතක් හදා ගැනීම අරමුණු කරගෙනයි කියලා. ඒ මානව සම්පත අපේ රට ඇතුළේ සිතීමේ ධාරිතාව, වැඩ කිරීමේ ධාරිතාව, නිෂ්පාදනය කිරීමේ ධාරිතාව, සමාජ සම්බන්ධතා ගොඩනැඟීමේ ධාරිතාව, මානවත්වයේ ධාරිතාව වැඩි කර ගන්න ඉවහල් වනවා කියන අදහස ඉදිරිපත් කරමින් මගේ අදහස් දැක්වීම අවසාන කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු නිසාම් කාරියප්පර් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් තිබෙනවා.

[4.37 p.m.]

**ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி எம். நிசாம் காரியப்பர்)
(The Hon. M. Nizam Kariapper, PC)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, I am privileged to speak at a time when the Hon. Prime Minister and Minister in charge of education is here. Hon. Prime Minister, first, let me congratulate you on your excellent performance at the World Economic Forum. But, that does not mean that I do not have all the right to criticize and express my opinion. Most of the MPs feel it is better that we congratulate you so that you do not get upset about whatever proposals you have brought in. But, I do not think you have that kind of personality. Be that as it may, let me now get onto the subject under discussion straight away.

ගරු ඇමතිතුමියනි, විශ්වවිද්‍යාල පනතෙහි දිගින් දිගටම කථා කළ එක කාරණයක් මෙතැන missing. You have to accept that. මොකද මට පෙර කථා කරපු ඇමතිතුමාත් කිව්වේ, පීඨාධිපතිවරුන් දැනට පත් කිරීමක් වනවා කියලා.

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)
පීඨාධිපතිවරුන් තෝරා ගැනීමක්.

**ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி எம். நிசாம் காரியப்பர்)
(The Hon. M. Nizam Kariapper, PC)
ඔව්, තෝරා ගැනීමක්. Thank you very much. තෝරා ගැනීමක් වෙන එක තමයි දැනට තිබෙන tradition එක. පරණ පනතට අනුව, they are entitled to wait for a particular period of time. හැබැයි, දැන් එකට අනුව, the Council has the right to remove. මම ගරු අගමැතිතුමියට පෙන්වන්න කැමැතියි, ඔබතුමියත් හිටපු "University Governance Autonomy and Accountability: Direction for Change, Workshop Report" එක. I am sure the Hon. (Dr.) Harini Amarasuriya was there in that team. There is a page on the appointment of the UGC, the Vice Chancellor, the Council of Academics and Administration.

ගරු අගමැතිතුමියනි, ඔබතුමියත් සහභාගි වෙලා 2015 අවුරුද්දේදී උසස් අධ්‍යාපනය වෙනුවෙන් විශ්වවිද්‍යාලය තුළ ස්වාධීනභාවය සඳහා ඉතා විශිෂ්ට රෙගුලාසියක් ගෙනැල්ලා තිබුණා. එහි සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කරන්න ඔබතුමිය ප්‍රමුඛ මේ ආණ්ඩුව ක්‍රියාත්මක වෙලා නැහැ. ඒක තමයි, පළමුවැනි කාරණය. දෙවැනි කාරණය තමයි, මේ Bill එකේ පොඩි ප්‍රශ්නයක් තිබෙනවා. මම ඇමතිතුමියටත් කියන්න හැදුවේ ඒකයි. With regard to the Dean, they use the words "unless removed from office by the Council". මෙතෙක් පීඨාධිපතිවරයෙකු ඉවත් කිරීමේ පටිපාටිය පිළිබඳව විශේෂිත ප්‍රකාශනයක් පනත්වල නොතිබුණත්, දීර්ඝ නඩු තීන්දුවල ස්වාභාවික රීතිවලට පටහැනිව ඉවත් කිරීමට විරුද්ධවත්, අසාධාරණ ලෙස ඉවත් කිරීමට විරුද්ධවත් - on arbitrary removal - නඩු තීන්දු රාශියක් ඇවිල්ලා තිබෙනවා. හැබැයි, තවමත් පීඨාධිපතිවරයෙකු ඉවත් කිරීමේ පටිපාටියක් ගැන සඳහන් වෙලා නැහැ. නමුත්, the Council has been given the power to remove him. එතැන තිබෙන ප්‍රශ්නය තමයි, his appointment is not made by the Council; the appointment is made by the Board. So, at least, there should be something to the effect "on the recommendation of the Board, the Council should have the power to remove." That is very important. Otherwise, it will go against the spirit of your own set of regulations put forward. I also request you to give, as soon as possible, some legal effect to this regulation.

Having said that, let me quickly get onto educational reforms. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට ලැබී ඇති කාලය කෙටි නිසා මම ටිකක් ඉක්මනින් මේ ගැන කියන්නම්. අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ගැන මම නම් කියන්නේ මේකයි. අපි ඔක්කෝම

පඹ ගාලක පැටලුණු නරි වාගේ අනවශ්‍ය දේවල් පිළිබඳවයි කථා කරන්නේ. අධ්‍යාපන ප්‍රතිසංස්කරණයෙන් අපි බලාපොරොත්තු වන අරමුණ අපට ඉෂ්ට කර ගන්න පුළුවන්ද කියන ප්‍රශ්නය තිබෙනවා.

ගරු අගමැතිතුමියනි, Grade 5වල තිබෙන බුද්ධි පරීක්ෂණයට Kindergarten එකේ ඉඳලා ටියුෂන් දෙන යුගයක තමයි අපි ඉන්නේ. ඒ ගැන බලන්නකෝ. බුද්ධි පරීක්ෂණය කියන්නේ දැනුම මැනීමක් නොවෙයි. ඒක මිනිසාගේ සිතීමේ හැකියාව, තර්කශීලී බව සහ නව ගැටලු විසඳීමේ හැකියාව මනින එකක්. කට පාඩම් කිරීමෙන් එහාට දශමයක්වත් යන්න බැරි තත්ත්වයට අපි පත් වෙලා තිබෙන්නේ ඇයි? මේ ප්‍රශ්නයට අපි උත්තර දුන්නාද? ඇයි, මේ තත්ත්වයට අපි පත් වෙලා ඉන්නේ? ඒකට තිබෙන මූලික හේතුව හඳුනා ගැනීම ගැන අපි අනිවාර්යයෙන් සිතන්න ඕනෑ. ඒ සඳහා කියන්න මම ඔබතුමාගේ අවසරය ලබා ගන්නම්.

අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ගැන මට කියන්න තිබෙන්නේ මේකයි. අනාගතයේ job market එකට පොර කෑම සඳහා, තිබෙන ඉහළම තනතුරු ලබා ගැනීම සඳහා job market එකට දරුවන් හැදෙන ක්‍රමවේදයක් එනතුරු මේ ප්‍රශ්නය එහෙමම තිබෙනවා. ඊට පසුව අපට තිබෙන්නේ මොනවාද? කඩඉම් පරීක්ෂණ තිබෙනවා. Grade Five Scholarship Exam එක යම්කිසි කඩඉම් පරීක්ෂණයක්, හොඳ ඉස්කෝලයකට ඇතුළත් වෙන්න. A/L කඩඉම් පරීක්ෂණයක්, විශ්වවිද්‍යාලවලට ඇතුළත් වෙන්න. අපි හිතමුකෝ, මොඩියුල ක්‍රමයක් ගෙනැල්ලා තරග විභාගය ඉවත් කළා කියලා. නමුත්, එතැනින් මේ ප්‍රශ්නය ඉවර වෙන්නේ නැහැ. ඊට පසුව වෙන්නේ මේකයි. මම ඇත්තටම දක්ෂයි කියලා හිතමු. නමුත්, මම දක්ෂ වුණු පලියට මා කැමැති විශ්වවිද්‍යාලයකට යන්න, මම කැමැති ඉහළම වෘත්තීමය රැකියාව ලබා ගන්න බැහැ. ඒ වෙනුවෙන් මට සිද්ධ වෙනවා, මගේ පන්තියේ ඉන්න අනෙක් ළමයාට වැඩිය එක ලකුණක් හරි වැඩිපුර ගන්න. ඒ නිසා අපි ඒ සඳහා ටියුෂන් යනවා. ඒකත් බැරි නම් අපි කොහොම හරි ටීචර්ව ෂේප් කරගෙන assignment එකේ ලකුණු වැඩි කර ගන්න හදනවා. මේ අධ්‍යාපන ක්‍රමයේ තිබෙන ප්‍රශ්නය ඒක නොවෙයි. තිබෙන ප්‍රශ්නය මෙයයි. අපි GDP එකෙන් අධ්‍යාපනයට සියයට 6ක් නොවෙයි, සියයට 10ක් වෙන් කළත් රැකියාව සඳහා පොර කෑමට දරුවන් සෑදීමේ අධ්‍යාපන ක්‍රමය වෙනස් කරන්න ඕනෑ. ඒක වෙනස් කරන්නේ කොහොමද?

සමාජයේ යම්කිසි මතයක් තිබෙනවා, ඉහළ වෘත්තීන් පිළිබඳව. ඒ කියන්නේ, වෛද්‍යවරයෙක් වෙන්න බැරි වුණොත් ඉංජිනේරුවෙක්, අපි වාගේ mathematics කරලා ඉංජිනේරුවෙක් වෙන්න ලැබුණේ නැත්නම් නීතිඥයෙක්, එහෙම බැරි නම් accountant කෙනෙක්, එහෙමත් බැරි නම් teacher කෙනෙක් වෙන්න ඕනෑ කියලා මතයක් තිබෙනවා. අපේ අනුර කුමාර දිසානායක මැතිතුමා Physical Science කරලා අද වනකොට රටේ ජනාධිපතිතුමා වෙලා සිටිනවා. දරුවන්ට තිබෙන සහජ හැකියාවයි, ලැදිකමයි එක්ක අධ්‍යාපනය ලබාගෙන රැකියාවක් ලබා ගත්තාම, ඒ රැකියාවට වටිනාකමක් දෙන ක්‍රමයක් ඔයගොල්ලන් හැදුවාද? නැහැ නේ. කුණු ඉවත් කරන ට්‍රැක්ටරයේ driver එනකොට "මට හරි ආසයි මේක පදින්න" කියලා මගේ පුතා කියනවාය කියලා අපි හිතමු. නමුත්, මම කවදාවත් මගේ පුතාව කුණු ට්‍රැක්ටරයේ driver හැටියට වැඩ කරන්න යවනවාද? හැබැයි, ඒක බොහොම වැදගත් job එකක්. නමුත්, සමාජයේ සම්මතයක් තිබෙනවා, ඒවා පහළ මට්ටමේ jobs, ඒ රැකියාවලට වටිනාකමක් නැහැ, සමාජයේ අගයක් නැහැ, හොඳ විවාහයක් කර ගන්න බැහැ, විවාහයක් කරගෙන දෑවැද්දක් ලබා ගන්න බැහැ කියලා. මේ වාගේ සමාජ ක්‍රමයක් තබා ගෙන අපි අධ්‍යාපන ප්‍රතිසංස්කරණයේ වැරැදි තැනකින් අල්ලා ගෙන ඉන්නේ. අපි ඉස්සෙල්ලා මේ ආණ්ඩුවෙන් විශේෂයෙන් බලාපොරොත්තු වුණේ මේකයි. I also belong to a generation who had faced all these problems. Mathematics කරලා engineer කෙනෙක් වෙන්න බැරි වුණාම අම්මලා, තාත්තලාගේ සැහෙන දෝෂාරෝපණයට අපි ලක් වුණා. මේ ක්‍රමය වෙනස් කරන්න නම්, අපේ ආර්ථික ක්‍රමයත්, අනාගතයේදී අපට ලැබෙන්න තිබෙන රැකියා වෙළෙඳ පොළ සම්බන්ධයෙන් තිබෙන සංකල්පයත් වෙනස් කරලා, දරුවන්ගේ සහජ හැකියාවන්වලට සුදුසු, තමන් කැමති, සමාජයේ ගරු කළ හැකි ඕනෑම තැනකින් රැකියාවක් ලබා ගත හැකි තත්ත්වයක් ඇති කිරීම වැදගත් කියන කාරණයත් කියමින් මගේ කථාව අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා. ඔබතුමාගේ පැහැදිලි කිරීම සඳහා විනාඩි 2ක කාලයක් තිබෙනවා.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)

Thank you very much, Sir.

Since I have just two-and-a-half minutes, all what I want to do, Madam Prime Minister, is to reiterate the points in the letter sent to you by the Federation of University Teachers' Association. In doing that, I want to highlight three points in that. One is the election of Deans and in that, to include prior administrative experience as a criterion for eligibility. That is the first point. The second point states, clarify that two terms refer to two consecutive three-year terms and the third point is on the removal of Deans and Heads of Departments. That is, to clearly specify the valid grounds for removal such as misconduct, incapacity, inefficiency or loss of confidence by the Faculty Board. They ask you to ensure a due process through the provision of written charges, the right to a hearing and an appeal mechanism to an independent body. The final point, Madam Prime Minister, is on cross-department appointments. There, what the FUTA is insisting on - we all also agree - is the requirement of a mandatory consultation with the relevant department prior to making such appointments. So, in the whole, the objective is to essentially maintain the autonomy of universities, instead of politicizing the activities of the universities, appointing various people based on political affiliations and to provide democratic rights inside that institution. I think, Madam, once you were also a Head of a Department, were you not? And you were not the most senior person, were you?

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය (අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය)**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய - பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சரும்)
(The Hon. (Dr.) Harini Amarasuriya - Prime Minister and Minister of Education, Higher Education and Vocational Education)

It was by rotation.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)

Okay, by rotation. What I am saying is, you got the opportunity to be the Head of the Department because your colleagues thought you would do a good job there. So, I think that needs to be maintained and that should not be politicized. If your contemporaries or your colleagues believe that you could do a good job, you should be given that job.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

Hon. Member, your time is over.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)

Sir, I will take just 30 seconds.

Also, I thought you did very well in Davos, representing the country. I just wanted to let you know that within my 30 seconds.

Thank you very much.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

අග්‍රාමාත්‍ය ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය. ඔබතුමියට විනාඩි 12ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.48]

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය (අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය)**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய - பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சரும்)
(The Hon. (Dr.) Harini Amarasuriya - Prime Minister and Minister of Education, Higher Education and Vocational Education)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද විවාදයට ගනු ලබන විශ්වවිද්‍යාල (සංශෝධන) පනත් කෙටුම්පතේ සංශෝධනවල අරමුණු පිළිබඳව මට කලින් කථා කරපු ආණ්ඩු පක්ෂයේ මැති ඇමතිවරු සියලුදෙනාම හොඳින් පැහැදිලි කළා. කිසිසේත්ම මෙය දේශපාලනීකරණයට හෝ ප්‍රජාතන්ත්‍රවාදී අවකාශය පටු කරන්න අපි ගන්නා උත්සාහයක් නොවෙයි. ඇත්තවශයෙන්ම ඒකේ අනෙක් පැත්ත ක්‍රියාත්මක කරන්නයි අපි උත්සාහ කරන්නේ. ඒ වාගේම, විපක්ෂයේ ගරු මන්ත්‍රීවරු සඳහන් කළ සමහර කරුණු අපි Committee Stage එකේදී ගෙනෙන Amendmentsවලට ඇතුළත් කර තිබෙනවාය කියන එකත් මම කියන්න කැමැතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේක පිටුපස විශාල සංවාදයක් තිබෙනවා. FUTA එකේත්, විශ්වවිද්‍යාල ප්‍රජාවේත් කාලයක් තිස්සේ තිබුණු ඉල්ලීමක් තමයි, විශේෂයෙන්ම අංශාධිපතිත්, පීඨාධිපතිත් පත් කිරීමේ ක්‍රියාවලිය ප්‍රජාතන්ත්‍රවාදී විය යුතුයි කියන එක. විශේෂයෙන්ම අපේ අනිල් ජයන්ත ඇමතිතුමා කිව්ව විධියට මෙම ක්‍රියාවලිය කල්ලි මත සිදු වන එක පුළුවන් තරම් සීමා කරලා, එම ක්‍රියාවලිය විවෘත කරන්න කියන ඉල්ලීමත් දිගින් දිගටම තිබුණා. විශේෂයෙන්ම මමත් සම්බන්ධ වුණු වාර්තාවක් ගැන අද කථා වෙනවා මම අහගෙන හිටියා. ඒ වාර්තාවේ තිබෙන ඉල්ලීමත් ඒකම තමයි. ඒ වාර්තාවේ තිබෙන දේවල් තමයි අපි දැන් ක්‍රියාත්මක කරගෙන යන්නේ. ඇත්තටම ඒ වාර්තාවේ තිබෙන නිර්දේශ ආයතනගත කරන්නත්, නීතියට එකතු කරන්නත් තමයි දැන් අපි මේ සංශෝධන ඉදිරිපත් කරමින් මැදිහත් වෙන්නේ. ඒ වාර්තාව මම දැක්කේ නැහැ. හැබැයි, මා දන්නා තරමින් 2015දී විතර විශ්වවිද්‍යාල ආචාර්යවරුන්ගේ සම්මේලනය සහ UGC එක එකතු වෙලා කරපු වැඩමුළුවක වාර්තාවක් තිබෙනවා. එම වාර්තාවේ නිර්දේශ ගණනාවක් තිබෙනවා. ඒ නිර්දේශ අනුව තමයි අපි විශ්වවිද්‍යාල තුළ ප්‍රජාතන්ත්‍රකරණය තවත් ශක්තිමත් කරන්න වැඩ කරමින් යන්නේ. ඒ සඳහා අවශ්‍ය තවත් සංශෝධන අපි ඉදිරියේදීත් ගෙනෙනවා. නමුත්, ඔබ සියලුදෙනාම දන්නවා, විශ්වවිද්‍යාල සම්බන්ධයෙන් මෙවැනි සංශෝධන ගෙනෙනකොට සාකච්ඡා අවශ්‍යයි වාගේම ඒවා ගැන හොඳ අධ්‍යයනයකුත් අවශ්‍යයි කියන එක. ඒ සඳහා අපි කමිටුවකුත් පත් කරලා තිබෙනවා. එම කමිටුවේ නිර්දේශ අනුව අපි ඒ කටයුතු කරගෙන යනවා.

ඇත්තටම මෙතැනදී කියැවුණු එක් කාරණයක් මට තේරෙන්නේ නැහැ. Sir Ivor Jennings බලාපොරොත්තු වුණු university autonomy එකට මෙතැනදී හානියක් සිද්ධ වෙනවා, මෙතැන දේශපාලනීකරණයක් වෙනවා කියලා සඳහන් කළා. ඒක සිද්ධ වෙන්නේ කොහොමද කියන එක මට නම් කිසිසේත්ම පැහැදිලි වුණේ නැහැ. මේ ගෙනෙන සංශෝධනය හරහා එවැනි දේශපාලනීකරණයක් සිද්ධ වෙන්නේ කොහොමද කියලා විපක්ෂයෙන් පැහැදිලි කළේත් නැහැ. ඇත්තටම මේ සංශෝධන තුළින් කරලා තිබෙන්නේ අංශාධිපති පත් කිරීමත්, විශේෂයෙන්ම පීඨාධිපති පත් කිරීමට තිබෙන pool එක තවත් පුළුල් කරලා, තව අවස්ථාව වැඩි කරන එකයි. ඒ වාගේම, ඒ හරහා ඊට තිබුණු සීමා අයින් කරලා, ඒකට qualify වෙන්න පුළුවන් ප්‍රමාණය වැඩි කරන එක තමයි මේ සංශෝධන තුළින් කරලා තිබෙන්නේ. දීර්ඝ සාකච්ඡාවක් හා සංවාදයක් හරහා තමයි අපි මේ සංශෝධන ඇතුළත් කළේ. විශ්වවිද්‍යාල ආචාර්යවරුන්ගේ සම්මේලනයෙන් ගෙනාපු යෝජනාත්, පසුව ගෙනාපු යෝජනාත් අපි Committee Stage එකේදී Amendments හැටියට ඉදිරිපත් කරන්නත් බලාපොරොත්තු වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන් අපේ රටේ රාජ්‍ය විශ්වවිද්‍යාල රජයේ මුදල් වැය කරමින් පවත්වාගෙන යන විශ්වවිද්‍යාල බව අපි හොඳින් දන්නවා. These are public universities and they have to be publicly accountable. මම හිතන විධියට 1960 ගණන්වල පාර්ලිමේන්තුව තුළ විශිෂ්ට සංවාදයක් තිබුණා, විශ්වවිද්‍යාලයක autonomy එක සහ public accountability එක අතර තිබෙන tension එක පිළිබඳව. එක පැත්තකින් විශ්වවිද්‍යාලයක් ඉතාම ස්වාධීනව තීන්දු තීරණ ගත යුතුයි කියන ඒ academic autonomy එක තිබෙන්න ඕනෑ අතරේ publicly-funded universities හැටියට ඔවුන් මහජනතාවටත් වගකිව යුතුයි කියන සංවාදය මට මතක විධියට 1960 ගණන්වල මේ සභාව තුළ සිද්ධ වුණා. ඒ සංවාදය හරහා තමයි අද කවුන්සලයට පත් කරනකොටත් කවුන්සලයේ external members, ඒ කියන්නේ විශ්වවිද්‍යාලයෙන් පිට ඉන්න අය, ඇතුළේ ඉන්න අයට වඩා එකකින් වැඩි වෙන්නේ. ඒ සංයුතිය ගත්තාම, *ex-officio* ඉන්න පිරිස, ඒ කියන්නේ විශ්වවිද්‍යාලය තුළින් ඉන්න ඕනෑ පිරිස පහයි කියලා අපි හිතුවොත්, එළියෙන් පත් වෙන පිරිස හැම තිස්සේම ඊට වඩා එකක් වැඩියි. එහෙම පත් කරන external membersලාට, එහෙම නැත්නම් පිටින් පත්වෙච්ච සභාවේ සාමාජිකයන්ට තිබෙන විශේෂ වගකීම තමයි යම්කිසි විධියකින් මහජනතාව වෙනුවෙන් විශ්වවිද්‍යාලය තුළ පෙනී සිටීම. මහජනතාවගේ interest එක, public interest එක වෙනුවෙන්,

public accountability එක වෙනුවෙන් පෙනී සිටීම. ඒ අර්ථයෙන් තමයි ඒ විධියට පත් කරලා තිබෙන්නේ. ඒ අර්ථයෙන්ම තමයි ඒක ඇමතිවරයාගේ පත්වීමක් බවට පත්වෙන්නේත්. එතැන තර්කය වුණේ, ඇමතිවරයා මහජන නියෝජිතයෙක්; එතකොට මේ සභාවට ඇමතිවරයා පත්කළ යුත්තෙත් මහජනතාව නියෝජනය කරන පුද්ගලයන් කියන එක.

අපි දන්නවා, ප්‍රායෝගිකව ඒක එලෙසම සිද්ධ වුණේ නැහැ කියලා. බොහෝ අවස්ථාවල විකෘති විධියට ඒ පත්වීම් සිද්ධ වුණා. සුදුසු අය නොවෙයි පත් වුණේ. අපි එවැනි අවස්ථා ගැන අහලා තිබෙනවා. අපි අහලා තිබෙනවා විතරක් නොවෙයි, අපි හොඳින් දන්න අවස්ථා තිබෙනවා. සමහර වෙලාවට නිල පාලක සභාව රැස්වීමට පෙර ඇමතිවරයා පාලක සභාව රැස්කරලා විය යුතු දේ මොනවාද කියලා agenda එක පවා හැදූ අවස්ථා ගැන මීට පෙර වාර්තා වෙලා තිබෙනවා. නමුත් ඒකේ අදහස වුණේ ඒක නොවෙයි. ඒකේ අදහස වුණේ public university එකක් වීම නිසා public accountability කියන එකත් අතිශයින්ම වැදගත් කියන එකයි. Academic autonomy කියන එක හා සමානව public accountability එකත් ආරක්ෂා විය යුතුයි. ඒ නිසා අපි මේ ගෙනෙන සංශෝධනය තුළ කිසිසේත්ම university autonomyවලට කිසිම හානියක් වෙන්නෙත් නැහැ; දේශපාලනීකරණය කරන්න උත්සාහයකුත් නැහැ. ඇත්ත වශයෙන්ම මෙතැනින් සිද්ධ වෙන්නේ විශ්වවිද්‍යාල ප්‍රජාව තව ශක්තිමත් වෙන එක. තමන්ගේ පරිපාලනයට පත් විය යුතු අය පත් කිරීමේදී විශ්වවිද්‍යාල ප්‍රජාව තව බලවත් කරන එක තමයි සිද්ධ වෙන්නේ. ඒ නිසා මේකට ගෙනැවිත් තිබෙන විවේචන එච්චර වලංගු නැහැ කියලා තමයි මට කියන්න වෙන්නේ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Order, please! මේ අවස්ථාවේ ගරු කථානායකතුමා මූලාසනයට පැමිණෙනවා ඇති.

***අනතුරුව ගරු කේ. සුජිත් සංජය පෙරේරා මහතා මූලාසනයෙන් ඉවත් වුයෙන්, ගරු කථානායකතුමා මූලාසනාරූඪ විය.***
*அதன்பிறகு, மாண்புமிகு கே. சுஜித் சஞ்ஜய பெரேரா அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.*
*Whereupon THE HON. K. SUJITH SANJAYA PERERA left the Chair, and THE HON. SPEAKER took the Chair.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අද දින සභාවේ කටයුතු අවසන් වන තෙක් කාලය ලබා දීමට සභාව එකඟද?

**ගරු මන්ත්‍රීවරු**
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
Aye.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු අග්‍රාමාත්‍යතුමිය කථා කරන්න.

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)
බොහොම ස්තුතියි, ගරු කථානායකතුමනි. මට මේ වෙලාවේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ පිළිබඳව එන කරුණු පිළිබඳවත් වචන කිහිපයක් කියන්න අවශ්‍යයි. මම ගරු විපක්ෂයෙන් ඉල්ලා සිටිනවා, අපේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ පිළිබඳ අන්තර්ගතය හරියට හදාරලා මේ විවේචන ඉදිරිපත් කරන්න කියලා. නැත්නම් ඇත්තටම මෙතැන අධ්‍යාපන ප්‍රතිසංස්කරණ සඳහා තිබිය යුතු සංවාදය අපට ගන්න බැහැ. මේ විධියට දකින දකින එකෙන් දමලා ගහනකොට ඇත්තටම අපට අවශ්‍ය වන ප්‍රයෝජනවත් සංවාදය ඇති වෙන්නේ නැහැ. අධ්‍යාපන ප්‍රතිසංස්කරණ පිළිබඳ ප්‍රයෝජනවත් සංවාදයක් අවශ්‍යයි. අපිට ඒ විවාදය ගන්න අමාරු වෙනවා, මේ වෙලාවට ක්‍රෝධයෙන් සහ වෛරයෙන් දකින දකින ඒවායින් දමලා ගහන්න උත්සාහ කරන නිසා.

උදාහරණයක් හැටියට මම මේක කියන්නම්. ගරු විපක්ෂ නායකතුමා ඊයේ ලැයිස්තුවක් කියවලා අහනවා, මේ ප්‍රතිසංස්කරණවල මේවා තිබෙනවාද කියලා. ගරු කථානායකතුමනි, අපි ඉදිරිපත් කරලා තිබෙන සහ මේ සභාවට සභාගත කරපු සංකල්ප පත්‍රිකාව තුළ තිබෙනවා, ජාතික අධ්‍යාපනික ඉලක්ක මොනවාද කියලා. මම මිනිත්තු දෙකක් අරගෙන ඒක කියවන්නම්, ගරු කථානායකතුමනි. මොකද, අපි නැවත නැවත අවධාරණය කළ යුතුයි, අපි කරන්න යන්නේ මොකක්ද කියන එක.

පළමුවැනි එක, මිනිස් අගයන්ට ගරු කිරීම මත පදනම්ව පුද්ගලයන්ගේ නීරෝගී සහ ප්‍රීතිමත් ජීවන රටාවක් සඳහා අවශ්‍ය ශාරීරික, මානසික, අධ්‍යාත්මික, සමාජ චිත්තවේගීය සහ පාරිසරික යහ පැවැත්ම ප්‍රවර්ධනය කිරීම. මේ, ජාතික අධ්‍යාපන ඉලක්ක. ඒ ඉලක්ක අනුව තමයි විෂයමාලාව හැදෙන්නේ; අන්තර්ගතය හැදෙන්නේ. දෙවැනි එක, ජාතික අවශ්‍යතා සහ ගෝලීය ප්‍රවණතා සමඟ සමපාතව තාක්ෂණික, සමාජ ආර්ථික සහ සංස්කෘතික දියුණුව සඳහා දැනුම, කුසලතා, ආකල්ප සහ මානව ගුණාංග සංවර්ධනය කිරීම. තුන්වැනි එක, කුතුහලය, විවේචනාත්මක චින්තනය, ගැටලු විසඳීමේ කුසලතා, නිර්මාණශීලීත්වය සහ නවෝත්පාදන හැකියාව සහිත ඵලදායී පුද්ගලයන් බිහි කිරීම. හතරවැනි එක, සමාජ සාධාරණත්වය සහ ප්‍රජාතන්ත්‍රවාදී ජීවන රටාවක සම්මතයට අනුකූලව යුතුකම් සහ වගකීම් ඉටු කරමින් මානව අයිතිවාසිකම් සහ රටේ නීති කෙරෙහි ගෞරවය ප්‍රවර්ධනය කිරීම. පස්වැනි එක, වෙනස්කම් කළමනාකරණය කිරීම සහ සංකීර්ණ සහ අනපේක්ෂිත තත්ත්වයන්ට මුහුණදීමට පුද්ගලයන් දියුණු කිරීම. හයවැනි එක, දේශීය හා ගෝලීය අභියෝගවලට ප්‍රතිචාර දක්වමින් ජාතියේ සංස්කෘතික හා පාරිසරික උරුමය ආරක්ෂා කිරීම. හත්වැනි එක, ඉගෙනීමට, ඉගෙනීමේ හැකියාව වැඩිදියුණු කිරීම සඳහා සිහි බුද්ධියෙන් හා ස්වයං විඥානාත්මක ඉගෙනුම් ලබන්නෙකු ප්‍රවර්ධනය කිරීම.

ඊයේ ගරු විපක්ෂ නායකතුමා ලැයිස්තුවක් කියෙව්වා. Digital literacy ගැන කිව්වා, Data Science ගැන කථා කළා. Cybersecurity, Data Analytics ආදී වශයෙන් ලැයිස්තුවක් කියෙව්වා නේ. ඇත්තටම ගරු කථානායකතුමනි, ඒක පොතක අන්තර්ගතය - table of contents - වාගේ. අපි 6 වසරේ ඉඳන් 13 වසර වෙනකම් මේවා උගන්වන්න ඕනෑ. පළමුවැනි වාරයේ සියල්ලම උගන්වන්නේ නැහැ නේ. නමුත් අන්තර්ගතය දිහා බැලුවා නම් එතුමාට තේරුම් ගන්න පුළුවන්, මේ ජාතික අරමුණුවලට අනුකූල යෝජිත කුසලතා මොනවාද කියලා. මම ඒවායින් දෙක, තුනක් කියන්නම්. පළමුවැනි එක, පදනම් සාක්ෂරතා. ඒ යටතේ තිබෙනවා, සාක්ෂරතාව, සංඛ්‍යා සාක්ෂරතාව, විද්‍යාත්මක සාක්ෂරතාව, අධ්‍යයන සාක්ෂරතාව, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සාක්ෂරතාව, මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව, සංස්කෘතික හා සෞන්දර්යාත්මක සාක්ෂරතාව, මූල්‍ය හා ව්‍යවසායකත්ව සාක්ෂරතාව. දෙවැනි එක, ඩිජිටල් හා අනාගත කුසලතා. ඒ යටතේ තිබෙනවා, ඩිජිටල් ප්‍රවීණතාව, කේතකරණය - coding, කෘත්‍රිම බුද්ධිය පිළිබඳ දැනුවත්භාවය, දත්ත සාක්ෂරතාව සහ මාර්ගගත ආරක්ෂාව.

[ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය]

මේවා තමයි අපේ මේ යෝජනා කරලා තිබෙන අධ්‍යාපන ප්‍රතිසංස්කරණවල ඉලක්ක සහ දියුණු කළ යුතුයි කියලා හඳුනාගෙන තිබෙන කුසලතා. ඒ අනුව තමයි syllabus එක හැදෙන්නේ, curriculum එක හැදෙන්නේ; අන්තර්ගතය හැදෙන්නේ. එතකොට මේවා බලන්නේ නැතුව ඇවිල්ලා අර table of contents වාගේ දෙයක් කියාගෙන කියාගෙන යනකොට ඇත්තටම අපි කොහොමද ඵලදායී විධියට මේවා ගැන සංවාදයක් කරන්නේ? ඒක නිසා තමයි මම අපේ විපක්ෂයට පුන පුනා යෝජනා කරන්නේ මේකේ අන්තර්ගතය හරියට කියවලා, ඇත්තටම අපිට අවශ්‍ය වන සාධනීය විවේචනත් ඉදිරිපත් කරලා දියුණු සංවාදයකට අපි ලැහැස්ති වෙමු කියලා.

විශේෂයෙන්ම අද ගෝලීය අධ්‍යාපනය ගැන කථා කරනකොට, ගෝලීය අධ්‍යාපන ප්‍රතිපත්ති ගැන කථා කරනකොට කථා වෙන ප්‍රධාන ඉලක්ක දෙකක් තිබෙනවා. ඒ, "Lifelong Learning" කියන එකයි, "Leaning to Learn" කියන එකයි. මේ දෙකම තිබෙනවා, අපේ ඉලක්ක හැටියට. මම ඒක වැදගත් කියලා කියන්නේ ඇයි? අද ලෝකය වෙනස් වන වේගයත් එක්ක ඇත්තටම අපිට දරුවෙකුට මොන වාගේ කුසලතාද, මොන වාගේ දැනුමද අද දිය යුත්තේ කියලා තීරණය කරන්න බැහැ.

එච්චරටම වේගයෙන් ඒවා වෙනස් වෙනවා. අපට දරුවෙකුට දෙන්න පුළුවන් වෙන්නේ එසේ වේගයෙන් වෙනස් වන ලෝකයත් එක්ක ගනුදෙනු කරමින් ඉදිරියට යන්නට අවශ්‍ය ශක්තිය හා කුසලතායි. ඒ නිසා තමයි "Lifelong Leaning" කියන සංකල්පය මෙතැනදී වැදගත් වෙන්නේ. ඉගෙන ගත යුත්තේ නිශ්චිත කාල රාමුවක් තුළ විතරක් නොවෙයි. ජීවිතය පුරාම ඉගෙන ගන්න පුළුවන් වෙන්න ඕනෑ. රැකියාවක් කරන ගමන් නැවත වතාවක් ඉගෙනුම් ක්‍රියාවලියට එන්න පුළුවන් වෙන්න ඕනෑ; ඉගෙන ගන්නා ගමන් රැකියාවක් කරන්න පුළුවන් වෙන්න ඕනෑ. මේ සියල්ලටම අවශ්‍ය flexibility එක අප මේ යෝජනා කර තිබෙන අලුත් අධ්‍යාපන ව්‍යුහය තුළ ඉදිරිපත් කර තිබෙනවා. විශේෂයෙන්ම "Learning to Learn" කියන එක, ඉගෙන ගැනීමට ඉගෙන ගන්නා එක තමයි වැදගත්ම දේ. මොකද, අපි තවදුරටත් දරුවන්ට කරුණු විතරක් උගන්වා හරි යන්නේ නැහැ. කරුණු ඉගෙන ගෙන කට පාඩම් කරගෙන ඇවිල්ලා ඒවා test paper එකකට ලියන එක නොවෙයි, කුසලතාව කියන්නේ. කරුණු සොයා ගෙන යන එක, ඒවා අධ්‍යයනය කරන එක, සත්‍ය අසත්‍ය හරියට තෝරා ගැනීමේ හැකියාව කියන මේ සියල්ල තමයි අප මේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ හරහා ඉදිරිපත් කරන්න උත්සාහ කරන්නේ.

ඊළඟට, අප ඉදිරිපත් කරන මේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණවල තිබෙන වැදගත්ම දේ තමයි vocational pathway එක දරුවන්ට විවෘත කරන එක. වෘත්තීය අධ්‍යාපනය, තාක්ෂණ අධ්‍යාපනය කියන එකට ආශාව ඇති කරන එක, ඒකත් එක්ක කුතුහලය ඇති කරන එක, ඒකට වටිනාකමක් දෙන එක, ඒක අධ්‍යාපනයේ කොටසක් බවට පත් කරන එක මේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණවල ඉදිරිපත් කර තිබෙන වැදගත්ම දෙයක්. ඒ හරහා රැකියාවකට විතරක් සීමා නොවී, හොඳ පුරවැසියෙකු බිහි කිරීම සඳහා අවශ්‍ය කුසලතා සියල්ල ඇති කරන්නත් මේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ තුළ අපි යෝජනා කර තිබෙනවා.

ගරු කථානායකතුමනි, 6 ශ්‍රේණියේ module එකක ප්‍රශ්නයක් ඇති වුණා. ඒ වැරැද්ද අපි භාර ගත්තා. ඒ වැරැද්ද භාරගෙන ඒක නිවැරැදි කරන්න අපි වහාම කටයුතු කළා. ඒක තමයි වගකිව යුතු ආණ්ඩුවක් හැටියට කළ යුත්තේ. ඒක නිවැරැදි කරන එක අපේ වගකීම. එම වගකීමත් එක්ක තමයි අප මේ කටයුතු ක්‍රියාත්මක කරන්නේ. නමුත් එතැනදී විපක්ෂය කරන්න උත්සාහ කළේ මොකක්ද? ඒ කාරණය ඔසවා ගෙන මේකේ අන්තර්ගතය ගැන කිසිම දැනුමක් නැතුව, කිසිම හැඟීමක් නැතුව ඉතාම වෛරී අන්දමින් හැසිරුණා. මොකද, හැම අවස්ථාවකම බලන්නේ මොකක් හරි අල්ලා ගෙන මේ ආණ්ඩුව පෙරළන්න නේ. අප්‍රේල් නොවෙයි, දෙසැම්බර්වලද කොහේද තව ජනාධිපති කෙනෙක් එනවා කියනවා මම දැක්කා. ඔන්න ඔය - *[බාධා කිරීම්]* නැහැ, නැහැ, ආයෙත් කියනවා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
අගමැතිත් අයින් කරනවා කිව්වා. - *[බාධා කිරීම්]*

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)
ඔව්, අගමැතිත් අයින් කරනවා කිව්වා නේ. දැන් ඒ යෝජනාවත් ඉල්ලා අස් කරගෙනද කොහේද. කවදාද ඒක ගෙනෙන්නේ? *[බාධා කිරීම්]* මම ඒක එනකල් බලාගෙන ඉන්නේ. *[බාධා කිරීම්]* No-Confidence Motion එක ගෙනෙනකල් මම මේ බලාගෙන ඉන්නේ. ජනාධිපති අයින් කර ගන්න බැරි වුණාම අඩුම තරමේ අගමැති අයින් කර ගන්න උත්සාහ කළා නේ. කෝ ඉතින්! ඒ උත්සාහයත් දැන් නැහැ නේ. මම අද උදේ ඇවිල්ලා, දුවගෙනම මෙහි ආවේත් No-Confidence Motion එකට මුහුණ දෙන්න කියලා. කෝ? ගෙනෙන්නේ නැද්ද? *[බාධා කිරීම්]* අපරාදේ! අපි නම් ලැහැස්ති වෙලා හිටියේ.

මම එකක් කියන්නම්. No-Confidence Motion එක ඔබතුමන්ලා ගෙනෙන්න ඕනෑ නැහැ. මේ අගමැති වෙනස් වෙන්න ඕනෑ කියලා මේ රටේ ජනතාව තීරණය කළාම අපි ගෙදර යන්නත් සූදානම්, හොඳද? අපි වග කියන්නේ මේ රටේ ජනතාවට; අපේ හෘදය සාක්ෂියට. ඒ අනුව අපි වැඩ කරගෙන යන්නම්.

ගරු කථානායකතුමනි, අපි මේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ගෙනෙන්නේ අද ලෝකයට ගැළපෙන පරිදියි. අද ලෝකය අතිශයින්ම සංකීර්ණයි; කාටවත් predict කරන්න බැරි විධියට වෙනස් වෙනවා. අපේ වාගේ රටවල් විතරක් නොවෙයි, දියුණුයි කියන රටවල් වුණත් අධ්‍යාපනය වෙනස් විය යුතු දිශානතිය ගැන අතිශයින් බරපතළ සාකච්ඡාවක ඉන්න මොහොතක, විශේෂයෙන්ම මේ පාර්ලිමේන්තුව තුළ අපි බාල, තුච්ඡ දෙකේ සාකච්ඡා කරලා වැඩක් නැහැ, ගරු කථානායකතුමනි. මෙතැනදී මේ සඳහා දියුණු සාකච්ඡාවක් අවශ්‍යයි. ඒ දියුණු සාකච්ඡාව ගන්න අප හැම වෙලාවේම සූදානම්. ඒ සඳහා මතුපිටින් පෙනෙන දේවල් දිහා බලන්නේ නැතුව, වචන ටිකක් විතරක් අහුලා ගන්නේ නැතුව මේ ප්‍රතිසංස්කරණවල අන්තර්ගතය හොඳට බලලා, ලෝකයේ සිද්ධ වන දේවල් ගැනත් හොඳින් අධ්‍යයනය කරලා ඒ බරින් අපි මේ සංවාදය කරමු කියන යෝජනාව කරමින්, මට මේ කාලය ලබා දීම සම්බන්ධව ස්තුතිවන්ත වෙමින් මම නිහඬ වෙනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
***පනත් කෙටුම්පත ඊට අනුකූලව දෙවන වර කියවන ලදී.***

*வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.*
*அதன்படி, சட்டமூலம் இரண்டாம் முறை மதிப்பிடப்பட்டது.*

*Question put, and agreed to.*
*Bill accordingly read a Second time.*

***මතු පළවන යෝජනාව සභා සම්මත විය:***
***''පනත් කෙටුම්පත පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවකට පැවරිය යුතු ය.'' - [ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය]***

*தீர்மானிக்கப்பட்டது:*
*"சட்டமூலம் முழுப் பாராளுமன்றக் குழுவுக்குச் சாட்டப்படுமாக." - [மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய]*

*Resolved:*
*"That the Bill be referred to a Committee of the whole Parliament." - [The Hon. (Dr.) Harini Amarasuriya]*

***කාරක සභාවේදී සලකා බලන ලදී.***
***[ගරු කථානායකතුමා මූලාසනාරූඪ විය.]***

*குழுவில் ஆராயப்பட்டது.*
*[மாண்புமிகு சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.]*

*Considered in Committee.*
*[THE HON. SPEAKER in the Chair.]*

***1 වන වගන්තිය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.***
*1ஆம் வாசகம் சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Clause 1 ordered to stand part of the Bill.*

## 2 වන වගන්තිය.- (1978 අංක 16 දරන පනතේ 49 වන වගන්තිය සංශෝධනය කිරීම)
### வாசகம் 2.- (1978ஆம் ஆண்டின் 16ஆம் இலக்கச் சட்டத்தின் 49ஆம் பிரிவைத் திருத்துதல்)
CLAUSE 2.- (*Amendment of section 49 of the Act, No. 16 of 1978)*

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)

ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධන ඉදිරිපත් කරනවා:

(1) "2 වන පිටුවේ, 1 වන සහ 2 වන පේළි ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'(ආ) යම් ජ්‍යෙෂ්ඨ මහාචාර්යවරයකු, මහාචාර්යවරයකු, ආශ්‍රිත මහාචාර්යවරයකු හෝ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයකු (I වන ශ්‍රේණිය), (අ)' "

(2) "2 වන පිටුවේ, 8 වන සහ 9 වන පේළි ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'ගැනීමෙන් පසුව ඒ ජ්‍යෙෂ්ඨ මහාචාර්යවරයා, මහාචාර්යවරයා, ආශ්‍රිත මහාචාර්යවරයා හෝ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයා (I වන ශ්‍රේණිය) එම අධ්‍යයන අංශයේ ප්‍රධානයා' "

(3) "2 වන පිටුවේ, 12 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

' "කරනු ලැබුවහොත් මිස," යන වචන වෙනුවට "කොමිෂන් සභාව විසින් නිශ්චිතව දක්වනු ලැබිය හැකි නිසි කාර්යපටිපාටියට අනුකූලව පාලක" ' "

(4) "2 වන පිටුවේ, 25 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'සඳහා තෝරා පත් කරනු නොලැබිය යුතු ය.' "

***සංශෝධන පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*திருத்தங்கள் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Amendments put, and agreed to.*

***2 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*2ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Clause 2, as amended, ordered to stand part of the Bill.*

## 3 වන වගන්තිය.- (ප්‍රධාන ප්‍රඥප්තියේ 51 වන වගන්තිය සංශෝධනය කිරීම)
### வாசகம் 3.- (முதன்மைச் சட்டவாக்கத்தின் 51ஆம் பிரிவைத் திருத்துதல்)
CLAUSE 3.- (*Amendment of section 51 of the principal enactment*)

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)

ගරු සභාපතිතුමනි, මම පහත සඳහන් සංශෝධන ඉදිරිපත් කරනවා:

(1) "4 වන පිටුවේ, 2 වන පේළියේ සිට 4 වන පේළිය දක්වා (එම පේළි දෙක ද ඇතුළුව) ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'සඳහා අධ්‍යයන අංශයක ප්‍රධානයා ලෙස පත් කරනු ලැබීමට සුදුසුකම් ඇති ජ්‍යෙෂ්ඨ මහාචාර්යවරයකු,' "

(2) "4 වන පිටුවේ, 8 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'ශ්‍රේණිය) නොමැති අවස්ථාවක දී, සනාතන සභාව විසින් තීරණය කරනු ලබන එම පීඨයේ' "

(3) "4 වන පිටුවේ, 18 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

' "කරනු ලැබුවහොත් මිස," යන වචන වෙනුවට "කොමිෂන් සභාව විසින් නිශ්චිතව දක්වනු ලැබිය හැකි නිසි කාර්යපටිපාටියට අනුකූලව පාලක" ' "

(4) "5 වන පිටුවේ, 11 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'වෙනත් තැනැත්තන් නොමැති අවස්ථාවක' "

***සංශෝධන පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*திருத்தங்கள் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Amendments put, and agreed to.*

***3 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***

*3ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*

*Clause 3, as amended, ordered to stand part of the Bill.*

***4 වන වගන්තිය, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*4ஆம் வாசகம் சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Clause 4 ordered to stand part of the Bill.*

*ප්‍රඥප්ති වගන්තිය සහ නාමය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.*
*පනත් කෙටුම්පත, සංශෝධන සහිතව වාර්තා කරන ලදී.*
*சட்டமாகு வாசகமும் தலைப்பும் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*சட்டமூலம் திருத்தங்களுடன் அறிக்கை செய்யப்பட்டது.*

*Enacting Clause and Title ordered to stand part of the Bill.*
*Bill reported with Amendments.*

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)
ගරු කථානායකතුමනි, "පනත් කෙටුම්පත සංශෝධිතාකාරයෙන් දැන් තුන්වන වර කියවිය යුතුය" යි මම යෝජනා කරමි.

තවද, පනත් කෙටුම්පතෙහි සෝදුපත්වල භාෂා දෝෂ, මුද්‍රණ දෝෂ, ව්‍යාකරණ දෝෂ හා අංක දෝෂ නිවැරැදි කර ගැනීම සහ ආනුෂංගික සංශෝධන සඳහා අවසර ලබා දෙන ලෙස ද ඉල්ලා සිටිමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*පනත් කෙටුම්පත ඊට අනුකූලව සංශෝධිතාකාරයෙන්, තුන්වන වර කියවා සම්මත කරන ලදී.*

*வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.*
*அதன்படி, சட்டமூலம் திருத்தப்பட்டவாறு மூன்றாம்முறை மதிப்பிடப்பட்டு நிறைவேற்றப்பட்டது.*

*Question put, and agreed to.*
*Bill, as amended, accordingly read the Third time, and passed.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාව විසින් අද දින අපර භාග 2.30ට පවත්වන ලද රැස්වීමේදී එළඹි තීරණය ප්‍රකාරව යෝජනාව ඉදිරිපත් කිරීම, ගරු පාර්ලිමේන්තුවේ සභානායකතුමා.

## පාර්ලිමේන්තුවේ කටයුතු
## பாராளுமன்ற அலுவல்
## BUSINESS OF THE PARLIAMENT

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

> "පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාව විසින් අද දින අපර භාග 2.30ට පවත්වන ලද රැස්වීමේ දී එළඹි තීරණය ප්‍රකාරව අද දින න්‍යාය පත්‍රයේ ප්‍රධාන වැඩ කටයුතුවල අංක 1 දරන විෂයයට ඉක්බිතිවම ඇතුළත් විය යුතු 'ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ වන යෝජනා සම්මතය' පිළිබඳ වැඩ පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 27හි විධිවිධානවලින් නිදහස් විය යුතු අතර, සභාවේ විශේෂ අවසරය ඇතිව අද දිනම එම යෝජනා සම්මතය පාර්ලිමේන්තුව විසින් සම්මත කරනු ලැබිය යුතු ය."

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
ගරු කථානායකතුමනි, -

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
ගරු කථානායකතුමනි, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41අ. ව්‍යවස්ථාව අනුව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවට සිවිල් සමාජයේ පුද්ගලයන් තිදෙනෙකු ගරු අගමැතිනියගේත්, ගරු විපක්ෂ නායකතුමාගේත් එකඟතාවෙන් හඳුනාගෙන ඇති බව පක්ෂ නායක රැස්වීමේදී අපට දැනුම් දුන්නා. දැන් ඒ ගෞරවනීය නම් තුන මේ ගරු සභාවේ අනුමැතියට ඉදිරිපත් කරනකොට, ඒ තනතුරුවලට ගෞරවයක් වන පරිදි නිශ්චිත ක්‍රියා පටිපාටිය අනුගමනය කරමින් සිදු කළ යුතු බව අපි පක්ෂ නායක රැස්වීමේදීත් පෙන්වා දුන්නා. අපි එහෙම කිව්වේ නිවැරදි පාර්ලිමේන්තු සම්ප්‍රදාය අනුගමනය කිරීමේ වැදගත්කම නිසායි.

විශේෂයෙන්ම අගමැතිනියයි, විපක්ෂ නායකතුමායි හඳුනාගත් නම් තුන ගැන අපේ කිසිම විරුද්ධත්වයක් නැහැ. අපි අවධාරණය කළේ න්‍යාය පුස්තකයට ඇතුළත් කරලා නියමිත දින ගණනට පසුව ස්ථාවර නියෝග අනුව ගරු සභාවේ අනුමැතිය ලබා ගැනීම වඩා සුදුසු බවයි. ඒ යෝජනාව මෙහෙම කඩිමුඩියේ ගෙනෙන්නේ නැතුව න්‍යාය පුස්තකයට ඇතුළත් කරලා නියමිත දින ගණනට පසුව ඉදිරිපත් කරන්න කියන ඉල්ලීම තමයි අපි කළේ. ඒ බව මම ගරු සභාවට දැනුම් දෙන්න කැමැතියි.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, ඒ සඳහා ස්ථාවර නියෝගවල සම්පූර්ණ අවසරය තිබෙනවා. ස්ථාවර නියෝග 23 (1) යටතේ මෙසේ සඳහන් වනවා:

> "ප්‍රධාන වැඩකටයුතු, දිනට නියමිත කටයුතු හා යෝජනා පිළිබඳ දැනුම්දීම්වලින් සමන්විත විය යුත්තේ ය."

අපි තවමත් ඒ අවස්ථාවේ තමයි ඉන්නේ. ඒ පිළිබඳව ලේකම් මණ්ඩලය විසිනුත්, Parliamentary Business Committee එකේදී දැනුම් දුන්නා. එම නිසා දැන් ඒ නම් ඉදිරිපත් කිරීමෙන් කිසිම ආකාරයක අගෞරවයක් ඇති වෙන්නෙත් නැහැ, පාර්ලිමේන්තු සම්ප්‍රදායට හානියක් වන්නෙත් නැහැ. එකම දේ, 27 කියන ස්ථාවර නියෝගය පමණක් අපි suspend කරනවා. ඒක සාමාන්‍යයෙන් මීට කලින් අවස්ථා රාශියකදී සිදු වුණු දෙයක්. ඒ නිසා මේ කාරණයේදී කිසිම ආකාරයකින් ස්ථාවර නියෝග උල්ලංඝනය වීමක් සිදු වන්නේ නැහැ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමනි, ස්ථාවර නියෝග 23 (1) ප්‍රකාරවයි එම වැඩකටයුතු කරලා තිබෙන්නේ.

යෝජනාව ඉදිරිපත් කිරීම, ගරු අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය.

## ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව: ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවට නියෝජිතයන් පත් කිරීම
## அரசியலமைப்பின் கீழான தீர்மானம்: அரசியலமைப்புப் பேரவைக்கு உறுப்பினர்கள் நியமனம்
RESOLUTION UNDER THE CONSTITUTION: APPOINTMENT OF MEMBERS TO THE CONSTITUTIONAL COUNCIL

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)

ගරු කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

> "ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41අ. (1) (ඉ) (iii) ව්‍යවස්ථාව යටතේ පත් කරන ලද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ වත්මන් සාමාජිකයන්ගේ ධුර කාලය, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41අ. (8) (ආ) ව්‍යවස්ථාව යටතේ 2026.01.19 දින සිට ක්‍රියාත්මක වන පරිදි ඉකුත් වී ඇති හෙයින්;
>
> ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41අ.(1) (ඉ) (iii), 41අ. (4) සහ 41අ. (5) ව්‍යවස්ථා යටතේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවට අග්‍රාමාත්‍යතුමිය සහ විරුද්ධ පක්ෂයේ නායකතුමා යන දෙදෙනාගේම එකඟත්වය මත, කථානායකතුමා විසින් නාමයෝජනා කරනු ලැබ, ජනාධිපතිතුමා විසින් පත් කරනු ලබන පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් නොවන්නාවූ පහත සඳහන් තැනැත්තන් නම් කරනු ලැබීම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41අ. (5) ව්‍යවස්ථාව යටතේ පාර්ලිමේන්තුව විසින් අනුමත කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි:-
>
> 1. කලුපහේ ඔස්ටින් ප්‍රනාන්දු *මහතා;*
> 2. මහාචාර්ය වසන්තා සෙනෙවිරත්න *මහත්මිය;* සහ
> 3. උඩුනුවර ගම්පතිගේ රන්ජිත් ආරියරත්න *මහතා*"

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

අද දින සභාවේ විශේෂ අවසරය ඇතිව ගරු අග්‍රාමාත්‍යතුමිය විසින් ඉදිරිපත් කරන ලද යෝජනා සම්මතයට සභාව එකඟද?

**ගරු මන්ත්‍රීවරු**
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
Aye.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ඒ අනුව, "ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ වන යෝජනා සම්මතය" සභා සම්මත වූ බව ප්‍රකාශ කරමි.

සභාව කල් තැබීම. ගරු සභානායකතුමා.

## කල්තැබීම
## ஒத்திவைப்பு
ADJOURNMENT

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු කථානායකතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය" යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

## කල්තැබීමේ ප්‍රශ්න
## ஒத்திவைப்பு வினாக்கள்
ADJOURNMENT QUESTIONS

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මනෝ ගනේසන් මන්ත්‍රීතුමා.

**ගරු මනෝ ගනේසන් මහතා**
(மாண்புமிகு மனோ கணேசன்)
(The Hon. Mano Ganesan)

ගරු කථානායකතුමනි, මා මෙම ප්‍රශ්නය යොමු කරන්නේ, ගරු අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමා වෙතටයි.

ගරු ඇමතිතුමනි, මගේ සිංහල භාෂාව උච්චාරණයේ අඩුපාඩු තිබෙන්න පුළුවන්. නමුත්, මෙය ජනතාවාදී මෙන්ම සංවේදී ප්‍රශ්නයක්. එම නිසා සුදුසු උත්තරයක් ලැබෙයි කියලා මම බලාපොරොත්තු වනවා.

සමස්ත බන්ධනාගාර පද්ධතිය තුළ සියයට 300ක පමණ තදබදයක් නිර්මාණය වී ඇතැයි අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යවරයා පසුගිය දා පාර්ලිමේන්තුවේදී ප්‍රකාශ කළේය. එවැනි පසුබිමක් යටතේ බන්ධනාගාරවල තදබදය අවම කර ගැනීම සඳහා හිටපු අධිකරණ අමාත්‍ය විජයදාස රාජපක්ෂ මහතා විසින් ඉදිරිපත් කරන ලද 2024 අංක 25 දරන අපරාධ නඩු විධාන සංග්‍රහයට කරන ලද සංශෝධනයකට අනුව, චූදිතයෙකු වරදකරු කිරීමට පෙර ඔහු අත් අඩංගුවේ සිටි කාලය දණ්ඩනය නියම කරනු ලබන අවස්ථාවේ ඒ චූදිතයාගේ දණ්ඩනයෙහි කොටසක් ලෙස සැලකෙන විධිවිධාන සලසා ඇත.

01. නමුත්, මෙම නීතිය ක්‍රියාත්මක වන්නේ 2024 වසරේ සිට බැවින්, ඊට පෙර බන්ධනාගාරගතව අභියාචනා ඉදිරිපත් කරන ලද දඬුවම් කාලය අඩු නොවූ අය සඳහා මෙය ක්‍රියාත්මක නොවන හෙයින් ඔවුන් සඳහා ද මෙම සංශෝධනය ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන්නේද? නොඑසේ නම් ඒ මන්ද?

02. බන්ධනාගාරය තුළ රිමාන්ඩ් සැකකරුවන් විශාල ප්‍රමාණයක රස පරීක්ෂක වාර්තා ප්‍රමාද වීම මත නඩු කටයුතු ඉදිරියට පවත්වාගෙන යැමට නොහැකිව රක්ෂිත බන්ධනාගාරගතව ඇත. එබැවින් ඔවුන් සම්බන්ධයෙන් නීතිමය කටයුතු කඩිනම් කිරීම සඳහා ගෙන ඇති වැඩ පිළිවෙළ කුමක්ද?

[ගරු මනෝ ගනේසන් මහතා]

03. සුළු වැරදි සඳහා පොදු සමාව දැනට ක්‍රියාත්මක නොවන තත්ත්වයක් තුළ එය නැවත ක්‍රියාත්මක කිරීමට පියවර ගන්නේද?

04. බරපතළ තත්ත්වයෙහිලා නොසැලකෙන වැරදි සම්බන්ධයෙන් බන්ධනාගාරගත කර සිටින වයස අවුරුදු 70ට වැඩි යහපත් කල්ක්‍රියාවෙන් පසුවන්නන් නිදහස් කරන ක්‍රමය මේ වන විට ක්‍රියාත්මක වන්නේද? නොඑසේ නම් ඒ මන්ද?

ගරු ඇමතිතුමනි, මෙය ජනතාවාදී සංවේදී ප්‍රශ්නයක්. මේකට උත්තර දෙන්න. එච්චරයි.

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා (අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමා)**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார - நீதி மற்றும் தேசிய ஒருமைப்பாட்டு அமைச்சர்)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law - Minister of Justice and National Integration)

ගරු කථානායකතුමනි, මම ස්තුතිවන්ත වෙනවා ගරු මනෝ ගනේසන් පාර්ලිමේන්තු මන්ත්‍රීතුමාට ඒ ඉතාම සංවේදී සහ ජනතාවාදී ප්‍රශ්නය ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන්. ඒ වාගේම, මම මේ ගරු සභාවට කියන්නට ඕනෑ, මෙතැනට නිකම්ම මේ ප්‍රශ්නය ඉදිරිපත් කළා නොවෙයි කියන එක. ගරු මනෝ ගනේසන් මන්ත්‍රීතුමාත්, ගරු සුජීත් සංජය පෙරේරා මන්ත්‍රීතුමාත් යන දෙපළම මින් පෙර අවස්ථාවකත් මා මුණගැසී මේ සංවේදී තත්ත්වය පිළිබඳව කරුණු පැහැදිලි කිරීමක් කරනු ලැබුවා. ඒ නිසා මම එතුමන්ලාට ස්තුතිවන්ත වෙනවා. ඔබතුමන්ලා අද මේ ප්‍රශ්නය ඉදිරිපත් කළා විතරක් නොවෙයි, ඒ වෙනුවෙන් කැප වෙච්ච මන්ත්‍රීවරු දෙපළක් නිසායි මා ඉතාම ගෞරවයෙන් ඔබතුමන්ලාට මේ උත්තරය දෙන්නේ.

01. 2025 අංක 25 දරන අපරාධ නඩු විධාන සංග්‍රහ (සංශෝධන) පනත සංශෝධනය කථානායකවරයා විසින් අත්සන් කර ඇත්තේ 2024.05.03 වන දිනය. ඒ අනුව, එකී පනත අදාළ වන්නේ එදිනට පසුව නඩු තීන්දුවලට වේ.

We cannot have a situation of retrospective application of legislation. So, it is a problem. ඔබතුමන්ලා ඇවිල්ලා මට කරුණු දක්වපු කාලය තුළම මම නීති කොමිෂන් සභාවට මේ ප්‍රශ්නය යැව්වා - because I understand that it is a serious problem. තවම නීති කොමිෂන් සභාවෙන් මට මේ තත්ත්වය වෙනස් කරලා නිර්දේශ හෝ නිරීක්ෂණ ලැබිලා නැහැ. මොකද, ආපස්සට බලපාන්න - retrospectively - කටයුතු කිරීමේදී unconstitutional තත්ත්වයක් තිබෙනවා. ප්‍රශ්නය විසඳාගන්නේ කොහොමද කියලා මම නීති කොමිෂන් සභාවට ඉල්ලීම් කර යැව්වා. මම නැවත ඔවුන්ට සිහි කැඳවීම් යවා මේ ගැන සොයා බලන්න කටයුතු කරනවා.

02. රක්ෂිත බන්ධනාගාරගත කර ඇති සැකකරුවන්ගේ රස පරීක්ෂක වාර්තා ප්‍රමාද වීම හේතුවෙන් නඩු කටයුතු ප්‍රමාද වීම යන කරුණ මත උද්ගත වී ඇති බන්ධනාගාර තදබදය අවම කිරීම සඳහා රස පරීක්ෂක දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ පුරප්පාඩු පිරවීමට අවශ්‍ය පියවර ගනිමින් පවතී. විශේෂයෙන් මත්ද්‍රව්‍ය සම්බන්ධ නඩු භාණ්ඩ විශ්ලේෂණය මේ ප්‍රමාදයට මෙන්ම අනෙකුත් අපරාධ නඩු ප්‍රමාදයට ද සහ විශාල නඩු භාණ්ඩ ප්‍රමාණයක් රස පරීක්ෂක දෙපාර්තමේන්තුව තුළ ගොඩගැසී තිබීම යන කාරණාවලට ද මෙම නිලධාරි හිඟය හේතු වෙලා තිබෙනවා. එකී දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩලයට ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ තනතුරු 35ක් පුරප්පාඩුව පවතින බැවින් එම පුරප්පාඩු සම්පූර්ණ කිරීමට අවශ්‍ය පියවර අප පර්යේෂණ නිලධාරි තනතුරු නාමය සහිතව කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීම සඳහා අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් ඉදිරිපත් කරන ලදී. ඒ අනුව කැබිනට් මණ්ඩලය විසින් "විද්‍යාත්මක පර්යේෂණ නිලධාරි" යන තනතුරු නාමය සහිත තාවකාලික පදනමින් තනතුරු 50ක් ඇති කිරීම පිණිස අවශ්‍ය පියවර ගැනීමට අනුමැතිය ලබාදී ඇත. මේ සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ 2026.01.16 - දැනට දින කිහිපයකට පෙර - දිනැති ලිපිය මඟින් මාගේ අමාත්‍යාංශය වෙත එකඟත්වය දන්වා එවා ඇත. ඒ අනුව මෙකී පුරප්පාඩු ද පිරවීමට ඉතා කඩිනමින් මාගේ අමාත්‍යාංශය කටයුතු කරන බව දන්වමි. ඒ අනුව රස පරීක්ෂක වාර්තා ප්‍රමාදයකින් තොරව ඉදිරිපත් කිරීමට හැකියාව ලැබෙයි කියා අපේක්ෂා කරනවා.

03. සුළු වැරදි සඳහා පොදු සමාව මෙවරද නිදහස් දිනය සඳහා ලබාදීම පිණිස බන්ධනාගාර කොමසාරිස් ජනරාල් විසින් මා වෙත ඉදිරිපත් කළ ලිඛිත ඉල්ලීම පරිදි, 2026.02.04 දිනට යෙදෙන ජාතික නිදහස් දිනය වෙනුවෙන් පොදු සමාවක් ලබාදීම සඳහා මා විසින් ගරු ජනාධිපතිතුමා වෙත දැනටමත් යෝජනා කර ඇත.

04. වරින් වර ප්‍රදානය කරන ලද ජනාධිපති පොදු සමාවන් යටතේ වයස අවුරුදු 65, අවුරුදු 75 ඉක්ම වූ රැඳවියන් සම්බන්ධයෙන් කොන්දේසිවලට යටත්ව පොදු සමාවන් ලබාදීම සිදු කර ඇත. 2026.02.04 දිනට යෙදෙන ජාතික නිදහස් දිනය වෙනුවෙන් පිරිනැමීමට යෝජිත සමාවට ද වයස අවුරුදු 65 ඉක්ම වූ රැඳවියන් සම්බන්ධයෙන් ද පොදු සමාවක් ලබාදීමට යෝජනා වී ඇත.

**ගරු මනෝ ගනේසන් මහතා**
(மாண்புமிகு மனோ கணேசன்)
(The Hon. Mano Ganesan)

Hon. Minister, I am not raising this to blame you, but we came and met you months before. ඒක දන්නවා නේ. මමත්, ගරු සුජීත් සංජය පෙරේරා මන්ත්‍රීතුමාත් ඔබතුමාව මුණගැසුනා. අපි ඊට සම්බන්ධ ලියකියවිලිත් ඔබතුමාට දුන්නා. නමුත්, ඒක ප්‍රමාද වෙලා තිබුණා. පසුව අපි පාර්ලිමේන්තුවේ විවිධ අවස්ථාවලදී ඔබතුමාට මේ සම්බන්ධයෙන් දැනුම් දුන්නා, මතක් කළා. පසුව අපි Secretariat එකට ලියුමක් ලිව්වා, අමාත්‍යාංශයේ MCC එක කැඳවන්න කියලා. පසුගිය ජූලි මාසයෙන් පසුව ඒක කැඳවලා නැහැ. *[බාධා කිරීමක්]* ඔව්, මට උත්තරයක් ලැබුණා. මම ගරු කථානායකතුමාට දැනුම් දුන්නා, ලියුමක් ලිව්වා. I wrote to you asking for an MCC meeting. දැන් අවුරුද්දකට ආසන්න කාලයක් වෙනවා. මාස කිහිපයක් තිස්සේ මේක කැඳවලා නැහැ. එහෙම කැඳෙව්වා නම් ඒක එතැන කථා කරන්න තිබුණා. එහෙම නම් අපට එතැනදී ඒ නිලධාරින්ට මුහුණ දෙන්න තිබුණා; ඔවුන් එක්ක කථා කරන්න තිබුණා. ගරු ඇමතිතුමනි, ඔබතුමාට මේ විෂය පමණක් නොවෙයි තිබෙන්නේ, තවත් විෂයයක් තිබෙනවා. ඒ නිසා මේක ප්‍රමාද වෙනවා. අපට එක දවසක් වෙන්න පුළුවන්. හිටපු අධිකරණ අමාත්‍ය ගරු විජයදාස රාජපක්ෂ මැතිතුමා මේක සංශෝධනය කරන්න යොමු කර තිබුණා. කැබිනට් මණ්ඩලයේත් මේක සාකච්ඡා කර තිබුණා. ඒක ඇත්තටම නැවතුණු තැන ඉඳලා පටන් ගන්න තිබුණා. එතැන ඉඳලා ඒක නැවත පටන් ගන්න කියලා අපි ඉල්ලීමක් කරනවා. කරුණාකර ඒක කරන්න, ගරු ඇමතිතුමා. මොකද, මේක සංවේදී ප්‍රශ්නයක්. මේක දේශපාලන ප්‍රශ්නයක් නොවෙයි නේ. මේක ජනතාවාදී ප්‍රශ්නයක්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා ප්‍රශ්නය අසා ඉක්මනින් අවසන් කරන්න.

**ගරු මනෝ ගනේසන් මහතා**
(மாண்புமிகு மனோ கணேசன்)
(The Hon. Mano Ganesan)

පොඩ්ඩක් ඉන්න, ගරු කථානායකතුමනි. මට පොඩි වෙලාවක් දෙන්න. මේක සංවේදී ප්‍රශ්නයක්. ගරු කථානායකතුමනි, සංවේදී ප්‍රශ්නයකදී බාධා කරන්න එපා. මගේ කථාව නවත්වන්න කියන්න එපා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා යොමු කරන ප්‍රශ්නය වෙනුවෙන් විනාඩි දෙකක කාලයක් තමයි දෙන්න පුළුවන්.

**ගරු මනෝ ගනේසන් මහතා**
(மாண்புமிகு மனோ கணேசன்)
(The Hon. Mano Ganesan)

මේක අවසන් කරන්න, මට අවස්ථාව දෙන්න. මමත්, සුජීත් සංජය පෙරේරා මැතිතුමා ඇතුළු අපි දෙදෙනාටම ඒ වගකීම තිබෙනවා. අපි දෙදෙනා විවිධ අවස්ථාවලදී රිමාන්ඩ් බන්ධනාගාරය ඇතුළට ගිහිල්ලා සාකච්ඡා කරලා බලලා ආවා. ඒ මිනිස්සු ලොකු බලාපොරොත්තුවකින් ඉන්නවා. අපි සම්බන්ධයෙන් නොවෙයි, ඒ අය ඔබතුමන්ලා සම්බන්ධයෙන් තමයි බලාපොරොත්තු තියාගෙන ඉන්නේ. එම නිසා ඒ දේ කරන්න.

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)

ගරු මන්ත්‍රීතුමනි, සමහර දේවල්වල යම් පමාවන් තිබෙන බව මම පිළිගන්නවා. නමුත්, සමහර දේවල් සිදු කරන්න යම් කාලයක් ගත වෙනවා. මම කියන්නේ නැහැ ඔක්කෝම හරියටම සිද්ධ වුණා කියලා. නමුත්, විජයදාස රාජපක්ෂ ගෙනාපු නීතිය ආපස්සට, retrospective legislation එකක් විදියට අපට දුවන්න බැහැ. ඒක වෙනස් කරන්න ඕනෑ නිසා තමයි මම ඒක Law Commission එකට යැව්වේ. යම් කාලයක් ගතවෙලා තිබෙනවා. මම ඒක පිළිගන්නවා. නමුත්, මේක සිද්ධ කරන්න අපි සූදානම්. ඒක කරන්න අපි සූදානම්. *[බාධා කිරීමක්]* Law Commission එකට යවලා තිබෙනවා කියලා මම දන්නවා.

**ගරු මනෝ ගනේසන් මහතා**
(மாண்புமிகு மனோ கணேசன்)
(The Hon. Mano Ganesan)

අනිවාර්යයෙන් ඒ වැඩේ කරන්න ඕනෑ, ප්‍රමාද කරන්නේ නැතිව. බොහොම ස්තුතියි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

මීළඟට, ගරු කංචන වැලිපිටිය මන්ත්‍රීතුමා.

Order, please! මේ අවස්ථාවේදී කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයකු මූලාසනය සඳහා ගරු සුජීව දිසානායක මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)

ගරු කථානායකතුමනි, "ගරු සුජීව දිසානායක මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු සුජීව දිසානායක මහතා මූලාසනාරූඪ විය.***
*அதன்பிறகு, மாண்புமிகு சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு சுஜீவ திசாநாயக்க அவர்கள் தலைமை வகித்தார்கள்.*
*Whereupon THE HON. SPEAKER left the Chair, and THE HON. SUJEEWA DISSANAYAKE took the Chair.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු කංචන වැලිපිටිය මන්ත්‍රීතුමනි, ඔබතුමාට විනාඩි 7ක කාලයක් තිබෙනවා.

**ගරු කංචන වැලිපිටිය මහතා**
(மாண்புமிகு கஞ்சன வெலிப்பிட்டிய)
(The Hon. Kanchana Welipitiya)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් මා පහත සඳහන් ප්‍රශ්නය අහනවා.

කොළඹ කොටස් වෙළෙඳ පොළ ගනුදෙනු වර්තමාන රජය පත්වීම සමඟ ශීඝ්‍ර ඉහළ යාමක් නිරීක්ෂණය වේ. විශේෂයෙන්ම දේශපාලන ස්ථාවරත්වය සහ රජයේ ආර්ථික ප්‍රතිපත්ති පිළිබඳව පෞද්ගලික අංශයේ පවතින ධනාත්මක ප්‍රවේශය මේ තුළින් තහවුරු වේ. මෙවන් පසුබිමක පසුගිය දිනක සිදු වූ ගනුදෙනුවල දෝෂසහගත තත්ත්වයක් ද වාර්තා විය.

01. වර්තමාන රජය පත් වන අවස්ථාවේ සිට මේ දක්වා කොළඹ කොටස් වෙළෙඳ පොළ කොපමණ වර්ධනයක් සිදු වී තිබේද?
02. ප්‍රශ්නගත සිදුවීම මේ වන විට නිරාකරණය කර තිබේද?
03. ඒ සඳහා හේතු සහ වගකිව යුත්තන් සොයාගෙන තිබේද?
04. ඉදිරියේදී එවැනි සිදුවීම් ඇති නොවීමට ගෙන ඇති පියවර මොනවාද?
05. කොටස් වෙළෙඳ පොළ කටයුතු සඳහා වැඩි ආයෝජක පිරිසකගේ දායකත්වය ලබා ගැනීමට සහ ගනුදෙනු පුළුල් කිරීමට තිබෙන සැලසුම කුමක්ද?
06. කොටස් වෙළෙඳ පොළ තුළ මූලික කොටස් නිකුතු ප්‍රමාණය ඉහළ දැමීමට ගෙන ඇති පියවර මොනවාද? එහි 2026 වසර සඳහා වූ ඉලක්ක මොනවාද?

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම 2024 සැප්තැම්බර් 23වෙනි දා, ඒ කියන්නේ අපේ ජනාධිපතිවරයා දිවුරුම් දීපු දවස වන විට සමස්ත කොටස් මිල දර්ශකය - ASPI - 11,096.81කට තිබුණේ. හැබැයි අද උදේ වන විට සියලු කොටස් මිල දර්ශකය වාර්තා වෙනවා 23,958.51ක් ලෙස. ඒක දෙගුණයකටත් වඩා වැඩි ප්‍රමාණයකින් වර්ධනය වෙලා තිබෙනවා. ඒ වාගේම පසුගිය දවස්වල ප්‍රාග්ධනීකරණය රුපියල් ට්‍රිලියන 4.04 සිට රුපියල් ට්‍රිලියන 8 දක්වා දෙගුණයකින් වැඩි වෙලා තිබෙනවා කියලා දැක්කා. ඒ වාගේම පසුගිය කාර්තු 4 තුළ ලැයිස්තුගත සමහර සමාගම්වල ලාභය ට්‍රිලියන 8 ඉක්මවන තැනට පත් වෙලා තිබෙනවා, එම ලාභාංශ ආයෝජකයන් අතර බෙදා දීම නිසා ඒ ආයෝජකයන්ගේ උනන්දුව ඉහළ ගිහින් තිබෙනවා කියලා අපි පසුගිය වාර්තාවලින් දැක්කා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, නමුත් දත්ත මෙහෙම තිබියදී විපක්ෂය මේ වෙලාවේ උත්සාහ කරමින් සිටිනවා, රටේ ආර්ථික අස්ථාවරත්වයක් තිබෙනවා කියන්න. ජනතාව තුළ සැකය සංකාව මතු වෙන ආකාරයට ප්‍රකාශ කරන්න ඔවුන් පෙළඹිලා සිටිනවා.

[ගරු කංචන වැලිපිටිය මහතා]

අද සහ ඊයේ කථාබහ වුණු අධ්‍යාපන ප්‍රතිසංස්කරණ පිළිබඳව ප්‍රශ්නයත් ඒ වාගේ තමයි. මොකද, අගමැතිතුමිය ගැන විශ්වාසය පලුදු කරලා, මේ ආණ්ඩුව අස්ථාවරයි කියලා සමාජයේ සැකයක් හදන්න හදනවා. ඒ සඳහා විවිධ දේවල් කරනවා. මන්ත්‍රීවරු හැටියට ඒ ගොල්ලන් අගමැතිතුමියට විරුද්ධව විශ්වාස භංගයක් අත්සන් කරනවා. එය අද භාර දෙනවා, හෙට භාර දෙනවා කියලා මාධ්‍යයේ ප්‍රචාරය කරනවා. නමුත් දැන් දිනයක් නැතිව ඉන්නවා කියලා ආරංචි වෙනවා. ඒ හැම දෙයකින්ම ඔවුන් උත්සාහ කරන්නේ සමාජයේ අස්ථාවරත්වයක් හදන්න, විශ්වාසය පලුදු කරන්න. අපි බලයට එන්න ඉස්සෙල්ලාත් ඒ වාගේම තමයි කිව්වේ. අපට ජාත්‍යන්තර සම්බන්ධතා නැහැ කිව්වා. අපේ ජාතික ජන බලවේගය බලයට පත් වුණොත් IMF එක දාලා යයි කිව්වා. ණය කළමනාකරණය කර ගන්න බැරි වෙයි කියමින්, විවිධ දේවල් ප්‍රකාශයට පත් කළා. හැබැයි ආණ්ඩුවක් හැටියට ස්ථාවරව තමන්ගේ ප්‍රතිපත්ති අනුව අපි රටේ ජනතාවට දුන් පොරොන්දු ඉෂ්ට කරමින් යනවා.

අද වන විට රටේ ජනතාවට, අපේ රටේ ව්‍යාපාරිකයන්ට, දේශීය සහ විදේශීය සමාගම්වලට මේ ආණ්ඩුව කෙරෙහි තිබෙන විශ්වාසය තමයි අපේ රටේ දත්තවලින් සහ ඒ හැම දෙයකින්ම පෙන්වන්නේ. රටේ ජනතාවගේ, අපේ ව්‍යාපාරිකයන්ගේ, ලෝක ප්‍රජාවගේ විශ්වාසය දිනාගෙන මේ ආණ්ඩුව කටයුතු කරනකොට විපක්ෂයේ අය කලබල වෙලා දඟලනවා. ඒක නිසා තමයි මම ගරු ඇමතිතුමාගෙන් මේ ප්‍රශ්න ටික අහන්නේ. අපේ ආණ්ඩුව 2026 අවුරුද්ද ඇතුළත මේක තවත් සංවර්ධනය කර ගැනීම වෙනුවෙන් කටයුතු කරන ගමන් යම් අඩු පාඩුවක් තිබුණා නම් ඒවා නිවැරදි කර ගැනීමටත් කටයුතු කරනවා. පසුගිය ජනවාරි 07වෙනි දා කොටස් වෙළෙඳ පොළේ බිඳ වැටීමක් ගැන ලොකු ප්‍රචාරයක් ලබා දෙනවා අපි මාධ්‍යවලින් දැක්කා. හැබැයි ඒක සුළු අතපසුවීමක් කියන එක පසුව වාර්තා වුණා. මාධ්‍යත්, විපක්ෂයත් ඒ වාගේ බොරු බිල්ලෝ මවන අවස්ථාවක, මේ වසර තුළ අපේ ආණ්ඩුවේ ස්ථාවරත්වය පවත්වා ගැනීම සඳහා ඔබතුමන්ලා ගෙන ඇති ක්‍රියාමාර්ග මොනවාද කියලා මම ගරු ඇමතිතුමාගෙන් අහන්න කැමැතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

පිළිතුරු සැපයීම, මුදල්, ක්‍රම සම්පාදන සහ ආර්ථික සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා.

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා (කම්කරු අමාත්‍ය සහ මුදල් සහ ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த - தொழில் அமைச்சரும் நிதி, திட்டமிடல் பிரதி அமைச்சரும்)
(The Hon. (Dr.) Anil Jayantha - Minister of Labour and Deputy Minister of Finance and Planning)

විශේෂයෙන්ම ආර්ථිකය ඇතුළේ කොටස් වෙළෙඳ පොළේ ප්‍රාග්ධනීකරණය, කොටස් වෙළෙඳ පොළෙන් ප්‍රාග්ධනය එකතු කිරීම කියන කාරණා සම්බන්ධයෙන් ගත්තොත්, අපි ආණ්ඩු බලය ලබා ගන්නකොට තිබුණේ සාපේක්ෂව අඩු අගයක්. මේ වනකොට එය දෙගුණයකින් වර්ධනය වුණා වුවත්, තවදුරටත් කොටස් වෙළෙඳ පොළ තුළ ප්‍රාග්ධනය එකතු කිරීම කියන කාරණය තවත් වර්ධනය කර ගත යුතු වනවා.

01. ජනාධිපතිවරයා පත් වුණාට පස්සේ, 2024 සැප්තැම්බර් 21වැනි දා සිට සියලු කොටස් මිල දර්ශකය ඒකක 11,096ක් වෙලා තිබෙනවා. ඒක 2026 වර්ෂයේ අද වන විට තිබෙන ප්‍රමාණය ගත්තාම, ඒකක 23,956ක් ලෙස විශාල වර්ධනයක් පෙන්නුම් කරනවා. මෙය ඉතිහාසයේ සියලු කොටස් මිල දර්ශකයේ වැඩිම අගය වනවා. ඒ වාගේම ඒ කාල සීමාව ඇතුළත දෛනික පිරිවැටුම දෙගුණයකින් විතර වර්ධනය වෙලා තිබෙනවා. එය වෙළෙඳ පොළ ක්‍රියාකාරිත්වය සහ ආයෝජකයින්ගේ සහභාගිත්වය වැඩිවීම පෙන්නුම් කිරීමක් විධියට තමයි අපි දකින්නේ.

02. මෑතකදී කොටස් වෙළෙඳ පොළේ සිදු වූ ප්‍රශ්නගත සිදුවීම, ඒ කියන්නේ මිල එකවර ඉහළ යෑමත්, වෙළෙඳ පොළ කටයුතු තාවකාලිකව නවතා දැමීමත් පිළිබඳව වූ ප්‍රශ්නය එදිනම නිරාකරණය කර ගන්න අපට පුළුවන්කම ලැබුණා. සාමාන්‍යයෙන් කොළඹ කොටස් හුවමාරුව තුළ සිදු වන සෑම ගනුදෙනුවක්ම ස්වයංක්‍රීය ගනුදෙනු පද්ධතියක් හරහා පවතින රීතිවලට යටත්ව, මිල නියාමනය කිරීමකින් තමයි සිද්ධ වන්නේ. නමුත්, බොහෝ රටවල කොටස් හුවමාරුව සඳහා භාවිත කරන ක්‍රියාමාර්ග මත පදනම් වෙමින්, වෙළෙඳ පොළ ඉල්ලුම හා සැපයුම මත සමාගමක් තමන්ගේ කොටස් ගනුදෙනු ආරම්භ කරන පළමුවැනි දිනයේදී කොටසක මිල තීරණය විය යුතුය යන සංකල්පය මත, කොළඹ කොටස් හුවමාරුව තුළ පළමු දිනයේ සිදු වන ගනුදෙනුවල මිල පාලනයක් සිද්ධ වන්නේ නැහැ.

මේ අදාළ සිදුවීම වුණේ, ජනවාරි 07වැනි දා කොළඹ කොටස් හුවමාරුව තුළ නව සමාගමක් වන Wealth Trust Securities Limitedහි මූලික කොටස් නිකුතුවෙන් පසු, සමාගමේ කොටස් මුල්වරට කොටස් හුවමාරුව හරහා ගනුදෙනු සිදු කිරීම ආරම්භ වීමෙන් පසුවයි. එහි මූලික කොටස් නිකුතුවට අදාළ කොටසක මිල රුපියල් 7ක් විධියට නියම කරලා තිබුණා. එම සමාගමේ කොටස් සඳහා ආයෝජකයින්ගේ විශාල ඉල්ලුමක් තිබුණා. ඒ විශාල ඉල්ලුම් ඇණවුම් ප්‍රමාණය, පූර්ව ආරම්භක කාලය, ඒ කියන්නේ pre-open session එක තුළ ස්වයංක්‍රීයව ගනුදෙනු පද්ධතිය වෙත ලැබී තිබුණු අතර, මූලික කොටස් නිකුතුවෙන් කොටස් හිමි වූ ආයෝජකයින් අධික මිල ගණන්වලට විකිණීම සඳහා ඇණවුම් ඉදිරිපත් කරලා තිබුණා. මෙම පද්ධතිය වෙත කොටස් සඳහා ලැබී තිබුණු ඉල්ලුම් ප්‍රමාණය - buy orders - ලැබී තිබූ සැපයුම් ඇණවුම් ප්‍රමාණයට වඩා ඉතා වැඩියි. මෙම ඉල්ලුම් ඇණවුම් අතර නිශ්චිත මිලකට කොටසක් මිලදී ගැනීමට කැමැති බව සඳහන් නොකළ වෙළෙඳ පොළ ඇණවුම් - market orders - විශාල ප්‍රමාණයක් ලැබී තිබූ අතර, එම ප්‍රමාණය තිබූ සමස්ත විකුණුම් ඇණවුම් ප්‍රමාණයට වඩා වැඩි විය. ඇතැම් ආයෝජකයින් පූර්ව ආරම්භක කාලය - pre-open session එක - තුළ රුපියල් 25,000 වැනි මිලකට විකුණුම් ඇණවුම් ඇතුළත් කරලා තිබුණා. ඒ හේතු දෙක නිසා, සමාගමේ කොටසක මිල ඉහළ අගයකින් එනම්, රුපියල් 25,000ක් මත ගනුදෙනු ආරම්භවීම සිද්ධ වුණා. එය අසාමාන්‍ය ගනුදෙනු නිරීක්ෂණයක් කියලා වාර්තා වුණු විගස, ඒ බලපෑම පැතිරීම වැළැක්වීම සඳහා කොළඹ කොටස් හුවමාරුවේ ගනුදෙනු අත්හිටුවන ලදී.

ඉන් පසු ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව හා තැරැව්කාර සමාගම් සමඟ පැවැත් වූ සාකච්ඡාවකින් පස්සේ, කොටස් වෙළෙඳ පොළේ සාධාරණ, විධිමත් හා විනිවිදභාවය පවත්වා ගෙන යෑම සඳහා ඒ දිනය තුළ සිදු විය යුතු ඒ අදාළ ගනුදෙනු සියල්ල අවලංගු කිරීමට කටයුතු කළා. එමඟින් අදාළ අසාමාන්‍ය ගනුදෙනු නිසා සිදුවීමට ගිය අහිතකර බලපෑම ඉවත් කිරීමට හැකි වුණු අතර, පද්ධතිමය අවදානම අවම කර ගැනීමට හැකි වුණා. එසේම මේ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව හා කොළඹ කොටස් හුවමාරුව ක්ෂණිකව ක්‍රියාත්මකවීම මත, කොළඹ කොටස් වෙළෙඳ පොළේ සාධාරණත්වය හා විශ්වසනීයත්වය රැක ගැනීමට හැකියාව ලැබුණා.

ඊට අමතරව, ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව විසින් මෙම සිද්ධිය පිළිබඳ පූර්ණ විමර්ශනයක් ආරම්භ කර තිබෙනවා. එහිදී හෙළිවන තොරතුරු අනුව අදාළ පුද්ගලයින්ගෙන් යම් වැරදි කටයුත්තක් සිදු වෙලා තිබෙනවා නම් ඒ අයට විරුද්ධව අවශ්‍ය නීතිමය ක්‍රියාමාර්ග ගැනීමටත් සැලසුම් සූදානම් කර තිබෙනවා.

03. ඉහත සඳහන් කළ ඇණවුම ඇතුළත් කිරීම කොළඹ කොටස් හුවමාරුවේ වෙළෙඳ ගනුදෙනුවලට අදාළ නීති රීතිවලට - trading rulesවලට - අනුකූලව සිදු වෙලා තිබෙනවා. නමුත්, ඉහත සිදුවීම සඳහා මූලික ඇණවුම් ඉතා ඉහළ මිලකට යොමු කරන ලද ආයෝජකයින් හඳුනා ගෙන ඇති අතර, එම ආයෝජකයින් පිළිගත් වෙළෙඳ පොළ තත්ත්වයන්ට පරිබාහිරව මොන යම් හෝ අභ්‍යන්තර න්‍යාය පත්‍රයක් පදනම් කරගෙන එම ඇණවුම් යොමු කළාද කියන කාරණය විමර්ශනය වෙමින් පවතිනවා. මෙම කරුණ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා සුරැකුම් පත් හා විනිමය කොමිෂන් සභාව විසින් සිදු කළ මූලික විමර්ශනයේ මූලික අදියරේදී සමහර වගකිවයුත්තන් හඳුනා ගෙන ඇති අතර, ඔවුන් සිදු කර ඇති වරදේ අපරාධමය ස්වරූපයක් තිබෙනවාද යන්න තහවුරු කරගැනීම සඳහාත්, ඒ වාගේ තවත් වගකිවයුත්තන් සිටිනවාද කියලා හඳුනා ගැනීම සඳහාත් විමර්ශන ආරම්භ කර අදාළ හේතු හඳුනා ගනිමින් තිබෙනවා. එම විමර්ශන ඉක්මනින් අවසන් කිරීමට කොමිෂන් සභාව බලාපොරොත්තු වනවා.

04. 2026 ජනවාරි මාසයේ 07වැනි දා සිදුවෙච්ච අසාමාන්‍ය ගනුදෙනු පිළිබඳ සාකච්ඡා කිරීමට විශේෂ කොමිෂන් සභා රැස්වීමක් එදිනම කැඳෙව්වා. එහිදී ඉදිරියේදී එවැනි තත්ත්වයක්ඇති වීම වළක්වා ගැනීමට පියවර රාශියක් ගත්තා. එහි ප්‍රධානම පියවර විධියට, මූලික කොටස් නිකුතුවෙන් පසු අදාළ සමාගමේ කොටස් පළමුවරට කොළඹ කොටස් හුවමාරුව හරහා ගනුදෙනු ආරම්භ වන දිනයේදී වෙළෙඳ පොළ ඇණවුම් සඳහා අවසර නොදීම කියන තාවකාලික ක්‍රියාමාර්ගය ගත්තා.

05. 2025-2035 සඳහා වූ උපාය මාර්ගත් ඇතුළත් කර සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභා උපාය මාර්ග සැලැස්ම වැඩිදියුණු කරලා කෙටි කාලීන, මධ්‍ය කාලීන සහ දිගු කාලීන සංවර්ධන අරමුණු සහිතව ඉදිරිපත් කර තිබෙනවා. එහි ක්‍රියාකාරකම් 12ක් ඇතුළත්ව තිබෙනවා. ඒවා ඉදිරියේදී ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වනවා.

06. නව ලැයිස්තුගත කිරීම් පිළිබඳ ව්‍යාපෘතියක් යෝජනා කර තිබෙනවා. ඒ වාගේම ඉලක්කගත වැඩසටහන් හා දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීමට යෝජනා කර තිබෙනවා. ඊට අමතරව විශේෂයෙන්ම තාක්ෂණය යොදා ගනිමින් ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශයත් සම්බන්ධ වෙලා මේ සඳහා ගත හැකි වෙනත් පියවර ගණනාවකුත් යෝජනා කර තිබෙනවා.

බොහොම ස්තුතියි.

***එකල්හි වේලාව අ.භා. 5.30 පසු කර තිබුණෙන් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා විසින් ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තබන ලදී.***

***පාර්ලිමේන්තුව ඊට අනුකූලව, අ.භා. 5.40ට, 2026 පෙබරවාරි 03වන අඟහරුවාදා පූ.භා. 9.30 වන තෙක් කල් ගියේය.***

*அப்பொழுது நேரம் பி.ப. 5.30 மணிக்குப் பிந்திவிட்டமையால் மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள் வினா விடுக்காமலேயே பாராளுமன்றத்தை ஒத்திவைத்தார்.*

*இதன்படி, பி.ப. 5.40க்கு, பாராளுமன்றம் 2026 பெப்ருவரி 03, செவ்வாய்க்கிழமை மு.ப. 9.30 மணி வரை ஒத்திவைக்கப்பட்டது.*

*It being past 5.30 p.m., THE HON. PRESIDING MEMBER adjourned Parliament without Question put.*

*Parliament adjourned accordingly at 5.40 p.m. until 9.30 a.m. on Tuesday, 03rd February, 2026.*

**සැ.යු.**

මෙම වාර්තාවේ අවසාන මුද්‍රණය සඳහා ස්වකීය නිවැරදි කළ යුතු තැන් දක්වනු රිසි මන්ත්‍රීන් මින් පිටපතක් ගෙන නිවැරදි කළ යුතු ආකාරය එහි පැහැදිලිව ලකුණු කොට, පිටපත ලැබී දෙසතියක් නොඉක්මවා **හැන්සාඩ්** සංස්කාරක වෙත ලැබෙන සේ එවිය යුතුය.

**குறிப்பு**

உறுப்பினர் இறுதிப் பதிப்பிற் செய்யவிரும்பும் பிழை திருத்தங்களைத் தமது பிரதியில் தெளிவாகக் குறித்து அதனைப் பிழை திருத்தப்படாத பிரதி கிடைத்த இரு வாரங்களுள் **ஹன்சாட்** பதிப்பாசிரியருக்கு அனுப்புதல் வேண்டும்.

**NOTE**

Corrections which Members suggest for the Final Print should be clearly marked in their copy and sent to the Editor of HANSARD within two weeks of receipt of the uncorrected copy.

---

**Contents of Proceedings :**

**Final set of manuscripts**
**Received from Parliament :**

**Printed copies dispatched :**

**හැන්සාඩ් වාර්තා**
**කොළඹ 5, පොල්හේන්ගොඩ, කිරුළපන පාර, අංක 163 දරන ස්ථානයෙහි පිහිටි**
**රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන්**
**මිල දී ගත හැක.**

**මෙම හැන්සාඩ් වාර්තාව www.parliament.lk වෙබ් අඩවියෙන්**
**බාගත හැක.**

ஹன்சாட் அறிக்கையின் பிரதிகளை
இல. 163, கிருலப்பனை வீதி, பொல்ஹேன்கொட, கொழும்பு 5இல் அமைந்துள்ள
அரசாங்க தகவல் திணைக்களத்தின் அரசாங்க வெளியீடுகள் அலுவலகத்தில்
பணம் செலுத்திப் பெற்றுக்கொள்ளலாம்.

இந்த ஹன்சாட் அறிக்கையை www.parliament.lk எனும் இணையத்தளத்திலிருந்து
பதிவிறக்கம் செய்ய முடியும்.

Hansard Reports can be purchased from the Government Publications Bureau
at the Department of Government Information,
No. 163, Kirulapone Avenue, Polhengoda, Colombo 5.

This Hansard Report can be downloaded from
www.parliament.lk

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.